

# භික්ෂු ශීලය.

# භික්ෂු ශීලය.

ශ්‍රී කල්‍යාණි වංශික

ඉලුක්වත්තේ මෙධඞ්කරාභිධාන ස්වාමිපාදයන්ගේ

ශිෂ්‍යාවූ

දෙහිවල සද්ධර්මගුප්තපිරිවෙණ ආචාර්‍ය්‍යධුරන්ධර

උඩුගම්පල සුවර්ණජ්‍යොතාභිධාන ස්වාමීන්වහන්සේ

විසින් සම්පාදිතයි.

ඇම්. ධර්මරත්න ලක්මිණිපහන් කතෘ මහත්මයා

විසින්

සිඩ්පත්‍රාවලොකනයෙන් ප්‍රතිගෘහීතයි.

රාමඤ්ඤ නිකායික

දශවර්ගිකාරක සඞ්ඝ සභාවට පිළිගන්වනලදී.

ගල්කිස්සේ

ධර්මොදය බෞද්ධ පාඨශාලාවේ ආචාර්‍ය්‍ය

කොන්දගමගේ දවිත් ප්‍රනාන්දු උපාසකතුමා

මාවිසින්

කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි

මුද්‍රණයකරවනලදී.

බු: ව: 2436.

ක්‍රි: ව: 1893.

# භික්‍ෂු ශීලය.

ශ්‍රී කල්‍යාණී වංශික

ඉලුක්වත්තේ මෙධඞ්කරාභිධ ස්වාමිපාදයන්ගේ

ශිෂ්‍යවූ

දොඹවල සද්ධර්මගුප්තපිරිවෙණ ආචාර්‍ය්‍යධුරන්ධර

උඩුගම්පල සුවර්ණජොත්‍යාභිධ සාමින්නාන්සේ

විසින් සම්පාදිතයි.

ඇම්. ධර්මරත්න ලක්මිණිපහන් කර්තෘ මහත්මයා

විසින්

සිඛිපත්‍රාවලොකනයෙන් ප්‍රතිගෘහීතයි.

රාමඤ්ඤ නිකායික

දශවර්ගී කාරක සඞ්ඝ සභාවට පිළිගන්වනලදී.

ගල්කිස්සේ

ධර්මොදයා බෞද්ධ පාඨශාලාවේ ආචාර්‍ය්‍ය

කොන්දගමගේ දවින් ප්‍රණාන්දු උපාසකවන

මාවිසින්

කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි

මුද්‍රණයකරවනලදී.

බු: ව: 2436.

ක්‍රි: ව: 1893.

## ශ්‍රී සුශීල මුද්‍රාධාණ සමාගමේ
## සමාජික මහතුන්ගේ (අපට ලැබුනුක්‍රමයට) නාමලේඛණය.

1 කොළඹ තිදෝරිස් ප්‍රණාන්දු මුදලාලි මහත්මයා.
2 " ඇච්. මාහිරිස් ප්‍රණාන්දු මුදලාලි මහත්මයා.
3 " මර්සේලිස් ප්‍රණාන්දු මුදලාලි මහත්මයා.
4 " ඩබ්ලිව්. ඒ. දොන් මානුවෙල් ලියන මහත්මයා.
5 කළුතර බබා මුදලාලි මහත්මයා.
6 " එලියෙස්හාමි උපාසක මහත්මයා.
7 පානදුරේ දොන් වෙලූන් ජයවර්ධන ආරච්චි මහත්මයා.
8 ගස්වාපොල සිඤ්ඤෝඅප්පුහාමි උපාසක මහත්මයා.
9 ඩී. ජේ. අයි. අභයවර්ධන කැස්බෑවේ ස්කෝලේ මහත්මයා.
10 ගල්කිස්සේ ඇස්. ජී. සී ගෝමිස් ඔපිසර මහත්මයා.
11 " සී. ඩී. ප්‍රණාන්දු උපාසක මහත්මයා.
12 සවිසත නිමානිස්පේරා වෙදඅප්පුහාමි.
13 දඹුවුවේ. සිඤ්ඤෝඅප්පුහාමි උපාසක මහත්මයා.
14 කළුතර ඇල්. බී. බෙත්තෝ උපාසක මහත්මයා.
15 මොරටුවත්තේ රණවිර ජයවර්ධන විදානආරච්චි මහත්මයා.
16 නාපගොඩ ඩී. බී. ආර්. ජයතුන්ගඅප්පුහාමි.
17 මිරිගම ජී. සී. සේනානායක රාළහාමි.
18 පානදුරේ ඩයස් මහත්මයා.
19 වලානේ මනිමේල්කුරේ මහත්මයා.
20 වැකඩ මත්තෙස්පේරා රේන්දමහත්මයා.
21 පානදුරේ ප්‍රන්සිස්කු ප්‍රණාන්දු මුදලාලි මහත්මයා.
22 හොරේතුඩුවේ මැන්දිස්කුරේ මහත්මයා.
23 කොප්පනාවේ හරමානිස්අප්පු මුදලාලි මහත්මයා.

### කොටස් බාගයගෙවූ මහත්වරු.

24 පානදුරේ මත්තෙස් අප්පුහාමි.
25 උඩුගම්පල දොන් කාරොලිස් ගුණවර්ධන රෙජිස්ටර් රාළහාමි.
26 " දොන් බස්තියන් ගුණවර්ධන අප්පුහාමි.
27 උඩුගම්පල වෙලූන් පෙරේරා අමරසිංහ ස්කෝලේ මහත්මයා.

### මෙම සමාගමට සම්මාදන්වශයෙන්ද කිප දෙනෙකුගෙන් මුදල් ලැබී තිබෙන්.

ඇන්. ඇස්. ප්‍රණාන්දු වෙළඳ මහත්මයා විසින් මෙම සමාගමට කරදාසි රීමක් ප්‍රදානකරණ ලදි. විමලසුරේන්ද්‍ර මුදියන්සේරාලහාමි විසින් මෙහි අන්තැනක යොදා තිබෙන යොගාවචර සිතියම කපාදීමෙන් උපකාර කරණලදි.

ලැබුනු මුළු මුදල රුපියල් 355 ශත 18 යි. කත්තෝරු ගාස්තුව රුපියල් 198යි. කරදාසි වියදම 175 යි, ශත 99 යි. පොත්බැඳීම් ආදි සුලු වියදම් රුපියල් 26 යි.

---

# සංක්‍ෂේපනීය

භික්‍ෂුශීලනාම්වූ මෙම ප්‍රකරණය වනාහි භික්‍ෂූන්ට දේශනාකර වදාළාවූ සප්තාපත්තිස්කන්ධයකින් සමන්විතවූ ශික්‍ෂාපද ශීලයයි කියනලද ප්‍රාතිමොක්‍ෂ සංවරාදි සතර සංවරසීලය විස්තාරකොට කරණලද මාහැඟි ප්‍රශස්ත විනයග්‍රන්ථයකි. ලඞ්කාද්වීපයේ පැතිර පවත්නාවූ රාමඤ්ඤනිකායේ කාරකසඞ්ඝසභාවේ දශමහාස්ථවිරයන්වහන්සේලාට අනන්තගීතව වැඩවිසූ සවදෙශදෙශාන්තරයේ පතළ කල්‍යාණ කීර්ති දෙහබාරිවූ සකල්සාධුජනනයනරසාඤ්ජනවූ ශ්‍රී කල්‍යාණ වංශික ඉළුක්වත්තේ මේධංකරාභිධ හ ස්වාමිපාදෝත්තමයානන් වහන්සේගේ ධර්මාන්තේවාසීවූ දෙහිවල සද්ධර්මගුප්ත පිරිවෙණ ආචාර්‍ය්‍යවූ ගෞරවනීය උඩුනම්පල සුවණ්ණජෝතාභ්‍යාසහ ස්වාමිපාදයන්වහන්සේ විසින් මෙම ග්‍රන්ථය සම්පාදන කළබව ප්‍රාරම්භ කථායෙන් පෙණේ. මෙකල ලඞ්කාද්වීපයේ පණ්ඩිත සම්මත බොහෝ භික්‍ෂූහු විනය ධර්මය සම්බන්ධයම්කාරණයක් විචාළකල්හි "අනුපසම්පන්නයන්ට විනය කියාදීම තහනම්ය"යි කියමින් තිස්සසාමණේරයන්වහන්සේට ප්‍රථමකොට විනයපිටකය පාඩම්නොකෙරෙව් කාරණයහා මිලිඳුපැන "පාතිමොක්ඛුද්දෙසො" යනාදියද ඊට උදාහරණකරති. * එසින්

---

* සාමණේර තැන්හට මුලු විනයපිටකයෙහි පිළිපැදීමක් නැති හෙයින් සූත්‍ර අභිධර්මයන් කටපාඩම් කරවති. උගත් සූත්‍ර අභිධර්මයන්ඇති මහලු පැවිදිතැන්හට වනාහි සියලුවිනයපිටකයෙහි පිළිපැදීම්ඇති හෙයින් මුලුවිනයපිටකය පාඩම්කරවති. මෙය වනාහි ත්‍රිපිටකය ඉතුරු නොකොට ඉගැන්වීමෙහි චාරිත්‍රයකි. ත්‍රිපිටකධරවනු කැමති තිස්සසාමණේරයන් වහන්සේටද එසේ පැවති චාරිත්‍රයෙන් හෙරණ් පැවිදි කල්හි සූත්‍ර අභිධර්ම පිටකද්වය උගන්වා උපසම්පන්නකාලයෙහි විනයපිටකය ඉගැන්වූයේය. දැන් ත්‍රිපිටකය ඉතුරු නොකොට කවරෙක් උගන්වත්ද? මෙයින් උගත් සූත්‍ර අභිධර්මයන් ඇතිසාමණේර තැන්හට විනයපිටකය ඉගැන්වීම හෝ වුවමනා විනය පදයක් ඉගැන්වීමහෝ තහනම්යයි කෙසේ ප්‍රකාශවන්නේද; නැත්තේමය. නො එසේනම් නාගසේන කුමාරයන්හට ප්‍රථමකොට අභිධර්මයි උගන්වාපසුව සූත්‍ර විනය ධර්මයන් ඉගැන්වූහෙයින් සූත්‍ර පිටකයත් අනුපසම්පන්නයන්ට ඉගැන්වීම තහනම්යයි කියයුතු බවට නොපැමිණෙන්නේද? විනය පටිච්ඡන්නවාදයෙහි තත්වාර්ථයන් "විනය අපටිච්ඡන්න භාවනිර්ණය, පානදුරේ අභිනවවාද" යන පොත්වලින් බලාගතහැකි හෙයින් ඒ ගැණ මෙහි අති ප්‍රපඤ්ච නොවෙමු.

භික්ෂූන්ගේ සුප්‍රතිපත්තිය මේය, දුෂ්ප්‍රතිපත්තිය මේය,යි නො
දන්නාවූ බොහෝ බෞද්ධයෝ වර්තමානකාලික භික්ෂූන්ගේ දුෂ්
ප්‍රතිපත්තියම සුප්‍රතිපත්තිකොට ගනිමින් අස්ථානයෙහි පැහැදී
මාදී සතර මහාදෝෂයෙහිගැලී අපායමාර්ගයට පැමිණ සිටිති.
අපායමාර්ගයම ස්වර්ගමාර්ගයයි ගනිමින් මුළාව සිටින්නාවූ තෙරු
වන් සරණ පරමකොට වසන සැදැහැවතුන්ට මෙම ප්‍රකරණය
තෙම භික්ෂු ධර්මය දැනීමට අසහාය ස්වර්ණදර්පණයක් වැනිවේ.
තමහට වැඩකැමති බුද්ධාගම්කාර අපසහෝදර සජ්ජනයන්ට
මෙයින්ඇති මහත් ප්‍රයෝජන සංඛ්‍යය දක්නාවූ මෙහි පහත
නම් පෙණෙන අප විසින් භික්ෂුශීල මුද්‍රාධිකාණ සමාගම වෙනු
වෙන් මෙම පොත අවධූනස්වා ප්‍රසිද්ධකරණලදී. පෞරාණික
පොත් පත්වල ලිපිදෝෂ පහරණයෙන් හා සත්න ලිවි මෙන්ද
සකස්කොට මුද්‍රණය කරවනලද පොත් පත්හි ඇත්තාවූ නො
යෙක් දෝෂ් ගැණ පත් මගින්වාදකරණබැවි මෙකල දක්නාලැ
බේ. එසේ ඇතිකළ මෙබඳු ග්‍රන්ථයක් අමුතුවෙන් සම්පාදන
කිරීමේදී වැරදි ඇතිවීම අරුමනොවේ. කවරනම් පෘථග් ජන
යෙක්තෙම පරමගාම්භීර ධර්මජ්නය සම්බන්ධවූ මෙබඳු ග්‍රන්ථයක්
සර්වප්‍රකාරයෙන් නිදෝස්කොට සම්පාදන කරන්නේද? නොහැක්
කේමැයි. ලෝකශාසනාභිවෘද්ධිකාමි යම්උත්තමයෝ විද්‍යමානවූඅර්ථ
බාධක දෝෂයන් ප්‍රකාශකරත්නම් ඒ සියල්ල ශුද්ධකොට යටිකී ස
මාගම වෙනුවෙන් නැවත මුද්‍රණය කරවීමෙහි අදහස් ඇතිබව
ද, නැවත මුද්‍රණකරවීමෙහි අයිති වාසිකම අපවෙතම තබාගත්
බවද මෙයින් දතයුතු. මෙම පොත විකිණීමෙන් ලබනලද මුද
ලතම තමන්ගේ මෙලොව ප්‍රයෝජන පිණිස වියදම් නොකො
ට ප්‍රවේශම්කර තබත්නම් මෙව පොතමහෝ පෞරාණික උතුම්
ප්‍රශස්තවෙන යම් විනය ග්‍රන්ථයක් හෝ මෙසේ ප්‍රසිද්ධ කරවන්ට
හැකි බවද, මුද්‍රිත පොත්වල අගේනා ප්‍රමාණයෙන් මෙහි වටිනා
කම ශත 87 නමුත් ලාභාපේක්ෂායෙන්:' මෙව පොත මුද්‍රණනො
කරෙව් හෙයින් මෙයින් පොතක් ශත 62 කට වැඩිකොට නො
විකිනිය යුතුබවද,' භික්ෂුශීල මුද්‍රාධිකාණ; සමාගමේ අපසමාජික
මහතුන්ට සතුනිපුරයසරව මෙයින් දන්වමු.

මේවගව,

කොත්දගමගේ දවිත් ප්‍රණාන්දු

උපාසක.

# ප්‍රාරම්භය.

**නමො තස්ස පටිවිද්ධ සබ්බධම්මස්ස.**

යොගී ජිනෙනොති දමෙති තිවිධා'කාරෙන වෙනෙය්‍යෙ
තංසුගතං පණමිත්වා ආරම්භො ලිඛ්‍යතෙ අයං.

මේ (විනය) ධර්මයතෙම නානාප්‍රකාරවූ විශෙෂක්‍රම ඇති හෙයින්ද, කායවාක් විඥප්ති රූපයන්ගේ ප්‍රකොපයන් හික්මවනහෙයින්ද; විනයාර්ථ දන්නාවූ ප්‍රාඥයන් විසින් "විනය විනය"යි කියනලද්දේය. එහෙයින්කීහ අට්ඨකථාචාර්‍ය්‍යයෝ.

විවිධ විසෙස නයත්තා විනයනතො චෙ'ව කායවාචානං
විනයත්ථවිදූහි අයං විනයො විනයො'ති අක්ඛාතො.

ඒමේවිනයතෙම සංවරවිනය පහාණවිනයයි ද්විභෙදවිසින් ද්විදකෙක්වේ. එහි සංවරවිනයවනාහි, සීලසංවර, සතිසංවර, ඤාණසංවර, ඛන්තිසංවර, විරියසංවර,යයිපඤ්චවිධවේ. පහාණවිනය ද: තදඞ්ගප්පහාන, වික්ඛම්භනප්පහාන, සමුච්ඡෙදප්පහාන, පටිප්පස්සද්ධිප්පහාන, නිස්සරණප්පහාන,යයි පඤ්චවිධවේ. එහි "ඉමිනාපාතිමොක්ඛ සංවරෙන උපෙතොහොති සමුපෙතො" යනාදියෙහි **සීලසංවරය** කියනුලැබේ. "රක්ඛතිචක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති" යනාදියෙහි **සතිසංවරය** කියනු ලැබේ.

යානිසොතානි ලොකස්මිං සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑමි පඤ්ඤායෙ'තෙ පිථීයරෙ.

යනාදිතන්හි **ඤාණසංවරය** කියනුලැබේ. "උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති" යනාදිතන්හි **විරියසංවරය** කියනුලැබේ. පඤ්චවිධවූ මේ සංවරවිනයතෙම තමතමන් අයිතිවූ සංවරකට යුතුවූ හික්මවියයුතුවූ කායවාග් දුශ්චරිතාදීන් සංවරකරණහෙයින් සංවරයයිද; හික්මවනහෙයින් විනයයිද කියනුලැබේ. පහාණවිනයෙහි: විදර්ශනාඥානයතෙම කෙලශයන් තදඞ්ගවශයෙන් ප්‍රහීනකරණ හෙයින් **තදඞ්ගප්පහාන** යයි කියනුලැබේ. කෙලශයන් විෂ්කම්භනකරණ හෙයින් සමාධිතොමෝ **වික්ඛම්භනප්පහාන**යයි කියනුලැබේ. කෙලශයන්මුල්සිඳිමින් උපදනාහෙයින් සතරමාර්ගයෝතුමූ **සමුච්ඡෙදප්පහාන** නම්වෙත්. මාර්ගයෙන් වර්ජිතන කෙලශදරථයන් සංසිඳවනහෙයින් සතරඵලයෝතුමූ

**පටිප්පස්සද්ධිප්පහාන** නම්වෙත්. සර්වසංස්කාරයන් කෙරෙන් නික්මගියහෙයින් නිර්වාණයතෙම **නිස්සරණප්පහාන** යයිකියනුලැබේ. පඤ්චවිධවූ මේපහාන විනයතෙම ක්ලේශයන් හරණ අර්ථයෙන් පහානයයිද; හික්මවන අර්ථයෙන් විනයයිද; කියනුලැබේ. තදඞ්ගාදි ඒ ඒ ප්‍රහාණයන් ඇත්තාහට ක්ලේශප්‍රහාණයයි කියනලද ඒ ඒ විනය ඇතිවනහෙයින්ද, මේසියලු ප්‍රහාණයෝ **පහානවින** යයිකියනු ලැබෙත්. මෙසේ දශප්‍රකාර විනයන් අතුරෙන් භික්ෂුභික්ෂුණීආදි පස්සඟදූමියන්ගේ කායාදී ප්‍රකෝපයන් හික්මවන පිණිස උපනුපන්වරදට අනුරූපපරිච්ඡේදයෙන් පණවාවදාළාවූ ප්‍රඥප්තිශික්ෂාසංඛ්‍යාතවූ ඒ සීලසංවරය ප්‍රධානකොට විනයපර්යාප්තිය තෙම **සර්වාපරාධසාධක** යයිදු කියනු ලැබේ.

“සීලනී පතිට්ඨානීනි සීලං”යි නිර්වචනහෙයින් ඒ ඒ ප්‍රඥප්තිශික්ෂාපදයන් සමාදරයෙන් ගැණීමෙහි උපදනා කාමාවචරකුසලචිත්තසම්ප්‍රයුක්ත චේතනාතොම සමාධිආදී උත්තරිමනුෂ්‍ය ධර්මයන්ට ප්‍රතිෂ්ඨාහෙයින් සීලයයි කියනුලැබේ. “භින්නකිලෙසත්තා භික්ඛු; කිලෙසෙ භින්දතීතිවා භික්ඛූ”යි, නිර්වචනහෙයින් මාර්ගඥානයෙන් බිඳිනලද ක්ලේශයන් ඇතිහෙයින් තත්තද් ගුණාඞ්ගයෙන් ඒ ඒ අගුණාඞ්ගයන් බිඳිනුයි යන අර්ථයෙන්හෝ භික්ෂුනම් වේ. කායවාග්සංයමයෙහි යෙදී පවත්නාවූ බාහිත සමිත භේදිත වූ පාපයන්ඇති වස්ත්‍රාභරණයෙන් සැරහුනු ගෘහස්ථතෙමේද බ්‍රාහ්මණ, ශ්‍රමණ, භික්ෂු යන නාමවලින් ව්‍යවහාර කරනුලැබේ. එහෙයින් වදාළහ—ධම්මපදයෙහි.

අලංකතො චෙපි සමං චරෙය්‍ය
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
සො බ්‍රාහ්මණො සො සමණො’ස භික්ඛු.

“භික්ඛූනං සීලං භික්ඛුසීලං”යි නිර්වචනහෙයින් භික්ෂූන්ගේ සීලය භික්ෂුශීලයයි කියනුලැබේ. භික්ෂුශීලය ප්‍රකාශවනහෙයින් තත්ප්‍රකරණයද කරණයෙහි කාර්යෝපචාරයෙන් භික්ෂුශීලයයි කියනුලැබේ. භික්ඛුසීල: යනමේ නාමයතෙම සාමාන්‍යනාම විශේෂනාමයන් අතුරෙන් සාමාන්‍යනාමය. ක්‍රියා, ගුණ, ජාති, යදිච්ඡක, නාමයන්අතුරෙන් ගුණනාමය. එසේම සාමාන්‍ය, ගුණ, කිත්තිම, ඕපපාතික, නාමයන්අතුරෙන් ගුණනාමය. ආවත්ථික, ලිඞ්ගික, නෙමිත්තික, අධිච්චසමුප්පන්න, නාමයන්අතුරෙන් නෙමිත්තිකනාමය. අනිකුදු ක්‍රමයක්ද වේ. සමහරග්‍රන්ථකෙනෙක් වනානීආදි වශයෙන්නම් ලබත්. ඇතම්කෙනෙක් අන්තවශයෙන් නම් ලබත්. මෙමග්‍රන්ථය ආදිනාමවශයෙන්ද භික්ෂුශීලයයි නම්

ලැබීය. භික්ෂුශීලනම්වූ ඒ මේ ප්‍රකරණය තෙම පාතිමොක්ඛ සංවර නිද්දෙස, පාතිමොක්ඛ සංවර පරිසිට්ඨ සඞ්ගහ නිද්දෙස, පාතිමොක්ඛසංවර සීලවිපත්තිදොස නිද්දෙස, ඉන්ද්‍රියසංවරසීල නිද්දෙස, ආජීවපාරිසුද්ධි සීලනිද්දෙස, පච්චයසන්නිස්සිත සීලනිද්දෙස, මිස්සකසඞ්ගහ නිද්දෙස, චූළසීලාදි නිද්දෙස, දුස්සීලාදි නව නිද්දෙස, සාමණෙරසීල නිද්දෙස, යයි පරිච්ඡෙද දසයකින් සමන්විතවේ. එයින් ප්‍රථමපරිච්ඡෙදයෙහි පාරාජිකාදි සප්තාපත්තිස්කන්ධය සංක්ෂෙපයෙන් දක්වනලදී. දෙවෙනි පරිච්ඡෙදයෙහි ශික්ෂාපදයන්ගේ සතළොස්සාධාරණ ලක්ෂණ විනිශ්චයහා දුක්කටාපත්තිකඛන්ධ විස්තර දක්වනලදහ. තුන්වෙනි පරිච්ඡෙදයෙහි ප්‍රාතිමොක්ෂ සංවරසීලය විපත්තිවනපරිදිහා දුස්සීලව විසිමෙහිදොෂ දක්වනලදහ. සතරවෙනි පරිච්ඡෙදයෙහි චක්ෂුරාදි ඉන්ද්‍රියයන් සංවරකරණපරිදිහා අසංවරිකව විසීමෙහිදොෂද; පස්වනපරිච්ඡෙදයෙහි භික්ෂූන්විසින් දිවිපැවැත්වියයුතු පරිදිහා වරදවා ජීවත්වීමෙහි දොෂද, සවෙනි පරිච්ඡෙදයෙහි දැහැමින්ලැබනලද චීවරාදි ප්‍රත්‍යය ප්‍රයෝජන ගන්නපරිදි හා වරදවා ප්‍රයෝජන ගැණීමෙහි දොෂ දක්වනලදහ. සත්වන පරිච්ඡෙදයෙහි භික්ෂූන්ගේ පරිභොග විභාගයහා සතරවිරති, සතරධූර, සතර සුද්ධි, සීලානිසංස, ද්විවිධවූ සමථවිදර්ශනා භාවනාක්‍රම, එයින් ලැබෙනපුද්ගල විභාග, යන මේ තෙක් දෙය සංක්ෂෙපයෙන් දක්වා විනය නීය ප්‍රධානකොට භික්ෂුශීලය නිමවනුලැබූයේය. අටවෙනි පරිච්ඡෙදයෙහි සූත්‍රානයින් චූළසීල, මජ්ඣිමසීල, මහාසීල, යන ත්‍රිවිධ භික්ෂුසීලය දක්වනලදී. නවවෙනි පරිච්ඡෙදයෙන්; දුශ්ශීල භික්ෂූන්ගෙන් ලොකශාසන දෙකට සිදුවන මහත්වූ අනර්ථහා, සිල්වතුන්ගෙන් ලොකයාහට ඇති මහත්අභිවෘද්ධි දක්වනලදහ. දසවෙනි පරිච්ඡෙදයෙහි පස්ආකාරයකින් සාමණෙරසීලය දක්වා ඉක්බිති ඒ ශීලයාගේ මිස්සකසංග්‍රහ, විපත්තිදොෂ, ආනිසංස, සිල්රැක්කයුතුපරිදි, දක්වනලදහ. තදනන්තරව ග්‍රන්ථසෙත්‍රාත්‍රයද, කර්තෘ නිදර්ශනාදිය සහ කර්තෘ ආසිංසන දක්වා ග්‍රන්ථපරිසමාප්තිය කරණලද්දේය.

(1) ප්‍රථම පරිච්ඡෙදයේ "සීලංචතුබ්බිධං" යනාදිය **සද්ධම්මොපායන**යෙහිය. "ඉධ (භික්ඛවෙ) භික්ඛු" යනාදිය **විසුද්ධිමාර්ගයෙහිය.** දෙවෙනිපිට 1 වෙනි අධ්‍යාය පටන් 21 පිට උදකදුෂ්කෘතය අවසන්කොටඇති දෙසියවිස්සක් ශික්ෂාවෝ **විභඞ්ගමාතෘකා** යයි කියනලද භික්ෂුප්‍රාතිමොක්ෂයද, **කඞ්ඛාවිතරණී** නම්වූ එහි අටුවාවද, **විනයත්ථමඤ්ජුසා** නම්වූ එහි ටීකාවද, ආශ්‍රයකොට කියනුලදහ. ප්‍රථම පරිච්ඡෙදය අවසන්කොට තත්හිතන්හි කියනලද විස්තර හා, අධොලිපි වලින්කියනලද අධිකවිස්තරයෝ උභය

විභඩ්ගයයි කියනලද **පාරාජිකා**, පචිති පොත්දෙකද; දෙවිසිඛ
න්ධකයයි කියනලද **මහවග**, **සුලුවග**, පොත්දෙකද; (සොළස)
**පරිවාරපාඨයද**, යන විනයපෙළ පොත්පසහා, **සමන්ත පාසාදි**
**කා** නම්වූ විනය මහ අටුවාවද, **සාරත්ථදීපනී** නම්වූ විනයමහටී
කාවද, **විමතිවිනොදනී** නම්වූ අනුටීකාවද, **වජිරබුද්ධි** නම්වූ දෙ
වෙනි අනුටීකාවද; බෙහෙවින් ඇසුරුකොට කියනලදහ. එ
හෙත් 14වෙනි පිට "ලිඞ්ගෙ සඞ්ඝෙ ගණෙකස්මිං" යනාදිය **බුද්ධ**
**සික්ඛා**යෙනිය. 25 පිට 7 අඩ්කය අවසන්කොටඇති සමසතළිස්
දූනිශ්‍රිත ශික්ෂාවෝ පචිති පොතෙහි ඕමසවාද සුත්තවිභඩ්ග පා
ලිය ඇසුරුකොට අප විසින් විතරින් කියනලදහ.

(2) දෙවෙනි පරිච්ඡෙදයෙහි (28 පිට) "නිදානාඞ්ගුහාලං" යනාදි ස
ව් ශික්ෂා සාධාරණ සතලොස් විනය ලක්ෂණය **කඞ්ඛාවිතරණිය**
හා, එහිටීකාවද; 31 පිට "තරුංතිමූලං" යනාදිය **විනය** විනිච්ඡ
ය හා **විනයත්ථ සාරසන්දීපනී** නම්වූ එහි ටීකාවද; ඇසුරුකොට
කියනලදී. එහිම 1 වෙනි අඩ්කය පටන් 44 පිට 57 වෙනි අඩ්කය
අවසන්කොට ඇති "අනුජානාමි භික්ඛවෙ දුවෙපතෙත" යනාදි
ශික්ෂාවෝ යටකී සුලුවග මහවග හා තදඨකථා ටීකාවන් ආශ්‍රය
කොට කියන ලදහ. එහෙත් 34 වෙනි පිට "තස්සපාසාදිකං" ය
නාදිගය **විසුද්ධිමාර්ගයෙහිය**. 42 පිට 37වෙනි ශික්ෂාපදය පාරාජිකා
පොතෙනිය. 44 වෙනි පිට 59 වෙනි අඩ්කය පටන් 46 වෙනි පිට
71 වෙනි අඩ්කය අවසන්කොටඇති "විනාධානං වජ්ජනාස්ස" ය
නාදිය **බුද්ධසික්ඛාව** හා **සුමඞ්ගලප්පසාදනී** නම්වූ එහි ටීකාව ඇසු
රුකොට කියනලදී. 72 වෙනි 73 වෙනි අඩ්කවය අවසන්කොට ම
**නොරථපූරණී ලීනත්ථ වණ්ණනා** නම්වූ අඩ්ගුත්තර ටීකාවද;
74 වෙනි අඩ්කයේ "යොනවංනප්ජානාති" යනාදිය, **දීඝවාපිත්ත**
**සංගහයද**, "යාපහාරද" යනාදිය අට්ඨකඩ්ගුත්තරයේ **පහාරාද**
සූත්‍රයද ඇසුරුකොට කියනලදී.

(3) තුන් වෙනි පරිච්ඡෙදයෙහි (48 පිට) 1 වෙනි අඩ්කය පටන් 5
අඩ්කය අවසන්කොටඇති "යොධ සෙවතිදුස්සීලෙ" යනාදිය වි
සුද්ධිමාර්ගය හා **පරමත්ථමඤ්ජුසා** නම්වූ එහි ටීකාවද; 6 අඩ්කය අ
වසන්කොට පරිවාර පාඨයද; 7 අඩ්කය අවසන්කොට **සාරසංග්‍ර**
**හයද** ඇසුරුකොට කියනලදී. එහිද, 48 පිට "ඉත්ථියාලිඞ්ගන
සෙඛච" යනාදිය අග්ගික්ඛන්ධොපම සූත්‍රය ඇසුරුකොට කියන
ලද්දක්යයි සිතමු. 51 පිට "අනන්තමසො දුබ්භාසිතම්පි" යනාදිය
**මනොරථපූරණියෙහිය**. "සාපත්තිකස්ස" යනාදිය සාරත්ථදීපනී
ඉයහි අප විසින් දක්නාලදී. 52 පිට "යස්සඅච්චන්තදුස්සීල්‍යං"
යනාදිය **ධම්මපදයද**; 10වෙනි 11 වෙනි අඩ්කයන් අවසන්කොට
විසුද්ධිමාර්ගයද, 12 අඩ්කය, **සුමංගලවිලාසිනී** නම්වූ දීඝසඟි අටුවා

වද ඇසුරුකොට කියනලදී. එහිද, 53 පිට "දානංනාම" යනාදිය **සාරත්ථප්පකාසිනී** නම්වූ සංයුත්සඟි අටුවාහිය. "සෙවනංදීඝර ත්තා" යනාදිය **සුද්ධශීලප්‍රකරණ** අටුවාහිය.

(4) සතරවෙනි පරිච්ඡෙදයෙහි (56 පිට) 1 අඞ්කය විසුද්ධිමාර්ගීය හා එහිටීකාවද, 2 අඞ්කය බුද්ධශික්ඛාවද, 3 අඞ්කය පටන් 5 අඞ්කය අවසන්කොට ඉන්ද්‍රිය සංයුක්තකයෙහි **ආදිත්තපරියාය** සූත්‍රයද, 6 අඞ්කය **අත්තනගළුවංශයද** ඇසුරුකොට කියනලදී.

(5) පස්වෙනි පරිච්ඡෙදයේ (60 පිට) 1 අඞ්කය පටන් 8 අඞ්කය අවසන්කොට විසුද්ධි මාර්ගියහා එහි ටීකාවද; සන්නයද; (8-1) අඞ්කය අවසන්කොට **සම්මොහවිනොදනි** නම්වූ විභඞ්ගප්‍රකරණ අටුවාවද; (8-2) අඞ්කය පටන් පාරාජිකා පොතේ කුලදූසන සුත්තවිභඞ්ගයද; (8-3) අඞ්කය පටන් (8-5) අඞ්කය අවසන්කොට සමන්තපාසාදිකාවද; 9 අඞ්කය අවසන්කොට **ථෙරගාථාවද**; 10 අඞ්කය අවසන්කොට පාරාජිකා පොතේ උත්තරිමනුස්සධම්ම සුත්තවිභඞ්ගයද; 11 අඞ්කය අවසන්කොට **පපඤ්චසූදනී** නම්වූ මැදුම්සඟි අටුවාවද; ඇසුරුකොටකියනලදී. 12 අඞ්කය "ජීවිත ඤ්චඅධම්මතා" යනාදි ආචාර්‍ය්‍ය වචනයද; 13 අඞ්කය පපඤ්චසූදනියද, ඇසුරුකොට කියනලදී. එහෙත් 63 පිට 16 පෙළ "ජෙට්ඨභාතා" යනාදි ගාථාව පූර්‍වාචාර්‍ය්‍ය වචනයකි. එහිම 29 පෙළ "කැපකරුවී උපස්ථානකිරීමෙහි" යනාදිය චතුක්කඞ්ගුත්තර අපණ්ණකවර්ගයෙ **වණිජ්ජ** සූත්‍රය ඇසුරුකොට කියනලදී.

(6) හවෙනි පරිච්ඡෙදයේ (66 පිට) 1 අඞ්කය පටන් 6 අඞ්කයඅවසන්කොට විසුද්ධිමාර්ගීයහා තිකඞ්ගුත්තර අපණ්ණකප්‍රතිපදා සූත්‍රයද, 7 අඞ්කය අවසන්කොට දම්පියාවහා සද්ධර්මොපායනයද, 8 අඞ්කය අවසන්කොට මැදුම්සඟියේ **නිවාප** සූත්‍රය හා තදර්ථකථාවද, 9 අඞ්කය අවසන්කොට "කන්තාරෙ පුත්තමංසංව" යනාදි පෞරාණික වාක්‍යද; ඇසුරුකොට කියනලදී.

(7) සත්වෙනි පරිච්ඡෙදයේ (71 පිට) 1 අඞ්කය පටන් 3 අඞ්කය අවසන්කොට විසුද්ධිමාර්ගීය හා සමන්තපාසාදිකා සාරත්ථදීපනී විමතිවිනොදනී රූපියපටිග්ගහණ ශික්ෂාවර්ණනාවද, 4-5 අඞ්කවය අවසන්කොට සද්ධර්මොපායනයද, 6 අඞ්කය අවසන්කොට ඛුද්දසිකද; 7 අඞ්කය අවසන්කොට සද්ධර්මොපායනයද, 9 අඞ්කය අවසන්කොට විසුද්ධිමාර්ගීය හා අඞ්ගුත්තරනිකායද; 10 අඞ්කය අවසන්කොට දම්පියාවදී; 11 අඞ්කය පටන් 17 අඞ්කය අවසන්කොට සද්ධර්මොපායනය හා **අභිධම්මත්ථසඞ්ගහයද**; අභිධම්මත්ථ **විභාවනී** නම්වූ එහි ටීකාවද; සන්නයද ඇසුරුකොට කියනලදී. එහෙත් 71 පිට 11 පෙළ "අතීතයෙහි විනදෑවූ" යනාදි

පස්විසි මහබය "ජාතිජරා ව්‍යාධි චුතිචසොකො" යනාදි පූජ්‍යාචා
ර්‍ය වචනය ඇසුරුකොට කියන ලදී.
(8) චූලසීලාදි නිද්දෙස නම්වූ 8 පරිච්ඡෙදය, දීඝසඟියේ සාමඤ්ඤ
ඵලසූත්‍රය හා තදර්ථකථාවද; සුමඞ්ගලවිලාසිනී ලීනත්ථවණ්ණනා
ගි ඒ සූත්‍රටීකාවද; ආශ්‍රයකොට කියනලදහ.
(9) නවවෙනි පරිච්ඡෙදයේ(91පිට) 1 අඞ්කය **පරමත්ථජොතිකා**
නම්වූ සූත්‍රනිපාත අටුවාවේ චූළසූත්‍රවර්ණනාවද; 2 අඞ්කය පටන් 5
අඞ්කය අවසන්කොට අඞ්ගුත්තර **චතු**ක්කනිපාතය හා තදර්ථක
ථාවද; **කොකාලික සූත්‍ර** අටුවාවද: 9 අඞ්කය පුද්ගලප්‍රකර
ණය හා තදර්ථ කථාවද; ආශ්‍රයකොට කියනලදී. 7 අඞ්කය ආචා
ර්‍ය පරපුරෙන් අසනලද "යෙතෙ භික්ඛවෙ භික්ඛූ" යනාදි පාඨා
නුසාරයෙන් කියනලදී. එහි ශුක්ලපක්ෂය මැදුම්සඟි අටුවාවේ
ආකාංඛෙය්‍ය සූත්‍රවර්ණනායෙහි බුදුන් විසින් වදාළබව ප්‍රකාශව
න හෙයින් එයද ආදරකටයුතුමය. 8 අඞ්කය තිකඞ්ගුත්තරයද,
(9) අඞ්කය සඤ්ජීවජාතකයද; 10 අඞ්කය පරමත්ථජොතිකා
නම් **ඛුද්දකපාඨට්ඨකථා**වේ මඞ්ගලසූත්‍ර වර්ණනාවද; ආශ්‍රයකොට කිය
නලදී. 99 පිට "නතෙපසංසන්ති" යනාදිය හා 16වෙනි 17වෙනි
අඞ්කයන් චතුක්කඞ්ගුත්තරය ඇසුරුකොට කියනලදහ. 100 පි
ට 22 අඞ්කයේ "මහාරාජ ගොමෙධ යඤ්ඤං" යනාදිය බ්‍රාහ්
**මණධම්මික** සූත්‍ර අටුවායෙහිය. (10) දසවෙනි පරිච්ඡෙදය වින
ය සඞ්ග්‍රහ නම්වූ **පාලිමුත්තක** විනිච්ඡයෙහි **පබ්බජ්ජා** විනිච්ඡ
යද, විනයාලඞ්කාර නම්වූ ටීකායෙහි තත්වර්ණනාවද, ආශ්‍රය
කොට කියනලදී. එසිත් ඉතිරි කාරණයෝ ඒ ඒ තත්හිම මෙ
නම් පොතෙහියයි කියනලදහ. 112 පිට අඩොලිපිය දුබ්බච ශි
ක්ෂාපද වර්ණනාව ඇසුරුකොට කියනලද්දේය.
වර්තමානකාලයෙහි ලඞ්කාවිපවාසී ඇතම් භවතුන්ගේ "විනය
පාළිඛම්මය සාමණෙරාදී අනුපසම්පන්නයන්ට කියාදීම ආගමේ
තහනම්කරතිබේ" යන දුර්මතයෙන් ගැහැට විඳිනු ලබන්නා
වූ විනය පාළිඛම්මය අසාදනගනු කැමති බෞද්ධ උපාසකාදීන්
ගේ කණගාටුව දැනවදළාවූ ශ්‍රීකල්‍යාණවංශික ගෞරවනීයඋගත්
ප්‍රසිද්ධ ගණාචාර්‍ය ඉලුක්වත්තේ **මෙධංකරාභිධ** ස්වාමිපාදයානන්
වහන්සේගේ අනුමතය ලද්දාවූ මෙහි පහත නම් පෙණෙන මා
විසින් ශාසනාභිවෘද්ධිය සඳහා මේ ප්‍රකරණය සම්පාදන කරණලදී.
කොත්දගමගේ **දවිත් ප්‍රනාන්දු** උපාසකමහත්මයාගේ ආරාධනා
වෙන් මෙහි දසවෙනි පරිච්ඡෙදය ලියනලදී. උයනකුමාරගේ
**හුරණිනිස්අප්පු** මුදලාලි මහත්මයාගේ ආරාධනාවෙන් මේ ග්‍රන්ථ
මුඛයෙහි පුස්ථක නාමයෝ දක්වන ලදහ. මෙම ග්‍රන්ථසම්පාද
නයෙහි ශුද්ධිය පිණිස ගෞරවණීය **ඤාණින්ද්‍රාභිධ** ස්වාමීන්ව

හත්සේද ඇම්. ධර්මරත්න ලක්ෂ්මිණී පහන් කාන්තීමහත්මයාද අවසානය දක්වා හිතේසීව උපස්ථම්භවූබව සතුති පූර්වාංගමව ප්‍රකාශ කරම්හ.

මෙහි විරුද්ධාර්ථාවබෝධ වචනයෝ සුද්ධිපත්‍රයෙහි යොදන ලදහ. "ප්‍රයෝජන වේදනා ඕමක" යනාදිතැන්වල දීර්ඝවයෙදීම සාමාන්‍යජනයාට කියවා ගැනීමෙහි පහසුව පිණිස බව දත යුතු. පාළිවාක්‍යවල ඇතම්තැන හල්අකුරුයෙදීම මුද්‍රාලයේ අක්ෂරඌනතාවය නිසාය. ශ,ෂ,ස,ල,ළ,ණ,න,යන අක්ෂර විසමවයෙදී තිබෙනතැන් සහ හ්‍රස්වව තිබෙන දීර්ඝවියයුතු තැන්ද; දීර්ඝව තිබෙන හ්‍රස්වවිය යුතුතැන්ද, එයින් බලවත් අර්ථවිරෝධයක් නැති හෙයින් සුද්ධි පත්‍රයෙහි ඇතුළත් නොකළෙමු.

සර්වප්‍රකාරයෙන් නිර්දෝෂව මෙපමණ විශාල ග්‍රන්ථයක් සම්පාදන කිරීමෙහි ඇතිදුෂ්කරතාව එහි තත්වය දන්නාවූ පණ්ඩිත ජනයෝම දනිති. ශාසනසපීතිකාමී යම් යම් උත්තමයන් විසින් මෙහි අපගේ ප්‍රමාදභ්‍රමයෙන් ජනිතශාස්ත්‍රාගම විරෝධතැන් අපවෙත දන්වා එවත්නම් එය සතුටින් පිළිගනිමු.

යථාභූතං අජානන්තා වායමන්තාපි යොගිනො
විසුද්ධිං නාධිගච්ඡන්ති සුද්ධිකාමා'පියෙ ඉධ.

මේ ශාසනයෙහි කෙලශශුද්ධිය කැමතිවන්නාවූ යම් යොගාවචර කෙනෙක් තත්වූ පරිද්දෙන් නොදන්නාහු ව්‍යායාම්කරද්දී; ඔව්හු ක්ලේශවිශුද්ධියට නොපැමිණෙත්. එහෙයින් ගිහිගෙයින් නික්ම සසුන්වැද මහණදම් පුරන්නාවූ සියලු පැවිදි තැන්හට ශික්ෂාශීලය ඉගෙනීම පිණිස මෙම ප්‍රකරණය හස්තසාර වස්තුවක් සමණයයි සිතමු.

යාව තිට්ඨන්ති සුත්තන්තා විනයො යාව දිප්පති
තාව දක්ඛන්ති ආලොකං සූරියෙ අබ්භුට්ඨිතෙ යථා.

යම්තාක් සූත්‍රධර්මයෝ සිව්පිරිස අතරෙහි දැනීම් වශයෙන් පවතිද්ද; විනයධර්මය යම්තාක් එසේම බබලාද; ඒ තාක්කල් මොහාන්ධකාර විගමණයෙන් ප්‍රඥාලෝකය දකිත්; කෙසේද? සූර්යයා උදාවූකල්හි (චක්ෂුර්විඥාණය ලැබීමෙන් සමවිසම මාර්ග යන් දක්නෙත්)යම්සේද; එමෙනි.

සුත්තන්තෙසු අසන්තෙසු පමුට්ඨෙ විනයම්හි ච
තමො භවිස්සති ලොකෙ සූරියෙ අත්ථඞ්ගතෙ යථා.

සූත්‍රධර්මය නොදැනීම්වශයෙන් නැතිවීගියකල්හි; විනයධර්මය එසේම මුළාවගිය කල්හි; ලෝවැස්සාකෙරෙහි මොහාන්ධකාර වන්නේය, කෙසේද? සූර්යයා හස්තගිරිපර්වතයට ගියකල්හි යම්සේද; එමෙනි. ධර්මවිනයදෙක ඉගෙණුම් ගැනීමෙහි ඇත්තාවූ මහත් ආනිශංසයෝ මෙසේ දතයුතුහ.

තවද, ධම්මසාමිවූ සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ සියලුස
ත්වයන්හට ධම්මය උගන්වනු සඳහාම පාරමිධම්මයන් පූරණකළ
බව සුදත්තනම් ගෘහපතියාහට වදාළ සේක. සිව්පිරිසම ධම්මවි
නය දෙක්හි දක්‍ෂවනතුරු තමන්වහන්සේට පිරිනිවීම පිණිස
කළාවූ මාර ආරාධනාව පිළිනොගෙණ වැඩවිසූ බව පරිනිර්වාණ
සූත්‍රයෙන් ප්‍රකාශ වේ. උපාසකාදීන්ගේද ධර්මධරවීම විනයධරවී
ම මෙකල සමහරභික්‍ෂූන්ට අනභිමතනමුත් තථාගතයන්වහන්
සේට අභිමත බැව් මෙසේ ප්‍රකාශවනහෙයින් උපාසකාදීන් වි
සින්ද රක්සේ විනයධම්මය ඉගෙණගත යුතුමය.

මෙවගට—ත්‍රිවිධ ශාසන චිරස්ථිතිකාමීවූ,
සුවණ්ණජෝතියසභා.



SUVANNA JOTIYASABHA

යොගාවචරො.

සුදත්තස්ස රාමඤ්ඤනිකායිකානං
සඞ්ඝස්ස කිච්චෙ—දසවග්ගිකස්ස
ගන්ථං ඉමං භික්ඛූ පඤ්ඤ සීලං
කත්වානපූජෙමි සුපුණ්ණ පන්තං.

# භික්ෂු ශීලය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1 කරුණා පුණ්ණහදයං බුද්ධං බුද්ධාදි සෙවිතං,
ධම්මං අරියසඞ්ඝංච වන්දිත්වා වන්දනාරහං.

2 මෙධඞ්කරාභිධං නාම ථෙරංචා, චරියං මම
වන්දිත්වා නිරතං ධම්මෙ තස්සා,නුමතියා අහං.

3 සාසනෙ කුලපුත්තානං රතනාභරණොපමං,
භික්ඛුසීලං පවක්ඛාමි සීහලාය නිරුත්තියා.

1 සීලං චතුබ්බිධං පාතිමොක්ඛා ඉන්ද්‍රියසංවරො
ආජීවපාරි සුද්ධීච සීලං පච්චයනිස්සිතං.

මෙහි භාවය: "භික්ෂුශීලය වනාහි; ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රියසංවරශීලය, ආජීවපාරිශුද්ධිශීලය, ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලයයි සුව් වැදෑරුම් වේ"යනුයි—එහි ප්‍රාතිමොක්ෂ සංවරශීලය, "**ඉධ භික්ඛවෙ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසූති එවංවුත්තනමිදං පාතිමොක්ඛසංවරසීලංනාම**" යනු වෙන් දක්වනලදි—මෙහි භාවය. "මහණෙනි මේ ශාසනයෙහි සසරභයදක්නා සැදැහැයෙන් පැවිදිවූ කුලපුත්‍රතෙම ශික්ෂාපද ශීලයසික්‍යනලදප්‍රාතිමොක්ෂසංවරයෙන් හෙවත්කායවාක්කර්මයන් අරබයා පණවනලද ශික්ෂාපදයන්ගේ නොබිඳීමයයි කියනලද සංවරයෙන් සමන්විතවූයේ වාසය කෙරේද, කායික අවීතික්කම, වාචසික අවීතික්කම කායිකවාචසිකඅවීතික්කමයයි කියනලද ත්‍රිවිධ ආචාරයෙන් හා ආරක්ඛගොචර, උපනිස්සයගොචර, උපනිබද්ධගොචරයයි කියනලද ත්‍රිවිධගොචරයෙන් සම්පූර්ණවූයේ, සිත නැතිවත්පැමිණියහැකි ඇතම්සෙඛියා ඇවත්හට පැමිණීමහා අකුශල චිත්තොත්පාද මාත්‍රයයි කියනලද ස්වල්පවරදෙහිද භය දක්නාසුලුවූයේ නොහොත් දුෂ්කෘතදුර්භාෂිතාපත්තින් සතර පාරාජිකාපත්තින් මෙන්ද සතරපාරාජිකාපත්තීන් මහාමෙරු පර්වතය මෙන්ද සැලකීමෙන් භයදක්නා සුලුවූයේ වාසයකෙරේද, සපතාප

තතිස්කන්ධ සම්බන්ධවූ යම්පමණ ශික්ෂාපදයොවෙද්ද. ඒ සියලු ශික්ෂාපදයන් මනාකොටගෙණ ශික්ෂාපදයන්හි හික්මේද, (හෙතමෙ සීලසම්පන්නයයි) මෙසේ වදාරණලද ශීලය ප්‍රාතිමොක්ෂසංවර ශීලයනම් වේ''යනුයි—මෙහි අදහස: බෙහෙවින් කය වචනදෙක සම්බන්ධව පණවා වදාළාවූ සප්තාපත්තිස්කන්ධයයි කියනලද ශික්ෂාපදශීලය කය වචනයෙන් නොඉක්මවා(නොබිඳ)වාසය කිරීම ප්‍රාතිමොක්ෂසංවරශීලය බවයි.

එහි සප්තාපත්තිස්කන්ධයෝ නම්: පාරාජිකාපත්තිස්කන්ධය, සංඝාදිසෙසාපත්තිස්කන්ධය, ථුල්ලච්චයාපත්තිස්කන්ධය, පාචිත්තියාපත්තිස්කන්ධය, පාටිදෙසනියාපත්තිස්කන්ධය, දුක්කටාපත්තිස්කන්ධය, දුබ්භාෂිතාපත්තිස්කන්ධය, යන මේ සතයි.

1 එහි පාරාජිකා පත්තිස්කන්ධය කවරේද ? :—උපසපන් භික්ෂූහට මෛථුනරාගයෙන් මනුෂ්‍යාමනුෂ්‍ය තිරශ්චීන ස්ත්‍රීන්ගේ වර්චස්මාර්ගමූත්‍රමාර්ගමුඛමාර්ග වශයෙන් තුණක් තුණක් බැගින් දක්වන ලද නව මාර්ගද, මනුෂ්‍යාමනුෂ්‍ය තිරශ්චීන උභතොබ්‍යඤ්ජනකයන්ගේ යථොක්ත නව මාර්ගද, මනුෂ්‍යාමනුෂ්‍ය තිරශ්චීන පුරුෂයන්ගේ වර්චස්මාර්ග මුඛමාර්ග වශයෙන් දෙකක් දෙකක් බැගින් දක්වන ලද මාර්ග සයද, එසේම පණ්ඩකයන්ගේ ෂඩ් මාර්ගයද, යන මෙකී සමතිස් මාර්ගයෙහි තමා නිමිති ප්‍රවෙශයෙන් හා, මෙර මා විසින් ප්‍රවෙශකරවන කල්හිත්, ප්‍රවෙශන, ප්‍රවිෂ්ට, ස්ථිති, උද්ධරණ යන සතර ක්ෂණයන්හි ඉවසීමෙන්ද, සිදුවන (මෛථුනධම්ම) පාරාජිකා පත්තියද:—මනුෂ්‍යයෙක් අයත් පුරාණ නීලකහාපණයෙන් සතරෙන් කොටසක් a අගනාවූ හිමියන් විසින් නොදෙන ලද යම් කිසිවක් පස්විසි අවහාරයෙන් b යම් කිසි අවහාරයකින් සොර සිතින් ගැණීමෙන් සිදුවන (අදින්නාදාන) පාරාජිකා

---

a මේ කාලයෙහි රිට රිදීපහයයි ව්‍යවහාරකරති.

b ආදියන, හරණ, අවහරණ, ඉරියාපථ විකොපණ, ඨානාචාවන, යන නානාභණ්ඩ පඤ්චකයද—ඔවුනුම ඒක භණ්ඩවශයෙන් ඒක භණ්ඩ පඤ්චකයද—සාහත්ථික, ආණත්තික, නිස්සග්ගික, අත්ථසාධක ධුරනික්ඛෙප යන සාහත්ථික පඤ්චකයද—පුබ්බපයොග, සහපයොග, සංවිදාවහාර, සංකෙතකම්ම, නිමිත්තකම්ම, යන පුබ්බපයොග පඤ්චකයද—ථෙය්‍ය, පසය්හ, පරිකප්ප, පටිච්ඡන්න, කුසාවහාර, යන ථෙය්‍යාවහාර පඤ්චකයද—යන මෙකී පස්වැදෑරුම් පඤ්චකයෝ පස්විස් අවහාරයෝයි.

පත්තියද—ප්‍රතිසන්ධි විඥානසහිත කලලරූපයපටන් a මනුෂ්‍යප්‍රාණයක් මරණ චින්තායෙන් දිවි තොරකිරීමෙන් මෙරමාලවා තොරකරවීමෙන්සිදුවන(මනුස්සවිග්ගහ) පාරාජිකා පත්තියද—තමා සතන් නූපන් ප්‍රථමධ්‍යානාදිප්‍රභේදගත උතුරුමිනිස්දම් පාපෙච්ඡනායෙන් වචනය තේරෙණ මිනිසක්හට තමා කෙරෙහි ඇතිබව ප්‍රකාශ කිරීමෙන් සිදුවන (උත්තරිමනුස්සධම්ම) පාරාජිකාපත්තියද—යනමොහු සතරයි.

පණ්ඩක, ථෙය්‍යසංවාසක, තිත්ථියපක්කන්තක, තිරච්ඡානගත, මාතුඝාතක, පිතුඝාතක, අරහන්තඝාතක, ලොහිතුප්පාදක, භික්ඛුණීදූසක, සංඝභෙදක, උභතොබ්‍යඤ්ජනක, යනාමෙකී එකොළොස් දෙනාගේ භික්ෂුභාවයට අභව්‍යභාව සංඛ්‍යාතපාරාජිකාඑකොළොසද—වස්ත්‍රාදී යමකින් වසනලද හෝ නොවසනලද ස්වාංගජාතය එබඳු තමා, වසමග මුවමග, ප්‍රවෙශකර ගැණීමෙන්ද, එබඳුවූ මෙරමා අඟදැය. එබඳුවූ තමා මුවයෙන් ගැණීමෙන්ද, එහි තමා වසමගට ප්‍රවෙශවන අන්දමට ඉඳීමෙන්ද, සිදුවන අනුලොම් පාරාජිකාපත්ති සතරදැයි යන මේ විසලොස් පාරාජිකාවෝද b පාරාජිකාපත්තිස්කන්ධයෙහිම සංග්‍රහවටයෙති.

2 සංඝාදි සෙසාපත්තිස්කන්ධය කවරේ?—උපසපන් භික්ෂුහට එකොළොස් ආස්වාදයන් අතුරෙන් c මොචනාස්වාදයෙන්

a ප්‍රතිසන්ධියෙහි පටන් චිත්තක්ෂණ සතළොසක් ඉක්මෙනතුරු කර්මජ රූපායුෂය පවත්නා හෙයින් ඒ අතර මරණයක් නැතත් සත්වයයි යන සංඥාවටද, වධක සිතටද, උපක්‍රමයටද, අරමුණු වියහැකි බැවින් මෙසේ කියනලදී.

b "**කිලෙසාරීහි පරාජීයන්තො, පරාජිසින්ථාතිවා පාරාජිකො**" යනු නිර්වචනහෙයින් "කෙලෙස් සතුරන් විසින් (එම ජාතියෙහි නැවත උපසම්පන්න බවට අභව්‍ය බැව් කිරීමෙන්) පරදවනු ලැබේනුයි පරදවනලදනුයි හෝ පාරාජික නම් වේ–ඒ පාරාජිකාවූ භික්ෂුව නමුත් ගිහියෙක් හෝ සාමණේරයෙක් හෝ වී නැවත සරණාගමනාදිපටන් ඒ ඒ සිල්රැක මනාව පිළිපැදීමෙන් අයිත් මාර්ගඵලය හැර සෙසු මාර්ගඵලද ලබන්ට භව්‍ය වෙයි.

c මොචනාස්වාදය, මුච්චනාස්වාදය, මුත්තාස්වාදය, මෛථුනාස්වාදය, කැසීමෙහි ආස්වාදය, ඇළශියෙහි ආස්වාදය, දර්ශනාස්වාදය, හිඳීමෙහි ආස්වාදය, කථාකිරීමෙහි ආස්වාදය, ගෙහසිත ආස්වාදය, වණ්ණභඞ්ගාස්වාදය, යන මොහු එකළොස් ආස්වාදයෝයි:— එයින් කීන.

**"මොචන මුච්චන මුත්තස්සාද-මෙථුන කණ්ඩුති ඵස්සස්සාද"**
**"දස්සන නිසජ්ජන වාචස්සාද-ගෙහසිතෙ වණ භඞ්ග ස්සාද"**

හෙවත් මොචනය කරණුකැමැත්තෙන් හසතාදි යම් කිසිව කින් උපක්‍රමකොට ශුක්‍ර මොචනය කිරීමෙන් සිදුවනා (සුක්කවිස ට්ඨිකා) සඟ වෙසෙසද—කාය පරාමශීනයෙහි ආසාවෙන් මනු ෂ්‍ය ස්ත්‍රියකගේ හසතපාද කෙශකලාපාදී ශරීරාවයවයන් ඇල්වී මෙන්සිදුවනා (කායසංසග්ග) සඟවෙසෙසද—කාමය පිළිබඳ කථා කිරීමෙහි අදහසින් හොඳ නරක වචන තේරෙණ මිනිස් මාග මක් සමග වර්ච්ස්මාගී මූත්‍රමාර්ගයන් පිළිබඳ ගුණදොෂ කීමෙන් සිදු වන (දුට්ඨුල්ලවාචා) සඟ වෙසෙසද—මෛථුන රාගයෙන්යුක්තව "මට මෛථුන ධම්මයෙන් උපස්ථානකරව" යි යනාදි වශයෙන් මිනිස් මාගමකට කීමෙන්සිදුවන (අත්තකාම පාරිචරිය) සඟවෙ සෙසද—ස්ත්‍රිපුරුෂයන්ගේ කාම පිළිබඳ හසුන් ගෙණගොස් පුරුෂ ස්ත්‍රීන්ටදී පිළිහසුන් ගෙණවුත් ඔවුන්ට දීමෙන්සිදුවන (සංචරිත්ත) සඟ වෙසෙසද—කරදෙන දායකයෙක් නැතිව හුගත් වියතින් දිග දොළොස් වියතකටද, පළල සත් වියතකටද, වඩා රැගෙණ ලොකු ගෙයක් තමන්ට විසීම පිණිස කුටි වස්තු නොදෙසා කිරී මෙන්සිදුවන (කුටිකාර) සඟ වෙසෙසද—කරදෙන කෙනෙක් ඇතිකල්හි යථොක්ත ප්‍රමාණයට වඩා මහත්කොට ගතහැකි න මුත් විහාර වස්තු නොදෙසා කරවීමෙන්සිදුවන (මහල්ලක විහා රකාරාපන) සඟ වෙසෙසද—ක්‍රොධසිතින් සිල්වත් භික්‍ෂුවක්හට අ මූලිකපාරාජිකා ඇවතකින් සම්මුඛයෙහි චොදනාකිරීමෙන්සිදුව වන (අමූලිකචොදනා) සඟ වෙසෙසද—එළු බැටලු ආදී අන්කිසිවෙ කුගේ මෛථුනසංසග්ගයක් දැක ඒ ලේශයෙන් භික්‍ෂුවක් හට යට කී ආකාරයෙන් චොදනාකිරීමෙන් සිදුවන (කිංචිලෙසලෙස) සඟ වෙසෙසද—යන මේ විකුම් කෙණෙහි නොහොත් ඒ ඒ බුද්ධප්‍රඥ ප්තිය කඩකළ කල්හිම සිද්ධවන්නාවූ සඟ වෙසෙස් ඇවැත්නව යද—සමගි සංඝයාගේ බිඳීමට උත්සාහකරණ භික්‍ෂුහට එය අත්හරවනු පිණිස සෙසු භික්‍ෂූන් විසින් තුන් යළක් අවවාද ක ළ කල්හිනොහරීනම් ඉන්පසු තුන්යලක් සමනුභාෂණකම්ය කළයුතුයි, එය කරණතුරු නොහැර සිටීමෙන්සිදුවන (සංඝ භෙද) සඟවෙසෙසද—ඒ භික්‍ෂුවටම අනුවත්තික භික්‍ෂුගණයාට එසේම සංඝයා විසින් අවවාදකොට සමනුභාෂණකම්ය කළයු තුයි. එය කරණතුරු නොහැර සිටීමෙන්සිදුවන (භෙදානු වත්තක) සඟවෙසෙසද—භික්‍ෂූන් විසින් පවචිඛ ප්‍රාතිමො

ප්‍රාතිමෝක්ෂොද්දෙශයට a ඇතුලත් යම්කිසි ශික්ෂාපදයකින් අවවාද කරණු ලැබ තමන්ට අවවාද කිරීම ප්‍රතික්ෂෙප කරණ ඒ නොකීකරු භික්ෂුහට සෙසු භික්ෂූන් විසින් දුර්වචතාවය හරවනු පිණිස තුන් යලක් අවවාද කොට නොහරීනම් ඉන්පසු තුන් යලක් සමනුභාෂණකර්මය කළයුතුයි. එය කරණතුරු නොහැර සිටීමෙන්සිදුවන (දුබ්බච) සඟවෙසෙසද-පුෂ්පදානාදියෙන් කුලසංග්‍රහකරණ භික්ෂුව සෙසු භික්ෂූන් විසින් ඒ විහාරයෙන් බැහැරකරණු පිණිස කරුණු කියනකල්හි "භික්ෂූහු ඡන්දාදියෙන් අගතියට්යති" යි කියානම් ඒ දුග්‍රාහය හරවනු පිණිස සෙසු භික්ෂූන්විසින් තුන් යලක් අවවාදකොට නොහරීනම් ඉන්පසු තුන්යලක් සමනුභාෂණකර්මය කළයුතුයි. එය කරණතුරු නොහැර සිටීමෙන් ඒකුලදූෂක භික්ෂුහට සිදුවන (කුලදූසක) සඟවෙසෙසද b යන මේ තුන්වන සමනුභාෂණ කර්මයාගේ c අවසානයෙහිසිඬවන සඟවෙසෙස් ඇවැත් සතරද, යන තෙළෙසසංඝාදි සෙසාපත්තිස්කන්ධය නම් වේ.

3 ථුල්ලච්චයාපත්තිස්කන්ධය කවරේද?—අදත්තාදාන පාරාජිකාදි පාරාජිකාපත්තීන්ගේද, ශුක්‍රවිසට්ඨි ආදි සංඝාදිසේසාපත්තීන්ගේද, සාමන්තාපත්ති වශයෙන් සිඬවන තුලැසි ඇවැත්ද, ප්‍රථම පාරාජිකාපත්තිය සහිත එකී ආපත්තීන්ගේම අඩග අසම්පූර්ණත්වයෙන් සිඬවන්නාවූ තුලැසි ඇවැත්ද, පුෂ්පාරාම ඵලාරාමාදී ආරාමද, ආරාම වතුද, විහාරද, විහාරවතුද යන මේ ථාවරදෑද, ඇඳ පුටු කොමට්ට මෙට්ට ආදී සැතපෙන හිඳිනා දෑද, ලොහොසැලි ලොහො කටාරම්, මුහලොහො සැලි, ලොහො කලගෙ

---

a නිදාන, පාරාජිකා, සංඝාදිසෙස, අනියත, විත්ථාරුද්දෙස, යනමොහු පස්දෙන පාතිමොක්ඛුද්දෙශයෝයි.

b "**සංඝො ආදිම්හි චෙව සෙසෙසු ච ඉච්ඡිතබ්බො අස්සාති සංඝාදි සේසො**"යි නිර්වචන හෙයින්(සංඝාදි සෙස ඇවතට පැමිණි සීලවිපන්න ඒ භික්ෂුව විසින් පිරියයුතු)ආදියෙහි කියනලද පිරිවෙසෙහිද, සෙසයයි කියනලද මානත, අබ්භානකර්මයන්හිද, සංඝයා කැමතිවියයුතුවූයේ මේ ආපත්තියටනුයි සංඝාදි සෙසනම්වේ. ඒ දූෂිතසිල්ඇති භික්ෂුවගේ සුඬිය පිණිස කළයුතු වත, මානත, අබ්භාන යන කර්මනුණට සංඝයාම උවමනාබැවින් සංඝාදි සෙසනාමය දක්වනලද බව මෙහි භාවයි,

c ඥප්තිය සතරවෙනිකොට ඇති විනය කර්මයක්,

ඩි, කෙටේරි, මහවෑ, පොරෝ, හුදලු නියම් යන මේ දෑද, වේවැල් ආදි වැල්ද, හුණ බට ආදියද, ඉළුප්ආදි ගෝවල් සෙවිලිකරණ තණද, තල්කොල තලකොල ආදිකොලද, මුදු තණද, බබුස් තණද, මැටිද, ලීබඩු හා මැටිබඩුද යනමේ පස්රැසකින් a දක්වනලද පස්විසිවැදෑරුම්වූ සඟසතුකොටදෙනලදහෝ සඟසතු බිම උපන්නාවූහෝ භාණ්ඩයක් බෙදාගන්නා භික්ෂුහට සිදුවන තුලැසිඇවැත්ද, පරහටදෙන්නාවූභික්ෂුහටසිඬවන තුලැසිඇවැත්ද, මිනිමස් අනුභවකිරීමෙන් සිඬවන තුලැසිඇවතද, ලිඟවෙජදනයෙන්සිදුවනතුලැසිඇවතද, ජීරණගොතාකළ, නියදවැගිරෙන්කළ, පූවරු ගොතා කළ සිවුරුද, මිනිකෙස්වලින් හා අස්ලොම්වලින්කළ සිවුරුද, බකමූනු පිහාටු ගොතාකළ සිවුරුද, අඳුන් දිවිසම්ද, යනමෙකිසිවුරුඇඳීමෙන් හා පෙරවීමෙන් සිඬවන තුලැසි ඇවැත්ද, එකසීමාවතුළභෙද අදහසින් පෝයපවාරණාදියක්රීමෙන්සිඬවනතුලැසිඇවැතද b යනාදි ආපත්තිහු ථුල්ලච්චයාපත්තිස්කන්ධය නම්වේ.

4 පාචිත්තියා පත්තිස්කන්ධය කවරේද?—උපසපන්භික්ෂුහට අනුලොම් සහිතවූ ඛොම කොසෙයාදි c යම් කිසි සිවුරක් නො ඉටා නොවිකපා දශදවසකට වඩාකල් තබාගැනීමෙන්සිදුවන

---

a විහාර විහාර වත්‍ථු ප්‍රථම රැසයි. ආරාම ආරාම වත්‍ථු දෙවෙනි රැසයි. ඇඳ පුටු කොට්ට මෙට්ට තුන්වෙනි රැසයි, ලොහො සැලි—පෙ—නියම් සතරවෙනි රැසයි: වේවැල්—පෙ— ලී බඩුහා මැටි බඩු, පස්වෙනි රැසයි. එහෙයින් වදාළහ.

“ඉති පඤ්ච හි රාසීහි-පඤ්චනිම්මලලොචනො”
“පඤ්චවීසවිධං නාථො-ගරුභණ්ඩං පකාසයි”

b **ථූලො ච සො අච්චයො චෙති ථුල්ලච්චයො**”යි යනු නිර්වචන හෙයින් “මහත්වූයේත් ඒමය වරදවූයේත් ඒමනුයි. ථුල්ලච්චය නම්වේ.” භික්ෂුභාවය හරවා මතු ලජ්ජිධර්මයෙහි පිහිටවන නොහොත් සගමොක් දෙක ලැබීමට භව්‍යකරවන පාරාජිකාපත්තීහු ද, වත, මානත, අබ්භානයන ත්‍රිවිධ විනය කර්මයෙන් උට්ඨාන ශුද්ධියෙන් සුඬවන සඟ වෙසෙස්ද හැර, දෙශනාසුඬියෙන් හෙවත් ආපත්තිදෙසීම් විනයකර්මයෙන් සුඬවන ඇවැත් අතුරෙන් මහ වරද තුලසියයිදක්වනලද බව මෙහි භාවයි.

c ඛොමනම්, ක්ෂෞමවැහරින් කළවස්ත්‍ර, කෘමිකොෂ හූයින් කළ වස්ත්‍ර, කපුහුයින්කළවස්ත්‍ර, සනවැහරින්කළවස්ත්‍ර, ඛොමහුආදී

වස්ත්‍රව නිස්සර්ජනය කටයුතුවූ (**අතිරේක චීවරධාරණ**) නිස්සග්ගි පචිත්තියද—සංඝාටිආදි නාමයෙන් ඉටා ෲ පරිගරණය කරණලද තුන්සිවුරෙන් එකරැයකුදු වියෝව විසීමෙන්සිදුවන (**චීවරවිප්පවාස**) නිසග්ගි පචිතියද-කඨිණය නොඅතුළ කල ඉල්මාසයෙන් සෙසුමාසයන්හිද අතුළකල ඉල්, උඳුවප්, දුරුතු, නවම්, මැදින්දින යන පස්මාසයෙන්අනික් මාසයෙක්හිද උපන් බොමාදි සිවුරු වස්ත්‍රයක් පිළිගෙණ ප්‍රත්‍යයාසාව ඇතිවද මාසයකට වඩාකල් තබාගැණීමෙන් පැමිණෙන (**අකාලචීවරගහණ**) නිසග්ගි පචිතියද—නො නෑ භික්ෂුණියක්ලවා වරකුදු ප්‍රයෝජනගත් පරණ සිවුරක් සේදවීම් පඬුපෙවීම්ඇපිල්ලීම් කරවීමෙන්සිඬවන (**පොරාණධොවන**)නිසග්ගි පචිතියද-හුවමාරු කිරීමක් හැර අධිෂ්ඨානයට සෑහෙන වඩුරියනක් දිගඇතිවඩුවියනක් පළලඇති පශ්චිම සිවුරක්නමුදු නොනෑ භික්ෂුණියක් අතින් ගැණීමෙන්සිඬවන (**පාටිවට්ටක**) නිසග්ගි පචිතියද-සොරුන් විසින් සිවුරු පැහැරගත්කාලයෙ සිවුරු දැගියකාලය ආදි කාලහැර අන්කාලයෙක්හි නොනෑ නොපැවරුවෙකුගෙන්සිවුරුඉල්වීමෙන්සිඬවන(**චීවරවිඤ්ඤත්ති**) නිසග්ගි පචිතියද—එබඳු කාලයක නොනෑ නොපැවරුවන්ට සිවුරුඋවමනා බව ඇඟවූ පසු ඔවුන් විසින් උවමනා තරම් සිවුරු ගැණීම පිණිස බොහෝ සිවුරුදෙතු ලබන්නේ එයින් අදනය පොරෝනයට වඩා ගැණීමෙන් සිඬවන (**තදුත්තරිසාදියන**) න්සග්ගිපචිතියද-නොනෑ නොපැවරු ගෘහපතියෙකු විසින් තමන්ටදීමට සූදානම්කරණලද සිවුරෙහිසොඳුරු මාහැඟි බැව්

---

සියල්ල හෝ සමහරක් හෝ මිශ්‍රකොටකළ වස්ත්‍ර, සිංහව්‍යාඝ්‍රාදී වසලලොම් හැර සෙසු ලොම්වලින්කළ වස්ත්‍ර යන මේ සදෙන ජාතිවශයෙන් අනුදැන වදාළ කැප වස්ත්‍රයෝයි. ඒසියල්ලෙන් සිවුරුකොට මුල්පඬු කඳපඬු ආදී සවැදෑරුම් පඬුඅතුරෙන් යම් කිසිවකින් පඬු පොවා කබ්බින්දු ඔබාගත් කල්හි කැපසිවුරුවෙති—දුහුල්නම්, වෘක්ෂවැහරින්කළවස්ත්‍ර, පත්තුන්න දෙශයෙහි උපදනාවස්ත්‍ර, සෝමාරදෙශයෙන් උපදනා වස්ත්‍ර, චීනදෙශයෙහි උපදනා වස්ත්‍ර, පුණ්‍යර්ධියෙන් පහළවූ සිවුරු, දෙවියන් විසින් දෙනලද සිවුරුයන සවැදෑරුම්වූ සිවුරුවස්ත්‍ර සුදුසු පරිද්දෙන් යටකී සවැදෑරුන් වස්ත්‍රවලට අනුලොම්වෙති,

ෲ විනය පරිද්දෙන් තමන්ගේ බව සිතින් සලකා ගැණීමයි.

සලකා "මෙපමණ දිග පළල වේවා" යනාදි වශයෙන් අධිකවි ධානයට පැමිණ ඉක්බිති එය ලැබීමෙන් සිඬවන (අප්පවාරිත)නි සඟිපචිතියද-ගෘහපති ගිහිනීන් දෙදෙනෙකුන් විසින් එසේ සූද, නම්කාරණලද සිවුරෙහි අධික විධානයට පැමිණ එය ලැබීමෙන් සිඬවන (දුතියඅප්පවාරිත) නිසඟි පචිතියද-රජ ඇමති ආදී කෙ ණෙක් විසින් භික්ෂුවක්හට යවනලද සිවුරු මුදලින් භික්ෂුවගේ දූක්වීමෙන් මුදලලැබූ ආරාමිකාදි කෙණෙක් විසින් නිපදවනලද විවරය තුන්වාරයකින් මතු "ඇවැත්නි මට සිවුරෙන් ප්‍රයෝජන ය"සිසිනිකරවාහෝ, සවරකින්මතු දෙසා සිටහෝ ලබාගැණී මෙන් සිදුවන(රාජ) නිසඟි පචිතියද-එකම කෝසෙය්‍ය ක්‍රිමි හූය කින්ද මිශ්‍රකොට සිඳිමසැතපිම පිණිස ආස්තරණයක් කිරීමෙන් කරවීමෙන් සිඬවන (සන්ථත) නිසඟි පචිතියද-අන්‍ය වර්ණයෙන් අමිශ්‍ර කලු එළුලොම්වලින්ම එසේ ඇතිරිල්ලක් කිරීමෙන් කර වීමෙන්සිඬවන (සුඬසන්ථත) නිසඟිපචිතියද-හුදු කළු එළුලොම් දෙභාගයකට වඩා රැගෙණ සුදුඩද කිඹුල්වන්වූද, එළුලොම්දෙ භාගයක්නොගෙණ අන්‍යවර්ණ මිශ්‍ර කළු එළුලොම් ඇතිරියක් කිරී මෙන් කරවීමෙන් සිඬවන(නවසන්ථත) නිසඟි පචිතියද-ආස්ත රණයක් කළතැන් පටන් සාවුරුද්දකින් මෑත භාගයෙහි සංඝ සම්මුතියක් නැතිව අනික්ආස්තරණයක් කිරීමෙන් සිඬවන (අනු වස්සක සන්ථත) නිසඟි පචිතියද—වරකුඩු හිඳිමෙන් පරණවූ හිඳිනා ඇතිරියක්ඇති භික්ෂුවවිසින් එයින් සුගත් වියතක් පමණ රෙදිකඩක්ගෙණ නොඅල්වා අලුත් හිඳිනා ඇතිරියක් කිරීමෙන් සිඬවන(පුරාණසන්ථත)නිසඟිපචිතියද-ගෙණියෙත්තෙක් නැත් කල්හිද තුන් යොදුනෙකින්මත්තෙහි එළුලොම් ගෙණයාමෙන් සිඬවන (ලොමහරණ) නිසඟි පචිතියද-නොනෑ භික්ෂුණියක් ල වා එළුලොම් සේදවීමෙන් පඬුනැස්වීමෙන් අවුල්හැරවීමෙන් සිඬ වන (ධොවන) නිසඟි පචිතියද—රන් රිදී මසු කහවනු තමාසතු කොට ගැණීමෙන්ද අනුන්ලවා එසේම ගැන්වීමෙන්ද තමන් වෙනුවට තබණලද්ද ඉවසීමෙන්ද සිඬවන (රූපියපටිග්ගහණ) නිසඟි පචිතියද-නානාප්‍රකාරවූ රන් රිදී මසු කහවනු ගණුදෙනු වට පැමිණීමෙන් සිඬවන(රූපියසංවොහාරක) නිසඟි පචිතියද-වස්ත්‍රාදී කැපවස්තූන් සම්බන්ධවද "මෙය රැගෙණමෙය දෙව" යනාදි වශයෙන් නානාප්‍රකාරවූ හුවමාරුවට පැමිණීමෙන් සිඬ වන (කයවික්කය) නිසඟි පචිතියද-නොඉවූ නොවිකාපූ ඉටීමට

තරම්වූ * පාත්‍රයක් දශදවසකටවඩාකල් තබාගැණීමෙන් සිද්ධව
න (පත්තනිදහන) නිසගිපචිතියද—පිළියම්පසකින් අඩුපාත්‍රය
ඇතිකල්හි අනික් අළුත්පාත්‍රයක් ඉල්වාගැණීමෙන් සිද්ධවන
(ඌනපඤ්චබන්ධන) නිසගිපචිතියද-ගිතෙල්,වෙඬරු,තලතෙල්ආදී
තෙල්,මීපැනි,උක්සකුරු,යනාපඤ්චවිධභෛෂජ්‍යයන්පිළිගෙණසත්
දවසකට වැඩිකල් තබාගැණීමෙන් සිද්ධවන (භෙසජ්ජනිදහන)
නිසගිපචිතියද—ග්‍රීෂ්මසෘතුවෙහි අනතිම මාසයෙන් මෑතභාග
යෙහි වැසිසලුසිවුර සෙවීමෙන් අඩමසකින් මෑතභාගයෙහි අධි
ෂ්ඨානකොට හැඳගැන්මෙන් සිද්ධවන (වස්සිකසාටික) නිසගි
පචිතියද—උපසපන් භික්ෂුවක්හට සිවුරක්දී නැවත කිපුනුසිත්
ඇතිව නොසතුටුව සවසැඟුවෙන් එයකඩාගැණීමෙන් කඩවා
ගැන්වීමෙන් සිද්ධවන (අච්ඡින්දන) නිසගිපචිතියද—තමන්විසින්
ඉල්වාගන්නාලද අනුලොම්සහිත සවැදෑරුම් නූල්වලින් පෙහෙ
රන්ලවා සිවුරක් වියව්මෙන් සිද්ධවන (සුත්තවිඤ්ඤත්ති) නිසගි
පචිතියද—තමන්ට පිදීමපිණිස සිවුරුවියවන නොනෑ නොපැ
වරුවන්ගේ පෙහෙරන්කරා එලඹ "මෙයාකාරයෙන් දිගපුළුල
හා ගණකම් කරව් ඊට අපිත් යමක් කුළීවශයෙන් දෙන්නෙමු
යයි" යනාදී අධිකවිධානයෙන් නූල්වැඩිකොට කරවනලද
සිවුරලැබීමෙන් සිද්ධවන (තන්තවාය) නිසගිපචිතියද—පෙර
වස්වැස පවාරණයට දශදවසක් තිබියදී දෙනලද ඉක්මන් සිවුර
පිළිගෙණ නොසිටා නොවිකපා චීවරකාලය ඉක්මවීමෙන් සිද්ධ
වන (අච්චෙකචීවර) නිසගිපචිතියද-පෙරවස්වැස පවාරණය
කොට ඉල්මසතුල ඉටු තුන්සිවුරෙන් එකක් ඇතුළුගම තබා සැ
කසහිතභයසහිත අරණ්‍යසෙනාසනයෙහි වසන භික්ෂුහට සදව

---

* පාත්‍රයතෙමේ උත්කෘෂ්ටපාත්‍රය මධ්‍යමපාත්‍රය ඕමකපාත්‍රයයි ත්‍රි
විධවේ-එහි උත්කෘෂ්ට පාත්‍රයතෙම මගධනැළියෙන් දෙනැළි
යක් සහලෙන් පිසනලද බතද, එයින් සතරෙන් කොටසක්
ව්‍යඤ්ජනදගණී, මධ්‍යම පාත්‍රයතෙම එයින් අඩියක් ගණී, ඕමක
පාත්‍රයතෙම එයින් අඩියක් ගණී-එහි උත්කෘෂ්ට පාත්‍රයතෙම උ
ත්කෘෂ්ට උත්කෘෂ්ටපාත්‍රය උත්කෘෂ්ට මධ්‍යමපාත්‍රය උත්කෘෂ්ට ඕ
මකපාත්‍රයයි ත්‍රිවිධවේ, මධ්‍යමපාත්‍රයතෙමේ, මධ්‍යමඋත්කෘෂ්ට
පාත්‍රය මධ්‍යමමධ්‍යමපාත්‍රය මධ්‍යමඕමකපාත්‍රයයි ත්‍රිවිධවේ—ඕම
කපාත්‍රයතෙමේ ඕමකඋත්කෘෂ්ටපාත්‍රය ඕමකමධ්‍යමපාත්‍රය ඕම
කඕමකපාත්‍රයයි ත්‍රිවිධවේ, මෙකීනව වැදෑරුම්පාත්‍රයෙන් උත්
කෘෂ්ට උත්කෘෂ්ටපාත්‍රයද, ඕමක ඕමකපාත්‍රයද යන දෙකහැර
මධ්‍යයෙහි පාත්‍රසත අධිෂ්ඨානයට තරම්වේ, නොහොත්සෑහේ.

සකටවඩා ඒ අරණ්‍යසෙනාසනයෙන් නොහොත් සිවුරෙන් ඉවත්ව විසීමෙන් නොහොත් අරුණුනැගීමෙන් සිඛවන(**ඡාරත්ත විප්පවාස**) නිසග්ගිපචිතියද—සඝනට පිරිනම්නලද චීවරාදිලාභය දැන දැන තමන්ට පිරිනැම්මෙන් සිඛවන (**අත්තනපරිනාමන**) නිසග්ගිපචිතියද--යන මෙකී සමතිස් පචිතිආපත්තීහු නිස්සග්ගිය විනයකම්මසහිතහෙයින් නිසගි b පචිතිනම්වෙති.

4-2 උපසපන් භික්‍ෂුහට දැන දැන බොරුකීමෙන් සිඬවන (**මුසාවාද**) සුද්ධපචිතියද-හීනොත්කෘෂ්ට වශයෙන් දක්වනලද ජාති, නාම, ගොත්‍ර, කම්ම, ශිල්ප, ව්‍යාධි, සණ්ඨාන, කෙලශ, ආපත්ති, ආක්‍රොෂ, යන දශපදයෙන් යම්කිසිවකින් ගටාඋපසත් භික්‍ෂුවකට සම්මුඛයෙහි බිණීමෙන් සිඬවන (**ඕමසවාද**) සුද්ධපචිතියද-උපසම්පන්නයෙක් විසින් උපසම්පන්නයෙක්හට අසම්මුඛයෙහි කියනලද යථොක්ත දශපදයෙන් යමක් පිළිබඳ වචනයත් ගෙණගොස් භෙදකරවන අදහසින් එම භික්‍ෂුහට කීමෙන් සිඬවන (**පෙසුඤ්ඤහරණ**) සුද්ධපචිතියද-සාමණෙරාදි අනුපසම්පන්නයන්සමග බුද්ධභාෂිත, ශ්‍රාවකභාෂිත, දෙවභාෂිත ඍෂිභාෂිත, යන පිටකත්‍රයධම්මයන් කීමෙන් සිඬවන (**පදසොධම්ම**) සුද්ධ

b "**නිස්සග්ගෙනියුත්තා නිස්සග්ගියා**"යි නිර්වචනහෙයින් මේ ආපත්තිය "වස්තුනිස්සර්ජනයෙහි යෙදුනෙත්තුයි,, නිස්සග්ගියනම් වේ, මෙකී නිසගිඇවැත්වලට පැමිණි භික්‍ෂූන්ගේ තමතමන්ට අකැපවූ ඒඒ වස්තූන් ඇලයහැර සංඝගණ පුද්ගලයන්මදි, ඉක්බිති භික්‍ෂුවකගේ පාමුල ආපත්තිය දෙසීමෙන් රූපියපටිග්ගහණ රූපියසංවොහාර ඌනපඤ්චබන්ධන යන ආපත්තිතුනහැර සෙසුසියලු ඇවතින් නැගීමවෙයි-නිසගිවස්තුව සංඝයාටම නිස්සර්ජනයකොට සංඝසම්මුතියෙන් නියමකරණලද භික්‍ෂුවකගේ පාමුල ඇවැත්දෙසීමෙන් එකී ඉතිරි ඇවැත්තුණෙන් නැගීමවෙයි-"සෙසුනිසගි ඇවැත්වලින්මෙන්ම ඒ ඇවැත්තුණෙනුත් නැගීමවේ"යයි ඇතම්භවතුන්ගේ කල්පනායි--"**ලිඞ්ගසඞ්ඝගණකස්මිං චතුධාපත්තිවුට්ඨිති**"යි යනුවෙන් "ලිඟපරිවර්තනයෙන් සංඝයාකෙරෙන් ගණයාකෙරෙන් පුද්ගලයාකෙරෙන් යයි සතරාකාරයකින් ඇවතින් නැගීමවේ"යයි-දැක්වූහෙයින්ද-"**එකානිද්ධිසං පත්තං සඞ්ඝෙසඞ්ඝානි ලබ්භරෙ**"යි යනුවෙන් මේ "රූපියපටිග්ගහණ රූපියසංවොහාර ඇවැත්දෙකද ද්විතියපත්තයයි කියනලද ඌනපඤ්චබන්ධන ඇවතද යන තුණ සංඝයාකෙරෙන්මූ ඇවතෙන් නැගීමවේ"යයි දැක්වූහෙයින්ද ඒ භවතුන්ගේ කල්පනා මතිමාත්‍රයි. වනච්නිසටිකා බලනු.

පච්තියද—උපසපන්භික්‍ෂුවක්හැර අනිකෙක් සමග සියල්ලවස නලද සියල්ලවටකරණලද; සියල්ලවසනලද බොහෝමයක් වටකරණලද, සියල්ලවසනලද අඩියක්වටකරණලද, බොහො මයක් වසනලද සියල්ලවටකරණලද, බොහොමයක් වසනලද බොහොමයක් වටකරණලද, බොහොමයක් වසනලද අඩියක් වටකරණලද, අඩියක්වසනලද සියල්ලවටකරණලද, අඩියක් වසනලද බොහොමයක් වටකරණලද, අටවැදෑරුම්කුටියෙක්හි පිටපිටතුන්රැයක් හිරුඋදාවීමට ප්‍රථම යෙත්නගින රශ්මියවැටෙ නාතුරු සයනයකොට සතරවෙනිරැය එහි සයනයකිරීමෙන් හි රු අස්තගමයවූ තැන්පටන් උපසපන් අනුපසපන් දෙදෙනාගේ ප්‍රයොගපාසා සිද්ධවන(සහසෙය්‍ය) සුද්ධපච්තියද–එසේම එදවස උපන් මිනිස් මාගමක් නිමුත් එකී අටවැදෑරුම් කුටියෙහි හිරු අස්තඞ්මයට පසු සයන ඉරියව්ව පවත්වද්දී භික්‍ෂුවක් විසිනුත් ක්‍ෂණයකුදු එසේ පැවැත්වීමෙන් සිද්ධවන (මාතුගාමසහසෙය්‍ය) සුද්ධපච්තියද--සබ්භාසබ්භායනෙපුල් දන්නා මිනිස්පුරුෂයෙක් නැතිව මිනිස්මාගමකට වචනපසකින් සයකින්මතු යටකී පිට කනුයධම්මය දෙසීමෙන් සිද්ධවන(උත්තරිජප්පඤ්චවාචා)සුද්ධප ච්තියද—උපසපන් භික්‍ෂුවක්කෙරෙන් අනිකෙක්හට තමාකෙ රෙහි විද්‍යමාන ධ්‍යානාදි ප්‍රභෙදගත උතුරුමිනිස්දම් ප්‍රකාශකි රීමෙන් සිද්ධවන (භූතාරොචන) සුද්ධපච්තියද--එසේම උපස පනක්හුගේ සඟවෙසෙස් ඇවතක් ආපතනිවසතුදෙකගට සං ඝසම්මුතියක්නැතිව අනුපසම්පන්නයෙක්හට කීමෙන් සිද්ධව න(දුට්ඨුල්ලාරොචන)සුද්ධපච්තියද—උද්ධනපාත්‍රපචනාදියෙන් නොදනලද හුදුමැටි හුදුපස් පොළොව බොහෝමැටි බො හෝ පස් පොළොව වැසිවැස හාරමසක් ඉක්මුණුපස් රැස් මැටි රැස්ද, යනමෙකී ජාතපෘථිවිය යටත්පිරිසෙයින් පොළොව සම කරණ පිණිස කුරුමුසුන් ආදියකින්හෝ ගටමින් කැණීමෙන් කැණවීමෙන් සිද්ධවන (පඨවිඛණන) සුද්ධපච්තියද—උදකටඨ ථලටඨවසයෙන් දක්වනලද වැඩුනාවූද නිල්නතියට පැමිණ වැ ඩීගණයන්නාවූද භූතගාමසංඛ්‍යාත සියලු වෘක්‍ෂතෘණලතාදීන් ගේද-පැලවෙනගතිය ඇති සියලුම මුල්, පුරුක්, අතු, ගෙඩි, ඇ ට, යන පස් වැදෑරුම් බීජ ග්‍රාමයාගේද-මුල් හා නිල්පාට කොළ ද ඇතිවූකල්හි කැපීම්, කැඩීම්, බිඳීම්, පැලීම්, ඉයිලීම්, ආදියකිරී මෙන් සහ මෙය කපව, කඩව, පලව, බිඳුව්, උගුල්වව, යනාදි අකැපව්‍යවහාරයෙන් සිඳීම් ආදිය කරවීමෙන් සිඛවන (භූතගාම පාතව්‍යතා) සුද්ධපච්තියද—"ඇවැත්නි! තොපි, මෙනම් ඇවතට පැමිණියෙහිදැයි" චොදනාවශයෙන් අසනලදකල්හි දියයුතු පිළි

තුරුනොදී අනික්ඛන්තිමෙහිද, කිසිවක්නොකියා හිඳීමෙන් සංඝයාට වෙහෙස කිරීමෙහිද, සංඝයාවිසින් අඤ්ඤවාදක විහෙසක කම්මය කළකල්හි නැවතත් එසේකිරීමෙන් සිඳුවන (**අඤ්ඤවාදක විහෙසක**) a සුද්ධපචිතියද--තෙළෙස් සම්මුතින් අතුරෙන් b එකක් හෝ බොහොමයක් හෝ ලද්දාවූ භික්ෂුහට අවසක්කරණු කැමතිව උපසම්පන්න භික්ෂූන්ලවා ලාමකකොට සිතවීමෙන් හා උත්සම්පයෙහි "මෙතෙම ඡන්දාදියෙන් සෙනසුන් පණවත්තේය"යි යනාදියකීමෙන් සිඳුවන (**උජ්ඣාපනකඛියනක**) c සුද්ධපචිතියද-සඟසතු ඇඳපුටු ආදියක් තමා පිණිසහෝ අනුන්පිණිස හෝ අභ්‍යවකාශයෙහි පණවා නගානොහිබාහෝ නොතබ්බවාහෝ නොපිළිවිස හෝ යාමෙන් සිඳුවන (**අජ්ඣොකාසසන්ථරණක**)* සුද්ධපචිතියද—සඟසතු කොට්ටමෙට්ටආදී යම්සෙය්‍යාවක් සව්ප්‍රතිච්ඡන්න වෙහෙරෙක්හි තමා පිණිස හෝ අනුන්පිණිස හෝ අතුටහෝ අතුරවා හෝ බැහැර යනකල්හි නානානොතබා හෝ නගානොතබ්බවා හෝ නොපිළිවිසහෝ විහාරොපචාරය ඉක්මවා යාමෙන් සිඳුවන (**විහාරසන්ථරණක**) සුද්ධපචිතියද-සඟසතු වෙහෙර වාසයපිණිස පළමුකොට පැමිණි භික්ෂුහට ඒබව දැනදැන පීඩාවනසේ එහිවැද හිඳීම් සැතපීම්කිරීමෙන් සිඳුවන (**අනුපඛජ්ජනිසජ්ජ**) සුඬපචිතියද—සඟසතු වෙහෙරෙන් කිපුනුසිතින් උපසපන්භික්ෂුවක් නෙරපීමෙන්හෝ නෙරපවීමෙන් සිඬවන (**නික්කඩ්ඪණක**) සුඬපචිතියද--මධ්‍යමප්‍රමාණ පුරුෂයාගේ හිසනොවැදෙනතරම් අහසෙහිවූ සඟසතුකුටියෙක්හි හෙවත් උඩුමහලෙක්හි තලාදපිට තබනලද ආහච්චපාදයයි කියනලද පාවිදව්යල්ගසා ඇනතෙංගසනලද ඇඳපුටුවෙක්හි හදිස්සියෙන් හිඳීම් සැතපීම්කිරීමෙන් සිඬවන (**වෙහාසකුටි**) සුඬපචිතියද--තමන් පිණිසකරණලද මහල්ලක විහාරයෙහි දොරබාසහිත උළුවස්සෙහිද, දොරබාසහිත ජනෙල්කවුළුවෙහිද, නිශ්චලබව පිණිස උළුවස්සපටන් හාත්පස දොරබාවේ පළලපමණතැන ඉක්මවා මැටිආදියගැසීමෙන් හෝ ගෑමෙන්ද, ඡදනයෙහි දෙතුන්පරික්ෂෙපයකින් හෝ දෙතුන්පේළියකින් මත්තෙහි සෙවිලිකරවීමෙන්ද, සිඬ

---

a අඤ්ඤවාදකය, විහෙසකයයි පචිතිදෙකක්දවේ.

b භත්තුද්දෙසක, සෙනාසනගාහාපක, භණ්ඩාගාරික, චීවරපටිග්ගාහක, චීවරභාජක, යාගුභාජක, ඵලභාජක, ඛජ්ජභාජක, අප්පමත්තක විස්සජ්ජක, වස්සිකසාටියගාහාපක, පත්තගාහාපක, ආරාමිකපෙසක, සාමණේරපෙසක, යනමොහුයි.

උජ්ඣාපනකය, ඛීයනකයයි පචිතිදෙකක්දවේ.

වන (කුටිලෙපන) සුද්ධපචිතියද--දැනදැන ප්‍රාණීත්සහිත ජලය මැටිවලට හෝ තෘණාදියට හෝ වැක්කිරීමෙන්ද, වක්කරවීමෙන්ද, සිඛවන (**උදකසිඤ්චනක**) සුද්ධපචිතියද--භික්ෂුණොවාදක සම්මුතියක්නොලැබ අෂ්ටවාචික, උපසම්පදාව a ලත් භික්ෂුණියක්හට අෂ්ටගරුධම්මයෙන් b අවවාදකිරීමෙන් සිඛවන (**අසම්මතොවාදක**) සුද්ධපචිතියද-භික්ෂුණොවාදක සම්මතයිලැබද

---

a උපසම්පදාතොමෝ ඒහිභික්ඛුඋපසම්පදාය, සරණාගමන උපසම්පදාය, ඔවාදපටිග්ගහණ උපසම්පදාය, පඤ්හව්‍යාකරණ උපසම්පදාය, ගරුධම්මපටිග්ගහණ උපසම්පදාය, දූතෙන උපසම්පදාය, අට්ඨවාචික උපසම්පදාය, ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාය යි අටවැදෑරුම්වේ—එහි භික්ෂුණීසංඝයාගෙන් ලැබූඉක්බිති භික්ෂු සංඝයාගෙන් ලැබියයුතු භික්ෂුණී උපසම්පදා තොමෝ උභයසංඝයාවිසින් ඤත්තියදෙවරක් සහ අනුශ්‍රාවණය සවරක් අස්වනහෙයින් "**අට්ඨසුවාරෙසුවාචං අසසඅන්තීති**" යන නෙරුක්තිකනයින් "අට්ඨවාචක" නම්වේ—සෙස්සෙහි විස්තරග්‍රන්ථ බාහුල්‍යයිනිත් නොදක්වන්නෙමු—එහෙත් අට්ඨවාචික උපසම්පදාව භික්ෂුණීන්ගේ නැතිවීමෙන් නැතිවූබවද, ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව පන්දහසක් හුවිරුදු ශාසනයෙහි පවත්නාබැව් දසෙසුසියල්ල බුද්ධකාලයෙහිම නැවතුනුබවද දතයුතුයි.

b උපසම්පන්නවෙන් ශතවර්ෂයක් ඇති භික්ෂුණිවිසින් එදවස උපසම්පදාවූ භික්ෂුහට වැඳීම්ආදිය කළයුතුබවද; මසක්පාසා භික්ෂු සංඝයාගෙන් පොහෝදින විචාරීමට හා අෂ්ටගරුධම්මය ඇසීමට පැමිණීම බලාපොරොත්තුවිය යුතුබවද; වස්විසූභික්ෂුණීය විසින් උභයසංඝයා කෙරෙහි "වනත්ස දැකීමෙන් ඇසීමෙන් ගන්ධ, රස, ස්පර්ශයෙන්, සැකකිරීමෙන් (මාවරදකියනු පිණිස) සංඝයාපවරන්නෙමි, සඞ්ඝතෙමේ අනුකම්පාපිණිස මට කියනසේක්වා වරදදක්නාවූමම ඊට ප්‍රතිකර්ම කරන්නෙමි"යි පැවරිය යුතුබවද; සඟවෙඩුසස් ඇවතට පැමිණි මෙහෙණිය විසින් උභයසංඝයා කෙරෙහි පසළොස්දිනක් මානතපිරිය යුතුබවද; දෙයවිරුද්දක් මූළල්ලෙහි ප්‍රාණඝාත, අදත්තාදාන, අබ්‍රහ්මචරියා, මුසාවාද, සුරාපාන, විකාලභොජන, යන ෂඩ්විධධම්මයෙන් වෙන්වවිසූ ශික්ෂමානාව උභයසංඝයා කෙරෙහි උපසම්පදා කළ යුතුබවද; භික්ෂුණියක්විසින් කිසිආකාරයකින් භික්ෂුවක්හට ආක්‍රොශපරිභව නොකළයුතුබවද; භික්ෂුණීන්විසින් භික්ෂූන් කෙරෙහි චොදනානොකළයුතුබව සහ භික්ෂූන්විසින් භික්ෂුණීන් කෙරෙහි චොදනාකළ යුතුබවද; යන කරුණුඅට භික්ෂුණීන් විසින් දිවිහිමියෙන් නොයික්මවියයුතු හෙයින් අෂ්ටගරුධම්ම නම්වෙත්.

ෂූයභියා අසනඩහතවූවායින්පසු අෂ්ටගරුධම්මයෙන්හෝ අන්කිඤ
වක්න් අවවාදකිරීමෙන් සිඛවන (**අත්ථඞගත**) සූඩපචිතියද—මෙ
හෙණවරට ගෙවන් භික්‍ෂුණීන්වසනපන්ඥලට ගොස් නොගි
ලන්භික්‍ෂුණීන්ට එසේම අවවාදකිරීමෙන් සිඛවන(**උපස්සය**) සූ
ඩපචිතියද—යටකීසම්මතයලද භික්‍ෂූන්ට "භික්‍ෂූහු ආමිසයනිසා
භික්‍ෂුණීන්ටඅවවාදකරත්" යයිකීමෙන් සිඛවන (**ආමිසහෙතු**) සූ
ඩපචිතියද—හුවමාරුවක්හැර නොනෑභික්‍ෂුණීනියක්හට හැඳී
මට පෙරවීමටපොහොනා සිවුරක්දීමෙන් සිඛවන(**චීවරදාන**) සූඩ
පචිතියද—නොනෑභික්‍ෂුණියකගේ සිවුරුමැසීමෙන්හා මැස්වී
මෙන් සිඛවන (**සිබ්බන**) සූඩපචිතියද—කරතත කණ්ඩායමක්
සමග එක්වීයාඩුතු සැකසහිතභයසහිත මාර්ගයහැර සමග ගිවිස
ගෙණ එකදිගස්මාර්ගයකට යටත්පිරිසෙයින් තමත්හු ත්ගමින් අන්
ගමකටහෝ පැමිණීමෙන් සිඛවන(**සංවිධානගමන**)සූඩපචිතියද-
සරස එතරවීමක්හැර උඩුගංබලාහෝ යටගංබලායන නැව්පා
රුආදියකට භික්‍ෂුණියක්සමග එකටගිවිසගෙණ පැමිණීමෙන්
සිඛවන(**නාවාභිරූහණ**)සූඩපචිතියද—පළමුකොට ගෘහසථයන්
ගේ පටන් ගැන්මක්නැතිව භික්‍ෂුණියක්විසින්ම සම්පාදනයකර
ණලද පිණ්ඩපාතය අනුභවකිරීමෙන්සිඛවන(**භික්ඛුණීපරිපාචිත**)
සූඩපචිතියද—හුදකලාවූ භික්‍ෂුණියක්සමග හුදකලාව හිඳී
මෙන් සිඛවන (**රහොනිසීදන**) සූඩපචිතියද—සියල්ලටදෙන පි
ණ්ඩිස ආවාසමණ්ඩපාදියෙක්හි පණවනලදපිණ්ඩය නොගිලන්ව
එකදවසකට යැපෙනතරමටවඩා ගැණීමෙන් සිඛවන (**ආවස
ථපිණ්ඩ**)සූඩපචිතියද—ගිලානසමයාදි සත්වැදෑරුම්සමය a හැර
"ඔදනයගණුව, භොජනයගණුව, බතගණුව"යි යනාදිවශ
යෙන් නිමන්ත්‍රණයකරණලදුවහෝ විඥප්තියෙන්හෝ උ
පන් පඤ්චවිධ භෝජනය b යටත්පිරිසෙයින් සතරනමක්ව එක
ටගෙණ අනුභවකිරීමෙන් සිඛවන (**ගණභොජන**) සූඩපචිතිය
ද-බොහෝම්නිසූන්විසින් එකී පස්වැදෑරුම්භෝජනයෙන් ආරාධ
නාකරණලදින් ආරාධනාපිළිවෙළ ඉක්ම්වාගොස්හෝ සියල්
ලන්ගේ බත්එකටලදකල්හි ලදපිළිවෙළඉක්මවාහෝ අනුභව
කිරීමෙන් සිඛවන(**පරම්පරභොජන**) සූඩපචිතියද—පඩුරුපිණිස
හෝ මගවියදම් පිණිස හෝ සම්පාදනය කරණලද කැවුම්
අගලා ආදියෙන්, කුලයටපැමිණිභික්‍ෂුවට රුචිලෙසගැණීමට

---

a ගිලානකාලය, සිවුරුදෙනකාලය, සිවුරුකරණකාලය. දීර්ඝමාර්ගයෙහියනකාලය, නැව්නගින්නකාලය, බොහෝභික්‍ෂූන්ගමහැසිරෙණකාලය. ශ්‍රමණයෙක් විසින් බතින්ආරාධනාකළකාලය.

b බත්, අගලා, කොමුපිඩු, ගොඩමස්, දියමස්.

පත්කළකල්හි පිරුදෙතුන්පාත්‍රයකට වඩාගැන්මෙන් සිඩවන (**මන්තිපත්තපටිග්ගහණ**) සුඩපව්තියද—වළඳනකල්හි බෙදන පිණ්ස අත්පසට c හෙණනලද පඤ්ච භොජනයෙන් යමක් කයවචනයෙන් ප්‍රතික්‍ෂෙපකොට නැගිට නැවත අනතිරික්ත ඛාද්‍යභොජ්‍යාදිආමිසයක් අනුභවකිරීමෙන් සිඩවන(**පවාරණ**)සුඩ පව්තියද—ප්‍රතික්‍ෂෙප පවාරණයට d පැමිණිභික්‍ෂුවක්හට් දැන දැන "මහණිකවඅනුභවකරව"යි පැමිණෙව් අනතිරික්තභොජනය උත්වැලඳුකල්හි සිඳුවන (**අභිහට්ඨුපවාරණ**) සුඳුපව්තියද—හිරු අවරවූතැන්පටන් පසුවදාට එළිවෙනතුරු ඛාද්‍යභොජ්‍යාදියක් අනුභවකිරීමෙන් සිඳුවන (**විකාලභොජන**) සුඳුපව්තියද—තමන් පිළිගත් ඛාද්‍යභොජ්‍යාදියක් එකදවසකුදුතබා අනුභවකිරීමෙන් සිඳුවන(**සන්නිධිකාර**) සුඳුපව්තියද—නොගිලන්ව තමන්පිණිස ගිතෙල්, වෙඬරු, තලතෙල් ආදිතෙල්, මීපැනි උක්සකුරු, දියමස්, ගොඩමස්, කිරි. දිකිරි. යනමෙයින් මිශ්‍රකරණලද හැල්. වී, යව, තණ, අමු, තිරිඟු, ගොදමු, යනසප්තවිධ ධාන්‍යයෙන් කරණලද භොජනයක් වාග්විඥප්තියෙහි අගවා ලබාගෙණ අනුභවකිරීමෙන් සිඳුවන(**පනීතභොජනවිඤ්ඤත්ති**) සුඳුපව්තියද—සුඳුජලයහාදැහැටිදඬුහැර අන්කිසිඛාද්‍යාදියක් දැනුකාම, අභිහාර, හත්පාස, ඊරණකම්ම, තිධාදාන, විධාගාහ, යන පඤ්චගපටිග්ගහණයෙන් පිළිනොගෙණ පරගලගතකිරීමෙන් හෙවත්වැලඳීමෙන් සිඳුවන(**අපටිග්ගහණ**) සුඳුපව්තියද-අචෙලක පරිබ්‍රාජක පරිබ්‍රාජිකාදී යම්කිසිවෙකුට ඛාද්‍යභොජ්‍යාදියක්

---

c භිදිනාභික්‍ෂුහුගේ අසුත්කෙළවරපටන්, සිටින්නහුගේ විලුඹකෙළවරපටන්, සයනයකරන්නාහුගේ ඇලය පිටිපසපටන් දෙරියන්වියත් අභිමුඛය අත්පසනම්වේ.

d වළඳනකල් අත්පසට්බෙදනපිණිස ගෙණෙනලද පඤ්චභොජනයෙන් යමක් නොගෙණහැරිමයි.

e මෙහිපිළිගන්නාලද පිණ්ඩපාත ගිලානප්‍රත්‍යයත්ගේ යාවකාලිකය යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවිකයයි තබාවැලඳීම චතුර්විධවෙයි-පිටිමුල් ගෙඩිඛාද්‍යාදිය. පිළිගෙණ හිරඅවරවනතුරු ප්‍රයොජනයගතහැකිබැවින් ගේ යාවකාලිකයි—අට්ඨිලොම්සහිත අඹපැත් දඹපැත්ආදි අෂටවිධපානය පසුවදාටඑළිවෙනතුරු එසේම ප්‍රයෝජනගතහැකිහෙයින් ගේ. යාමකාලිකයි—ගිතෙල් වෙඬරු ආදිය .සත්දවසක්තබා පරිභොගකලහැකිහෙයින් ගේ, සත්තාහකාලිකයි—කහ, ඉඟුරු, ලූණු, ලූනු, මිරිස්, වදකසා, ආදිබෙහෙත්වගී පිළිගෙණ ජිවිතාන්තයදක්වා පරිභොගකළහැකිහෙයින් ගේ. යාවජීවිකාකාලිකයි.

සියනින්දිමෙන් සිඳුවන(**අචෙලකාදන**)සුද්ධපච්තියද—“ඇවැත්
නිඑව ගමටහෝ නියම්ගමටහෝ පිඩුපිණිසයන්නෙමු”යි ගිවිස
ගෙණ මාගමක්සමග හසනාදියක්කරණුසල්ලා ඒ භික්‍ෂුහට කි
සියම්ආමිසයක්දීහෝ නොදීහෝ පිටත්කරඇරීමෙන් සිඳුවන
(**උය්‍යොජන**)සුද්ධපච්තියද—මෛථුන්ධම්රාගයෙන්රත්වූ ස්ත්‍රීපුරු
ෂයන්දෙදෙනසහිත සයනීඝරයෙහි හෙවත් සැතපෙනකාමර
යෙහි දොරබාදෙරියන්වියත්අත්පස ඉක්මවා ඉඳීමෙන් සිඳුවන
(**සභොජනකුල**) සුද්ධපච්තියද—මාගමක්සහිතව දැරුකුඩ්ඩාදී
පවුරකින් පිරිසන්තැන හිඳිමෙන් සිඳුවන(**රහොනිසජ්ජ**)සුද්ධපච්
තියද-හුදකලාව හුදකලාමාගමක්සමග නොපිරිසන්තැන නමුදු
පියවිතෙපුල් නොඇසෙනතරම්තැන හිඳිමෙන් සිඳුවන (**දුතිය
රහොනිසජ්ජ**) සුද්ධපච්තියද—පඤ්චවිධභොජනය අතුරෙන් යම්
කිසිවකින් ආරාධනාකරණලදුව කුලයන්හි හැසිරීමට සිතඋපන්
කල්හි දොළොස්රියන්අත්පස ඇතිභික්‍ෂුව“මෙනම් ඇත්තාගේ
කුලයටයන්නෙමි”යි කියාහෝ “චාරිත්තංආපුච්ඡාමි” කියාහෝ
නොපිළිවිස ආරාධනාලද බතවලඳාහෝ නොවලඳාහෝ ආරාධ
නාලද කුලයෙන් අන්කුලයන්හි සිවුරුදෙන සිවුරුකරණකාලය
හැර අන්කාලයෙක්හි මධ්‍යහ්නකාලය නොඉක්මවා හැසිරීමටපැ
මිණීමෙන්සිඳුවන(**චාරිත්ත**)සුද්ධපච්තියද-“වහන්ස මෙපමණ
කාලක් මුලුල්ලෙහි මෙනම්මෙනම් බෙහෙතින් උවටැනාකල්හි
මෙපමණින් මට දැනුම්දුනමැනවැ”යි කිසිවෙක්විසින් ප්‍රත්‍යයප
වාරණයෙන් පවරණලදුව නැවතපැවරීමක්නැතිව නිත්‍යපැවරී
මක්හෝනැතිව ඒකාලයහෝ බෙහෙත්හෝ බෙහෙත්ප්‍රමාණය
හෝ ඉක්මවා විනාවීමෙන් සිඳුවන (**භෙසජ්ජවිඤ්ඤාපන**) සුද්ධප
ච්තියද—යාමටසුදුසු කරුණක්නැතිව යුද්ධයපිණිසනික්මුනු හ
ස්ත්‍යනිකාදී සෙනාවදක්නාපිණිස යාමෙන් සිඳුවන(**උය්‍යුත්තද
ස්සන**)සුද්ධපච්තියද-සෙනාවකරායාමට සුදුසුකරුණක් ඇතිකල්
හිද ගොස් එහි දෙතුන්රැයකටවඩා විසීමෙන් සිඳුවන (**සෙනා
වාස**)සුද්ධපච්තියද—දෙතුන්රැයක්එහි වසමින් යුද්ධකරණතැන
හෝ සෙනාගණන් කරණතැනහෝ සෙනාව්‍යූහයක්හෝ සෙ
නානීකයක්හෝ ක දක්නාපිණිසයාමෙන් සිඳුවන (**උය්‍යොධික**)

---

ක පුරුෂයන් දොළොස්දෙනෙක් සහිතවූ ඒකඇතෙකු හත්ථි
ව්‍යූහනම්වේ-පුරුෂයන්තුන්දෙනෙක් සහිතවූ එකඅශ්වයෙකු හ
යව්‍යූහනම්වේ-පුරුෂයන් සතරදෙනෙක් සහිතවූ ඒකරථය රථ
ව්‍යූහනම්වේ-(මෙසිව්‍යිවිධව්‍යූහයම සෙනාව්‍යූහනම්වේ) මේ ල
ක්‍ෂණයෙන් යටත්පිරිසෙයින් ඇතුන්තුන්දෙනෙකු අසුන්තුන්දෙ

ෂුද්ධපච්තියද—රහමෙරපානය කිරීමෙන් සිද්ධවන (**සුරාපාන**) සුද්ධපච්තියද—ක්‍රීඩාභිප්‍රායයෙන් උපසපන්භික්‍ෂුවකගේ කායස්පර්ශයකිරීමෙන් හෙවත් කිතිකැවීමෙන් සිද්ධවන(**අඞ්ගුලිපතොදක**) සුද්ධපච්තියද—කෙළනා අදහසින් යටත්පිරිසෙයින් ගොප්ඇටය ගැලෙනාතරම් ජලයටබැසීමේපටන් සියලුප්‍රයොගයන්හි සිද්ධවන (**උදකහස්සධම්ම**) සුද්ධපච්තියද—උපසපන්භික්‍ෂුවක් විසින් ප්‍රඥප්තිශික්‍ෂාපදයෙන් අවවාදකරණකල්හි ඔහටහෝ සිකපදයටහෝ අගෞරවකිරීමෙන් සිද්ධවන(**අනාදර**)සුද්ධපච්තියද—භයඋපදවනුකැමතිව උපසපන්භික්‍ෂුවක් සමීපයෙහි භයානකරූපතැබීමෙන් භයානකශබ්ද්‍සඳ්‍ක්වීමෙන් එබඳුකථාඇස්වීමෙන් සිද්ධවන (**භිංසාපනක**) සුද්ධපච්තියද—පාත්‍රපිසීම් පහන්දැල්වීම්ආදී කෘත්‍යයක්නැතිව හුදේක් තපින්නුකැමැත්තෙන් නොගිලන්වගිනිදැල්වීමෙන් මෙරමාලවාදැල්ලවීමෙන් සිද්ධවන (**ජොතිසමාදහන**)සුද්ධපච්තියද—නැහැමටනියමකල්හැර අඩමසකින්මෑතභාගයෙහි ස්නානයකිරීමෙන් මධ්‍යමණ්ඩලවැසිභික්‍ෂුන්ට පැමිණෙන (**නහාන**) සුද්ධපච්තියද—ඇඳීමටපෙරවීමට ප්‍රහෝනා අලුත්සිවුරක් හෙවත් පරිභොගනොකළසිවුරක් නීලාදිවර්ණයකින් මකුණුපිටපමණහෝ මොණරඇසතරම්හෝ කප්බිඳුනොතබා පරිභොගකිරීමෙන් සිද්ධවන (**දුබ්බණ්ණකරණ**) සුද්ධපච්තියද—උපසම්පන්නභ්‍ය සමීපයෙහි භික්‍ෂුවක්හටහෝ භික්‍ෂුණියක්හටහෝ ශික්‍ෂමානාවක්හටහෝ හෙරණක්හටහෝ හෙරණියක්හටහෝ විකල්පනයකරණලද ඍ අතිරෙක චීවරය නොපසුදුරා ඏ පරිභොගකිරීමෙන් සිද්ධවන(**විකප්පන**) සුද්ධපච්තියද—උපසප

---

නෙකු රථතුණක් නොහොත් පුරුෂයන් තිස්හතරදෙනෙක් සහිත ඇතුන්තුන්දෙනෙකු පුරුෂයන්නවදෙනෙක්සහිත අසුන්තුන්දෙනෙකු පුරුෂයන් දොළොස්දෙනෙක්සහිත රථතුනක් පිළිවෙලින් හත්ථානීක අස්සානීක රථානීක නම්වේ—කඩුගත්පුරුෂයන්සතරදෙනෙකු පත්තානීක හෙවත් සෙනානීකනම්වේ.

ඍ ඒ අතිරෙක චීවරාදිය රැගෙණ තමන් සාදෘෂ්ටසම්භක්ත ව්‍යක්ත භික්‍ෂුවකගේ අත්පසට පැමිණ උත්කුටුකයෙන්හිඳ "ඉමං චීවරං තුය්හං විකප්පෙමි"යි තුන්යලක් කියාදීමයි—එය සම්මුඛ අසම්මුඛ පරම්මුඛ විකප්පනයයි ත්‍රිවිධවේ—එහි ප්‍රයොජනය විතය නෙච්වරික භික්‍ෂුහට තුන්සිවුරෙන් යම්කිසිවකින් පඩුගැසීමාදි කරුණක් අතිකල්හි වෙන්ව සිටීමටහා සූත්‍රනෙච්වරිකයාහටද පඩුනොපොවනලද සිවුරු වස්ත්‍ර ප්‍රවේසන් කරගැණීමටත් අවකාශදීමයි.

ඏ එම විකල්පනයලද භික්‍ෂුව විසින් ඒ චීවරාදියවිකප්පූ භික්‍ෂුහට පරිභොගාදිය කිරීමට විනයනසීන් අවසරදීම පසුදීරීමනම්වේ.

භික්ෂු සන්තක පාත්‍රයක්හෝ සිවුරක්හෝ නිසීදනයක්හෝ ඉඳි
කටුකුළාවක්හෝ පටියක්හෝ යටත්පිරිසෙයින් සිනාසෙන අද
හසින්වත් සඟවාතැබීමෙන් මෙරමාලවාඤ්ගවා තැබවීමෙන් සි
ද්ධවන(**අපනිධාන**)සුද්ධපචිතියද—පරජිතුලසිඇවැත්වලට වස්තු
වූ මනුෂ්‍යදෙවතාදීන්හැර කුඩාවූහෝ මහත්වූහෝ සතෙකු දැ
නදැන දිවිනැලවීමෙන් සිද්ධවන (**පාණජීවිතාවොරොපන**) සුද්ධ
පචිතියද-දැනදැන නොපෙරුජලය පානයකිරීමෙන්සිඩවන(**සප්**
**පාණක**)සුද්ධපචිතියද-දහම්වූපරිද්දෙන් ව්‍යපශමනය කරණලද
කෘත්‍යාධිකරණය “නැවතජ්නිශ්චය කටයුතුය”යි දැනදැන උක්
කොටනය කිරීමෙන් හෙවත් විනිශ්චයටගැණීමෙන් සිද්ධවන
(**උක්කොටනක**) සුද්ධපචිතියද—දැනදැන උපසපන්භික්ෂුවක්හු
ගේ දුළුල් ඇවතක් “අනිකෙකුට නොකියව”යි වැසීමෙන් සිද්ධ
වන(**දුට්ඨුල්ලපටිච්ඡාදන**)සුද්ධපචිතියද—උනුවිසිවයස්ඇති පුඟු
ලෙක් දැනදැන උපසම්පදාකිරීමෙන් උපාධ්‍යායභික්ෂුහට සිද්ධවන
(**ඌනවීසති**)සුද්ධපචිතියද—දැනදැනසොරගැල්කාණ්ඩයක්සමග
ගිවිසගෙණ එකදිඝිමාගීයට පිළිපැදීමෙන් සිද්ධවන (**ථෙය්‍යසත්**
**ථ**) සුද්ධපචිතියද—මිනිස්මාගමක්සමග ගිවිසගෙණ එකදිඝිමාගී
යට පිළිපැදීමෙන්සිද්ධවන(**සංවිධානගමන**)සුද්ධපචිතියද—“භාග්‍ය
වතුන් විසින් ස්වගීමොක්ෂාවරණයයි වදාරණලද අනතරායකර
ධම්මයන් සෙවනයකරන්නාහට අනතරායපිණිස නොපවත්
නාබැව් හෙවත් ඒ බුද්ධවචනය වරදබැව් මමදනිමියි” යම්භික්ෂු
වක් කියාද, එය ඇසූ දුටු සෙසුභික්ෂූන් විසින් දෘෂ්ටිව්පතනා එමභි
ක්ෂුහට “ඇවැත්නි එසේනොකියව” යනාදිවශයෙන් තුන්යලක්
අවවාදකළ යුතුයි, එසේද කියතුලබන්නේ දෘෂ්ටියනොහරිනම්
සෙසුභික්ෂූන්විසින් එයහරවනුපිණිස දෘෂ්ටියනොහැරීමෙහි උත්
ක්ෂෙප කම්මයකළයුතුයි, එසේකරණුලබන්නාහට දෘෂ්ටිය නො
හැරීමෙන් කම්මවාක්‍යාවසානයෙහි සිද්ධවන (**දිවසිඅප්පටිනිස්ස**
**ජ්ජන**)සුද්ධපචිතියද—නොකරණලද ඔසාරණ කම්මයඇති නො
හොත් නැවත සංඝයාවිසින් ඇතුලත්කරණීනාගත් එසේ කියන
සුළු දෘෂ්ටිව්පතනා භික්ෂුවක් සමග පොහෝපවුරුණු ආදි විනයක
ම්මකිරීමෙන්ආමිසසම්භොගකිරීමෙන් එකාජදනය හෙවත් සෙවි
නියතුලශයනයකිරීමෙන්සිඩවන(**උක්ඛිත්තානුවත්තක**)සුඩපච්
තියද-සබ්බනාසනාවෙන් නාසනලද හෙරණක්හටධම්මාමිෂයෙන්
උපකාරකිරීමෙන් තමන්ට උපස්ථානකරවාගැණීමෙන් සමඟ ස
ම්භොගකිරීමෙන් සමග එකසෙව්නියතුල විසීමෙන්සිඩවන(**උප**
**ලාලන**)සුඩපචිතියද—භික්ෂූන්විසින් ප්‍රඥප්තිශික්ෂාපදයෙන් “ඇව
ත මෙසේනොකරව මෙය අකැපයයි” කියතුලබන්නේ “යම්
පමණ කාලයකින් මම දක්ෂබහුශ්‍රැත විනයධරයන්අතින් පිළි

විසිත්නෙම්ද ඒතාක්මෙහි නොනික්මෙත්නෙම්''යි සිමෙන්
සිඩවන (**සහධම්ම**) සුඩපචිතියද—පාමොක් දෙසනුලබනකල්හි
''මේක්ෂුද්‍ර ක්‍ෂුද්‍රශික්ෂාපදයන් උදෙසීමෙන් කවර ප්‍රයෝජන
ද? ඒකාන්තයෙන් කුකුස්ආදියපිණිස පත්වනාහුය''යි .මෙසේ
ශික්ෂාපදයන්ට නිනදාබැණීමෙන් සිඩවන(**සික්ඛාපදවිවණ්ණක**)
සුඩපචිතියද—යම් භික්ෂුවක්තෙම අඩමසක්පාසා පාමොක් උදෙ
සනු ලබනකල්හි ''ඇවැත්නි මේධම්මයත් විනයෙහිආයේ වින
යවබැසගෙණසිටියේ අඩමසක්පාසා උදෙසීමටඒයයි මමදැන්ම
දැනගනිමි නොහොත් මේකාරණයි විනයට ඇතුළත් ශික්ෂාපද
යක්බව මින්ඉහත නොදැන සිටියෙමි''යි කියන්නේද, ඒභික්ෂුහට
නිනදාකොට දහම්වූපරිද්දෙන් සිදුවූඇවතින් නැගිසිටවීම කළ
යුතුයි-මත්තෙහිද නුවුළාව පිණිස මොහාරොපනකම්මය කළ
යුතුයි එසේකළ ඉක්බිති මුළාවීමෙන් සිඩවන (**මොහනක**)
සුඩපචිතියද—උපසපන් භික්ෂුවක්හට කිපුනුසිතින් පහරදීමෙන්
සිඩවන (**පහාරදන**) සුඩපචිතියද—උපසපන් භික්ෂුවක්හට එසේ
පහාරදෙන ආකාරදැක්වීමෙන් සිඩවන (**තලසත්තික**) සුඩපචිති
යද—භික්ෂුවක්හට දශිනාදිමුල්රගිත සගවෙශෙස් ඇවතකින්
චොදනාකිරීමෙන් සිඩවන (**අමූලක**) සුඩපචිතියද—අපහසුවක්
කරණුකැමැත්තෙන් භික්ෂුවක්හට ''තෝනොපිරුණු විසිවයස්
ඇත්තෙකැයි යනාදින් දැනදැන කුකුස් ඉපදවීමෙන් සිඩවන(**කුක්
කුච්චුප්පාදන**)සුඩපචිතියද-හටගත් ඩබරකෝලාහලවිවාදඇති
භික්ෂූන්ගේ ''රහස්බස් අසන්නෙමි''යි වචන ඇසෙනතැන සිටී
මෙන් සිඩවන (**උපස්සුති**) සුඩපචිතියද—දහම්වූපරිද්දෙන් කර
ණලද අපලොකනාදි චතුර්විධකම්මයන්ට ඡන්දයදි පසුව අරුචිය
ප්‍රකාශකිරීමෙන් සිඩවන (**කම්මපටිබාහන**) සුඩපචිතියද—සංඝ
යාකෙරෙහි විනිශ්චයකථාවක් පවත්නාකල්හි ඡන්දයනොදී නැ
ගිටයාමෙන් සිඩවන (**ඡන්දඅදන**) සුඩපචිතියද-සමගිසංඝයා කැ
ප්ව සිවුරක්දී පසුව ''භික්ෂූනුමිත්‍රභාවයෙන් සංඝලාභයබෙදත්''
යයි අරුචිය පහළකිරීමෙන් සිඩවන (**ඛීයනක**) සුඩපචිතියද-සඝ
නාටපිරිනමණලද චිවරාදිලාභය දැනදැන පුද්ගලයෙකුට පිරිනැ
මීමෙන් සිඩවන (**ලාභපරිණාම**) සුඩපචිතියද-අභිෂෙකලද ක්ෂ
ත්‍රියරජක්හුගේ පහවනොගිය රජඇති පහවනොගිය රාජදේවී
ඇති අන්තඃපුරයෙහි ප්‍රථමයෙන් නොදන්වා, ඉන්ද්‍රඛීලය ඉක්මවා
යාමෙන්. සිඩවන (**අන්තෙපුරප්පවෙසන**) සුඩපචිතියද—ගිහි
යන්ට මුළාවනොස්නිබූනු රත්නයක්හෝ රත්නයයි සම්මතලද
දෙයක්හෝ ආරාමයෙන් ආවාසයෙන් පිටතදී ප්‍රවෙසම්කොට
තබන පිණිස ගන්නාවූද ගන්වන්නාවූද ආරාමආවාසදෙක්හිත
මූත් ''මෙය ප්‍රවෙශම්කොට දෙව''යි දෙනලද යටත්පිරිසෙයින්

මවිකණපලඳන තාලපත්‍රාදියක්හෝ ප්‍රවේශම්කොට තැබීමෙන් සිද්ධවන (**සපිසාමන**) සුද්ධපාචිත්තියද—ප්‍රකෘතිකථාව ඇසෙනතරම් දුරසිටිභික්‍ෂුව විකල්හි ගම්වැදීනබව නොවිචාරා ඉක්මන්කටයුත්තක්නැතිව විකාලයෙහි ගම්වැදීමෙන් සිද්ධවන (**විකාලගාමප්පවෙසන**) සුද්ධපාචිත්තියද—ඇට, දත්, අං, යනමෙයින් හිදිගෙයක් හෙවත් ඉදිකටුකුළාවක් කරවීමෙන් සිඩවන බිඳදමාවිනා අන්හැවියකින් දෙසාසුඩවිය නොහැකි(**සූචිඝර**) සුද්ධපාචිත්තියද—විටම (වියල)පටන් සුගත්අඟුලෙන්අටඟුලකටවඩා උසරැගෙණ ඇඳක් හෝ පුටුවක්හෝ කරවීමෙන් සිද්ධවන කපාදමාවිනා අන්හැවියකින් දෙසා සුඩවියනොහැකි(**මඤ්චකාරාපන**)සුද්ධ පාචිත්තියද—පුළුන්පුරවා ඇඳක්හෝ පුටුවක්හෝකරවීමෙන්සිද්ධවන බිඳ පුළුන් ඇද දමාවිනා අන්හැවියකින් දෙසාසුඩවිය නොහැකි(**තූලොනද්ධමඤ්ච**)සුඩපාචිත්තියද—දිගින්සුගත්වියතින්දෙවියතකටදපළලින් එක්වියත්හමාරකටද දාවල්ලවවියතකටදවඩා රැගෙණ හිඳිනාසිවුරක්කිරීමෙන්සිඩවන වැඩිහරියකපාදමාවිනා අන්පරිද්දකින් දෙසාසුඩවියනොහැකි (**නිසීදනකාරාපන**) සුඩපාචිත්තියද—දිගින් සුගත්වියතින් සතරවියතකටද පළලින් දෙවියතකටදවඩා රැගෙණ කස්පිළිසන් සිවුරක්(හෙවත් වණවැස්මක්)කිරීමෙන් සිඩවන යටකීවිධියෙන්විනා දෙසා සුඩවියනොහැකි(**කණ්ඩුපටිච්ඡාදන**) සුඩපාචිත්තියද—දිගින්සුගත්වියතින් සවියතකටද පළලින්දෙවියත් හමාරකටද වඩාරැගෙණ වැසිසළු සිවුරක්කරවීමෙන්සිඩවන යටකීවිධියෙන්විනා දෙසා සුඩවියනොහැකි(**වස්සිකසාටික**)සුඩපාචිත්තියද-බුදුන්ගේ [c] වියතින් දිගින් නවවියතක්ද උසින්සවියතක්ද ඇති සුගත්සිවුරතරම් හෝ ඊටවඩා හෝ සිවුරක්කරවීමෙන් සිඩවන යටකීවිධියහැර දෙසාසුඩවියනොහැකි(**සුගතචීවර**)සුඩපාචිත්තියද-යනමොහු දෙඅනූදෙනා [a] පාචිත්තියාපත්තිස්කන්ධනම්වේ:-

5—පාටිදෙසනීයාපත්තිස්කන්ධය කවරේද?:—ඈතුළුගමට ප්‍රවිෂ්ටවූ නොනෑභික්‍ෂුණියකගේ අතින් ඛාද්‍යභොජ්‍යයක් සියතින් පිළිගෙණ වැළඳීමෙන් සිදුවන (**අඤ්ඤාතිකාපටිග්ගහණ**) පිළිදෙස්නී ඇවතද—කුලයන්හි බතින්පවරණලදුව වළඳමින් සිටි කල්හි "මෙහිව්‍යඤ්ජනබෙදව මෙහිබත්බෙදවයි" විධානකරමින් සිටි භික්‍ෂුණියට "නැගනියෙනි යම්තාක් භික්‍ෂූනුවළඳද්දත් තාක් ඉවත්වෙවයි" නොකියා වළඳන භික්‍ෂුගණයාහට එකිනෙකා කෙරෙහි පැමිණෙන (**වොසාසමාන**) පිළිදෙස්නී ඇවතද—ගෘහොපචාරයට ඇතුල්වීමට ප්‍රථමයෙන් ආරාධනා නොකර

[a] "පාතෙතීකුසලං චිත්තන්තිපාචිත්තියං" යනු නිර්වචනයෙසින් "කුසලචිත්තය හෙළානුයි" පාචිත්තියනම්වේ.

[c] මධ්‍යම පුරුෂයාගේ තුන්වියතයි.

ණීලද නොහිලත් භික්ෂුහට ශෛක්‍ෂසම්මතය[a] ලද කුලයෙහි ඛාද්‍යභොජ්‍යයක් සියතින් පිළිගෙණ අනුභවකිරීමෙන් සිදුවන (**සෙඛසම්මත**) පිළිදෙස්නී ඇවතද—අනතරාය උපද්‍රවසහිත අරණ්‍යශයනාසනයෙක්හි වසනනොගිලන් භික්ෂුහට ආරාමයටහෝ ආරාමළපචාරයට හෝ පැමිණ යමෙක් විසින් "වහන්සමෙනම් ඛාද්‍යභොජ්‍යයක් ගෙණදෙන්නෙමියි" නොදන්වනලද් ඛාද්‍යභොජ්‍යයක් ආරාමයතුළදී සවහස්තයෙන් පිළිගෙණ වැළඳීමෙන් සිදුවන (**ආරඤ්ඤක**) පිළිදෙස්නී ඈවතද—යනමොහු සතරදෙන පාටිදෙසනීයාපත්තිස්කන්ධ නම්වේ:—[c]

6-දුෂ්කෘතාපත්තිස්කන්ධය කවරේද?:-1-උපසපත්භික්ෂූහට නැබවඩල දෙදණමඩළුයන, තෙමඩුලුවසා පිරිමඩුලුනොකොට හදනායහැඳීමෙන් පිරිමඩුලුනොකොට පොරෝනය පෙරවීමෙන් සිදුවන(**අපරිමණ්ඩලනිවාසන-පාරුපන**)දුෂ්කෘතවයද—ගණ්ඨිය පාසයෙහිනොලා නුවාකෙළවරින්ග්‍රියවනොවසාදෙකොණ සම කොට හකුළා මැණික්කට්ටුවදක්වා නොවසාඇතුළුගමයාමෙන් හා දෙඅත්ල, දෙපතුල,හිස, යනපස්තැනහැර සෙසුසියලුකය නොවසා ඇතුළුගම හිඳීමෙන් සිදුවන (**සුපටිච්ඡන්නඅගමණ- අනිසීදන**)දුෂ්කෘතවයද—අතපය ලකළුවමින් (වනමින්) අසංවරිකව ඇතුළුගමයාමෙන්හා එසේහිඳීමෙන් සිදුවන(**සුසංවුතඅගමන-අනිසීදන**)දුෂ්කෘතවයද—යටහෙලනලද ඇස්නැතිව වියදඬුපමණ දුරඉක්මවා බලමින් ඇතුළුගමයාමෙන්හා එලෙසහිඳීමෙන් සිදුවන(**ඔක්ඛිත්තචක්ඛුඅගමන-අනිසීදන**) දූෂ්කෘතවයද—එක අංශයකින්හෝ අංශදෙකින්හෝ ඔසවනලද සිවුරුඇතිවඇතුළුගමයාමෙන් හා හිඳීමෙන් සිදුවන(**උක්ඛිත්තකායගමන-නිසීදන**)දුෂ්කෘතවයද—තොලවිවෘතකොට මහසිනාවෙන් සිනාසෙමින් ඇතුළුගමයාමෙන්හා හිඳීමෙන්වන(**උජ්ජග්ඝිකායගමන-නිසීදන**)දුෂ්කෘතවයද—උස්මහත් ශබ්දකොට ඇතුළුගම යාමෙන්හා හිඳීමෙන්වන(**මහාසද්දගමණ-නිසීදන**)දුෂ්කෘතවයද—කයසලසලා,අත සලසලා,හිසසොලව සොලවා,ඇතුළුගමයාමෙන්හා හිඳීමෙන්වන (**කාය-බාහු-සීසප්පචාලක ගමණ-නිසීදන**) දුෂ්කෘතෂට්කයද—උකුලෙහිඅතතබාඇතුළුගමයාමෙන්හා හිඳීමෙන්වන(**ඛම්භකතගමණ-නිසීදන**) දුෂ්කෘතවයද—හිසවසා පෙරව ඇතුළුගමයාමෙන්

---

[a] ශ්‍රද්ධාවෙන් වැඩෙන වස්තුවෙන් පිරිහෙන කුලයෙන් ඔවුන්ගේ ආරාධනාවක් නැතිව පිණ්ඩපාතාදිය නොගන්න හැටියට සංඝයාඅතර විනයපරිද්දෙන් තබාගන්නාලද සම්මතයකි.

[c] "පටිදෙසෙතබ්බං පාටිදෙසනීයං,,යි නිර්වචන හෙයින් නැවත දෙසියයුතු ඇවත(රැළුහිවශයෙන්හෝ)පාටිදෙසනීයනම්වේ.

හා හිඳීමෙන් සිදුවන(**ඔගුණ්ඨිතගමණ-නිසීදන**)දුෂ්කෘතමයද-ඇඟිලි අක් ඔසවා විලුඹින්හෝ විලුඹඔසවා ඇඟිලි අගින්හෝ ඇතුළුගමයාමෙන් සිදුවන (**උක්කුටික ගමන**)දුෂ්කෘතයද—පල්ලත්කායෙන් හෙවත් කෙණෙඩින් සඟළ සිවුරමැඩ ඇතුළුගව හිඳීමෙන්සිදුවන (**පල්ලත්ථිකනිසීදන**)දුෂ්කෘතයද—යනමෙකී සාරුප්‍යබව් පිණිස පණවනලද සවිසි දුෂ්කෘතාපත්තිහුද.

6-2. "පිඬුපිළිගණිමි"යි සිතියනූපදවා පිඬුපිළිගැණීමෙන්වන (**සක්කච්ච අපටිග්ගහණ**) දුෂ්කෘතයද—තමන්ගේ අධිෂ්ඨාන පාත්‍රයෙහි පාත්‍රසංඥා නැතිව පිඬුපිළිගැණීමෙන්වන (**පත්තසඤ්ඤීඅපටිග්ගහණ**) දුෂ්කෘතයද—ලබනලද බතින් සතරෙන්කොටසකටවඩා මුං, මෑ, කොල්ලු, ආදියෙන් කරණලද අතින්ගෙණගියහැකි සූපය තමන් පිණිස පිළිගැණීමෙන් වන (**සමසූපකඅපටිග්ගහණ**)දුෂ්කෘතයද—අධිෂ්ඨානොපග පාත්‍රයාගේ ඇතුළුමුවවට ඉක්මවා පිඬුපිළිගැණීමෙන්වන (**සමතිත්තික අපටිග්ගහණ**) දුෂ්කෘතයද—"පිඬුවළඳමි"යි සිතියනූපදවා වැළඳීමෙන් වන (**අසක්කච්චභුඤ්ජන**)දුෂ්කෘතයද—පාත්‍රගත සංඥාවෙන්තොරවවැළඳීමෙන්වන(**පත්තසඤ්ඤී අභුඤ්ජන**)දුෂ්කෘතයද—තමන් අභිමුඛයෙහිපටන් පිළිවෙළින්පිණ්ඩයනොවැළඳීමෙන්වන(**සපදානඅභුඤ්ජනක**)දුෂ්කෘතයද—යටකීපරිද්දෙන් සමසූපපිණ්ඩයනොවැළඳීමෙන්වන(**සමසූපක අභුඤ්ජන**)දුෂ්කෘතයද—මුදුනමැඩ(හෙවත්පාත්‍රයමැදින්ගෙණ)පිණ්ඩය වැළඳීමෙන්වන(**ථූපතොමද්දන**)දුෂ්කෘතයද—නැවත් ලබනකැමැත්තෙන් සූපව්‍යඤ්ජනබතින් වැසීමෙන්වන(**ඔදන පටිච්ඡාදන**) දුෂ්කෘතයද—නොගිලන්ව නොනෑ නොපැවරුවන්ගෙන්බත්හෝ ව්‍යඤ්ජනහෝ විනවාඅනුභවකිරීමෙන්පැමිණෙන(**සූපොදනවිඤ්ඤත්ති**)දුෂ්කෘතයද—දොස්කියනු කැමැත්තෙන් මෙරමාපාත්‍රයබැලීමෙන් පැමිණෙන(**උජ්ඣානසඤ්ඤී**) දුෂ්කෘතයද-ඉතාමහත්පිඬුකොට අනුභවකිරීමෙන්සිදුවන(**අතිමහන්තකබලකරණ**) දුෂ්කෘතයද—පිරිමඬුළුනොකොට අහරපිඬු අනුභවකිරීමෙන් සිදුවන (**පරිමණ්ඩල ආලොපඅකරණ**) දුෂ්කෘතයද—අහරපිඩමුවදොරට නොපමුණුවා මුවවිවෘතකිරීමෙන්සිදුවන(**මුඛද්වාර විවරණ**)දුෂ්කෘතයද—හස්තය නොහොත් ඇඟිලි මුවතුලටප්‍රවේශකරකර අනුභවකිරීමෙන්වන(**හත්ථමුඛප්පවෙසන**)දුෂ්කෘතයද-අහරසහිතමුඛයෙන් කථාකිරීමෙන්වන(**බ්‍යාහරණ**)දුෂ්කෘතයද-අහරපිඬු මුඛයට ඔසවා දමදමා(හෙවත් විසිකරමින්) අනුභවකිරීමෙන්සිදුවන(**පිණ්ඩුක්ඛෙපක**) දුෂ්කෘතයද—අහරපිඩ කඩකඩා අනුභවකිරීමෙන්සිදුවන (**කබලාවච්ඡෙදක**)දුෂ්කෘතයද—වඳුරන්මෙන් හකුපුරවපුරවා අනුභවකිරීමෙන්සිදුවන(**අවගණ්ඩකාරක**) දුෂ්කෘතයද—අත ගසාදමදමා අනුභවකිරීමෙන් සිදුවන (**හත්ථ

**නිද්ධුනක**) දුෂ්කෘතයද—බත්තුළුවිසිර විසිරවා අනුභව කිරීමෙන් වන(**සිත්ථාවකාරක**)දුෂ්කෘතයද—දිවනෙරව නෙරවා අනුභවකිරීමෙන්වන(**ජිව්හානිච්ඡාරක**) දුෂ්කෘතයද—චපුචපුයන ශබ්දකරමින් අනුභවකිරීමෙන් වන (**චපුචපුකාර**) දුෂ්කෘතයද—සුරුසුරු යන ශබ්දකරමින් අනුභවකිරීමෙන් වන(**සුරුසුරුකාර**) දුෂ්කෘතයද—අතලෙවලෙව, පාත්‍රයලෙවලෙව, තොලලෙවලෙව, අනුභවකිරීමෙන් වන(**හත්ථ-පත්ත-ඔට්ඨ-නිල්ලෙහක**) දුෂ්කෘතත්‍රයද—ඉඳුල්අතින් පැන්භාජනය ගැණීමෙන් වන (**ථාලකපටිග්ගහණ**) දුෂ්කෘතයද—පාත්‍රයසේදූ බත්තුළුසහිත දියත්ත ඇතුළුගම නොහොත් ගෙමිදුළුවල දැමීමෙන්වන (**සසිත්ථකඪනක**) දුෂ්කෘතයද-යනමේ භොජන ප්‍රතිසංයුක්ත සමත්‍රිංශත්කුලාවෝද.

6--3. කුඩයක්ගත්අත්ඇති, සතරරියන් පමණ දණ්ඩක්ගත්අත්ඇති,ශස්ත්‍රයක්ගත්අත්ඇති,ආයුධයක්ගත්අත්ඇති, නොගිලනාට දහම්දෙසීමෙන් සිඛවන(**ඡත්ත-දණ්ඩ-සත්ථ-ආයුධපාණී e ධම්මදෙසන**)දුෂ්කෘතසතරද—කාෂ්ඨපාදුකානැගී,වහන්නැගී,නොගිලනාට දම්දෙසීමෙන්සිඛවන(**පාදුක-උපාහනාරූළ්හ S**)දුෂ්කෘතවයද—යානාවට පැමිණි,සයන ඉරියව්වටපැමිණි,නොගිලනාට දම්දෙසීමෙන්සිඛවන(**යාන-සයනගත s**)දුෂ්කෘතවයද—අතින් හෝ වස්ත්‍රාදියකින්හෝ දෙදණමඩුලුබැඳසිටින නොගිලනාට දම්දෙසීමෙන්සිඛවන(**පල්ලත්ථික S**)දුෂ්කෘතයද—කෙශාන්තයවසා හිසබැඳ සිටින්නාවූද, හිසවසාපෙරව සිටින්නාවූද, නොගිලනාට දම්දෙසීමෙන්සිඛවන(**වෙඨිත-ඔගුණ්ඨිතසීස s**)දුෂ්කෘතවයද—බිම හිඳ යටත්පිරිසෙසින් පැදුරුකළාල්ආදී මිටි ආසනයක නාමුත් හුන්නාවූ නොගිලනාට දම්දෙසීමෙන්සිඛවන(**ඡමාය s**)දුෂ්කෘතයද—එක්මිටිආසන්යෙකහිඳ උස්ආසනයෙහි උන් නොගිලනාටදම්දෙසීමෙන්සිඛවන(**නීචාසන s**)දුෂ්කෘතයද-ඝ-ඉදගෙණහුන්නොගිල

---

e මෙහි මින්මතු "ධම්මදෙසන" යනපදය වෙනුවට මේලකුණ ☞ S දතයුතුයි.

ඝ මෙකල සමහර බෞද්ධයෝ මෙම ශික්ෂාපදයෙහි ප්‍රතිපක්ෂනයගෙණ බුද්ධකාලයෙහි ඇතම්රජ බමුණුආදීහු තමතමන්ගේ ව්‍යාඝ්‍රස්ථානාදියෙහි මිටිඅසුන්වලහිඳ බුදුන්සමග ප්‍රශ්නවිචාරීමාදිවශයෙන් ධම්මසාකච්ඡාකළබව දෘෂ්ටාන්තකරමින් ධම්මාශනය උස්කොට පණවාමිටිඅසුන් නැඟීහිඳ සද්ධම්මශ්‍රවණයකරති-"සමආසනයෙහිඋන් අයටපවා බණකියනැකිය,එබැවින් ධම්දෙශකභික්ෂුහට එසින්කිසි ඇවතක් නැත" යනාදිය කියමින් ඔවුන්ගේණපානායටකී දෘෂ්ටාන්තය ගර්භාවක්‍රාන්ති සමයාදියෙහි දක්වන ධම්දේශනා සමයට ගැළපේදැයි නොසිනා සමහර භික්ෂූහුද එය

නාට සිටගෙණ දම්දෙසීමෙන්සිදුවන(ඨාන ඃ)දුෂ්කෘතයද—පසුව යමින් පෙරටුවයන නොගිලනාට දම්දෙසීමෙන්වන(පච්ඡතොඃ) දුෂ්කෘතයද—නොමගින්යමින් මගින්යන නොගිලනාට දම්දෙසීමෙන්වන (උප්පථ S)දුෂ්කෘතයද—සිටගෙණ නොගිලනත්ව මලමූත්‍රපැහැරීමෙන් සිදුවන (ඨිතක)දුෂ්කෘතයද—නොගිලනත්ව තිල්තෘණ සහිත බිම මලමූත්‍ර කෙලසෙම්සොටු ආදිය දැමීමෙන් වන (හරිත) දුෂ්කෘතයද—නොගිලන්ව පරිභොග ජලයෙහි මලමූත්‍ර කෙලසෙම්සොටු ආදිය දැමීමෙන් වන (උදක) දුෂ්කෘතයද—යන මෙකී එකුන්විසිදුකුළාවෝද්, යන උද්දෙසාගත පන්සැත්තෑදුකුළාවෝද, සාමාන්‍යයෙන් විනය පාලියෙහි තබ්බාදි ප්‍රත්‍යයකින් නියමකර වදාළදෙය නොකිරීමෙන්හා නකාරාදි ප්‍රතිශෙධයකින් තහනම්කර වදාළදෙය කිරීමේහි සිදුවන උද්දෙස මුක්තක සියලු දුකුළාවෝද, දුෂ්කෘතාපත්තිස්කන්ධ ෲ නම්වේ:—

දුෂ්කෘතාපත්තිස්කන්ධය තෙමේ සර්වසංග්‍රාහිකවශයෙන් පූර්වප්‍රයෝග, සහප්‍රයෝග, අනාමාස, දුරුපචිණ්ණ, විනය, ඤාත, ඤාත්ති, පටිස්සවදුක්කට වශයෙන් අටවැදෑරුම්වේ—පාරාජිකාදි ඒ ඒ ආපත්තිසාධක අඞ්ගයන්ට පූර්වභාගයේ කායවාක් ප්‍රයෝගයන්

---

න්වරදියයි කියති-තාමූත් මෙකළ අනෛර්‍යාණික මිථ්‍යාධර්ම්ය අසත්තන්ගේ පල්ලිවල නියමිත චාරිත්‍රයට එකඟවීමෙන් මිථ්‍යාකර්ම් සමාදානයවියහැකිබැවින්හා බණ ඇසීමට මිනිස්ලොවට එන දිව්‍යබ්‍රහ්මයෝපවා “හිඳගැණීමට සිතුවහොත් අසුන්පැනනගින හෙයින් ඒගැණ සිතකුදුනුපදවා සිටගෙණම බණඅසති” යන ආගම හෙයින් එයසාවද්‍යවේ-එහෙයින් යටකී දෙසනා සමයෙන් අනික්කාලවල ඒඒතන්හි මිටිඅසුන්නැග ධර්ම්සාකච්ඡාකළ රජ බමුණුආදිහුද්වා දෙසනා සමයෙහි එම චාරිත්‍රය නොපැවැත්වූවෝ:—එතැන්පටන්අදවනතුරු සංඛ්‍යාපථාතික්‍රාන්ත රාජරාජ මහාමාත්‍යාදි සියලුරට සියලුබෞද්ධයෝම ශරීරසුකුමාලතාදි කිසිවක්නිසා භූමිසංබන්ධව සක්මගිය අසුන්නැග නොහිඳ ත්‍රිවිධවාරයෙන් ධර්ම්ගෞරවයකරමින් බිම අතුරණලද යම්කිසිවකහිඳම උතුම්නෛර්‍යාණික ශ්‍රී සද්ධර්ම්ය ශ්‍රවණය කරති—සම්බාධස්ථානාදියෙහි බුද්ධවචන කථාකරන්නාවූත්ම පහසුවන පිණිස පණවා වදාළ විනයශික්ෂානය පෙරළා දෙසනාසමයට ගැණීමයටකී ආගම නයටහා ආගම ගෞරවයපිණිස පැවැත්වූනියමචාරිත්‍රයටත් ගැළපේදැයි ආගම ගෞරවයදන්නාවූ ප්‍රාඥයන්විසින්ද ඒ බෞද්ධමහතුන්විසින්ද සැලකියයුතු. මේ අපමතයි.

ෲ “දුට්ඨුකතං දුක්කටං”යි නිර්වචනහෙයින් වරදවා නොහොත් නපුරුකොට කරණලද්ද දුෂ්කෘතනම්වේ.

හි සිදුවන ආපත්තිතොමෝ පුබ්බ ප්‍රයෝග දුෂ්කෘතනම්වේ-ඒ ඒ ආපත්තිසාධක අඞ්ගසඞ්ගිත කායවාක්ප්‍රයෝගයන්හි සිදුවන ආපත්තිතොමෝ සහ ප්‍රයෝග දුෂ්කෘතනම්වේ-දශවිධරත්න, සප්තවිධධාන්‍ය, ආයුධභාණ්ඩ, තූර්‍ය්‍යභාණ්ඩ, ස්ත්‍රී රූප, ස්ත්‍රීආභරණ පරාමර්ශනයෙහිසිදුවන ආපත්තිතොමෝ අනාමාසදුෂ්කෘතනම්වේ-"මෙය නොකටයුතු"යයි පණවනලද්දගේ කිරීමෙහිසිදුවනු ආපත්තිතොමෝ දුරුපචිණ්ණ දුෂ්කෘතනම්වේ—සෙසු සත්වැදෑරුම් දුෂ්කෘතයෙන් ඉතිරිවූ විනයෙහි පණවනලද දුක්කටාපත්තිතොමෝ විනයදුෂ්කෘතනම්වේ—එකොළොස් සමනුභාෂණ කර්‍මයන්හි a යමක් "ඥප්තියෙහි දුෂ්කෘතය"යි වදාරණලද්දේද ඒ ඥප්ති දුෂ්කෘතනම්වේ—වස්වසීම් ආදියනැණ දෙනලද ප්‍රතිඥාව සම්පාදනය නොකරන්නාහට සිදුවන ආපත්තිතොමෝ පටිස්සව දුෂ්කෘතනම්වේ-"අසවල් භික්ෂුතෙම සංඝභෙදය පිණිස උත්සාහකරු"යයි අසා අල්පය (අදහස) දැනගත්කල්හි එයවළක්වනපිණිස එහිගොස් අවවාදනොකරණ භික්ෂුහට සිදුවන ආපත්තිතොමෝ ඤාතදුෂ්කෘතනම්වේ:—අෂ්ටදුෂ්කෘත විනිශ්චයයි:—

7. දුබ්භාෂිතා'පත්තිස්කන්ධය කවරේද?:—හීනජාතික උපසපන්නක්හට ක්‍රීඩා අදහසින් ඍජුවහෝ පර්‍ය්‍යායනෙපුලෙන් හෝ හීනජාතියෙන් ගටාබිණීමෙන් අවදනා ගෙවත් සිඳවන (**හීනහීන ජාත්‍යොමසවාද**) දුබ්භාෂිතා'පත්තියද--හීනජාතික උපසපන්නක්හට ක්‍රීඩා අදහසින් ඍජුවහෝ පර්‍ය්‍යායනෙපුලෙන්හෝ උත්කෘෂ්ට ජාතියෙන් ගටාබිණීමෙන් අවදනා (**හීනපණීතජාත්‍යොමසවාද**) දුබ්භාෂිතාපත්තියද—උත්කෘෂ්ටජාතික උපසපන්නක්හට එසේම හීනජාතියෙන් ගටාබිණීමෙන් අවදනා (**පණීත හීනජාත්‍යොමසවාද**) දුබ්භාෂිතාපත්තියද—උත්කෘෂ්ට ජාතික උපසපන්නක්හට් එසේම උත්කෘෂ්ට ජාතියෙන් ගටාබිණීමෙන් අවදනා (**පණීත පණීතජාත්‍යොමසවාද** b) දුබ්භාෂිතාපත්තියද—හීන නාමික උපසපන්නක්හට එසේම හීනනාමයෙන් ගටාබිණීමෙන් අවදනා (**හීනහීනනාම** J) දුබ්භාෂිතාපත්තියද—හීන නාමික උපසපන්නක්හට එසේම උත්කෘෂ්ට නාමයෙන් ගටාබිණීමෙන් අවදනා (**හීනපණීතනාම** J) දුබ්භාෂිතයද—උත්කෘෂ්ට නාමික උ

---

a භික්ෂු ප්‍රාතිමොක්ෂයෙහි යාවතතියක සඞ්ඝාදිසෙස් සතරද දුටසි අප්පටිනිස්සජ්ජන පචිත්තියද භික්ෂුණී ප්‍රාතිමොක්ෂයෙහි උක්ඛිත්තානුවත්තිකා පාරාජිකාවද යාවතතියක සඞ්ඝාදිසෙස් සතරද චණ්ඩකාලි පචිත්තියද යන මෙකී ආපත්තීන් ආරෝපනයකරණුපිණිස කරණලද කර්‍ම එකොළොසකි.

b මින්මතු **ඔමසවාද** යන පදයවෙනුවට මේලකුණ J දක්නුනු.

පසපනක්හට එසේහීනනාමයෙන් ගටාබිණීමෙන් අවදනා (**ඡණ්ණාසිනනාම**J) දුභාෂිතයද–උත්කෘෂ්ටනාමික උපසපනක්හට එසේම උත්කෘෂ්ටනාමයෙන් ගටාබිණීමෙන් අවදනා (**ඡණ්ණාඡණ්ණනාම**J) දුභාෂිතයද–හීනගෝත්‍රඇති උපසපනක්හට එසේම හීනගෝත්‍රයෙන් ගටාබිණීමෙන් අවදනා (**හීනහීනගොත්ත**J) දුභාෂිතයද–හීනගෝත්‍රඇති උපසපනක්හට එසේ උත්කෘෂ්ටගෝත්‍රයෙන් ගටාබිණීමෙන් අවදනා (**හීනඡණ්ණනගොත්ත**J) දුභාෂිතයද–උත්කෘෂ්ටගෝත්‍රඇති උපසපනක්හට එසේහීනගෝත්‍රයෙන් ගටාබිණීමෙන් අවදනා (**ඡණ්ණාහීනගොත්ත**J) දුභාෂිතයද–උත්කෘෂ්ටගෝත්‍රඇති උපසපනක්හට එසේඋත්කෘෂ්ට ගෝත්‍රයෙන් ගටාබිණීමෙන් අවදනා (**ඡණ්ණාඡණ්ණනගොත්ත**J) දුභාෂිතයද–හීනකම්කඋපසපනක්හට එසේහීනකම්මයෙන් ගටාබිණීමෙන් අවදනා (**හීනහීනකම්ම**J) දුභාෂිතයද–හීනකම්ක උපසපනක්හට එසේ උත්කෘෂ්ටකම්මයෙන් ගටාබිණීමෙන් වන (**හීනඡණ්ණනකම්ම** J) දුභාෂිතයද–උත්කෘෂ්ටකම්ක උපසපනක්හට එසේ හීනකම්ම යෙන් ගටාබිණීමෙන්වන (**ඡණ්ණාහීනකම්ම**j) දුභාෂිතයද–උත් කෘෂ්ටකම්මික උපසපනක්හට එසේ උත්කෘෂ්ටකම්මයෙන් ගටාබිණීමෙන්වන (**ඡණ්ණ ඡණ්ණනකම්ම** j) දුභාෂිතයද–හීන ශිල්පික උපසපනක්හට එසේ හීනශිල්පයෙන් ගටාබිණීමෙන්වන(**හීනහීනසිප්ප** j)දුභාෂිතයද–හීනශිල්පික උපසපනක්හට එසේඋත්කෘෂ්ටශිල්පයෙන් ගටාබිණීමෙන්වන(**හීනඡණ්ණනසිප්ප**j) දුභාෂිතයද–උත්කෘෂ්ට ශිල්පික උපසපනක්හට එසේ හීනශිල්පයෙන් ගටාබිණීමෙන්වන(**ඡණ්ණාහීනසිප්ප**j)දුභාෂිතයද–උත්කෘෂ්ටශිල්පික උපසපනක්හටඑසේ උත්කෘෂ්ටශිල්පයෙන් ගටාබිණීමෙන්වන(**ඡණ්ණඡණ්ණනසිප්ප**j) දුභාෂිතයද–හීනා'බාධිකඋපසපනක්හට එසේ හීනාබාධයෙන් ගටාබිණීමෙනවන (**හීනහීනාබා ධ**j)දුභාෂිතයද–හීනාබාධික උපසපනක්හට එසේ උත්කෘෂ්ටාබාධ යෙන්ගටාබිණීමෙන්වන (**හීනඡණ්ණනාබාධ**) දුභාෂිතයද–උත්කෘෂ්ටාබාධික උපසපනක්හට එසේහීනාබාධයෙන් ගටාබිණීමෙන් වන (**ඡණ්ණාහීනාබාධ**j) දුභාෂිතයද–උත්කෘෂ්ටා'බාධික උපසප නක්හට එසේඋත්කෘෂ්ටාබාධයෙන් ගටාබිණීමෙන්වන(**ඡණ්ණඡණ්ණා'බාධ**j) දුභාෂිතයද–හීනසණ්ඨානික උපසපනක්හට එසේ හීනසණ්ඨානයෙන් ගටාබිණීමෙන්වන(**හීනහීනසණ්ඨාන**j) දුභාෂිතයද–හීනසණ්ඨානික උපසපනක්හට එසේ උත්කෘෂ්ටසණ්ඨා නයෙන් ගටාබිණීමෙන්වන(**හීනඡණ්ණනසණ්ඨාන**) දුභාෂිතයද– උත්කෘෂ්ටසණ්ඨානික උපසපනක්හට එසේ හීනසණ්ඨානයෙන් ගටාබිණීමෙනවන (**ඡණ්ණාහීනසණ්ඨාන**j) දුභාෂිතයද–උත්කෘ ෂ්ටසණ්ඨානික උපසපනක්හට එසේ උත්කෘෂ්ටසණ්ඨානයෙන් ග

ටාබිණීමෙන්වන(**උක්කට්ඨං උක්කට්ඨෙන ලිඞ්ගෙන**)දුභාෂිතයද–සංකෙලශික උපසපනක්හට එසේ සංකෙලශිකතායෙන් ගටාබිණීමෙන්වන(**හීනං හීනෙන කිලෙසෙන**)දුභාෂිතයද–සංකෙලශික උපසපනක්හට එසේ නිෂ්කෙලශිකතායෙන් ගටාබිණීමෙන්වන (**හීනං උක්කට්ඨෙන කිලෙසෙන**) දුභාෂිතයද–නිෂ්කෙලශික උපසපනක්හට එසේ සංකෙලශිකතායෙන් ගටාබිණීමෙන්වන (**උක්කට්ඨං හීනෙන කිලෙසෙන**)දුභාෂිතයද–නිෂ්කෙලශික උපසපනක්හට එසේම නිෂ්කෙලශිකතායෙන් ගටාබිණීමෙන්වන(**උක්කට්ඨං උක්කට්ඨෙන කිලෙසෙන**)දුභාෂිතයද–හීනා'පත්තික උපසපනක්හට එසේහීනා'පත්තියෙන් ගටාබිණීමෙන්වන(**හීනං හීනාය ආපත්තියා**) දුභාෂිතයද–හීනාපත්තික උපසපනක්හට එසේ උත්කෘෂ්ටාපත්තියෙන් ගටාබිණීමෙන්වන (**හීනං උක්කට්ඨාය ආපත්තියා**) දුභාෂිතයද–උත්කෘෂ්ටාපත්තික උපසපනක්හටඑසේහීනාපත්තියෙන් ගටාබිණීමෙන්වන(**උක්කට්ඨං හීනාය ආපත්තියා**) දුභාෂිතයද–උත්කෘෂ්ටාපත්තික උපසපනක්හටඑසේඋත්කෘෂ්ටාපත්තියෙන ගටාබිණීමෙන්වන (**උක්කට්ඨං උක්කට්ඨාය ආපත්තියා**) දුභාෂිතයද–හීනා'ක්‍රොශික උපසපනක්හට එසේහීනාක්‍රොශයෙන් ගටාබිණීමෙන්වන(**හීනං හීනෙන අක්කොසෙන**) දුභාෂිතයද–හීනාක්‍රොශික උපසපනක්හට එසේ උත්කෘෂ්ටාක්‍රොශයෙන් ගටාබිණීමෙන්වන (**හීනං උක්කට්ඨෙන අක්කොසෙන**)දුභාෂිතයද—උත්කෘෂ්ටාක්‍රොශික උපසපනක්හට එසේ හීනාක්‍රොශයෙන් ගටාබිණීමෙන්වන(**උක්කට්ඨං හීනෙන අක්කොසෙන**)දුභාෂිතයද—උත්කෘෂ්ටාක්‍රොශික උපසපනක්හට ක්‍රීඩාඅදහසින් සෘජුවහෝ පර්යාය තෙපුලෙන්හෝ උත්කෘෂ්ටාක්‍රොශයෙන් ගටාබිණීමෙන් පැමිණෙන (**උක්කට්ඨං උක්කට්ඨෙන අක්කොසෙන**) දුභාෂිතයද—යන මෙකී ආපත්තීහු සමසතළිස දුභාෂිතාපත්තිස්කන්ධය ඌවේ.

---

මෙතෙකින් ආධුනික බුද්ධිජනයාගේප්‍රමොදය පිණිස
කරණලද ශික්ෂාශීල නම් ප්‍රකරණයෙහි **පාතිමොක්ඛසංවර**
**නිද්දෙස** නම්වූ ප්‍රථම පරිච්ඡේදය නිමවනලදී.

(ස. අ. 1) **එවංසඞ්ඛෙපතො'මක්ඛාත'මෙතං**
**නිද්දෙසං ජානාති යොහිකාමුසීලෙ**
**සන්තා'පත්තික්ඛන්ධ භෙදෙසුදක්ඛො,**
**අච්චන්තං සො සාධුනාති පමුත්තො.**

---

ශික්ෂාපදශීලයයි කියනලද ප්‍රාතිමොක්ෂ සංවරශීලයාගේ කෞශල්‍යය පිණිස මෙහි දූත් පරිශිෂ්ට සඞ්ග්‍රහයකුදු එළවනුලැබේ-:
(1) සියලු ශික්ෂාපදයන්ගේ වනාහි සාධාරණ විනිශ්චයප්‍රශ්නීස

---

ඍ “දුරාභට්ඨං (භාසිතං) දුබ්භාසිතං,,යි නිර්වචනයෙහෙයින් නපුරු කොට කියනලද වචනයෙන් හැඟි ඇවතදුභාෂිතනම්වේ.

අනතුරුව කියනු ලබණ "නිදානං" යනාදී මෝතොමෝ මාතෘකා වන්නීය.

(1) නිදානං පුග්ගලං වත්ථුං පඤ්ඤත්තිවිධි'මෙව ච
ආණත්තා'පත්ත'නා පත්ති විපත්ති අඞ්ග'මෙව ච.

(2) සමුට්ඨානවිධිං කිරියා සඤ්ඤා චිත්තාණත්තිකං
වජ්ජකම්මප්පභෙදඤ්ච තිකද්වයවිධිං තථා.

(3) ලක්ඛණං සත්තරසධා ඨිතං සාධාරණං ඉදං
ඤත්වා යොජෙය්‍ය මෙධාවී තත්ථ තත්ථ යථාරහං.

**1** එහිනිදානනම් වෙසාලි රාජගහ සාවත්ථි ආලවක කොසම්බි සක්ක භග්ග(නගරජනපද)යන්ගේ වශයෙන් ප්‍රඥප්තිස්ථාන හෙවත් ශික්ෂාපදපැණවූතැන් සත්වැදෑරුම්වේ; මේවනාහි සියලු ශික්ෂාපදයන්ගේ නිදානයී—:**2** පුග්ගලනම් යමෙක් යමෙක් අරබයා ඒඒශික්ෂාපද පණවනලද්දේද ඔහු පුද්ගලයාය; ඒආදි කම්මික පුද්ගලයෝ වනාහි භික්ෂූන්ගෙන් තෙවිසිදෙනෙකැයිද භික්ෂුණීන්ගෙන් සත්දෙනෙකැයිද කියනලදී–එහෙයින්කීහ.

(1) සුදින්නො ධනියො සම්බහුලා වග්ගුමුදාතීරිකා
සෙය්‍යසකො උදායීචා'ලවකා ඡන්න මෙත්තියා.

(2) දෙවදත්ත'ස්ස ජිපුනබ්බසු ඡබ්බග්ගියො'පනන්ද'ඤ්ඤතරෙපිච
හත්ථකොචානුරුද්ධො ච සන්ථරසමුල්ලපන්ථකො
නන්දත්ථෙරෙන තෙවීස භික්ඛූනං ආදිකම්මිකා.

(3) සුන්දරීනන්දා ථුල්ලනන්දා ඡබ්බග්ගිය'ඤ්ඤතරා'පිච
චණ්ඩකාලී සම්බහුලා'චෙව වෙච භික්ඛුණියො'පිච
භික්ඛුණීනන්තු සත්තෙව හොන්ති තා ආදිකම්මිකා.

**3** වස්තුනම් ඒඒ පුද්ගලයන්ගේ අධ්‍යාචාරය හෙවත් ඒඒවැරදි ක්‍රියාවකිරීමයි; මෙසේ නිදාන පුද්ගල වස්තුවශයෙන් සියලුශික්ෂාවන්ගේ විනිශ්චය දතයුතු-:**4**-ප්‍රඥප්තිවිධිය, යත්‍යු ප්‍රඥප්ති අනුප්‍රඥප්ති අනුප්පන්නප්‍රඥප්ති සර්වත්‍රප්‍රඥප්ති ප්‍රදෙශප්‍රඥප්ති සාධාරණප්‍රඥප්ති අසාධාරණ ප්‍රඥප්ති එකතොප්‍රඥප්ති උභතොප්‍රඥප්තිවශයෙන් ප්‍රඥප්තිය නවවැදෑරුම්වේ-: එහි ප්‍රඥප්තිනම් පළමුකොට පණවනලද්දය, ඊටඅනුව පණවනලද්ද අනුප්‍රඥප්තිය; එහි අනුප්පන්න ප්‍රඥප්තිනම් දොෂයනුපන්කල්හි පණවනලද්දය; ඕතොමෝ අෂ්ට ගරුධම්ම ප්‍රතිග්‍රහණවශයෙන් භික්ෂුණීන්ගෙටම පණවනලද්දීය; ඕතොමෝ භික්ෂූන්කෙරෙහි නැත්තීය; මධ්‍යම මණ්ඩලයෙහිද සියලු ප්‍රත්‍යන්තයන්හිද ඇවැත්යයි පණවනලද්ද සර්වත්‍රප්‍රඥප්තිය; මධ්‍යම මණ්ඩලයෙහි පමණක් ඇවැත්යයි පණවනලද්ද ප්‍රදෙශ ප්‍රඥප්තිය; එයු විනයධරයා පස්වෙනිකොට ඇති ගණයාගෙන් (නොහොත් පස්නමගෙන්) උපසම්පදාකිරීම සහරපටින් මන්තෙන්සාර මණ්ඩලද වහන්දැරීම නිතරන්නෑම සම්ඇතිරිළි දැරීමයනමොවුන්ගේ වශයෙන් චතුර්විධවේ; අනිකුදුසියලුප්‍රඥප්ති (ශික්ෂාවෝ) සර්වත්‍රප්‍රඥප්ති

නම්වේති,භික්ෂූන්ටද භික්ෂුණීන්ටද සාධාරණවූප්‍රඥප්තිතොම සා
ධාරණ ප්‍රඥප්තිනම්වේ-හුදුභික්ෂූන්ටම පණවනලද ශික්ෂාපදයඅසා
ධාරණප්‍රඥප්තිවේ-සාධාරණ අසාධාරණ ප්‍රඥප්තිදෙකද එකතො
උභතො ප්‍රඥප්තිදෙකද අර්ථවශයෙන් එකක්මය; එහෙයින් සෙසු
සතර ප්‍රඥප්තිවශයෙන් සියලු ශික්ෂාවන්ගේ විනිශ්චයදතයුතුයි-:
5-ආනත්ති යනු ආඥාය;-6-ආපත්ති යනු පූර්වප්‍රයෝගාදි වශයෙන්
ආපත්තිප්‍රභෙදය-7-අනාපත්තියනු අජානනාදිවශයෙන් අනාප
ත්තිප්‍රභෙදය-8-විපත්තියනු සීල,ආචාර, දිට්ඨි,ආජීව, යන සතරින්
එකකි--මෙසේ ආනත්තිආදි සතරදෙනාගේවශයෙන්ද සියලුශි
ක්ෂාවන්හි විනිශ්චය දතයුතුයි-:9-අඞ්ගයනු සියලු ශික්ෂාපදයන්
ගේ ආපත්තිසාධක අඞ්ගයි; එය සේවියයි සිතය,මාගීයෙහි මාගීප්‍ර
වෙශනය,යනාදීන් දතයුතුයි:-10-සමුට්ඨාන යනු සියලුආපත්තීන්
ගේ කායය, වචනය, කයවචනදෙකය. කායචිත්තය, වාචාචිත්තය
කායවාචාචිත්තය, යනමේ එක අඞ්ගයක්ඇති අඞ්ගදෙකක් ඇති
අඞ්ගතුණක්ඇති සමුට්ඨාන සදෙනෙක්වෙති; එහිපූර්වතුණ අචි
ත්තකය පසුවන්තුණ සචිත්තකය; ඔවුන් අතුරෙන්එකකින්හෝ
දෙකකින්හෝ තුණකින්හෝ සතරකින්හෝ සයෙන්මහෝ ආ
පත්තිහුනැගිවිති; සමුට්ඨාන පසකින් නඞ්ගි ඇවතක්නැත්තේ
ය-: එහි එකසමුට්ඨානතුනක්ද විසමුට්ඨාන පසක්ද තිසමුට්ඨා
නදෙකක්අචතුසමුට්ඨානදෙකක්ද ඡසමුට්ඨාන එකක්දැයි ශීෂීවශ
යෙන් **පඨම පාරාජික සමුට්ඨානාදි** නාමයෙන් තෙළසක් දක්වන
ලදහ-: එහෙයින්කිහ.

(4) තිධාඑකසමුට්ඨානා පඤ්චධාවිසමුට්ඨිතා
ද්විධාතිචතුරුට්ඨානා එකධාඡසමුට්ඨිති.

මෙසේ කීයනලද[සමැදෑරුම්] සමුට්ඨානයාගේ වශයෙන්ද සිය
ලුශික්ෂාවන්හි විනිශ්චය දතයුතුයි-: 11-සියලු ආපත්තිහු ක්‍රියාවශ
යෙන්කයවචනයෙන්කටයුතුදෙයකිරීමෙන්සිඛවන ඇවත,නො
කිරීමෙන් සිඛවන ඇවත; කිරීමෙන් නොකිරීමෙන් සිඛවන ඇව
ත; කිසිකලෙකකිරීමෙන් කිසිකලෙක නොකිරීමෙන් සිඛවන ඇව
ත; කිසිකලෙකක්රිමෙන් කිසිකලෙක නොකිරීමෙන් කිසිකලෙකකි
රීම් හිනොකිරීම් දෙකින් සිඛවන ඇවතයයි පංචවිධවෙති; මෙසේ
කියනලද[පස්වැදෑරුම්]කිරියා භෙදයෙන්ද සියලුශික්ෂාවන්හිවිනි
ශ්චය දතයුතුයි-: 12-සියලුම ආපත්තිහු සඤ්ඤාවිමොක්ඛ නොස
ඤ්ඤාවිමොක්ඛ වශයෙන් ද්විවිධවෙති-යම්ඇවතක් ඇවතට පැමි
ණෙන සංඥාව නැතිකමින් ආපත්තිභාවයෙන් මිදේද ඕතොමෝ
සඤ්ඤාවිමොක්ඛනම්වේ; යම්ඇවතක් ඇවතටප,මිණෙනසංඥාව
නැතත් ආපත්තිභාවයෙන් නොමිදේද ඕතොමෝ නොසඤ්ඤාවි
මොක්ඛනම්වේ; මෙසේ මෙයාකාරයෙන් කියනලද ද්විවිධසඤ්ඤා

භෙදයෙන්ද සියලුශික්ෂාවන්හි විනිශ්චය දතයුතුයි-: 13-තවද සි
යලුම් ආපත්තීහු සචිත්තක අචිත්තකයයි චිත්තවශයෙන් ද්විවිධවෙ
ති-යම් ඇවතක්තොමෝ සචිත්තක සමුට්ඨානගුණෙන් නගීද ඕ
තොමෝ සචිත්තකනම්වී;යම් ඇවතක්තොමෝ අචිත්තකසමුට්ඨා
නයෙන් හෝ චිත්තකමිශ්‍රසමුට්ඨානයෙන් හෝ නගීද ඕතොමෝ
අචිත්තකනම්වී; මෙසේ මෙ ආකාරයෙන් කියනලද ද්විවිධචිත්ත
භෙදයෙන්ද සියලුශික්ෂාවන්හි විනිශ්චය දතයුතුයි-: 14-සියලුම
ආපත්තීහු වජ්ජවශයෙන් ලොකවජ්ජ ප්‍රඥප්තිවජ්ජයයි ද්විවිධවෙති-ය
ම්ඇවතකගේ සචිත්තක සමුට්ඨානපක්ෂයෙහි සිත අකුසල්මවේද
ඕතොමෝ ලොකවජ්ජවී; යම්ඇවතකගේ සචිත්තකපක්ෂයෙහි
සිතකුසල්හෝ අකුසල්හෝ අව්‍යාකෘතහෝවේද ඕතොමෝ ප්‍රඥ
ප්තිවජ්ජවී; මෙසේ වජ්ජප්‍රභෙදයෙන්ද සියලුශික්ෂාවන්ගේ විනිශ්චය
දතයුතු-: 15-සියලුආපත්තීහුම කායකම්ම වාක්කම්ම උභයකම්ම
වශයෙන් ත්‍රිවිධවෙති; එහි කාය,කායචිත්ත, සමුට්ඨානදෙකින් න
ගින ආපත්තීහු කාය කම්මනම්වෙති; වාචා,වාචාචිත්ත, සමුට්ඨාන
දෙකින් නගින ආපත්තීහු වාක් කම්මවෙති; කායවාචා, කායවා
චාචිත්ත; යන සමුට්ඨානදෙකින් නගින ආපත්තීහු උභයකම්ම
වෙත්;මෙසේකියනලද ත්‍රිවිධකම්මප්‍රභෙදයෙන්ද සියලුශික්ෂාවන්
ගේවිනිශ්චයදතයුතුයි-"මනොද්වාරෙ ආපත්තිනාමනත්ථි" යනු
වෙත්"මනොද්වාරයෙන්ඇවතක්නැත්තේය"යිකියනලදද මෙය ව
නානිතමත්වෙනුවට තබනලද රන්රිදීමුදල් ඉවසීමෙන් රූපියස
ම්ගහණසඳ; මෙරමාවිසින් ප්‍රයොගකරණුලබන කල්හි ප්‍රවේස
න, ප්‍රවිෂ්ට, ස්ථිති, උද්ධරණ, යනසතර ක්ෂණයන්හි ඉවසීමෙන්
මෛථුනධම්ම පාරාජිකාපත්තියද සිද්ධවනහෙයින් "අනාගරාබාදිරව
නා" යනාදියමෙන් බාහුල්‍යවෘත්තීන් කියනලදයයි ආචාර්‍ය්‍යමත
යි.-: 16-17 ත්‍රිකවශවිධිය යනු කුසලත්‍රිකවිධිය වෙදනාත්‍රිකවිධිය ය
න දෙකයි; ඇවතට පැමිණෙන භික්ෂුතෙම වනාහි අකුසලසි
තඇත්තේ හෝ පැමිණෙයි; කුසල සිතඇත්තේහෝ අව්‍යාකෘ
තචිත්තය ඇත්තේහෝ පැමිණෙයි;එසේම දුක්ඛවෙදනාවෙන්
යුක්තවූයේ හෝ පැමිණෙයි; සුඛවෙදනාවෙන් යුක්තවූයේ හෝ
උපෙක්ෂාවෙදනායෙන් යුක්තවූයේහෝ පැමිණෙයි; මෛත්‍රීකව
යද සැතපීතිරොධ සමාපත්තියටපැමිණි සිත්නැත්තාවූ චෙතනා
නැත්තාවූ භික්ෂුහට(ද්විවිධ)සහසෙය්‍යාපත්තිය පැමිණෙනහෙයින්
(යටකීලෙස)බාහුල්‍යවෘත්තියෙන් කියනලදැයි දතයුතු—:මෙසේ
ඇතිකල්හිවනාහි සියලුශික්ෂාපදයන්හි අකුසලචිත්තවශයෙන්
එකසිතෙක; කුසල අව්‍යාකෘතවශයෙන් සිත්දෙකෙක; සියල්
ලත්ගේ වශයෙන් සිත්තුනෙක; දුක්ඛවෙදනාවශයෙන්ද එකවෙ
දනාවෙක; සුඛඋපෙක්ෂාවශයෙන් වෙදනාවෝ දෙදෙනෙක;

සියල්ලත්ගේ වශයෙන් වෙදනාවෝ තුන්දෙනෙකමයයි මෙම ප්‍රභෙදය ලැබෙයි; අනික්වෙදනාවක්නැත්තේයි; මේතිදෙනාදිවූ වෙදනාත්‍රිතය අවසන්කොටඇති සතලොස්ප්‍රකාර ලක්ෂණය දන පණ්ඩිතභික්ෂුතෙම ඒ ඒ ශික්ෂාපදයන්හි සුදුසුපරිද්දෙන් "අසවල් නුවරදී මෙනම් පුග්ගලයාගේ මෙනම් අධ්‍යාචාරය නිසා මේ ශික්ෂාපදය පණවනලදී මෙය අසවල් ප්‍රඥප්තිය" යනාදි වශයෙන් යොදන්නේය:—මෙසේදක්වනලද මේ සතලොස් සාධාරණ ලක්ෂණය ඒ ඒ ශික්ෂාවන්හියොදා දන්නාවූ ප්‍රාඥභික්ෂුතෙමේ සියලු ප්‍රඥප්තියෙහි ප්‍රවීණවන්නේය. **එහෙයින්කීහ.**

(5) තදංගනිමූලං නවපත්තමේතං චයඞ්කුරංසත්තඵලං ඡප්පුප්ඵං ජානාතියොවිප්පභවං විසාඛං ජානාතිපඤ්ඤත්තිමසෙසතොසො.

භාවය: නිදාන, පුග්ගල, වත්ථු,යයි කියනලද මුල්තුනක්ඇත්තාවූ; නවවැදෑරුම් ප්‍රඥප්තියයි කියනලද පත්‍රනවයක්ඇත්තාවූ; ලොකවජ්ජය, ප්‍රඥප්තිවජ්ජය,යි කියනලද අඞ්කුරදෙකක්ඇත්තාවූ; ආනත්ති, ආපත්ති, අනාපත්ති, විපත්ති, සඤ්ඤා, වෙදනාත්තික, කුසලත්තික, යයි කියනලද ඵලසතක්ඇත්තාවූ; ෂට්සමුට්ඨානයයි කියනලද මල්සයක් ඇත්තාවූ, චිත්ත,කම්ම;යයි කියනලද ප්‍රභවදෙකක් ඇත්තාවූ; ක්‍රියා,අඞ්ග;යයිකියනලද අතුදෙකක් ඇත්තාවූ; (යට) කියනලද සාධාරණ සතලොස්ලක්ෂණ විනිශ්චය සංඛ්‍යාතමේවෘක්ෂය යමෙක්දනීද; ඒ භික්ෂුතෙම ප්‍රඥප්තියයි කියනලද විනයපිටකය සර්වප්‍රකාරයෙන්දනී-:මේ සාධාරණවිනිශ්චයයි.

(2) දැන් අනන්තරපරිච්ඡේදයෙහි දක්වනලද සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් සර්වක්ෂුද්‍රානුක්ෂුද්‍රයයි කියනලද දුෂ්කෘත දුර්භාෂිතාපත්තීන් කෙරෙහි තියුණුගෞරවය ඇති කුලපුත්‍රයන්විසින්ම පාටිදෙසනීය පචිති නිසගි ථුලසී සංඝාදිසෙස පරාජිකාපත්තිස්කන්ධයන් රක්ෂාකරණුලබන හෙයින් දුෂ්කෘතාපත්තිස්කන්ධයෙහිවූසදතාවයපිණිස උද්දේශමුක්තක දුෂ්කෘතාපත්තීන් අතුරෙන් ඉතා ස්වල්පයක් සංක්ෂෙපයෙන් ගෙණහැරදක්වනුලැබේ:—

(1) **"අනුජානාමි භික්ඛවෙද්වෙ පත්තෙ අයොපත්තං මත්තිකාපත්තං"**යි වදාළහෙයින් යකඩපාත්‍රයහා මැටිපාත්‍රය ශාසනාවතීර්ණ කුලපුත්‍රයන්ගේ නියමභාජනයවේ-එයවනාහි • උපසම්පන්න භික්ෂූන්විසින් උපසම්පදාවූ දශදවසක්තුල අධිෂ්ඨානකොට පිළියම්පසක්වනතුරු පරිභොගකළයුතුයි; ස්වර්ණමයාදි අකැප පාත්‍ර එකොළොසක් තහනම්කරණලදහ; හස්තාග්‍රාදියෙහි මනුෂ්‍යයෝ ස්වර්ණාදිභාජනයෙක්හි ව්‍යඤ්ජනාදියදෙද්ද එයඅල්වන්නාහටපවා දුෂ්කෘතාපත්තිවේ; පලිඟු කැටුමැටි කස්ලොහො ආදියෙන් කරණලද තැටිආදි භාජනයන් පුද්ගලිකපරිභොගයෙන්

පරිභෝගකිරීමෙන් දුකුලාවේ; සංඝසන්තක ගිහිසන්තක තාව කාලිකවශයෙන්වත්-"**න භික්ඛවෙ පත්තො ලග්ගෙතබ්බො සොලගෙහස්ස ආපත්ති දුක්කටස්ස**" යනාදිය වදාළහෙයින් භිත්ති බිලාදියම්කිසිතැනක පාත්‍රයඑල්වා තබන්නාහට දුෂ්කෘතවේ; ඇඳ, පුටු,ඇක, ඡත්‍ර, බුලිබිම, පාපිට, යන මෙකීතන්හි තබන්නාහටද දුකුලාවේ—"**අනුජානාමි භික්ඛවෙ ආධාරකං**" යනාදිය වදාළහෙයින් රෙදිකඩ, පැදුරු, කළල්, ලෑලි, පිරිබඩබිම, යනාදිබුලි ආදිය නොවදිනතැනක තබන්ටවත්-පාත්‍රයගත් අත්ඇතිව දොර, ජනෙල්කවුළු හරින්නාහට දුකුලාවේ; අංශකූටයෙහි එල්වාගෙණ වත්-සුප මස්මාංශ ඇට ආදිකසලනා ඉඳුල්වතුර හෝවත් මුවදෙව්ජලය පාත්‍රයෙන්හැරගෙණ දමන්නාහටද; නැවතනොකණුකැමනි මස්ඇටආදිය පාත්‍රයෙහි තබන්නාහටද දුකුලාවේ-ඉඳුල්අතින් සුබපාත්‍රය අල්වන්නාහටද දුකුලාවේ;පාත්‍රයසෝදන්නහු විසින් පාත්කොටසෝදා, රෙදිකඩින්පිස අතපිටතබා මොහොතක්කල් උෂ්ණයගන්වා යටකීකැපභූමියක තැබියයුතුයි; උෂ්ණයගැන්වීමට අව්වෙහිහෝ ගින්නෙහිහෝ තබන්නාහට දුකුලාවේ—"**නචළපජ්ඣායං අනාපුච්ඡා එකච්චස්සපත්තො දාතබ්බො**" යනාදිය වදාළහෙයින් තමන්ගේ උපාධ්‍යායආචාර්‍ය්‍යයන් නොවිචාරා භික්ෂුසාමණේරාදී ඇතිකෙනෙකුහට පාත්‍රවිවරාදීදීම් වත්නොදියයුතුයි; තමාවිසින්ද නොගතයුතුයි; ගණුදෙනුකරණ උභයපක්ෂයටම දුකුලාවේ—"**උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස පත්තො දාතබ්බො**" යනාදිය වදාළහෙයින් උපාධ්‍යාය ආචාර්‍ය්‍යයන්විසින් සද්ධිවිහාරිකයන්ට හෙවත් තමතමන්නිසා වසන්නාවූ භික්ෂුසාමණේරයන්ට පාත්‍රයක්දියයුතුයි; දිමට වැඩිපාත්‍රයක් නැතිනම් සොයාදීමට උත්සාහකළයුතුයි; එලෙස නොකරණ උපාධ්‍යාය ආචාර්‍ය්‍යභික්ෂූන්ට දුකුලාවේ—"**ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො,**"යනාදින් භගවතාණ්වන් වදාළහෙයින් පාත්‍රයනැත්වදත් වැළඳීමටයන භික්ෂූහටදුකුලාවේ a "**තන්ගනත්වා එක මනනං පතොනානිතත්පිතබ්බො**" "**පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං**"යනුවෙන් **ආගන්තුක**වත් හා **නෙවාසික**වත වදාළහෙයින් පාත්‍රය නොගෙන හැසිරෙණ භික්ෂුනිකායිකයෝ මෙම දෙයාකාරවතෙන් පිරිහීමෙන් දුකුලාඅවදිත්; සූත්‍රපිටකයෙහිද පක්ෂියෙකුමෙන් භික්ෂූහුහැසිරෙණබව B

---

a නියමපාත්‍රය හැරදමා ගෘහස්ථපරිභොගපිඟත් ආදියෙහි නිතර අනුභවකරමින් හැසිරෙණ ලක්දිව්වැසි බොහෝ උපාධ්‍යායආචාර්‍ය්‍යසද්ධිවිහාරිකවරු මෙම දෙඅැවතින් කෙසේ නිදහස්ද!

B එයමෙම පරිච්ඡේදයෙහි මතු විස්තරව ප්‍රකාශවන්නේය.

වදාළහෙයින් ශීලවන්තබුද්ධශ්‍රාවකතෙමේ ආහාරවේලාවක් පසුක
රණ පිණිස යන සියලුතන්හි ශික්ෂාගෞරවයෙන් පාත්‍රය රැගෙ
ණ හැසිරෙමින් ඒනැණ පණවා වදාළාවූ සියගණන් ශික්ෂාවන්
මනාව පුරමින් ශික්ෂාප්‍රතිපත්තියෙහි අප්‍රමාදවන්නේය.

(2) "අනුජානාමි භික්ඛවෙ තිචීවරං දිගුණං සඞ්ඝාටිං එකච්චියං උ
ත්තරාසඞ්ගං එකච්චියං අන්තරවාසකං" යි යනුවෙන් දෙපටසඞ්ඝා
ටියද තනිපටඋත්තරාසඞ්ගයද තනිපටඅන්තරවාසකයද යනතුන්
සිවුර අනුදැනවදාලසේක:-එකල්හි ෂට්වර්ගිකභික්ෂූහු අතිරික්තතුන්
සිවුරකින්ගම්වදිති අතිරික්තතුන්සිවුරකින් වෙහෙරසිටිති අතිරික්
තතුන්සිවුරකින් නෑහැමටයෙති එකල්හි භාග්‍යවතුන්වහන්සේ
"න භික්ඛවෙ අතිරෙකචීවරං ධාරෙතබ්බං" යනාදියෙන් එයතහ
නම්කළසේක:-ඉක්බිති අතිරේකචීවරය දසාහපරම මාසපරමව
ශයෙන් වදාරා "අනුජානාමි භික්ඛවෙ අතිරෙකචීවරං විකප්පෙ
තුං" යනුවෙන් විකල්පනයකරන්ට අවසරදුන්සේක:—ඉන්පසු
ලෞඛිවකායපටන්වසා හැඳනැහැමට වැසිසළුවක්ද; කායගුත්තිය
චීවරගුත්තිය සෙනාසනගුත්තිය පිණිස නිසීදනයක්ද; ඇඳපුටු
ආදිය සියල්ලවසා හිඳිමට එම නිසීදනචීවරය නොපෝනාහෙ
යින් පච්චත්ථරණයක්ද; කණ්ඩුවාබාධයවැසීමට කණ්ඩුපටිච්ඡාද
නයක්ද; මුවපිස්නාපිණිස මුඛපුඤ්ඡනයක්ද; පෙරහණ පාත්‍රපසු
ම්බි වහන්පසුම්බි ආදිය පිණිස ස්වල්ප වස්ත්‍රකෑබලි වුවමනාහෙ
යින් ඒපිණිස පරික්ඛාරචෝලයක්ද; උපනුපන් වස්තුවශයෙන්
අනුදැන වදාළසේක:—ඉක්බිති "අනුජානාමි භික්ඛවෙ තිචීවරං
අධිට්ඨාතුං නවිකප්පෙතුං" යනාදියෙන් තුන්සිවුරසංඝාටිආදි ඒඒ
නාමයෙන්ම ඉටන්ටද ඒඒනාමයෙන් නොවිකපන්ටද; වැසිසළුව
වැසිසාරමස ඉටන්ටද ඉන්මතුවිකපන්ටද; නිසීදනසිවුර ඉටන්ටද
නොවිකපන්ටද පසතරණය ඉටන්ටද නොවිකපන්ටද කස්පිළි
සන ආබාධයතිබෙනතුරු ඉටන්ටද ඉන්මතුවිකපන්ටද; මුවපිස්
නාසිවුර ඉටන්ටද නොවිකපන්ටද; පරිෂ්කාරචොලය ඉටන්ටද
නොවිකපන්ටද; වදාළහෙයින් යටත්පිරිසෙයින් සුගත්අඟුලෙන්
අටඟුලක් දිගඇති සතරඟුලක් පළලඇති රෙදිකඩපවා ඉටාපරි
හරණ කළයුතුය:—මෙම නවචීවරය තහනම්කළ පඬුවන්මැටි
ආදිඅකැපපඬුහැර අනුදැනවදාළාවූ මුල්පඬුආදිසවැදෑරුම්පඬුවලින්
යම්කිසිවකින්පඬුපොවාම කබ්බිඳුතබාමඅධිෂ්ඨානකොටපරිභො
ගකළයුතුයි; පච්චත්ථරණ පරික්ඛාරචොලමුඛපුඤ්ජන යනතුණ පඬු
නොපෙව්වත් කබ්බිඳුනොතැබුවත්වටී:-මෙහි චීවරපරිහරණ ච
ධිවශයෙන් සූත්‍රතෙචීවරිකය විනය තෙචීවරිකය පරික්ඛාරචො
ලිකයයි භික්ෂූහු තුන්දෙනෙකි; ඉටාගත් තුන්සිවුරෙන් පමණක්
තෙචීවරිකාඞ්ගවශයෙන් සතුටුවනසුලුවූ ඉටීමට තරම්අත්කිසි සිවු

රක්ෂිටාපරිභොගනොකරණභික්ෂුතෙම සූත්‍රතෙච්චරිකනම්වේ:–මෙහියට දක්වූනවච්චරය ඒ ඒ නාමවලින්මෂිටා විධිපරිද්දෙන් පරිහරණකරණභික්ෂුතෙම විනයතෙච්චරිකනම්වේ:–සංඝාටිආදී නවච්චරයම "ඉමංපරික්ඛාරචොලං අධිට්ඨාමි" යි පරිෂ්කාරචොල වශයෙන් ඉටාපරිහරණකරණ භික්ෂුතෙම පරික්ඛාරචොලිකනම් වේ:—මොහු තුන්දෙන ක්‍රමයෙන් උත්කෘෂ්ට මධ්‍යම මෘදුකගුණ ඇත්තෝවෙති; මොවුන්ගෙන් පළමුවෙනි දෙවෙනි දෙදෙන පෙලෙගිම අහෙසින් ශික්ෂාකාමි විනයධරයෝ ගරුවශයෙන් සලකති; එහෙයින් බුද්ධප්‍රඥප්තිය ගරුකොටගෙණවසන බුද්ධශ්‍රාවකතෙමේ සූත්‍ර තෙච්චරිකහෝ විනයතෙච්චරිකහෝ වන්නේය—:මෙසේ අනුදැනවදාළාවූ පාත්‍රය හා සිවුර ශික්ෂාගෞරවයෙන් පරිහරණ කරණ භික්ෂුවගේම ප්‍රව්‍රජ්‍යාධම්මය සඵලවන්නේය; එහෙයින්සිහ.

(6) තස්සපාසාදිකං හොති පත්තචීවරධාරණං
පබ්බජ්ජාසඵලාතස්ස යස්සසීලං සුනිම්මලං—

භාවය: යම් භික්ෂුවකගේශිලය අතිශයින්නිර්මලද ඔහුගේ පාසිවුරුදැරීම දුටුවන් පහදවන්නේවේ; ඔහුගේ ප්‍රව්‍රජ්‍යාවද සඵල වේ යනුයි–:රියමැදුරට රෝදදෙකමෙන් ප්‍රව්‍රජ්‍යාධම්මයට පාසිවුරු දෙක වූවමනාමවේ; තනිරෝදයෙන් රථයාගේපැවැත්මක්නැති බවමෙන්ම පාත්‍රයනැතිව සිවුරදැරීමෙන්වත් සිවුරනැතිව පාත්‍රය දැරීමෙන්වත් ප්‍රව්‍රජ්‍යාධම්මයක් මේශාසනයෙහි නැත්තේමය; විරුගයපිණ්ඩ පවත්නාභික්ෂුවෙසය සරාගයපිණ්ඩ පෙරළාසිවුරෙන් පමණක්අලංකාරව වසනාභික්ෂූන්ගේශිලයදූෂ්‍යබවද ඔහුගේ ප්‍රව්‍රජ්‍යාව සඵලනොවනබවද යටකී ගාථාදේශනාවෙන් පැහැදිලිව පෙණේ:—තවද යම්සේ වොටුනුපලඳිනුකැමති රාජකුමාරයෙක්හට ඛඩ්ගඡත්‍රාදි පඤ්චරාජකකුධභාණ්ඩය අවශ්‍යයෙන් උවමනාවේද එමෙන් ශාසනාවතීර්ණ කුලදරුවන්ට පාත්‍රයහා තුන්සිවුරවූවමනාමවේ; එහෙයින් උපසම්පදාමාලකයෙහි "පත්තචීවරං ආචික්ඛිතබ්බං අයංතෙපත්තො අයංසඞ්ඝාටිඅයංඋත්තරාසඞ්ගො අයං අන්තරවාසකො ගච්ඡඅමුම්හි ඔකාසෙතිට්ඨාහි" යනුවෙන් පාසිවුරුවිචාරාම උපසම්පදා කරන්ටද අපසු දෙනතුරු ඉල්වාගත් පරපිළිබඳ පාත්‍රයෙන් යුක්තවූවහු උපසම්පදානොකටයුතුයයිද වදාළසේක:—තවද "සෙය්‍යථාපිමහාරාජ පක්ඛිසකුණො යෙනයෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති එවමෙවඛොමහාරාජ භික්ඛු සන්තුට්ඨොහොති කායපරිහාරිකෙනචීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන යෙනයෙනෙව පක්කමති සමාදායෙව පක්කමති" යනුවෙන් "මහරජ යම්සේ පක්ෂිතෙම යම් යම් තැනෙක්හි

ඉගිලීයාද; පක්ෂනබතුණ්ඩහාරයෙන්යුක්තවම ඉගිලීයාද; මහරජ
එමෙන්ම භික්ෂුතෙම කයින් පරිහරණකරණුලබන චීවරයෙන්
කුසින් පරිහරණකරණුලබන පිඬුයෙන් සතුටුවූයේ යම්යම්තැ
නැකයයිද අෂ්ටපරිෂ්කාරයගෙණමයයි" වදාළහෙයින් "යම්
සේ රජවරු කඩුවෙන් කෘත්‍යයක් ඇතිකල්හි කඩුවරුඉගෙණම
යෙද්ද එමෙන්පිඬු සිඟීමටසහ වැලඳීමටත් අනුදැනවදාළ පාත්‍රය
නැතිව ආහාරවේලාව පසුකරණපිණිස ලජ්ජිප්‍රියශීලී ශික්ෂාකාමී
බුඩපුත්‍රයෝ කිසිතැනකනොයති—[illegible] පාත්‍රයසොරාගැණීම්ආදී යම්
කිසිආපදාකාලයක තාවකාලිකවශයෙන් අනිකුඩුකැපභාජනය
කවලඳත්ව අවසරඇති ලෙශයෙන් නියමපාත්‍රයහැර ගියගිය
තන්හි නිත්‍යගිහිපරිභොගවූ පිඟාන්ආදියෙහි ගිහින්ලෙස ආහා
රඅනුභවකරමින් හැසිරෙන භික්ෂුප්‍රතිරූපකයෝ පාත්‍රයගැණ ප
ණවාවදාලාවූ දීනපතාපිරියවූතු බොහෝ ශික්ෂාපදයන් නොපුර
ණ නිතර අලජ්ජිව වසන අඩගදවැනි අභිප්‍රව්‍රජිතයන්බව සැක
හැරදතයුතුයි:—

(**2—2**) මෙහි දක්වනලද අටළිපරිකඛාරය "තිච්වරිනි පත්තො
දන්තකටඨවෙඡදනවාසී එකාසුචි කායබනඩනං පරිස්සාවනනති"
ණුවෙන් යටක් තුන්සිවුරය පාත්‍රය දැහැටි කපන වැහැය ඉදික
ටුව පටිය පෙරහණයයි දක්වනලදී:—මෙහි එක එක පරිෂ්කාර
ය කායපරිහාර කුච්ඡිපරිහාරවශයෙන් දෙයාකාරයකින් භික්ෂූන්ට
නිතරප්‍රයෝජනවෙයි; එහිවිස්තර සාමඤ්ඤඵලසූත්‍ර අටුවායෙන් අ
සාබලාදතයුතු:—එයින් දැහැටිදඬු කපාගැණීමාදියට නියමකලවැ
හැයවෙණුවට ලක්දිවවැසි භික්ෂූන් හිසරැවුල් කපාගැණීමට අනු
දැනවදාළ දැලිපිහිය පරිහරණකරති—එය එසේමනම් "**නහිකඛ
වෙ නහාපිතපුබ්බකෙන ඛුරභණ්ඩං පරිහරිතබ්බං**" යනාදිශික්ෂා
වෙන්, කරනැවැම්කුලයෙන් පැවිදිවූ භික්ෂූන්ට දැලිපිහිය කරගල
කරකොපුව ආදිසියලු ඛුරභාණ්ඩයතහනම්කළහෙයින් ඒභික්ෂූන්
ට අෂ්ටපරිෂ්කාරයක් නොලැබේ—: අටපිරිකර සච්කුලිකභික්ෂූන්
ටම අයිතිහෙයින් ඊටදැලිපිහිය අයිතියයි සිතීම ආගමවිරොධ ආ
චීණ් කිලුටක්වේ:—දැලිපිහියට, වාසි යනනාමයක්ද පාලිභාෂායෙ
හි අවිද්‍යමානයි; **දන්තකඨච්ජෙදනවාසි** ඛුද්දකවාසි යනනම්බ
ලින් දක්වනලද අටපිරිකරටඅයත් වැහැයනම් අටුවායෙහි
දක්වනලද දැහැටිදඬු උක්දඬු කසපැන්ආදි කණබොණදෙයහා
මකාසකුවිදඬු ඇඳපුටුපා· අවයවාදියද කපාකොටා සැසගැණීම්
ආදියට සෑහෙනගරුභාණ්ඩනොවණ යම්කිසිආයුධයෙකි—: ඒබව
"**වාසකාසචිඅකාරාසකතාවාසිතෙවව**" යනඅටුවායෙන් මනාව
ප්‍රකාශවේ; එයවනාහි සමහරපින්වතුන්ගේ මීතයෙන් දණ්ඩකශ
ස්ත්‍රයයිද එයමෙකල ව්‍යවහාරවන ලොකුදුනුපිහියයිද සලකාත්.

(3) "**අනුජානාමි භික්ඛවෙ ඡත්තං**" යනුවෙන් ප්‍රථමකොට කු
ඩයක් අනුදැනවදාළ හෙයින් එසමයෙහි භික්‍ෂූහු කුඩ හිසලා ග්‍රාමන
ගරාදියෙහි හැසුරුණාහුය-: ඉක්බිති උපාසකයෙකුගේ දොස්කීමව
සනුකොටගෙණ "නභික්ඛවෙ ඡත්තං ධාරෙතබ්බං යො ධාරෙය්‍ය
ආපත්ති දුක්කටස්ස" යනුවෙන් සියලුභික්‍ෂූන්ට කුඩ ඉසලීම තහනම්
කළසේක:—ඉක්බිති කුඩයක් නැතිව මගබැසයා නොහැකි ගි
ලන්භික්‍ෂුවක් අරබයා "අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස ඡත්තං"
යනුවෙන් ගිලන්භික්‍ෂූහට කුඩ ඉසලීමට අවසරදුන්සේක—: එසම
යෙහි නොගිලන්භික්‍ෂූහු "ගිලානස්සෙව භගවතා ඡත්තං අනු
ඤ්ඤාතං නො අගිලානස්සාති" යනුවෙන් "ගිලනාහටම බුදුන්වි
සින් කුඩ ඉසලන්ට අවසරදෙනලදී; නොගිලනාට අවසරනො
දෙනලදියි" ආරාම ආරාමඋපචාර දෙක්හිද අව්‍යවටවැස්සට කුඩ ඉ
සලන්ට සැකකළාහුය—: එකල්හි භාග්‍යවත්තෙමෙ "**අනුජානාමි
භික්ඛවෙ** අගිලානෙනපි භික්ඛුනා ආරාමෙ ආරාමූපචාරෙ ඡත්තං ධා
රෙතුං"යි යනුවෙන් ආරාම ආරාම උපචාරදෙක්හි පමණක් නොගි
ලන්භික්‍ෂූන්ට කුඩ හිසලන්ට අවසරදුන්සේක—: "සෙතච්ඡත්තං
කිලඤ්ජච්ඡත්තං පණ්ණච්ඡත්තන්ති තීනි ඡත්තානි අනුඤ්ඤාතානි"
යනු අට්ඨකථා හෙයින් සුදුරෙදිවලින් සාදනලද කුඩය; හුනපතු
රුවලින් සාදනලද කුඩය; තල්කොළ ආදියෙන් සාදනලද කුඩය;
යන තුණම එහි කැපකුඩයෝයි-"මණ්ඩලබද්ධං සලාකබද්ධං" යනු
සුත්තවිභඞ්ගපාලිහෙයින් එම කුඩ තුණම හකුලන්ට සුදුසුවූවාහු
මවෙති; යමෙකුගේවනාහි ශරීරදාහයක්හෝ පිත්කෝපයක්හෝ
ඇස්රෝගයක්හෝවේද; කුඩය නොඉසලීමෙන් අත්කිසිනිදානග
ත ආබාධයක්හෝ උපදීද ඕහට යටකී කුඩ තුණ හිසලන්ටවටී-: වෂී
සෘතුවෙහිවනාහි නිතරවැසිපවත්නාහෙයින් චීවරගොපනය පි
ණිස හිසලන්ටද; අරණ්‍යාදියෙහි චණ්ඩමෘගසොරභය ඇතිකල්හි
ආත්මගොපනය පිණිස අතින්ගෙණ යන්ටද වටී:-"අගිලානොස
වෙභික්ඛු ඡත්තං ධාරෙය්‍ය දුක්කටං" යනුකීහෙයින් ලොකස්වභාව
යෙන්පවත්නා අව්වැස්ස ගිලන්කම් නොවනහෙයින් යටකී ගි
ලන්කම්නැතිව ග්‍රාමාදියෙහි කුඩ ඉසලනභික්‍ෂූහු දුකුළාවට පැමිණී
මෙත් නිතර අලජ්ජීවෙති-: "**එකපණ්ණච්ඡත්තං පනසබ්බත්ථ
වට්ටති**" යන අට්ඨකථා පාඨය "එකපණ්ණච්ඡත්තන්ති තාලපණ්ණා
දිනා එකෙනපණ්ණෙන කතඡත්තං" යන **විමතිවිනොදනී** ටීකා
පාඨයෙන් එකතලපතින් සාදනලද්දක්බව විස්තරකළහෙයින්ද;
"එකපණ්ණච්ඡත්තං නාම තාලපණ්ණං" යන විනයගණ්ඨිපදහෙ
යින්ද; එකතල්කොළයෙන් සාදනලද කුඩය, ගිලන්නොගිලන්සි
යලුභික්‍ෂූන්ට ග්‍රාමනගරාදි සියලුතැනට හිසලන්ටවටී—: එය මෙකා
ලූ **ගොමුඅත්තයයි** ව්‍යවහාරකරණුලැබේ:—"තළ්ජාතදණ්ඩන්

කත ගති තාලපණ්ණං සහදණ්ඩකෙනඡින්දිත්වා තමෙවඡත්තදණ්ඩං
කරොන්ති ගොපාලකාදයොපිය''යනුවෙන් එහි උපත්දණ්ඩත්ක
රණලද එවකටපැවති ගොපල්ලන්ගේ කුඩය මෙන් ඒකපණ්ණච්ඡත්‍ර
යයි විනයාලංකාරකත්‍රීවිසින්කියනලදහෙයින් * සමහරපිත්වත්
හුළුයින්මම්ටනැතිහෙයින් ගොටුඅත්ත ඒකපණ්ණච්ඡත්‍රය නොවේ
යයිකියති; යටකීටීකාගැටපද පාඨවලින් ඡත්‍රම්ටගැණයම්ක් නො
කීහෙයින්ද,පසුවකීපාඨයෙන්"ගොපාලකාදයොපිය'' යනුදෘෂ්ටා
න්තකොට ටීකාකළකාලයෙහිගොපල්ලන්අතර පැවතිසිරිත දක්වා
කීපමණක්මිනා එයනියමයක්නොවන්හෙයින්ද, ඒපිත්වතුන්ගේඑ
ම කියමනමනිමාත්‍රයි—:ගොටුඅත්ත වනානි බුදුන්විසින් තහනම්
නොකළහෙයින්ද තහනම්කළාවූ පළවණ්නූල්වලින්මැසීම්ආදි
සයාකාරයෙන් ඒකකුත්එහි නැතිහෙයින්ද; "එවං පාළිච අට්ඨ
කථඤ්ච අනුපෙක්ඛිත්වා අඤ්ඤානිපි කප්පියාකප්පියානි වෙදිත
බ්බානි" දක්වූහෙයින්ද; ගොටුඅත්ත එයින්ම ම්ටනැතත් ගැම
ලෙසින්ම කැපයටඅනුලොම්ශ්‍රමණ පරිෂ්කාරයක්බව මනාව ප්‍ර
කාසවේ—:තහනම්කළ ගිහි පරිභොග පටකුඩආදීසංග්‍රාමාදියෙහි
නිතර හිසලන භික්ෂූන් අලජ්ජීබව දතයුතුයි:—

(4) "න භික්ඛවෙ සඋපාහනෙන ගාමොපවිසිතබ්බො" යනාදි
ය වදාළහෙයින් වහන්පයලාගිම් වදිනභික්ෂුහට දුකුළාවේ—:"අ
නුජානාමිභික්ඛවෙ ගිලානෙනභික්ඛුනා ස උපාහනෙන ගාමංප
විසිතුං"යි වදාළහෙයින් යම්බඳුපාදාබාධයකින් වහන්නැතිව ග
මටයානොහැකිවේද එබඳුබලවත් ගිලනාවිසින් වහන්සහිතවයා
යුතුයි—:"අනුජානාමිභික්ඛවෙ අජ්ඣාරාමෙ උපාහනංධාරෙතුං"
යනුවදාළහෙයින් ආරාමයතුළ නොගිලනාහට සෙනාසනාදීන්‍ය
යවලක්වනුසඳහා වහන්පයලන්ටවටී—:"අනුජානාමිභික්ඛවෙ
ඒකපලාසිකං උපාහනං" යනුවදාළහෙයින්ද–"ඒකපටලාපන ප
රිභුත්තාවාහොතු අපරිභුත්තාවාසබ්බත්ථවට්ටති" යනු අටුවාහෙ
යින්ද–පරිභොගකරණලදහෝ නොකරණලදහෝ එක්සම්ප
ටින් සාදනලද්ද හැමතැනටමවටී ගෙහද එකපණ්ණච්ඡත්‍රයමෙ
නි, ගෘහස්ථයන්මෙන් වහන්පයලා ග්‍රාමනගරවල හැසිරෙන
භික්ෂූන් අලජ්ජීබව දතයුතුයි.

(5) "න භික්ඛවෙ යානෙනයායිතබ්බො–අනුජානාමිභික්ඛවෙ ගි

---

* එබඳු කුඩයක්ගත් අත්ඇති නොගිලනාටත් බණ නොකිය
යුතුබව දක්වන පිණිස සාරාර්ථදීපනියෙහි කියනලද එම පාඨය
ඛුද්දකවත්ථුක්ඛන්ධක අටුවාහි කියනලද "ඒකපණ්ණච්ඡත්තංප
නාසබ්බත්ථවට්ටති" යන්නට සම්බන්ධකරකිම්මට විනයාලංකාරක
ටත් ඇති යුක්තිය කුමක්දැයි සෙවියයුතුව තිබේ.

ලානස්සයානං" යනු වදාළහෙයින් යානා නැඟයන නොගිලන්භි
ක්‍ෂූනටද දුකුළාවේ–"කවරයානාවක්කැපද? කවරක් අකැපද" යි ක
ථාඋපන්කල්හි "අනුජානාමිභික්ඛවෙ පුරිසයුත්තං හත්ථවට්ටකං–
අනුජානාමිභික්ඛවෙ සිවිකංපාටංකින්ති" යනු වදාළහෙයින් පිරි
මින්වයන් යොදනලදයානාද; පුරුෂයන් විසින් ඇදගෙණයනයා
නාද; එසේම උසුලාගෙණයන සිවිගෙයද; පල්ලක්කිදවටි–:මෙ
හිද හිසරුජාආදි ස්වල්පාබාධයක් ඇත්තෙක් නොව පාදබීලාබා
ධාදි යම්කිසි බලවත් ආබාධයක් ඇතිහෙයින් යානාවක් නැතිව
යානොහැකි භික්‍ෂූනුම ගිලනාබව දතයුතුයි—:ගෘහස්ථයන්මෙන්
නිතරයානානැග ග්‍රාමනගරවල හැසිරෙන භික්‍ෂූනු අලජ්ජිවෙති.

(6) "නභික්ඛවෙදීඝා නඛාධාරෙතබ්බා" යනාදියවදාළහෙයින්
දික්නියපොතු දරණභික්‍ෂූහට දුකුළාවේ—:"නාභික්ඛවෙ වීසති
මට්ඨංකාරාපෙතබ්බං" යනාදිය වදාළහෙයින් නියපොතුකුරුවුගෑ
ම නියමල්ඇදීම්ආදිය කරණ භික්‍ෂූහටදුකුළාවේ–:අනුජානාමිභි
ක්ඛවෙ මලමත්තං අපකඩ්ඪිතුං"යි වදාළහෙයින් නියපොතුඅත
රකුණුපමණයිපහකළයුතුයි—. නියපොතුකැපූතැනකොරස ග
නියනැතිවනපිණිස මට්ඨත්කරත්ට අවසරදුන්සේක.

(7) "න භික්ඛවෙ ඵලිතංගාහාපෙතබ්බං" යනාදිය වදාළහෙයින්
පැසුනුහිසකේආදිය උදුල්වත්නාහට දුකුළාවේ–:බැමූදාඩිකා නා
සිකාආදියෙහි භයජනකව උසවනැගි රොමාදිය උගුල්ලත්ටවටි.

(8) "න භික්ඛවෙ සම්බාධෙලොමං සංහරාපෙතබ්බං" යනු වදා
ළහෙයින් කොෂකිසිලි ආදි හිරිකුප්පන ස්ථානයන්හි ලොම්ක
පන්නාහට දුකුළාවේ—:ආබාධයක්පිණිස වටී.

(9) "න භික්ඛවෙ දීඝංදන්තකට්ඨං ඛාදිතබ්බං" යනාදිය වදාළ
හෙයින් මිනිසුන්ගේ ප්‍රමාණඅගලින් අටඟුලකට වැඩිවූද සතරඟු
ලකට අඩුවූද දැහැටි වලදන භික්‍ෂූහට දුකුළාවේ—: අරුණට පළ
මුවහා දවල් දත්වලදා දැහැටි නොවලඳන භික්‍ෂූහටද මුඛසත්ති
යි වශයෙන් පචිති ආදිඇවැත්වෙති:—

(10) "න භික්ඛවෙ ලොකායතං පරියාපුණිතබ්බං" යනාදිය වදා
ළහෙයින් නිරර්ථකකරුණුවලින් යුක්තනිරර්ථක ශාස්ත්‍රහාතිරශ්චීන
විද්‍යාඉගෙණගන්නා භික්‍ෂූහටද උගන්වන භික්‍ෂූහටද දුකුළාවේ:–

(11) "න භික්ඛවෙ ලසුනංඛාදිතබ්බං"යනාදිය වදාළහෙයින් ලූ
නු කන භික්‍ෂූහට දුකුළාවේ–:ආබාධයපිණිසද ව්‍යඤ්ජනමිශ්‍රකල්
හිදවටී:–

(12) "න භික්ඛවෙ අධොතෙහි පාදෙහි සෙනාසනං අක්කමි
තබ්බං"යනාදියවදාළහෙයින් සුණුපිරියම්කළ භූමියද; ඇඳපුටුආදි

යද; ධූලිසහිත පසින්හෝ සේදූකල්හි දියසහිතවූ පසින්හෝ ව ගන් සහිත පයින්හෝ පාගන්නාහට දුකුලාවේ:-

(13) " න භික්ඛවෙ පරිකම්මකතාය භූමියා නුච්ඡිගිතබ්බං'' යනාදිය වදාලහෙයින් සුණුපිරියම් ආදිය කළ භූමියෙන් කෙලගසන් නාහට දුකුලාවේ-:

(14) ''න භික්ඛවෙ පරිකම්මකතා භිත්ති අඑසෙසතබ්බා'' යනාදිය වදාලහෙයින් සුණුපිරියම්ආදියකළ භිත්ති හා දොර, කවුළු, ගල්, මැම්, වෘක්‍ෂාදිය හේත්තුවීමෙන් සපශිකරන්නාහට දුකුලාවේ:—

(15) ''අනුජානාමි භික්ඛවෙ පච්චත්ථරිකං නිපජ්ජිතුං'' යනාදිය වදාලහෙයින් සඟසතුඇඳපුටුආදිය තමන්සන්තක පසතුරුණු සිවුර අතුට හින්දයුතුයි; ඉදින් ඇඟතැවරේනම් ලෝම්හ ණනින් දුෂ්කෘතාපත්තිවෙති:— •

(16) ''දසඉමෙ භික්ඛවෙ අවන්දියා'' යනාදිය වදාලහෙයින් බාල උපසම්පන්න, අනුපසම්පන්න, නානාසංවාසක වැඩිමහලු අධර්ම වාදී, මාගම, පණ්ඩක, පාරිවාසික, මූලායපටිකස්සනාරහ, මානත්තාරහ, මානත්තචාරික, අබ්භානාරහ, යන දසදෙනාද; නග්නයා හා මාතුකාතකාදී එකොළොස් අනවන්‍යපුද්ගලයෝද; යනදෙවිසිදෙන නොවැන්දයුත්තෝය-:වැඩිමහළු උපසම්පන්න, නානා සංවාසකධම්මවාදීවෘද්ධ,තථාගත,යනතුන්දෙනා වැන්දයුත්තෝය-:භත්තාග්‍ර, යාගුපානාදි තෙලෙස්තැනක වැඳීම තහනම්කළ ශේක-මෙකී නොවැන්දයුත්තන්ටහා නොවැන්දයුතුතන්හිද ව ඳිනා වැන්දයුත්තන්ටද නොවඳිනා භික්‍ෂුහට දුකුලාවේ:-

(17) ''න භික්ඛවෙ නහායමානෙන රුක්ඛෙ කායො උපඝංසෙතබ්බො'' යනාදිය වදාලහෙයින් සනානයකරන්නහුවිසින් වෘක්‍ෂ වැම්ආදියෙහි කය නොඉලියයුතුයි; එසේකරන්නාහට දුකුලාවේ- එකිනෙකා විසින්ද කයින් කය නොඉලියයුතුයි; ඌඩ්වකයවසන ජලසාටිකාකොණෙන් හා අතින්ද කය ඉලියයුතුයි:—

(18) ''න භික්ඛවෙ මල්ලිකා ධාරෙතබ්බා'' න පාමඞ්ගාධාරෙතබ්බා-නකණ්ණසුත්තකංධාරෙතබ්බං-න කටිසුත්තං ධාරෙතබ්බං-න ඔවට්ටංධාරෙතබ්බං'' යනාදිය වදාලහෙයින්-කණ්ණාභරණද, පලඹනුයද, ග්‍රීවාභරණද, නූල්පටක්පමණ කටිපලඳනාද, අත්පා වලලුද, අඟුලපලඳනාද, හස්තාභරණද, මුදුආදී ඇඟිලිපලඳනාද, දරන්නාහට දුකුලාවේ:—

(19) ''න භික්ඛවෙ දීඝාකෙසාධාරෙතබ්බා'' යනාදිය වදාලහෙයින් දෙයඟුලකට වඩා දික්හිසකේ ඇතිභික්‍ෂුහටද; ආබාධයක් නැතිව කතුරෙන් හිසකේ කපන්නාහටද; අලඞ්කාර පිණිස කොස්සෙන්, පනාවෙන්, ඉටිතෙලින්, වතුරෙන් මොලොක්

කොට හිසකෙස් සමකරන්නාහටද; දුකුළාවේ—:ඌර්ධ්වකෙස් ඇති අයවිසින්ද, උෂ්ණයෙන් තැවුණුඩහදිය බුලිසනිත හිස ඇත්තාවිසින්ද තෙත්අතින් සමකරන්ටවටී:—

(20) "**න භික්ඛවෙ ආදාසෙවා උදපත්තෙවා මුඛනිමිත්තං ඔලොකෙතබ්බං**" යනාදියවදාළහෙයින් ආබාධයක්නැතිව කැඩපතෙන්ද; ජලභාජනයෙන්ද මුහුනබලන භික්ෂුහට දුකුළාවේ–:ජරාදශීනයටවටී—:එදවස උපන් මාගමගේ පවා සත්‍රිසණ්ඨානයද; පිණ්ඩපාත දෙන්නහුගේ මුහුනද බලත්නාහට දුකුළාවේ:—

(21) "**නභික්ඛවෙ මුඛං ආලිම්පිතබ්බං–න මුඛංමද්දිතබ්බං–න මුඛංචුණ්ණෙතබ්බං**" යනාදිය වදාළහෙයින් ආබාධයක්නැත්තහු විසින් ජවිරාගාදියපිණිස මුඛාලෙපය; මුඛමද්දනය හෙවත් දත්මැදිම; මුවසුණුගැල්වීම; මුඛරජනය; හස්තපාදාදි ශරීරාවයවරජනය නොකටයුතු—:ඒ සියල්ලකිරීමෙහි දුකුළාවේ:—

(22) **න භික්ඛවෙ උච්චාසයන මහාසයනානි ධාරෙතබ්බානි**"යි යනාදිය වදාළහෙයින් පුලුත්ගුදිරි කොට්ටවල හිඳිනා සැතපෙන භික්ෂුහට දුකුළාවේ:—මෙහි විස්තර මත්තෙහි දක්නා ලැබේ.

(23) "**න භික්ඛවෙ නච්චංවා ගීතංවා වාදිතංවා දස්සනාය ගන්තබ්බං**" යනාදිය වදාළහෙයින්මනුෂ්‍ය, හස්ති, අස්ස, ගො, මහිෂ, සුනඛ, නෘත්‍යද; යටත්පිරිසෙයින් කුක්කුට මයූරාදීන්ගේ නෘත්‍යද; දක්නාපිණිස පියවරකුදුයන භික්ෂුහටද; නටන්නාවූ නටවන්නාවූ භික්ෂුහටද; දුකුළාවේ:-ගීතයෙහි නෘත්‍යකාරාදීන්ගේ ගීතයද අනිත්‍යතා ප්‍රතිසංයුක්ත සාධුගීතයද; දම්දෙසනකල්හි සාධුකාරදීම් සංඛ්‍යාතධම්ම ගීතයද–යටත්පිරිසෙයින් දන්තගීතයද කරණකරවන භික්ෂුහට දුකුළාවේ––:ගීතස්වරයෙන් ධම්මයකියන්ටද නොවටී–:"රත්නත්‍රය පිදීම්පිණිස නෘත්‍යගීතාදියකරන්ටද? කරවන්ටදැයි" විචාළකල්හි එය පිළිගන්ටද; සාධුකාරතවා දෙවන්ටද නොවටී–:එසේ විචාළකල්හි "රත්නත්‍රය පූජාලැබියයුත්තකි" යනාඛ්‍යපමණක් කියන්ටවටී:––වාද්‍යයෙහි ශෞරීරවීණාවාද්‍යද, උදකභෙරිවාද්‍යද, නොවටී–වාද්‍යකරන්නාවූද, කරවන්නාවූද, භික්ෂුහට දුකුළාවේ:—නෘත්‍යාදිසියල්ල ආරාමාදියෙහි හුත්තැනසිට ශබ්දශ්‍රාමාශාවෙන් තොරවදක්නාට අනාපත්තියි; ඒපිණිස අඩියකුදු යන්ටනොවටී–: වීථියෙහිසිට තමන් පිටිපසකරණ නෘත්‍යය ග්‍රීවයපෙරළා බලත්නාහටද දුකුළාවේ:—

(24) "**න භික්ඛවෙ අප්පටිවෙක්ඛිත්වා මංසංපරිභුඤ්ජිතබ්බං—න උද්දිස්සකතං**" යනාදිය වදාළහෙයින් පරීක්ෂානොකරණලද්දහෝ උද්දෙසාකරණලදහෝ මස් අනුභවකිරීමෙන් දුකුළා

වේ:—"අනුජානාමිභික්ඛවෙ තිකොටිකපරිසුද්ධංමංසං" යනාදිය වදාළහෙයින් තමන්නිසා කරණලද්දකැයි, නුදුටු නොඇසූ සැක හෝ නූපන් මස්වළඳන්ට වටී-[a]-

(25.) "**අනුජානාමි**භික්ඛවෙ උග්ගහිතපටිග්ගහීතං"යි වදාළ හෙයින් පිළිනොගෙණ ගත්දෙය අනික් භික්‍ෂුවක්හට පිළිගන්වා නැවත ඒ භික්‍ෂුව අතින් ගෙණ වළඳන්ටවටී-: එසේනොකොට තෙමේම නැවත පිළිගෙණ වැලඳීමෙන් දුකුළාවේ—:(26) "**න භික්ඛවෙ එකභාජනෙ භුඤ්ජිතබ්බං**" යනාදිය වදාළහෙයින් එකභාජනයෙහි වළඳන භික්‍ෂූන්ට දුකුළාවේ—: (27) "**න භික්ඛවෙ** එකමඤ්චෙතුවට්ටිතබ්බං" යනාදිය වදාළහෙයින් එකඇඳෙහි සයනයකරණ භික්‍ෂූන්ටද; එකඅස්තරණය එක පොරෝනයඇතිව සයනයකරණ භික්‍ෂූන්ටද; දුකුළාවේ-: මැදච්චරාදියකින් වෙන්කොටගෙණ සයනයකරන්ට වටී—:(28) "**න භික්ඛවෙ** නාභාපිතපුබ්බ කෙන බුරභණ්ඩං පරිහරිතබ්බං" යනාදිය වදාළ හෙයින් කරනැවැමිකුලයෙන් පැවිදිවූවන් විසින් දැළිපිහිය කරගල කරකොප්පුව එය දවටනරෙදිකඩ යන සියලු බුරභාණ්ඩය නොදැරියයුතුයි; දරානම් දුකුළාවේ-: ඕහට අනුන්සන්තක දැළිපිහියෙන් හිස රැවුල් හරවාගන්ට වටී—: (29) "**නභික්ඛවෙ** රුක්ඛො අභිරුහිතබ්බො" යනාදිය වදාළහෙයින් ගස්නගිණ භික්‍ෂුහට දුකුළාවේ-: චණ්ඩහත්ථිකාදීන්ගේ ලුහුබැඳීම් ආදී කෘත්‍යයක් ඇතිකල්හි පුරුෂ ප්‍රමාණයක් නගින්ට වටී; මම්මුළාවීම්ආදී ආපදාවක් ඇතිකල්හි මගබලනුපිණිස රිසිසේ නගින්ටවටී-: (30) "**න භික්ඛවෙ බුද්ධවචනං** ඡන්දසොආරො පෙතබ්බං" යනාදිය වදාළ හෙයින් වේදශ්‍ලෝමෙන් බුද්ධවචනය සංස්කෘත භාෂාවෙන් වාචනාමාගීතයට නගන්ට නොවටී; නැගීමෙන් දුකුළාවේ—: (31) "**න භික්ඛවෙ පටිභාණචිත්තකං කාරෙතබ්බං**" යනාදිය වදාළහෙයින් ස්ත්‍රීපුරුෂ තිරශ්චීනරූප සිතියම්ද; යටත්පිරිසෙයින් ගැඩවිලිරූපයකුදු සිතියම් කරණ භික්‍ෂුහට දුකුළාවේ-: ලී ආදියකින් රූප කපන්නාටද; "උපාසකය දොරටුපාල රූපයක්කරව"යි කියන සි

---

[a] "හැමලෙසින්ම මාංසරසභොජනය තහනම්කර වදාළසේක් නම් මනාය"යි මෙකල සමහරුන්ගේ මතයකි; එසේකළසේක් නම් පරඅයත් දිවිපැවතුම්ඇති ගෙපිළිවෙළින්සිඟා ජීවත්වන භික්‍ෂූන්ට මාංසරස අමිශ්‍ර ආහාර නොලැබෙනහෙයින් ජීවත්විය නොහැකිවේ:—එහෙයින් මෙයදැක වදාළාවූ දිඝීදර්ශීබුදුන්විසින් නිරවද්‍ය මාංසරස භොජනය අනුදන්නාලද බව දතයුතුයි-විමතිවිනොදනීනම් විනය අනුටීකා බලනු:—

ක්‍ෂුවටද; දුකුළාවේ—: රත්නත්‍රයෙහි ප්‍රසාදජනක සිතියම් කර
වන්ටද මාලාකම්මාදි ධම්මසිතියම් කරන්ටදවටී—: (32) "නභි
ක්ඛවෙ විප්පකතෙ භොජනෙභික්ඛූවුට්ඨාපෙතබ්බා" යනාදිය
වදාළහෙයින් වළඳන්ට පටන්ගත් භික්ෂූන් නැගුටුවන්නාහට දුකු
ළාවේ—: (33) "අනුජානාමි භික්ඛවෙ තිවස්සන්තරෙන සහ නි
සීදිතුං" යනු වදාළහෙයින් දෙවෂියකින් අඩුවූහෝ වැඩිවූහෝ
භික්ෂුව සමග එක ඇඳ පුටුවෙක්හි ඉන්ටවටී; ඇඳපුටුවෙක්හි එක
ඉරියව්වෙන් හිඳිනා දෙනමගෙපටන් වැඩිභික්ෂූන්ට දුකුළාවේ—:
තුන්දෙනෙකුගේ පටන් ඉන්ටගැකි දීඝාසනයෙහි මාගම, පණ්ඩ
ක, උභතොබ්‍යඤ්ජනකයන් හැර සියල්ලන්හට ඉන්ටවටී—: (34)
"නභික්ඛවෙ අත්තානං පාතෙතබ්බං" යනාදිය වදාළහෙයින් අ
හරසිඳීම්ආදී යම්කිසි උපක්‍රමයකින් මැරෙන්ට නොවටී—: තමන්
මැරීමෙහිද; ශරීරාවයවකපා කොටාගැණීමෙහිද දුෂ්කෘතවේ; උ
පන්සංවේගයෙන් "අහරසෙවීමත් ප්‍රමාදයයි" සළකාණ භික්ෂුහට
අහරසිඳීමෙන් අනාපත්තියි—: (35) "නභික්ඛවෙ දවාය සිලාපවි
ජ්ඣිතබ්බා" යනාදිය වදාළහෙයින් ක්‍රීඩාභිප්‍රායයෙන් ගල් ලී දඬු
ආදිය පෙරලන්නාහට දුකුළාවේ—: චෛත්‍යකම්මාදිය පිණිස
වටී—: (36) "නභික්ඛවෙ දායො ආලිම්පෙතබ්බො" යනාදිය වදා
ළහෙයින් ක්‍රීඩාපිණිස වනයෙහි ගිනිලන්නාහට දුකුළාවේ—: ස
තුන් නසනපිණිස ගිනිලන්නාහට පාරාජිකා, තුලසී, පචිති, වේ;
ලී දවනපිණිස ගිනිලන්නාහට වටිනාපරිද්දෙන් පාරාජිකාදිය
වේ—: (37) "අනුජානාමි භික්ඛවෙ දවාපතිසල්ලීයනෙනන මා
රං සංවරිත්වාපති සල්ලීසිතුං" යනුවදාළහෙයින් දහවල් දොරගැ
ර නිදන භික්ෂුහට දුකුළාවේ—: "දොර ආරක්ෂාකරව"යි උපාසකා
දී යමෙකුට නියමකොට නිදන්ටවටී—: (38) "නභික්ඛවෙ තදහු
පොසථෙ ස භික්ඛුකාආවාසා අභික්ඛුකො ආවාසොගන්තබ්බො"
යනාදිය වදාළහෙයින් එ දවස පොහෝදින ආරාමය ඉක්මවා සං
ඝයානැතිව අන්තරායනැතිව යන භික්ෂුහටද; පොහොය නොක
රණ භික්ෂුහටද; දුකුළාවේ—: (39) "නභික්ඛවෙ වස්සං උපගන්තබ්
බං" යනාදිය වදාළහෙයින් වස්නොඑළඹෙන භික්ෂුහට දුකුළා
වේ—: (40) "නභික්ඛවෙථෙරෙසු භික්ඛුසු උක්කුටිකං නිසින්නෙසු ප
වාරයමානෙසු ආසනෙ අච්ඡිතබ්බං" යනාදිය වදාළහෙයින් සව්
රභික්ෂූන් පවාරණ කරමින් උත්කුටුකයෙන් හුන්කල්හි එසේනො
හිඳ අසුන්හි හිඳින නවකභික්ෂූන්ට දුකුළාවේ—: (41) "අනුජානාමි
භික්ඛවෙ චතස්සො කප්පියභූමියො උස්සාවනන්තිකං, ගොනිසාදි
කං, ගහපතිං සම්මුතියන්ති" යනාදිය වදාළහෙයින් අකැපකිළි
යෙහි තබනලද එහි පිසනලද යාවකාලික යාමකාලිකය අනුභ
වකිරීමෙන් දුකුළාවේ—: (42) "නභික්ඛවෙ පබ්බජිතෙ අකප්පි

යෙ සමාදපෙතබ්බං"යනාදිය වදාළහෙයින් සාමණෙරාදීන් අකැ
පදෙයෙහි යොදවන භික්ෂුහට දුකුලාවේ—: (43)"නභික්ඛවෙ අ
හෙජ්ජකායෙපංසුකූලංගහෙතබ්බං"යනාදියවදාළහෙයින්නො
බිඳුනුකයෙන් පාංශුකූලගන්නාහට දුකුලාවේ—: (44) "අනුජා
නාමි භිකඛවෙ පඤ්චඞ්ග සමන්නාගතසස විස්සාසං ගහෙතුං"
යනු වදාළහෙයින් සංදිට්ඨ, සංභත්ත, ආලපිත, ජීවතිච, ජානනක
යන පඤ්චඞ්ගයෙන් යුත් අයගේ විශ්වාසග්‍රහණය ගත්ටවටී-යංතම්
විශ්වාසය ඇත්තනුගෙන් ගැණීමෙහි දුකුලාවේ—: (45) "න
භික්ඛවෙ සද්ධාදෙය්‍යං විනිපාතෙතබ්බං" යනාදිය වදාළහෙ
යින් ශ්‍රද්ධාවෙන් දුන්දෙය මව්පියන් හැර සෙසු නෑයන්ට දෙන
භික්ෂුහට දුකුලාවේ—: (46) "සචෙඋපජ්ඣායො හොති උපජ්ඣා
යෙන යාවජීවං උපට්ඨාතබ්බො" යනාදිය වදාළහෙයින් උපාධ්‍යා
ය ආචාර්‍ය්‍යාදීන් ඇතිගිලන්භික්ෂුහට ඒඒ අය විසින්ද; එසේ කිසි
වෙක්නැති ගිලන්භික්ෂුහට සංඝයාවිසින්හෝ සංඝසම්මතයලද
භික්ෂුවක්විසින් හෝ, උපස්ථාන කළයුතුයි—නොකරණ සංඝ ග
ණ පුද්ගලයාහට දුකුලාවේ—: (47) "ඉධපන භික්ඛවෙ වස්සංවු
ත්ථොභිකඛු අනුප්පන්නෙ චීවරෙපක්කමති සනෙතාවිබ්භිරුපෙගාහ
කෙදාතබ්බං" යනාදිය වදාළහෙයින් වස්වැස බැහැරගිය භික්ෂුව
ගේද; උම්මත්තකාදි විකාරයකටපත්වූ භික්ෂුවගේද; වස්සාවාසි
ක චීවරය (ඒ භික්ෂුහට දෙනුපිණිස) පිළිගණුකැමති සුදුස්සෙ
කුට දියයුතුයි—ඔහු භික්ෂු භාවයෙන් ඉවත්ව ගියකල්හි සාංඝික
වෙයි—: (48) "අනුජානාමි භිකඛවෙ ගිලානසසගුළං අගිලාන
සසඋදකං" යනු වදාළහෙයින් විකාලයෙහි සකුරුකාණනො
ගිලනාට දුකුලාවේ-පිපාසාදිය ඇතිකල්හි ජලයමිශ්‍රකොට පාන
යකරන්ට වටී—: (49) "න භික්ඛවෙ නග්ගියං තිත්ථිය සමාදාතං
සමාදිතබ්බං යොසමාදියෙය්‍ය ආපත්තිථුල්ලච්චයසස" යනු වදාළ
හෙයින් නිඝණ්ඨකව්‍රත සමාදන් භික්ෂුහට තුලසිවේ—: (50) "පා
දෙධොවන්තෙන එකෙනහත්ථෙන උදකං ආසිඤ්චිතබ්බං එකෙන
හත්ථෙනපාදා ධොවිතබ්බා" යනාදිය වදාළහෙයින් පයින්පයග
වා පාසෝදන භික්ෂුහට දුකුලාවේ--දරුබණ්ඩාදි යමක පයගවා
සෝදන්ට වටී—: (51) "නභික්ඛවෙ වච්චංකත්වාසති උදකෙ නා
චමෙතබ්බං" යනාදිය වදාළහෙයින් වචීස්කොට වතුරඇතික
ල නොසෝදන භික්ෂුහට දුකුලාවේ—: (52) "නදන්තකට්ඨං
ඛාදන්තෙන වච්චොකාතබ්බො" යනාදිය වදාළහෙයින් වචීස්ක
රමින් දැහැටිකණ භික්ෂුහට දුකුලාවේ—: (53) "ආචරියෙන භික්
ඛවෙ අනෙතවාසිකො සඞ්ගහෙතබ්බො" යනාදිය වදාළහෙයින්
අතවැස්සන්ට සේරිචාරීව හැසිරීමට ඉඩනබා ක්‍රියාකරණ ආචා
ය්‍යයෝ සාතිසාරයෝ හෙවත් වරදකාරයෝවෙති—: (54) "න

ආචරියස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා" යනු වදාළහෙයින් ආචාර්‍ය්‍යයන් කථාකරණකල්හි අතරතුර කථාකරණ ශිෂ්‍ය භික්ෂුහට දුකුළාවේ—"මෙසේ කථාකිරීමෙන් ඇවතට පැමිණේය"යි සිතෙනකල්හි එය කථාකොට වළක්වන්ට වටී—: (55) "අනුජානාමි භික්ඛවෙ භත්තග්ගෙ අනුමොදිතුං" යනාදිය වදාළහෙයින් දන්වළඳා ඉක්බිති දායකයන්ට අනුමෙවෙනි බණ වදාළයුතුයි-භික්ෂු සම්මතයෙන් හෝ දායකයන්ගේ ආරාධනාවෙන් හෝ අනුමොදනාවට නැවතුනු භික්ෂුහට පෙරපසු සතරනමක් නැවතියයුතුහ-එයින් අනුමොදකයාගේ අවසර නැතිව යන භික්ෂුහට දුකුළාවේ—: (56) "න භික්ඛවෙ සම්බාධස්ස සාමන්තා ද්වඞ්ගුලා සත්ථකම්මං වා වත්ථිකම්මං වා කාරාපෙතබ්බං" යනාදිය වදාළහෙයින් මලමාගී මූත්‍රමාගීයන්හි හෝ හාත්පස දෙඅඟුලක් තැන හෝ ශස්ත්‍රකර්ම්ම වස්තිකර්ම්ම කරවණ භික්ෂුහට තුලස්වේ—: (57) "න භික්ඛවෙ රත්තචිත්තෙන අඞ්ගජාතං ඡුපිතබ්බං" යනාදිය වදාළහෙයින් රාගසිතින් අඞ්ගජාතය ස්පර්ශකරණ භික්ෂුහට තුලස්වේ-: රාගචිත්තයෙන් අනුපසම්පන්නයන් ස්පර්ශකරන්නාහට දුෂ්කෘතවේ—: (58) "විනාධානං වජන්තස්ස දුක්කටං පරිසාවනං, යාචමානස්ස පදානෙ, අදදන්තස්ස දුක්කටං" යනුකී හෙයින් දෙගව්වක්පමණ දුර පෙරහන නැතිව යන භික්ෂුහටද දීඝමාගීයෙහි පෙරහන ඉල්වන්නාහට නොදෙන භික්ෂුහටද දුකුළාවේ-: පෙරහන නැතිනම් සඟලසිවුර පිළිගෙණ එයින් කොණක් පෙරහනවෙනුවට සිතාගෙණ යායුතුයි—: (59) "බුද්ධංධම්මං සඞ්ඝං ච, ආරබ්භ කරණෙදවං, දුක්කටං පරිසාවාපි, අඤ්ඤස්ස උපලාලනෙ" යනු කීහෙයින් රත්නත්‍රය අරබයා ක්‍රීඩාකිරීමෙන්ද; අන්‍ය භික්ෂුවකගේ ශිෂ්‍යසාමණේරාදීන්ට පාත්‍රාදිය දීමෙන්ද දුකුළාවේ—: (60) "වඩ්ඪිං පයොජයෙ ඤාතෙ, ඤාතික පවාරිතෙ, අත්තනො පරිභොගත්ථං, දින්නමඤ්ඤස්ස නොදදෙ" යනු කී හෙයින් පොලීකරන්නාහටද; නෑ නොපැවරූවන්ගෙන් (චීවරාදිය) ඉල්වන්නාහටද; තමන්ට පරිභොගයපිණිස නියමකොට දුන්දෙය පරිභොගනොකොට අන්කිසිවෙකුට දෙන්නාහටද; දුකුළාවේ—: (61) "උද්දිස්සයාචනෙ රක්ඛං, ඤත්වා ඤත්වා වදණ්ඩනං, ගීවා සස්ස දණ්ඩෙත දණ්ඩා, සයං දණ්ඩාපනෙපන, දණ්ඩස්ස අග්ඝභෙදෙන, ඤෙය්‍යා පාරාජිකාදිකා" යනු කීහෙයින් දඬගැසීමදැනහෝ නොදැනහෝ "අපගේ විහාරයෙහි අසවලාවිසින්ද අසවලාවිසින්ද පාත්‍රචීවර සොරාගෙණියාම් ආදි මෙනම් මෙනම් දෙයකළාහුය-කරන්නාහුය"යි විනිශ්චයකාරයන්ගෙන් උදෙසා ආරක්ෂාව ඉල්වීමෙහි ඒසොරුන්ට දඬගැසුවහොත් ඒදඬය (ඒ ආරක්ෂාවක භික්ෂුවවිසින්) ගෙවියයුතුවේ-: නඩුකාරයන්

විසින් "පාත්‍රචීවරාදිය සොරාගෙණගියනු කවුරුදැයි" විචාළ කල්හි "අසවලා විසිනැයි අපටකියන්ට නොවටී-එය නොපිම දැනගණිච් හුදෙක් අපි ආරක්ෂාව පමණක් ඉල්වන්නෙමු, එය අපට දෙව් ගෙණගියබඩුද ගෙන්වාදෙව්"යයි කියයුතුයි-: මෙසේනොවූදෙසා කීමක් ඇත්තේය එයාකියන්ටවටී-: තමන්විසින් දඬනැස්වීමෙහිවනාහි දඬයාගේ ප්‍රමාණයෙන් පාරාජිකාදිආපත්තීහු දතයුත්තාහුය-කෙත්වත් ගවමහිෂාදීන් පිළිබඳ නඩුකිමතබා ඒ පිණිස ආරක්ෂාඉල්ලීමත් නොවටී-: (62) "**හරන්තෙසුපරික්ඛාරං** චොරෙ චොරොතිභාසිතෙ, අනත්ථායෙසංගණ්හානෙන, දණ්ඩංහිවංසසතනතකං" යනු කීහෙයින් පිරිකර සොරාගෙණයන කල්හි ඔවුන්ට අනර්ථ පිණිස "සොරෙක සොරෙකැයි" භික්ෂුව විසින් කීකල්හි ඒඅසා විනිශ්චයකාරයෝ යම්පමණ දඬගණිද්ද; එපමණදඬය ඒ භික්ෂුවවිසින් ගෙවියයුතුවේ-: නොගෙව්කල්හි දඬප්‍රමාණයෙන් පාරාජිකාදි ආපත්තිහුවෙති-: (63) "**විඝාසුච්චාරසංඛාර**, මුත්තං ඡඩ්ඩෙය්‍යදුක්කටං, බහිපාකාරකුඩ්ඩානං, වලජෙනාවලොකයං, හරිතෙවාපිවීහාදි, නාළිකෙරාදිරොපිතෙ"යනු කීහෙයින් ප්‍රාකාරභිත්තීන්ගේ පිටත නොබලමින් ඉඳුල්හාමලමුත්‍රකසලාදිය දමන්නාහට දුකුළාවේ-: රොපනයකරණලද පරිභොග්‍යශාලිව්‍රිහ්‍යාදියෙහිද නාළිකෙරඅඹ පනසාදි වෘක්ෂමූලයන්හිද ඉඳුල්ආදිය දමන්නාහට දුකුළාවේ-: (64) "**රාජාගාරංපොක්ඛරණිං**, උය්‍යානංචිත්තාගාරකං, කීලත්ථංගච්ඡතොදට්ඨුං, ආරාමංදුක්කටංකතං" යනු කීහෙයින් රජයුවරජාදීන්ගේ ක්‍රීඩාපිණිසකරණලද රාජාගාරයද; පුෂ්කරණියද; උයනද; චිත්‍රාගාරයද; දක්නාපිණිස යන භික්ෂුහට පියවරක්පාසා දුකුළාවේ-: (65) "**අක්කොසනෙපරම්මුඛා**, ආපත්තිහිච සත්තහි. භික්ඛුඤ්චාසකංවාපි, අක්කොසනෙවචදුක්කටං" යනු කී හෙයින් අසම්මුඛයෙහි සප්තාපත්තිස්කන්ධයෙන් භික්ෂූන්හටද; ජාත්‍යාදි අන්කිසිවකින් උපාසකයෙකුටද ආක්‍රොශකරණ භික්ෂුහට දුකුළාවේ-:(66) "**අපන්නිශාඅනොකාස**, කතංචොදෙය්‍යදුක්කටං, සුද්ධසසවආචත්ථුකම්, නඔාඔකාසකාරණෙ" යනු කී හෙයින් "**කරොතුමෙ ආයස්මාඔකාසං නංවත්තුකාමො**"යි අවසර නොගෙණ භික්ෂූන්හට චොදනාකිරීමෙන් දුකුළාවේ-: එසේකරුණක්නැතිව චොදනාකිරීමට අවසරගැණීමෙන්ද දුකුළාවේ-: (67) "**සංකිඤ්චාවිතුංභත්ථ**, කම්මංතදනුසාරතො, ලද්ධංගහෙතුංනිත්කම්ම, මයාචිත්වාපිකප්පන් කාරෙතුමාහරාපෙතුං, යංකිඤ්චාපරසන්තකං" යනු කි හෙයින් වැද්දන්හැර අනිකුදු සියලුදෙනාගෙන් හස්තකර්මය ඉල්ලන්ටද; ඒඅනුසාරයෙන් උන්විසින් දුන්ජාතරූපාදියපවා ඒ පිණිස හිචසන්ටදවටී:—එසේනොව ගෘහස්ථකර්මාන්තයෙන් යෙදසිටින්

නාවුන්ලවා යම්යම්දෙය කරවාගැණීමාදියෙන් දුකුළාවේ--: නි
ෂකම්සිලිවූ විෂාසාදීන්ලවා හස්තකම්මයාඥනොකොට යම්යම්
දෙයකරවාගත්තද; පරසනතක සාරක්‍ෂකභොවන දරතෘණවැල්
ආදී යම්යම්දෙය අරණ්‍යයෙන් ගෙන්වාගත්තදවටි-:(68)“ගිහීනං
**ගොපකෙදෙන්තෙ**, ගහෙතුංදෙතියත්තකං, ලබ්භංයථාපරිච්ඡෙ‘
දං,සඞ්ඝචෙතියසනතකෙ” යනු කීහෙයින් ගෘහස්ථයන්සනතක
දෙය ගොපකයන්විසින් දෙනලද තරම ගත්තවටි-: සංඝචෛත්‍ය
සනතකදෙය සංඝයාගේනියමයපරිද්දෙන්ගත්තවටි-: එයනොප
කදනයෙන් ගත්නාහට වස්තුප්‍රමාණයෙන්ඇවැත්වෙති-: (69)‘
**පරිකථොභාසවිඤ්ඤත්ති**, නලබ්භාපච්චයචයෙ, විඤ්ඤත්තියෙව
තතියෙ, සෙසෙසබ්බම්පිලබ්භති” යනු කීහෙයින් චීවරපිණ්ඩපාත
දෙක්හි පරියායකථාවද; නිමිත්තකම්මයද; විඤ්ඤත්තියද නොවටී,
ශයනාසනයෙහි විඤ්ඤත්තියම නොවටී; ගිලන්පසෙහි පරියායක
ථාදිසියල්ලවටී; එසේලබනලද ගිලන්පස රෙගයසුවවූ කල්හිගැ
ණීමෙන් ඇවතක්නැතත් සන්තුෂ්ටභාවයට නොවටී—:(70)“න
**රූහනච්චයෙදනං**, පච්චණ්ණංසහබම්මිනං, සංඝසෙසවචනංහො
ති, ගිහීනංපනරූහති” යනු කීහෙයින් භික්‍ෂු සාමණෙර ශික්‍ෂමා
නා භික්‍ෂුණී සාමණෙරී යන පස්දෙනාහටම “මගේ ඇවෑමෙන්
මාසන්තකදෙය උපාධ්‍යයයාහට්ටාවේවා” යනාදිවශයෙන් ඇවෑ
මෙන්දීම ගැණීමනොවටී-: එය සාංඝයාහටම අයිතිවේ; එසේ
දෙනලද්ද ගැණීමෙන් පාරාජිකාදියපවා වියහැකිය; අච්චයදාන
ය වනාහි නිහිධම්මයකි—: (71) “**භික්ඛුවාසාමණෙරොවා**, කාලං
කයිරාථුපස්සයෙ, භික්ඛුසංඝොවදායජ්ජෝ, තත්සෙසෙපයිසංන
යො” යනු කීහෙයින් භික්‍ෂුවක්හෝ හෙරණක්හෝ භික්‍ෂුනීන්
ගේ පන්සලෙහි කලුරියකළකල්හි ඔවුන්සනතකපාසිවුරු ආදී
යෙහි භික්‍ෂුසංඝතෙමේම අයිතිවේ—: භික්‍ෂුණී ශික්‍ෂමානා
සාමණෙරීන් කෙරෙහිද මෙලෙසය—කාලක්‍රියාකළ භික්‍ෂුසාම
ණෙරාදීන්ගේ පාසිවුරු පමණක් සංඝයාවිසින් විනය පරිද්දෙන්
ගිලන්උපස්ථායකයන්ට දියයුතුයි; සෙසුසියල්ල ලහුබඩු සම්මුඛසං
ඝයාවිසින් බෙදාගතයුතුයි—: ගරුබඩු නොබෙදා පරහටනොදී
සාංඝිකපන්සලකතබා සාංඝික පරිභොගයෙන් පරිභොග කළ
යුතුයි:—(72) “**පාරිවාසිකානංභික්ඛූනං** වත්තංපඤ්ඤපෙස්සාමි”
යනාදින් පටන්ගෙණ “උපසම්පාදෙතබ්බං-නපමාය චඞ්කම
නෙන චඞ්කමෙ චඞ්කමිතබ්බං” යි ඛන්ධකයෙහි වදාළ පාරිවාසික
භික්ෂූන් විසින් ප්‍රකෘති භික්ෂූන්කෙරෙහි හැසිරියයුතු වත් සසැටද;
ඉන්මත්තෙහි “ **නභික්ඛවෙ පාරිවාසිකෙන** භික්ඛුනා පාරිවාසික
වුඩ්ඪතරෙන භික්ඛුනා සද්ධිං මූලායපටිකස්සනාරහෙන මාන
ත්තාරහෙන මානත්තචාරිකෙන අබ්භානාරහෙන භික්ඛුනාසද්ධිං

එකවජ්ජෙන්නආවාසෙවත්ථබ්බං'' යනාදීවූ ප්‍රකෘතිභික්‍ෂුව කෙරෙහි
හැසිරියයුතුවූම වත් වෙන වෙනම නොගෙණ පාරිවාසිකබුද්ධාදී
පුත්ගලයන් කෙරෙහි හැසිරියයුතු බැවින් ඔවුන්පස්දෙනාගේ
වශයෙන් එකතුකොට (ඒසියල්ලවත්) එකක් එකක්කොට ගැණී
මෙන් ලැබෙනවත් පංචකයද; උක්ඛිත්තයාකෙරෙහි පණවනලද
"**නපකතත්තස්ස** භික්ඛුනොඅභිවාදනං පච්චුට්ඨානං—පිටිසිපරි
කම්මංසාදිතබ්බං'' යනඅභිවාදනාදීන්ගේ නොකිරීමයයිකියනල
දඑකද; "**නපකතත්තොභික්ඛු**සීලවිපත්තියාඅනුද්ධංසෙතබ්බො''
යනාදීන්කියනලද වත් දසයද; යනමේදෙ අසූවත් ඉක්මවන්නා
හට එකක්පාසාදුකුළා අවදිත්-(73) "**ආගන්තුකානංභික්ඛූනං** ව
ත්තං පඤ්ඤපෙස්සාමි'' යනාදීන්පටන්ගෙණ වදාළ: ආගන්තුක,
ආවාසික, ගමික, අනුමෝදන, භත්තග්ග, පිණ්ඩචාරික, ආරඤ්ඤ
ක, සෙනාසන, ජන්තාඝර, වච්චකුටි, උපජ්ඣාය, සද්ධිවිහාරික, ආ
චරිය, අන්තෙවාසික, යන තුදුස් මහවත්හිඇතුළත් සියගණන් ශි
ක්‍ෂාවන් අනාදරයෙන් ඉක්මවන්නාහට එකක්පාසා දුකුළා අව
දිත්:—කඳුවත්අසූදෙක සියල්ලඅවස්ථාවන්හිනොව පිරිවෙස් විසී
මාදී කාලවලපමණක් ලැබෙනහෙයින් මහවත්හි ඇතුළත්නො
වෙත්:—මහවත්හිම ඇතුළත්වූ නිතර ලැබෙණ කතිපය ශික්‍ෂා
පද කෙණෙක් අපවිසින් මේ නිද්දේසයෙහි ආවේනිකව දක්වන
ලදහ:—(74) "**සොගවංනවිජානාති** න සොරක්ඛතිගොගණං, එ
වං සීලංඅජානන්තො, කිංසොරක්ඛෙය්‍ය සංවරං'' යනුවෙන් "ග
වයන්මෙතෙකැයි ගණනනොදන්නාවූ ගොපල්ලතෙම ගවපට්ටිය
යම්සේ නොරකීද; එපරිද්දෙන් ශික්‍ෂාපද මෙතෙකැ''යි සීලය
නොදන්නාවූ ඒ භික්‍ෂුතෙම කවරශීලයක් රක්‍ෂාකරන්නේද?
(නොකරන්නේමයයි) වදාළහෙයින්ද—**වත්තංනපරි පූරෙන්
තො, නසීලං** පරිපූරති, අසුද්ධ සීලො දුප්පඤ්ඤො, දුක්ඛානපරි මු
ච්චති— යනුවෙන් "වත්නොපුරන්නේ ශීලයනොපුරයි අපිරිසිදු
සිල්ඇති දුප්‍රාඥතෙම සසරදුකින් නොමිදෙයි'' යනු වදාළහෙ
යින්ද; උපන් රෝගය දැන බෙහෙත් කරණ වෛද්‍යාචාර්‍ය්‍යයෙක්
මෙන් උපන් වස්තුවශයෙන් පණවාවදාළාවූ අපවිසින් මෙහිසැකෙ
වින්ප්‍රකාශකළ ශික්‍ෂාවන් කල්‍යාණමිත්‍රොපාශ්‍රයෙන් විස්තරව දැන
ඉගෙණ "**සංපහාරාදමයා භික්ඛූනං** සික්ඛාපදං පඤ්ඤත්තං තං මම
සාවකාජීවිත හෙතුපි නාතික්කමන්ති'' යනුවෙන් එම්බාපහාරාද
අසුරෙන්ද්‍රය මා විසින් භික්‍ෂූන්ට යම් ශික්‍ෂාපදයක් පණවන ලද්
දේද, එයමාගේ ශ්‍රාවකයෝ ජීවිතහෙතුකොටද නොඉක්මවත්
(නොබිඳිත්)යයි වදාළ සුගතොවාදය සිතෙහි එලඹවාගෙන ක්‍ෂු
ද්‍රානුක්‍ෂුද්‍ර ශික්‍ෂාවන්හි තිබුනු ගෞරවයෙන් මහශික්‍ෂා පූරණකිරී
මෙන් මෙසේ ප්‍රාතිමොක්‍ෂ සංවරශීලයෙහි පිහිටියයුතු:—

මෙතෙකින් ආධුනිකභූදී ජනයාගේ ප්‍රමෝදයපිණිස කරණ ලද භික්ෂුශීලනම් ප්‍රකරණයෙහි ප්‍රාතිමෝක්ෂසංවර පරිශිෂ්ටසංග්‍රහනිර්දෙස නම්වූ දෙවෙනි පරිච්ඡේදය නිමහිනලදී:—

(ප. අ. 2.)
එවංභික්ඛුසොධපනසෙනවුත්තානං නිද්දෙසි'මංසොමනසිකරෙය්‍ය
සොදුක්කථා'පන්තිවිසාරදතානං සම්පාපුණෙනානාථපවිණනාකූච.

දැන් කියනලද ප්‍රාතිමෝක්ෂසංවරසීලයාගේ විපත්තිහා
විපත්තිදෝෂයො එලවතුලැබෙත්

(1) යොබසෙවති දුස්සීලෙ සීල වණ්ණෙන නසෙවති
වත්ථුවීතික්කමෙදොසං නපස්සතිඅවිද්දසු.
මිච්ඡාසංකප්පබහුලො ඉන්ද්‍රියානිනරක්ඛති
එවරූපස්සවෙසීලං ජායතෙහානභාගියං.

භාවය: මේ ශාසනයෙහි යම් අඥනයෙක්තෙම දුශ්ශීලයන් සෙවනයකරුද; සිල්වතුන් සෙවනයනොකරුද; තමන්ගේ සිල් පද කඩවීමෙහි දෝෂනොදකීද; නව මහා විතර්ක බහුලවූයේ ඉන්ද්‍රියයන් නොරකීද; එබඳු භික්ෂුවගේ ශීලය හානභාගියවත්තේය හෙවත් පිරහීමටයන සුලුවත්තේය-යනුයි:-මෙයින් දුශ්ශීලයන් ඇසුරුකරන්නහුගේ ශීලයවිපත්තිවනබව දක්වනලදී-: තවද- ත්‍රිවිධ අනාචාරයෙන් මිථ්‍යාජීවයෙන් ෂඩ්අගෝචරයෙන් යුත් ත්‍රිවිධගෝචර රහිත භික්ෂුවගේ ප්‍රාතිමෝක්ෂ සංවරයතෙමේ සර්‍වනොවේ කලක්නොපවති, පිරිහෙන පක්ෂයට යන්නේවෙයි- එහෙයින්—"ආචාරගොචරසම්පන්නොති අදිපනසබ්බං යථා පටිපන්නස්ස තං සීලං සම්පජ්ජති තම්පටිපත්තිං දස්සෙතුංවුත්තනති වෙදිතබ්බං" යනු දක්වනලදී-: (2) තවද—මේ ශීලයතෙමේ ඛණ්ඩශීල, ඡිද්‍රශීල, සබලශීල, කල්මාසශීලයයි කෙලෙසීම් වශයෙන් සතරවැදෑරුම්වේ-: යම් භික්ෂුවකගේ සප්තාපත්තිස්කන්ධයන් කෙරෙහි මුලහෝ කෙළවරහෝ ශික්ෂාපදයක් බිඳුනේ වේද; ඔහුගේශීලය කෙළවරඉරෙනලද වස්ත්‍රයක්මෙන් ඛණ්ඩශීලයවේ-: යම් භික්ෂුවකගේ ඒ ශීලයෙහි මැද ශික්ෂාපදයක් බිඳුනේවේද; ඔහුගේ ශීලය මැද ඉරුනු වස්ත්‍රයක්මෙන් ඡිද්‍රශීලය වේ-: යම් භික්ෂුවකගේ ශීලයෙහි පිළිවෙලින් දෙතුන්ශික්ෂාපද කෙණෙක් බිඳුනාහුද; ඔහුගේ ශීලයතෙමේ පොහොරදෙනක මෙන් සබලශීලයවේ-: යම් භික්ෂුවකගේ ශීලයෙහි අතරතුර ශික්ෂාපදයෝ බිඳෙනලදෑහුද; ඔහුගේශීලයතෙම තිත් දෙනක මෙන් කල්මාස ශීලයවේ—: ඒ ඛණ්ඩාදිභාවයෝතුෂ්ණා, ලාභ, කීර්ති, ඥාති, ශරීර, ජීවිතයන්ගේ වශයෙන්ද-: ~~~ ඉත්‍රියාලිඞ්ගන

ජෙඤ්ච සාසද්ධිංහසනංතථා දුට්ඨියාදුට්ඨිගහණං සද්දස්සව ණම්පිච.—පුබ්බෙබසීමනතිනිසද්ධිං කතඛිඩ්ඩාදිකංසරං කාමානු භොගිනංගහපතිං දිස්වාතප්පනාලයං—දෙවිත්තියොචනිස්සා ය, බ්‍රහ්මචාරසුරක්ඛණං ඉච්චෙතෙරිතාසත්ත මෙථුනානිපවුච්ච න්ති”—යනුවෙත්—ස්ත්‍රියවිලඳගැණීම;එසේ ඈ සමගසිනාසීම; ඈසෙන් ඈසහෙලාබැලීම;(ඈගේකථා)ශබ්දයඇසීම;පෙරස්ත්‍රීන් සමග කරණලද කෙළිසිනා ආදිය සිහිකිරීම; පස්කම් සැපවිඳින ගෘහපතියෙක් දැක එහි ආලයකිරීම, දෙව්ගනන් ලබනපිණිස බ්‍රහ්මචය්‍යාවමනාකොට රක්ෂාකිරීම;යයි කියනලද මෙහුසත්දෙ න ශප්තමෛථුනධම්මයයි කියනුලැබෙත්,යයි දක්වනලද සප් තමෛථුනධම්මයන්ගේ වශයෙන්ද සංග්‍රහකරණලදී:— (3) ත වද—දුෂ්කෘත දුර්භාෂිතාදි ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපදයන් දැනදැනමදි නයකරණ භික්ෂුවගේ පාරාජිකාදි මහශික්ෂාපදයෝද හානපක්ෂ යටයෙති-එහෙයින් “ආභිසමාචාරිකංධම්මං අපූරෙත්වා ආදිබ්‍රහ්ම චරියකංධම්මං පූරෙස්සතිති නෙතංඨානංවිජ්ජති” යනු වදාරණ ලදී-: භාවය, “අභිසමාචාරිකධම්මයයි කියනලද ක්ෂුද්‍රානුක්ෂුද්‍රවත් නොපුරා නොහොත් කුඩාකුඩා ශික්ෂාපද රක්ෂානොකොට ආදි බ්‍ර හ්මචරියයයි කියනලද මහශික්ෂාපද පූරන්නේය, රක්ෂාකරන් නේය යන කාරණය නොවන්නේය” යනුයි—: එහෙයින්ම අකු සලධම්මයන් කිරීමගැණ සිත ඉපදවීමද සතර අපායොත්පත්ති යට හෙතුයයි වදාරණලදී:—(4)තවද-මේ ශීලයතෙම අභිජ්ඣා, විසමලොභ, ක්‍රොධ. උපනාහ,‘මක්ඛ, පලාස, ඊර්ෂ්‍යා,මච්ඡරිය, මා යා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, ප්‍රමාද, යන උ පක්ලෙශධම්මයන් විසින්ද කෙලසනුලැබේ-:,මෙහි, අනුන්සන්ත කදෙය තමන්ට වේවායි සිතීම අභිධ්‍යානම්වේ; තමන් සතුවස්තු වෙහි දැඩිආසාතොමෝ විසමලොභනම්වේ; කිපෙනලක්ෂණය ක්‍රොධනම්වේ; බැඳපවත්නාක්‍රොධය උපනාහ නම්වේ; අනුන්ගු ණ වසනබව මක්ඛනම්වේ; අනුන්ගේ ගුණහා සම්ගුණ ඇතිවිය නොහෙම්යන චෙතනාව පලාසනම්වේ; මෙරමාසම්පත් නොඉ වසන බව ඊර්ෂ්‍යානම්වේ; තමන් සම්පත් සඟවණ බව මච්ඡරිය නම්වේ; කළුපව්වසනබව මායානම්වේ; නැතිගුණ පහළකර ණබව සාඨෙය්‍යනම්වේ; චිත්තවිකාරයෙන් දැඩිවූ අකුසල සිත ථම්භනම්වේ; අනුන්ගුණ මතුවියනොදෙනු කැමතිබව සාරම්භ නම්වේ; ජාතිආදියෙන් තමා උසස්කරණබව මාන නම්වේ; අති සයින් සියල්ලෙන්තමා උසස්කරණබව අතිමානනම්වේ; ජාත්‍ය දියෙන් සතුටුවනබව මදනම්වේ; පස්කම්ගුණයෙහි සිතබහාළී ම ප්‍රමාදනම්වේ, මොහුහැමදෙනම ප්‍රකෘතිසුද්ධචිත්තය කෙලෙ

සනගෙයින් උපක්ලේශ නම්වෙත්, මොහු සියළුදෙන භික්ෂූත්වි
සින් සියළු ඉරියව්වෙහිදීම "මේ සොළොස් උපක්ලේශධර්මයන්
ට පැවිද්දන් සිතතුළ ප්‍රකටව සිටීමට අවකාශනොදියයුතුයයි" කල්
පනාකිරීමෙන් පටිසංඛානප්‍රහාණවශයෙන් පහකටයුත්තාහුයයි"
දක්වනලදී—: මෙකී අකුසල චෛතසිකයන්ගෙන් ප්‍රකට භික්ෂු
තෙම ඥදකොණගිනිනත් මැද අසූචිතැවරුණු සතරඟුල්දිගඇති
සොහොන් ගිනිපෙණෙල්ලට සමානයයි පිඩොල්‍යසූත්‍රයෙහි දක්
වනලදී:—(5) තවද—ශීලයනම් ප්‍රාතිමොක්ෂසංවරශීලයයි මෙ
හිමතු කියනුලබන ඉන්ද්‍රියසංවරාදිය (වෙන්වශයෙන්) ශීලයෝ
යයි නොකියනලදහ—: ඉන්ද්‍රියසංවර ආජීවපාරිශුද්ධි ප්‍රත්‍යය සන්නි
ශ්‍රිත යනමොහුද ප්‍රාතිමොක්ෂසංවරයාගේම සමෘද්ධියපිණිස වදා
රණලදහු—: එහෙයින් ඉන්ද්‍රිය අසංවරයෙන් මිථ්‍යාජීවයෙන් ප්‍රත්‍ය
වෙක්ෂාකොනොකිරීමෙන් වසන භික්ෂුවගේද ප්‍රාතිමොක්ෂසංවරය
තෙම හානපක්ෂයට පැමිණේ:—(6) තවද-මේ ප්‍රාතිමොක්ෂසං
වරශීලයාගේ ශීල, දිට්ඨි, ආජීව, ආචාර, විපත්තියයි සිව්විපත්තිකෙ
ණෙක්වෙති—එහි සතර පාරාජිකාපත්තියට සහ තෙළෙස් සඟ
වෙසෙස්ආපත්තීන්ට පැමිනීම ශීලවිපත්තියවේ-දුස්සීලකමවේ-:
දිට්ඨිඅප්පටිනිස්සජ්ජනපච්චිත්ති ආපත්තියට පැමිණීම දිට්ඨිවිපත්ති
වේ—: උත්තරිමනුෂ්‍යධම්ම පාරාජිකාවට සංචරිත්තසඝවෙසසීට,
පරියාය නෙපුලෙන් උතුරුම්නිස්දම් ප්‍රකාශකිරීමෙන් තුලසියට,
පනීතභොජනවිඤ්ඤත්තිපචිත්තියට, සූපෝදනවිඤ්ඤත්තියෙන් දු
කුළාවට, පැමිනිමෙන් ආජීවවිපත්තිවේ—: ශීල දිට්ඨි ආජීව යන
ත්‍රිවිධවිපත්තියෙන් ඉතිරි ආපත්තිස්කන්ධයන්ට පැමිනීම ආචාර
විපත්තිවේ—: නොහොත් පාරාජිකාපත්තිස්කන්ධයට හා සාංඝාදි
සෙසාපත්තිස්කන්ධයට පැමිනීමෙන් ශීලවිපත්තියටද (හෙවත්දු
ස්සීලවීමටද) ආජීවවිපත්තියටද පැමිනෙ—: ථුල්ලච්චයාපත්තිස්ක
න්ධයට පැමිණීමෙන් ආජීව විපත්තියටහා ආචාරවිපත්තියටද පැ
මිනේ—: පාචිත්තියාපත්තිස්කන්ධයට පැමිණීමෙන් දෘෂ්ටි, ආචාර,
ආජීව, නය ත්‍රිවිධ විපත්තියටද පැමිනේ—: පාටිදෙසනීය, දුක්කට,
දුබ්භාසිත යන ත්‍රිවිධ ආපත්තිස්කන්ධයට පැමිණීමෙන් ආචාර, ආජීව,
ද්විවිධ විපත්තියට පැමිනේ:—මෙසේ මේ ශීලයාගේ විපත්තිතො
මෝ දතයුත්තීය—: දැන් විපත්තිදොෂයෝ කියනුලැබෙත්—:

(7) චතුර්විධ විපත්තිතොමෝ ස්වර්ගමොක්ෂයන් වලක්වන පස්
වැදෑරුම් අන්තරායකරධර්මයන් අතුරෙන් ආනාවීතික්කාම දොසය
වේ-එය වනාහි "සග්ගමොක්ඛානං අන්තරායං කරොන්තීති අ
න්තරායිකා තෙකම්මක්ලෙස විපාක උපවාද ආනාවීතික්කමවසෙ
න පඤ්චවිධා"යි දක්වනලදී-භාවය: ස්වර්ගමොක්ෂයන්ට අන්තරාය
කරන්නුයි අන්තරායිකානම්වෙත්; ඔව්හු කර්ම ක්ලෙශ විපාක උ
පවාද ආඥාවීතික්‍රම දොෂවශයෙන් පස්වැදෑරුම්වෙති—: "තන්ථ ප

**චානන්තරිය ධම්මා** කම්මන්තරායිකානාම තථා භික්ඛුනිදූසක කම්මං තම්පන මොක්ඛස්සෙව අන්තරායංකරොති නසග්ගස්ස, නියත මිච්ඡාදිට්ඨි ධම්මා කිලෙසන්තරායිකානාම පණ්ඩකතිරච්ඡාන ගත උභතොබ්‍යඤ්ජනකානං පටිසන්ධි ධම්මා විපාකන්තරායිකානාම අරියූපවාදධම්මා උපවාද අන්තරායිකානාම තෙපනයාව අරියෙ නඛමාපෙන්ති තාවදෙව නතතොපරං සඤ්චිච්චවීතික්කන්තා සත්ත ආපත්තික්ඛන්ධා ආණාවීතික්කමන්තරායිකානාම තෙපියාව භික්ඛුභාවං පටිජානාති නවුට්ඨාතිවා නදෙසෙතිවා තාවදෙව නතතොපරං" භාවය: එහි පඤ්චානන්තරියකර්මයෝ කර්මාන්තරායිකනම්වෙත්; භික්ෂුණීදූෂණකර්මයද එසේමය; ඒද වනාහි මොක්ෂයාගේම අන්තරායකරයි; ස්වර්ගයාගේ අන්තරායනොකරයි; නාස්තික අහේතුක අක්‍රිය යන නියත මිථ්‍යාදෘෂ්ටිධර්මය ක්ලෙශාන්තරායිකනම්වේ; පණ්ඩක තිරශ්චානගත උභතොව්‍යඤ්ජනකයන්ගේ අහේතුකද්විහේතුක ප්‍රතිසන්ධිධර්මයෝ විපාකාන්තරායිකනම්වෙත්; (ඔව්හුද මොක්ෂයම අන්තරායකරති) ශ්‍රොතාපන්නාදි ආර්‍ය්‍යගණයාට ද්වේෂාරොපණයකිරීම උපවාදඅන්තරායනම්වේ; ඒ ආර්‍ය්‍යොපවාද ධර්මයොවනාහි යම්තාක් ආර්‍ය්‍යයන් ක්ෂමානොකරද්ද ඒතාක් අන්තරායකරවෙති; ඉත්මතු (පයොගසම්පත්ති පටිබාහිතහෙයින් අනන්තරායකර) නොවෙති; දැනදැන අලජ්ජිතායෙන් ඉක්මවනලද සප්තාපත්තිස්කන්ධයෝ ආණාවීතික්‍රම අන්තරායකර ධර්මනම්වෙති; ("අන්තමසොදුබ්භාසිතම්පි අන්තරායකරමෙව" කීහෙයින් යටත්පිරිසෙයින් දුර්භාෂිතාපත්තියද ස්වර්ගමොක්ෂයන්ට අන්තරායකරමවේ) ඔව්හුදයම්තාක්කල් භික්ෂුභාවය හෝ දන්වූසිද; ඇවතින්හෝ දෙසනාවුට්ඨානයන ද්විවිධශුද්ධියෙන් නොනැගීද; එතාක් අන්තරායකරවෙති; ඉත්මතු අන්තරායකරනොවෙති, යතුකි—:"**සාපත්තිකස්ස භික්ඛවෙ** නිරයංවා වදාමි තිරච්ඡාන යොනිංවා" යනුවෙත් "මහණෙනි ඇවැත් සහිත (භික්ෂුහට) නිරයගතියහෝකියම්; තිරිසන්යොනියහෝ(කියමි") වදාළහෙයින් දැනදැන ආපත්තිවලට පැමිණෙන භික්ෂූනු යට කිලෙස ආඥාවීතික්‍රම දොෂයට අසුවීමෙන් මරණින්මතු නරකාදි සතර අපාය දුකටම පත්වෙතියි;:— (8) තවද—කාශ්‍යප බුදුන් සසුන්වැද ක්‍රීඩාපරව සිකපද නොසලකා හැසිර මිය පරලොවගිය එක් භික්ෂුවක්ගැණ ලක්ඛණ සංයුත්ත අටුවායෙහි "**පාපභික්ඛූති ලාමකභික්ඛු** ඒසා කිර ලොකස්ස සද්ධාදෙය්‍යානි චත්තාරො පච්චයෙ පරිභුඤ්ජිත්වා කායවචිවාරෙ අසඤ්ඤතො භින්නාජීවො චිත්තකීළංකීළන්තො විචරිත්වා තතො එකං බුද්ධන්තරං නිරයෙපච්චිත්වා පෙතලොකෙ නිබ්බත්තන්තො භික්ඛු

සද්දෙනෙව අත්තභාවෙන තිට්ඨන්ත්"යි දක්වනලදී—: භාවය: පාපභික්ෂුය යනු ලාමකභික්ෂුවයි; ඒ භික්ෂුතෙමවනාහි ලොවැස් සත්ගේ ශ්‍රද්ධාදෙය චීවරාදි සිව්පසය අනුභවකොට කාවිසිදෙර සංයත නුවූයේ හෙවත් කායවචනදෙකට පණවාවදාළ ශික්ෂාපද නොරැක්කේ බිඳුනාලද ආජීවයඇතිතේ චිත්තක්‍රීඩාකොළෙම්න් හැසිර ඒයින් සැව එක්බුද්ධාන්තරයක් මුළුල්ලෙහි හෙවත් (පොලෝසත්ගව් වැඩෙනතුරු) නිරයෙහිපැසී ප්‍රේතලොකයෙන් උපදනේ ගිනිගෙණ දිලියෙනා සඟලසිවුරුපාත්‍රධාරීව භික්ෂූනස මාන අත්මභාවයෙන් උපත්තේය—: එහිම "**පාපභික්ඛූති** ඉක්ඛුසු ඨානෙසුමූලවජ්ජිතෙනා පාරාජිකාපන්නෙනා පාපභික්ඛූති වුච්චති, ඉධපනපාරාජිකං අනාපන්නෙනා ඉච්ඡාචාරෙයිතො බුද්ධානුඤ්ඤාතානි සික්ඛාපදානි මද්දිත්වා විචරනෙනා පාපභික්ඛූනි අධප්පෙතො"යි දක්වනලදී—භාවය: පාප භික්ෂුය යනු මෙයින් අත් තැත්හි මූල්ඡින්පරිජි අවත්මහණහුම පාපභික්ෂුයයි කියනුලැබේ; මෙතැත්හිවනාහි පාරාජිකාපත්තියට නොපැමිනියාවූ ඊප්ශාචාර යෙහි සිටියාවූ ක්ෂුද්‍රානුක්ෂුද්‍ර සංඝාදිසෙසාදි ශික්ෂාපදයන් මදිනයකොට හැසිරෙම්නසිටි (භික්ෂුවම) පාපභික්ෂුය යනු අදහසී:— (9) තවද—යස්ස අච්චන්ත දුස්සීල්‍යං, මාලුවාසාලම්වොනතීං, කරොතිසොතථාත්තානං යථානං ඉච්ඡතිදිසො—භාවය: යම් ගිහිපැවිදි කෙනෙකුගේ දශඅකුසලයෙහි හැසිරීම් සංඛ්‍යාත වූද; නෙලෙස්සඟවෙසෙස් ආපත්තිවලට පැමිනීම් සංඛ්‍යාතවූද; ඒකාන්ත දුස්සීල බව; ශාලවෘක්ෂය වැලදගෙණ සිටි මාලුවා වැලක්මෙන් (ඔහු) වැලඳගෙණ සිටියේවේද; සතුරෙක්තෙම තමා සතුරාට යම්සේ අනර්ථයක් කරණුකැමතිවෙයිද; එපරිද්දෙන් එ ඒ කාන්තදුස්සීලබව තමහට සුගතියෙන් බැහැරකොට දුගතියට පැමිනවීම්වශයෙන් අනර්ථකරයි යනුයි:— (10) තවද—"**අපිචදුස්සීලො පුග්ගලො** දුස්සීල්‍යහෙතු අමනාපොහොතිදෙවමනුස්සානං අනනුසාසතියො බ්‍රහ්මචාරීනං දුක්ඛිතොදුස්සීලගරහාසු විප්පටිසාරීසීලවතංපසංසාසු තායචපනදුස්සීල්‍යතායසාණසාටකොවිය දුබ්බණ්ණොහොති, යෙබොපනස්ස දිට්ඨානුගතිං ආපජ්ජන්ති තෙසංදීඝරත්තං අපායදුක්ඛාවහණතො දුක්ඛසම්ඵස්සො, යෙසංදෙය්‍යධම්මංපතිගණ්හාති තෙසංනමහප්ඵලකරණතො අප්පග්ඝො ගනකවස්සගණ්කගූථකූපොවිය දුබ්බිසොධො ඡවාලාතම්ව උභතොපරිබාහිරො භික්ඛුභාවංපටිජානන්තොපි අභික්ඛුයෙව ගොගණං අනුබද්ධගද්‍රභොවිය සද්දභබ්භගෙහං සබ්බවෙරිපුරිසොවිය අසංවාසාරහොමතකලෙවරංවිය සුතාදිගුණයුත්තොපි සබ්‍රහ්මචාරීනං අපූජාරහො සුසා

නාගිච්චිය බ්‍රාහ්මණානං අභබ්බා විසෙසාධිගමෙ අනේධාවරූප
දස්සනෙ නිරාසොසද්ධමෙම චණ්ඩාල කුමාරකොව්‍යරජ්ජෙ සූ
ඛිතොසම්හිමසුකුමාරිනොපි දුක්ඛිතොව අග්ගික්ඛන්ධපරියායෙ
වුත්තදුක්ඛභාගිතාය" යනුවෙන් "දුස්සීල පුද්ගලතෙමේ දුස්සී
ලබව හේතුකොටගෙණ දෙවිමිනිසුන්ට අමනොඥවේද්ද; සබ්‍රම්
සරුන්ට (පිළිකුල්බැවින්) අනුශාසනාකටයුතුනොවේ; දුස්සීල
යන්ට ගර්හාකරණකල්හි දුක්ඛිතවේ, සිල්වත්නට පසසනකල්
හි පසුතැවිල්ලට පැමිණේ; එම දුස්සීලභාවයෙන් හනවස්ත්‍රයක්
මෙන් ගුණවර්ණයෙන් හා ශරීරවර්ණයෙන් දුර්වර්ණවෙයි; යම්දායක
උපස්ථායකාදී කෙණෙක් ඒ දුස්සීල භික්ෂුවගේ ලබ්ධි අනුබවට ක
පැමිණෙද්ද, ඔවුන්ට බොහෝකලක් අපාය දුක්ඵලවනහෙයින්
දුඃඛස්පර්ශියඇත්තේවෙයි; යම්කෙණෙකුගේ දානවස්තුව පිළිගණී
ද, ඔවුන්ට මහත්ඵලබව නොකරණහෙයින් හෙවත් (අදහස
නිස්ඵලකරණහෙයින්) මදක්අගණේයි; ඛ අනේකවර්ෂසමූහයෙහි
සචිතවූ අසූචිවලක්මෙන් සෝදන්ට නොහැකිවන්නේයි; සො
හොන්පෙනෙල්ලක්මෙන් ශ්‍රාමණ්‍යයෙන්ද; ගිහිභාවයෙන්ද
යන දෙකින්ම (බාහිර) පිටත්වන්නේයි; භික්ෂුබව ප්‍රතිඥාකරන්
නේද ගවසමූහය ළුහුබැඳයන කොටළුවෙකුමෙන් අභික්ෂුවම
වේ; හැමදෙනාම සතුරුකොට ඇතිපුරුෂයෙකුමෙන් නිරන්තර
යෙන් උද්විග්නවෙයි; (බයටපත්වූයේවෙයි,) මළකුණක්මෙන් සං
වාසයට සුදුසුනොවෙයි; බහුශ්‍රැතාදිගුණයෙන් යුක්තවූයේද
බමුණන්ට සොහොන්ගින්නක්මෙන් සබ්‍රම්සරුන්ගේ පූජාවටසු
දුසුනොවේ; රූපදැක්මෙහි අන්ධයෙකුමෙන් විශෙසාධිගමයෙහි
(මාර්ගඵලාදිය ලැබීමෙහි) අභව්‍යවේ; රජවීමෙහි සැඩොල්කො
ල්ලෙකුමෙන් ප්‍රතිපත්තිප්‍රතිවෙධසඞ්ඛ්‍යධර්මයෙහි අසානැත්තෙක්
වෙයි; අග්ගික්ඛන්ධසූත්‍රදේශනාවෙහි කී දුකටගිණව සිටිහෙයින්

---

ක ඒ දුස්සීල භික්ෂුවගේ වචනකිරීම (අවවාදලෙස ක්‍රියාකිරීම) ලබ්ධි අනුබවට යාම්බව මඞ්ගලසූත්‍ර අටුවාහි පෙණේ.

ඛ "දානං නාමනකස්සචි නිවාරිතං තෙන දුස්සීලස්සාපි අප්පික ස්ස සතිසම්භවෙදිතබ්බං" යනුවෙන් "දුස්සීලයාහට පැමිනි කල්හි දියයුතුයයි" දක්වනහෙයින් එකියනලද මදක් අගනා ආනිසංසය නිර්දෝෂවලැබෙන්නේ සිඟා ගෙදොරටපැමිණිකල්හි ආහාරාදිය දීමෙන්බවද—දෘෂ්ටානුගතියඹනොව "සෙවනංදිසරතනං අහි තාය දුක්ඛායහොති" කීහෙයින්ද—"සෙවනාති උපසංකමණං" කීහෙයින්ද-එබඳු ශ්‍රමණදුස්සීලයන් සොයාගොස් හෙවත් ඔවුන් වෙත පැමිණ චීවර පිණ්ඩපාතාදියදීම අපායෙහිත් පතනියට හේතු අසත්පුරුෂ සංග්‍රහයක්බව නිසැකවදතයුතු.

සැපඇත්තෙමියි සිතන්නේද; දුක්ඇත්තේමවේ"යයි දක්වනල දශෙයින් භික්ෂුශිලයට පිටිපාසටින භික්ෂුතෙමේ මෙකීදෙෂයෙන් යුක්තවන්නේය:— (11) තවද:

සංකාසසර සමාචාරො කසම්බුජාතො අවස්සුතොපාපො
අනෙතාපූනිනිචයා නිඤනොඅනලොකගුරු.

භාවය: සැකයෙන් සිහිකටයුතු පැවතුම් ඇත්තේයයිද; සිල්වතුන්විසින් දුරුකටයුතුබැවින් කසලස්වභාව ඇත්තේයයිද; සදෙරවැහෙන රාගාදියෙන් තෙත්වූයේයයිද; පාපස්වභාව ඇත්තේයයිද; ඇතුළත කුනුවූයේයයිද; යමෙකුට නින්දාකාරණ තුන්ලොවට ගුරුතෙමේ වදාළසේක්ද.

ධිරජීවිතං අබඤ්ඤස්ස තස්සසමණජන වෙසධාරිස්ස
අස්සමණස්සඋපහතං ඛතමත්තානං වහන්තස්ස.

කාලකන්නිවූ; ශ්‍රමණජනයාගේ වේසයදරුවාවූ; අශ්‍රමණවූ; සාරාදමනලද්කුසල් මූල්ඇතිගුණ ශරීරය උසුලන්නාවූ; ඒශ්‍රමණ දුස්සීලයාගේ ජීවිතයට නින්දාවේවා.

ගූථංවියකුණපංවිය මණ්ඩණකාමංවිවජ්ජයන්තිධ
යංනාමසීලවනෙතා සනෙතාකිං ජීවිතංතස්ස.

යම්සේ ආභරණයෙන් සැරසෙනුකැමති පුරුෂයෝ අසුචිනාකුණපය න්දුරුකරද්ද; එමෙන්ම මේ ශාසනයෙහි සිල්වත්වූ සත්පුරුෂයෝ; යම් දුස්සීලයෙක් සේවනභජනාදියෙන් දුරුකරද්ද; එබඳු ශ්‍රමණ දුස්සීලයාගේ ජීවිතයෙන් ප්‍රයෝජන කවරේද?

සබ්බභයෙහි අමුතෙතා මුතෙතාසබ්බෙහි අධිගමසුඛෙහි
සුපිහිතසගගවාරො අපායමග්ගංසමාරුළෙහා.

කාරුණායවත්තුභූතො කාරුණිකජිනසසනාභිකො
අඤ්ඤදුස්සීලසමො දුස්සීලතාය ඉති බහුවිධදෙසා.

ආත්මානුවාදාදි සියලුභයින් නොමිදුනාවූ; උපචාරාදිවූ සියලු අධිගම සුවයෙන් මිදුනාවූ; මනාකොට පියනලද ස්වර්ගීදොරටුව ඇත්තාවූ; අපායමගටනැංගාවූ, කරුණාඇති ජනයාගේ කරුණාවට භාජනවූ; ශ්‍රමණ දුස්සීලයාහා සදෘශවූ අන්කෙනෙක් නම් කව්රුද ? මෙසේ දුස්සීලභාවයාගේ දොෂයෝ අනේකප්‍රකාරයෝය යනු දක්වනලදහ:— (12) තවද—"පබ්බජිතොදුස්සීලො පමාදකාරණා සීලතො බුද්ධවචනතොඣානතො සතතඅරියධනතොචජනිංනිගච්ඡති" යනුවෙන් "ප්‍රව්‍රජිතතෙම දුස්සීලවූයේ ප්‍රමාදකාරණයෙන් සතරසංවරසීලයෙන්ද; බුද්ධවචනයෙන්ද; ධ්‍යානයෙන්ද; ශ්‍රද්ධා, ශීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා, යන ශප්

තායත්තනයෙන්ද; ක හානියට පිරිහීමටයයි" කියාද; "**පබ්බජිතස්ස අසුකොනාම** නාසක්ඛි සීලංරක්ඛිතුං නබුද්ධවචනං ගණ්හිතුංවෙජ්ජකම්මාදීහි ජීවති ඡහිඅගාරවෙහි සමන්නාගතොති එවං අබ්භුග්ගච්ඡති" යනුවෙන් "අසවල්නම් ප්‍රව්‍රජිතතෙම සිල්රකින්ට නොහැකිවූයේය; බුද්ධවචනය ඉගෙණගන්ට නොහැකිවූයේය; වෙදකම් ආදියෙන් ජීවත්වෙයි; බුද්ධඅගෞරව, ධර්ම, සඞ්ඝ, ශික්‍ෂා, ප්‍රතිපත්ති, අප්‍රමාද, යන සවිඅගෞරවයෙන් සමන්විතවූයේයයි; ඛ මෙසේ ප්‍රව්‍රජිතයාගේ පච්චූකිත්තිශබ්දයක් උස්ව පැනනගී" කියාද-: "**පබ්බජිතොපි** බහුභික්ඛු සන්තිපතිතා අවස්සං කොචිමමකම්මංජානිස්සති අථමෙ උපොසථම්පිපවාරණම්පි ඨපෙත්වා සාමඤ්ඤතො චාවෙත්වා නික්කඩ්ඪිස්සන්තීති සභයො උපසංකමිස්සති විසාරදෙහුත්වා කථෙතුං නසක්කොති එකච්චොපනදුස්සීලොපි දප්පිතොවියචරති සොපි අජ්ඣාසයෙනමංකුහොතියෙව" යනුවෙන් ප්‍රව්‍රජිතතෙමේද [දුස්සීලවූයේ] "දැන් බොහෝ භික්ෂූහු රැස්වූවාහුය; කිසිවෙක් මාගේකර්මය (දුස්සීල්‍යත්වය) දන්නේද; එකලමාගේ පොහොයකිරීමද; පවාරණකර්මයද; තබා ශ්‍රමණභාවයෙන්ද පහකොට බැහැරකරත්යයි" භය සහිතවූයේම එළඹෙන්නේය; පහවූභය ඇත්තෙක්ව කරුණුකියන්ට නොහැකිවෙයි; ඇතම්දුස්සීලයෝද දැඩිවූ[illegible]සක්මෙන් නිර්භයවූයෙක්මෙන් හැසිරෙයි; හෙතෙමේද අදහසින්මකුවේමය මැලිවේමයයි කියාද-: "**සම්මූළ්හො කාලංකරොතීති** තස්සහි මරණමඤ්චෙ නිපන්නස්ස දුස්සීලකම්මෙමසමාදාය වත්තිතංඨානං ආපාථං ආගච්ඡති සො උම්මීලෙත්වා ඉධලොකංපස්සති නිම්මීලෙත්වා පරලොකං තස්සචත්තාරො අපායා උපට්ඨහන්ති සත්තිසතෙන සීසෙ පහරියමානොවිය

---

ක මිලින්දප්‍රශ්නයෙහි "ජිනසාසන ධනපරියෙසනතොපි" යනාදී දුස්සීලවර්ණනාව "පබ්බජිතොදුස්සීලොපමාදකාරණා" යනාදි ඒස්සු මඞ්ගලවිලාසනී දීඝනිකායාර්ථකථාපාඨයට කෙසේගැලපේද?—

ඛ මෙයද-මිලින්දුපැණෙහි "බුද්ධෙසගාරවො" යනාදියටහා "බුද්ධධම්ම සංඝසරණ ගතායපි" යනාදියටත් කෙසේ ගැලපේද ? තවද: මනොරථපූරණී නම්වූ අඞ්ගුත්තරනිකායාර්ථ කථායෙහි "ඡහිසත්ථාරෙහි සද්ධිංදෙවදත්තොචෙව අඤ්ඤෙච එවරූපා" යනුවෙන් ශාස්තෘවරු සදෙන සහ පාරාජිකාවීමෙන් දුස්සීලවූ දෙවදත්තයාද; පාරාජිකාවී එසින් නොනැගිට ශ්‍රමණභාවය අඟවමින් සිටින එබඳුවූ අනිකුදු ශ්‍රමණ දුස්සීලයෝද; විපර්යාස දැකුම්ඇති මිථ්‍යාදෘෂ්ටිහුයයි කීහෙයින්ද; ශ්‍රමණ දුස්සීලතෙමේ තිසරණගත උපාසකයෙකු පමණවත් ගුණවත්තයෙකැයි කවර පාළිඅර්ථකථාදියෙක්හි පෙණේද ?

හොති සොවාරෙරථවාරෙඨානි විරවනෙනාමරති" යනුමෙන්-
"සුගිමුත්‍රාවූයේ කාලක්‍රියාකරයි යනු මරණමඤ්චකයෙහි හොත්තා
වූ ඔහට වනාහි දුස්සීලකර්මයෙහි සමාදන්ව පවත්වනලද කාර
ණය මනොවාරයට ආපාථගතවෙයි; (එලම්බිසිටි); හෙතෙම ඇ
සහැර මෙලොවදකී; ඇසපියා පරලොවදකී; ඔහට සතරඅපා
යයෝ එලඹසිටිත්; අඩයටි සියයකින් ඉසපහරණු ලබන්නෙක්
මෙන්වේයි; හෙතෙම වලක්ව වලක්වවයි මුරගසමින් මැරෙයි;
කියාද දක්වනලදහ:—මෙසේ ප්‍රාතිමොක්ෂසංවර ශීලයාගේ වි
පත්තිනූ විපත්තිදෝෂයෝ සංක්ෂිප්ප වශයෙන් දතයුත්තාහුය:—

මෙතෙකින් අධුනික භද්‍ර ජනයාගේ ප්‍රමෝදය පිණිස කරණ ලද භික්ෂුශීලයෙහි **පාතිමොක්ඛසංවරසීල විපත්තිදෝසනිද්දෙස** නම්වූ තුන්වෙනි පරිච්ඡේදය නිමවනලද්:—

(ප: අ: 3,)

**ඉමංපාතියනිද්දෙසං උග්ගණ්හෙය්‍යොවිචක්ඛණො**
**විපත්තිසීලෙනද්දෙසෙ කතාහත්ථොභවෙය්‍යසො.**

---

කියනලද ප්‍රාතිමොක්ෂ සංවරසීලයෙහි චිරස්ථිතිය පිණිස වදාලාවූ ඉන්ද්‍රිය සංවරශීලය දැන් මෙහි දක්වනුලැබේ—:

(1) "**සොචක්ඛුනා** රූපංදිස්වා නනිමිත්තග්ගාහීහොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකාඅකුසලාධම්මා අන්වාස්සවෙය්‍යුං තස්සසංවරායපටිපජ්ජති රක්ඛතිචක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙසංවරංආපජ්ජති සොතෙනසද්දංසුත්වා–පෙ–ඝාණෙනගන්ධංඝායිත්වා–ජිව්හායරසංසායිත්වා–කායෙන ඵොට්ඨබ්බංඵුසිත්වා–මනසාධම්මං විඤ්ඤාය නනිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී—පෙ—මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජතීති වුත්තමිදං ඉන්ද්‍රියසංවරසීලං" යනුවෙන් එයදක්වනලදී—:භාවය: ඒප්‍රාතිමොක්ෂසංවරශීලයෙහි පිහිටියාවූ භික්ෂුතෙම රූපදශීනයට පොහොසත්වූ උපකාශීශිප්‍රමාණ චක්ෂුඃප්‍රසාදය ඇසුරුකොට පවත්නාචක්ෂුර්විඥානයෙන් වර්ණායතනසංඛ්‍යාත රූපයදැක ලොභාදිකෙලශයන්ගේ ඉපදීමටහෙතුවූ ස්ත්‍රීපුරුෂාදී නිමිති නොගන්නාසුලුවේද; එසේම හස්තපාද විකාරසිනා ගීතිකාවිලොකිතාදි ප්‍රභෙද ආකාරය නොගන්නාසුලුවේද; යම්ඉන්ද්‍රිය අසංවරයක් හෙතුකොටගෙන සිහිනැමතිකවාටයෙන්චක්ෂුර්වාරය නොපියා වාසයකරණ ඒපුද්ගලයා කාමච්ඡන්දව්‍යාපාදාදී අකුශලධර්මයෝ ලුහුබැඳයෙද්ද ඒඅසංවරය සමාතිකවාටයෙන්වසන පිණිස පිළිපදීද; මෙසේපිළිපදින්නේ චක්ෂුන්ද්‍රියරක්ෂාකෙරේ චක්ෂුන්ද්‍රියෙහි සංවරයට පැමිණේ—:සිහින්

තඹමුඳුවක සටහන්ඇති ශ්‍රොත්‍රප්‍රසාදය ඇසුරුකොට පවත්නා
ශබ්දශ්‍රවණයට පොහොසත්වූ ශ්‍රොත්‍රවිඥානයෙන් ශබ්දයන්අසා
ද; එළුකුරයක සටහන්ඇති ඝ්‍රාණප්‍රසාදය ඇසුරුකොට පවත්
නා ගන්ධාඝ්‍රාණයට සමර්ථවූ ඝ්‍රාණවිඥානයෙන් ගන්ධයන්ආඝ්‍රාණ
කොටද; මානෙල්මල්පෙත්තක සටහන්ඇති ජිහ්වාප්‍රසාදය ඇසු
රුකොට පවත්නා රසාස්වාදයට පොහොසත්වූ ජිව්හාවිඥා
ණයෙන් රසයන්ආස්වාදකොටද; කෙස, ලොම, නඛ, ශුෂ්කචර්ම,
පිත්තකොෂ, යනපස්තැනහැර සෙසුසකලශරීරයෙහි පැතිරපැ
වති කායප්‍රසාදය ඇසුරුකොටපවත්නාවූ ස්පර්ශය විඳගැන්මෙහි
පොහොසත්වූ කායවිඥානයෙන් ස්පර්ශයවිඳද; හෘදය වස්තුව ඇසු
රුකොට පවත්නාවූ ධම්විජානනලක්ෂණ මනොවිඥාණයෙන්
ප්‍රසාදරූප, සූක්ෂ්මරූප, චිත්ත, චෛතසික, නිර්වාණ, ප්‍රඥප්ති, යන
සවැදෑරුම් ධර්මාරම්මණයදැනද; ලොභාදි කෙලෙසයන්ගේ ඉපදී
මට හෙතුවූ නිමිතිනොගන්නා සුලුවේද; (එසේම) ආකාරය
නොගන්නා සුලුවේද; —පෙ— (මෙසේ පිළිපදින්නේ) මනෙන්ද්‍රි
යෙහි සංවරයටපැමිණේ"යයි යම්ශීලයක්වදාරණලද්දේද; මෙය
**ඉන්ද්‍රියසංවර සීලනම්වේ**:—(2) තවද—"**චක්ඛුසොතාදි භෙද**
කි රූපසද්දාදිගොචරෙ, අභිජ්ඣාදෙමනස්සාදි, පවත්ති ඒනිවාර
ණියේ—නිග්ගණ්හාය සකංචිත්තං, කිට්ඨාදිං වියදුප්පසුං, සතිමා
සම්පජානොව, චරෙසබ්බිරියාපථෙ"—යනුවෙන්ද ඒඉන්ද්‍රිය සං
වර ශීලය දක්වනලදී—: භාවය: චක්ෂු, ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා, කා
ය, මනස්, යන සදෙරින් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම, යන
ඉෂ්ටානිෂ්ට සාරම්මණයෙහි උපදනාවූ අභිද්‍යාදෞර්මනස්‍යාදි කෙල
ශයන්ගේ උත්පත්තිය වළක්වන්නේය; නොයෙක්තැනින් කුඹු
රටවැද ගොයන්කන්නාවූ කුළුගොනෙකුවැනි නොයෙක් රූපාදි
අරමුණුබලා දුවන තමාගේ සිත වළක්වන්නේයි; සදෙරඑළ
වූ සිහිඇතිවම නුවණ ඇතිවම සියලු ඉරියව්වෙහි හැසිරෙන්නේ
ය; යනුයි:— මේ ඉන්ද්‍රියසංවර සීලයාගේ විපත්තිහා විපත්තිදො
ෂය ආදිත්තපරියාය සූත්‍ර නයින් දතයුතු—: (3)"**ආදිත්තපරියා**
**යංවො භික්ඛවෙ ධම්මපරියායං** දෙසිස්සාමි තංසුණාථ කතමො
ච භික්ඛවෙ ආදිත්තපරියායො ධම්මපරියායො වරංභික්ඛවෙ ත
ත්තාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතා
ය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං නත්වෙව චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙ
සු අනුව්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො, නිමිත්තස්සාද ගථිතංවා
භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය අනුව්‍යඤ්ජනස්සාද
ගථිතංවා තස්මිංසමයෙ කාලංකරෙය්‍ය ඨානමෙතං විජ්ජති යං
ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිංගච්ඡෙය්‍ය නිරයංවා තිරච්ඡාන
යොනිංවා ඉමංඛ්වාහං භික්ඛවෙ ආදීනවංදිස්වා එවංවදාමි" හා

වය: මහණෙනි තොපට ආදිත්තපරියායනම්වූ ධම්මදෙශනා
වක් කියනෙමි; එය අසව්; මහණෙනි ඒ ආදිත්තපරියාය නම්වූ
ධම්මදෙශනාව කවරේද? මහණෙනි ගිනිගෙනැත් වැලඳගන්නාල
ද ගාඪලසින් ඉන්ගෙණ දිලිසෙනලද ආලොකසජාතවූ රත්වූ ය
ශූලකතු චක්‍ෂුරින්ද්‍රිය පිරිමැදීම හෙවත් විනිවිදයාරා උපුටාහෙලී
ම උතුම්වන්නේය; චක්‍ෂුර්විඥානයෙන් දැනගතයුතු රූපයන්හි “අත්
හොබණ්ණුස පාහොබණ්ණුස”යි අනුව්‍යජන වශයෙන් යම් නි
මිත්තග්‍රහණයක්වේද; එසේගැන්ම උතුම්නොවන්නේයි; (කවර
හෙයකින්ද?) කෙලශජනක රූපනිමිත්තයාගේ රස විඳගැන්මෙ
හි ගැලෙනලද්දුව හෝ “හසනපාදාදි අවයවයෝ සුභයහ”යි ගත්
නාලද අනුව්‍යජනයාගේ රසවිඳගැන්මෙහි නැලෙනලද්දුව හෝ
සිටින්නාවූ කම්මජ චක්‍ෂුර්විඥානයක්සිටියේවීනම් ඒ පුග්ගලතෙම එ
සමයෙහි කලූරියකලේනම් . නරකයහෝ තිරිසන්අපාය හෝ
යන දෙගතිනඅතුරෙන් එක්තරාගතියකට උත්පත්තිවසයෙන්
යන්නේය; යන යමක්වේද ඒකාරණයවන්නේය—: මතුපෙය්‍යා
ල වශයෙන් කියනලද්දෙහිද විස්තරයවී මෙසේ දතයුතු:—(4)
“**වරංභික්ඛවෙ තිණ්හෙන** අයොසංකුනා-පෙ-සොතින්ද්‍රියං සම්ප
ලිමට්ඨං—පෙ—තිණ්හෙන නිඛාදනෙන-පෙ-ඝානින්ද්‍රියං සම්පලිම
ට්ඨං-පෙ—තිණ්හෙන ඛුරෙන-පෙ-ජිව්හින්ද්‍රියං සම්පලිමට්ඨං-පෙ-
තිණ්හාය සත්තියා -පෙ- කායින්ද්‍රියං සම්පලිමට්ඨං නත්වෙව කාය
විඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු අනුව්‍යඤ්ජනසො නිමිත්තග්ගා
හො නිමිත්තස්සාද ගථිතංවා භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං
තිට්ඨෙය්‍ය අනුව්‍යඤ්ජනස්සාද ගථිතංවා තස්මිංසමයෙ කාලංක
රෙය්‍ය ඨානමෙතං විජ්ජති යංද්විනනං ගතීනං අඤ්ඤතරංගතිං
ගච්ඡෙය්‍ය නිරයංවා තිරච්ඡානයොනිංවා ඉමංඛවාහං භික්ඛවෙ ආ
දීනවංදිස්වා එවංවදාමි” භාවයශි මහණෙනි තියුණුයකුලකින්
ශ්‍රොත්‍රෙන්ද්‍රිය උපුටාහෙළීම-තියුණුනියනකින් ඝ්‍රාණෙන්ද්‍රිය උපුටා
හෙළීම-තියුණුඛුරයකින් (කඩකැත්තකින්)ජිහ්වෙන්ද්‍රිය ඇදකපා
දැමීම—තියුණුශස්ත්‍රයකින් කායප්‍රසාදය උගුල්වාළීම්වශයෙන් පි
රිමැදීම උතුම්වන්නේය; කායවිඥානයෙන් දැනගතයුතුවූ ස්පර්ශ
යන්හි අනුව්‍යජනවශයෙන් නිමිත්තග්‍රහණය එසේ උතුම්නො
වන්නේය; මහණෙනි නිමිත්තාශ්වාදයෙන් ගැලෙනලද්දුවහෝ අ
නුව්‍යජනාශ්වාදයෙන් ගැලෙනලද්දුවහෝ සිටින්නාවූ කායවිඤ්ඤ
ණය සිටියේවීනම එසමයෙහි(ඒපුද්ගලතෙමේද)කලූරියකලේ
නම් නරකයහෝ තිරිසන්අපායහෝ යනදෙගතින් අතුරෙන්
එක්තරාගතියකට යන්නේය-; (5) “**වරංභික්ඛවෙ සුත්තං** සුත්තං
ඛොපනාහං භික්ඛවෙ ජීවිතානං වඤ්ඣංවදාමි අඵලංජීවිතානං
වදාමි බාලෙවවතන්රූපෙ විතක්කෙ විතක්කෙය්‍ය යථාරූපානං

විතක්කානං වසංගතො සඞ්ඝංභින්දෙය්‍ය ඉමංඛ්වාහං භික්ඛවෙ
ආදීනවංදිස්වා එවංවදාමි” භාවය: මහණෙනි හෙව ශයනයකිරී
ම උතුම්වන්නේය; මහණෙනි හෙව ශයනයකිරීම වනාහි ජීවිත
යන්ගේ වඳකමයයිකියමි; ජීවිතයන්ගේ නිෂ්ඵලකමයයිකියමි; යම්
බඳු පාප විතර්කයන්ගේ වසඟයවගියේ සංඝභෙදය කරන්නේද;
එබඳුවූ කාමවිතර්කාදි පවිටුවිතර්කයන්කල්පනානොකරන්නේය;
(කවරහෙයකින්ද ?කාමවිතර්කාදි නවමහාවිතර්කයන් * කල්පනා
කරණ පුද්ගලයාහට සංඝභෙද ආනන්තරියපවා සිදුවීමෙන් මර
ණින්මතු අතුරුකපක් මුළුල්ලෙහි අවීචිමහානරකයෙහිදුක්විඳින්
ට වනබැවිනි) මහණෙනි මේ දොෂය දැක මෙසේ හෙව ශයනය
කිරීම උතුම්යයිකියමි(වදාළසේක):—(6)මෙසේ ආදිත්තපරියාය
සූත්‍රනයින් ඉන්ද්‍රියඅසංවරයෙහි දොෂදක්නා ශ්‍රද්ධාවන්ත කුලපුත්‍ර
යෝ චක්ෂුරෙන්ද්‍රිය නැලවීමෙහි ඇලුනාවූපළඟැටියාගේ අතිශයින්
දිලිසෙන පහන්දැල්ලෙහි වැටී විනාශවීමද; ශ්‍රොත්‍රෙන්ද්‍රියගේ සැ
පයට අනුවයෙදුනාවූ තරුණමුවන්ගේ මුවවැද්දාවිසින් පවත්ව
නලද මිහිගෙඩි ශබ්දයට ඇසාකිරීමෙන් හීපහරට සම්මුඛවී
මද; ඝ්‍රාණෙන්ද්‍රිය නැලවීමෙහි තත්පරවූ මධුකරීන්ගේ හෙවත් මී
මැස්සන්ගේ මදවැගිරෙණ ඇතුකත්තල පැහැරීමෙන් විනාසවී
මද;ජිහ්වෙන්ද්‍රිය සතුටුකිරීමෙහි ඇලුනාවූ මසුන්ගේ බිලියෙහි ඇ
ම අනුභවකිරීමෙන් විනාසවීමද; කායෙන්ද්‍රිය නැලවීමෙහි ලොල්
වූ තරුණගයනීනුගේ ඇතින්නියන් කෙරෙහි බැඳීමෙන් විනාසය
ට පත්වීමද;බලත්වා:—මෙසේ ඉන්ද්‍රියසංවරශීලයාගේ විපත්තිහා
විපත්ති දොෂ දක්නා කුලපුත්‍රයන්විසින් ඉන්ද්‍රිය අසංවරයෙන්ම ජා
තාදි සියලු සංසාරදුකද; අටමහානරකාදි සියලු අපායදුකද; පැමි
ණෙනබවසලකා අනාදිමත් සංසාරයෙහි ඉෂ්ටානිෂ්ට රූපාදිසාර
මුණෙහි ගිජුවනුව හැසිරීමෙන් ආ කුළුගොණෙකුවැනි මේචිත්තය
ස්මෘතිරැහැනින් කායගතාසති භාවනානැමැති ටැඹෙහිබැඳ සියලු
ඉරියව්වෙහි සම්පජානකාරිව යම් ඉරියව්වෙක්හි යම්බඳුලොභාදි
කෙලශයෝ උපදනාහුවෙද්ද; ඒ ඉරියව්ව පෙරළීමෙන් ඒ කෙල
ශයන් පටිසංඛාන ප්‍රහාණාදියෙන් ප්‍රහීනකරමින්වාසයකළයුතුයි.

මෙතෙකින් ආධුනිකහුදී ජනයාගේ ප්‍රමොදය පිණිස කරණල
ද භික්ෂුශීලයෙහි ඉන්ද්‍රියසංවරශීල නිද්දෙස නම්වූ සතරවෙනි පරි
ච්ඡෙදය නිමවනලදී:—

---

* කාම, ව්‍යාපාද, විහිංසා, ඤාති, ජනපද, අමර, පරානුද්දයතා
ප්‍රතිසංයුක්ත, ලාභසත්කාර ශ්ලොක ප්‍රතිසංයුක්ත, අනවඥප්ති ප්‍ර
තිසංයුක්ත, විතර්කයෝය. පරමාර්ථ ජොතිකා අටුවාවෙහි බලනු.

(ප: අ: 4.)

**සොමතිමා අවබුජ්ඣතිඑතං ඉන්ද්‍රියසංවරශීලවිභාගං**
**ඉන්ද්‍රිය'සංවර ගිරුකාදබෙබා භාවිතඉන්ද්‍රියකො'ස භවෙශ්‍යං**

---

ඉන්ද්‍රියසංවරශීලයාගේ සම්පාදනයෙන් යම් ශීලයක් රක්‍ෂාකට යුතුවේද; එහෙයින් දැන් ඒ ආජීවපාරිශුද්ධිසීලය දක්වනුලැබේ–: (1) "**සාජීවහෙතු පඤ්ඤත්තානං ඡන්නංසික්ඛාපදානං** අවීතික්කමස්ස කුහණා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතාති එවමාදීනඤ්ච පාපධම්මානං වසෙන පවත්තා මිච්ඡාජීවා විරති, ඉදං ආජීවපාරිසුද්ධිසීලං" යනුවෙන් එය දක්වනලදී—: භාවය: ආජීවය හෙතුකොටගෙණ පණවනලද ශික්‍ෂාපද ෂට්කය නොඉක්මවන්නාහුගේ කුහණා, ලපනා, නෙමිත්තිකතා නිප්පෙසිකතා, ලාභෙනලාභං නිජිගිංසනතා, යන මේ ආදීවූද ලාමකස්වභා වශයෙන් පැවති මිථ්‍යාආජීවයෙන් යම් වැළැක්මක්වේද; මේ විරතිචෛතසිකයතෙම ආජීවපාරිශුද්ධිශීල නම්වේ—: (2) එහි ආජීවයනිසා පණවනලද ශික්‍ෂාපදසයකවරේද? :—ආජීවය හෙතුකොටගෙණ එය කාරණකොටගෙණ තෘෂ්ණාවෙන් මඩනාලද්දාවූ නැතිගුණ ප්‍රකාශකරණ අදහස් ඇති භික්‍ෂූහට පැමිණෙන මේ ප්‍රකරණයේ ප්‍රථම නිර්දෙසයෙහි කියනලද **උත්තරිමනුස්සධම්ම** පාරාජිකාපත්තියද, '**සංචරිත්ත** සඞ්ඝාදිසෙසාපත්තියද; "යමෙක් තොපගේ වෙහෙරවෙසේද ඒ භික්‍ෂුතෙම රහත්"යයි පර්යාය වශයෙන් උතුරු මිනිස්දම් ඇඟවීමෙන් වන **ථුල්ලච්චයාපත්තියද; පණීතභොජන විඤ්ඤත්ති** පච්චිති ඇවතද; d **සූපොදන විඤ්ඤත්ති** දුක්කෘතයද; විඤ්ඤත්තියෙන් ප්‍රණීත භොජනයක් ලැබ අනුභවකිරීමෙන් භික්‍ෂුනීන්ටවන **පාටිදෙසනීයා**පත්තියද; යනමොහුයි:—(3) එහි කුහණාතොම කවරේද?:—ලාභසත්කාර කීර්ත්ති ප්‍රශංසා ඇසුරුකළාවූ පවිටු අදහස්ඇති ඉච්ඡාවෙන් මඩනාලද්දහුගේ ලැබෙණ සිව්පසය වැළැක්වීම්සංඛ්‍යාත "**පච්චයපටිසෙධන**" කොහොන්වතින් හෝ; තමන්ගුණයන් ලොකෝත්තර ගුණයට ආසන්නකොට කියනලද "**සාමන්තජප්පන**" කොහොන්වතින් හෝ; ගරුකාරකැමැත්තාවූ පවිටු අදහසගේම ඇතිබව හෙතුකොටගෙණ "මෙසේමාආයසියෙකැයි ලොවැසිතෙමේ දැනගනීවා" යන අදහසින් **ඉරියාපථ සණ්ඨපනාදි** වශයෙන් කරණලද කොහොන්වතින් හෝ; ලෝකයා විස්මපත්කිරීමයි:—(4) එහි ලපනාතොම කවරේද?:-

---

d මෙහි පාටිදෙසනීය ඇවත භික්‍ෂුණීන් පිළිබඳ හෙයින් අපක්‍ෂිසනතාට පිළිවෙලනැර අන්තිමට යෙදූබව දතයුතු.

ලාභාදිය ඇසුරුකළාවූ පවිටුඅදහස්ඇති ඉච්ඡාවෙන් මඩනාලද්ද
හුගේ වෙහෙරට පැමිනි භික්ෂූන්දැක "පින්වත්නි කුමක්පිණිස
අව්ද, ඉදින් දත්පිණිස භික්ෂූන්ට ආරාධනාවට අවිනම් මම භි
ක්ෂූන්රැගෙණ එන්නෙමි" යනාදිවශයෙන් පළමුකොට කථාකි
රීම් සංඛ්‍යාත ආලපනහා ලපන සමුල්ලපනාදියකිරීමයි:-(5) එහි
නෙමිත්තිකතාතොම කවරේද?:—යටකියනලද අදහස් ඇත්තහු
ගේ දායකයන් ඉදිරියෙහි බඩගිණිදක්වන පිණිස කුසපිරිමැදීම්
ඈදී කායකම්මයද; බත්මදවී එය අගවනපිණිස "අදවෙහෙරබත්
වැහිරගියේය" යනාදිවාක්කම්මයද; කිරීම් සංඛ්‍යාත නිමිත්තකම්ම
ඔභාසාදිය කිරීමයි:-(6) එහි නිප්පෙසිකතාතොම කවරේද?:-
ලාභාදිය ඇසුරුකළාවූ පවිටුඅදහස් ඇති ඉච්ඡායෙන් මඩනාලද්
දහුගේ සිව්පසය නොදෙන්නවුන් "භයගන්වා ප්‍රත්‍යයලබමි"
යන අදහසින් දශවිධආක්‍රොශයෙන් ආක්‍රොෂකිරීම හා වම්භන
ගරහණ ඛිපනාදිය කිරීමයි:—(7) එහි ලාභෙනලාභං නිජිගිංස
නතාතොම කවරේද?:—යථොක්ත අදහස් ඇත්තහුගේ ස්වල්ප
ලාභයෙන් වැඩිලාභයක් වන්වාකොට ගැණීමෙහි කැමැත්
තෙන් එකකුලයකින්ලද ප්‍රත්‍යයගෙණ අනික්කුලයකට ගොස්
එහි අගයකියා දරුවන්හටදී එතනින්ලදප්‍රත්‍යයගෙණ තවත්තැ
නකටගොස් එසේකොට ගැණීම්වශයෙන් ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය
වැඩිකිරීමයි:—මේකුහණාදි පදයන්ගේ අතිසංක්‍ෂෙපයි විස්තර
කැමැති අයවිසින් විසුද්ධිමාර්ගයෙන් අසාබලා දතයුතු:—(8) ඒ
මේ මිථ්‍යාආජීවයතෙම "**එවමාදීනඤ්ච පාපධම්මානං වසෙන පව
ත්තා**" යන්නෙහි ආදිග්‍රහණයෙන් දක්වනලද හස්තපාදාදි අවය
වයන් නිසා පැවති අඞ්ගවිද්‍යාය, සකුණිරාවාදි නිමිත්තෙන් ප්‍රවෘත්ත
නිමිත්තශාස්ත්‍රය, උල්කාපාත දිග්දාහ භූමිචාලාදියෙන් ප්‍රවෘත්ත
උත්පාතවිද්‍යාය; ස්වප්නයන්ගේ ගුණ ගුණ දක්වන ස්වප්නශා
ස්ත්‍රය; ස්ත්‍රීපුරුෂ ලක්‍ෂණ දක්වන ලක්‍ෂණශාස්ත්‍රය; මීයන්විසින්
කනලද වස්ත්‍රාදියෙහි ගුණාගුණ දක්වන මූෂිකශාස්ත්‍රය; අග්නි
හොමයෙහි ගිණිවණ්ණයෙන් ගුණාගුණදක්වන අග්නිහොමශාස්ත්‍ර
ය; යානසැනෙහි ගුණාගුණ දක්වන දබ්බිහොමශාස්ත්‍රය; යනාදි
බුඩාගමෙන් පිටත් නානාප්‍රකාර තිරශ්චීනවිද්‍යාවන්ගේ වශයෙන්
ද, ඒක්විසි **අනෙසන, අෂ්ටකුලදූෂණ** වශයෙන්ද, විඤ්ඤත්ති, රූපි
ය සංවොහාර, කායවිකනයවශයෙන්ද, පැවැත්තේවේ:—(8-1) එ
හි ඒක්විසි අනෙසනය කවරේද!:—"**වෙළුදානං පුප්ඵදානං** පත්ත
දානං ඵලදානං දන්තකට්ඨදානං මුඛොදකදානං සිනානදානං චු
ණ්ණදානං මත්තිකාදානං චාටුකම්‍යතං මුග්ගසූප්‍යතං පාරිභට්ට
කතං ජඞ්ඝපෙසනියකං වෙජ්ජකම්මං දූතකම්මං පහෙණගම
ණං පිණ්ඩපතිපිණ්ඩා දානානුප්පදානං වත්ථුවිජ්ජා නක්ඛත්තවිජ්ජා

අඞ්ගවිජ්ජා'' යනුවෙන් දක්වනලද නොපණත්දෙය කිරීමයි-: එහි භාවය: උපස්ථායකාදීන් සතුටුකොට ප්‍රත්‍යයලබණඅදහසින් වෙහෙර උපන්නාවූ හෝ අරණ්‍යාදියෙන් ගෙණ එන ලද්දාවූ හෝ සඞ්ඝගණ පුද්ගල තමන්සන්තකවූ හුනදඬුදීම; එසේම පුවගුමල් සපුමල්ආදි මල්දීම; තාම්බූලතාලපත්‍ර ආදිපත්‍රදීම; තල්පොල් කොස්දෙල්ආදි ඵලවර්ගදීම; දැහැටිදඬුදීම; මුවදෝනාපැන්දීම; නහනපැන්දීම; මනරිසුණු කෙළිදසුණුආදි සුණුදීම; ප්‍රකෘතිමැටි පළවර්ණමැටි ආදි මැටිදීම; උපස්ථායකයන් විෂයෙහි තමන්දාසයෙක්මෙන් පවත්වනලද නිච්චවෘත්තිතායයි කියනලද චාටුකම්‍යතාය; ඣවුමුංසේ ජනයා සිත්ගැණීමපිණිස සැබෑමද කොට බොරු බොහෝකොට කියන මුග්ගසූප්පතාය; කුලයාඅයන් දරුවන්ට වස්ත්‍රාදියදී අලංකාරකිරීමෙන් කැවුන් කෙසෙල් ගෙඩි දෙමින් හිස අතගාමින් නැලවීම් සංඛ්‍යාතපාරිභට්ටකතාය; ග්‍රාමාන්තර දෙසාන්තරාදීන්හි ඒ ඒ ගෘහස්ථයන්ගේ හසුන් පිළිහසුන්ගෙණ යාම්ඊම් සංඛ්‍යාත ජඞ්ඝපෙසනිය; පැමිණි නොපැමිණි සියලුදෙනාට වෙදකම් කිරීම; ගෙන්ගෙට ගිහියන්ගේ පනිවුඩකීම් සංඛ්‍යාතදූතකම්මය; කොත්වත් අරන්ආදියට මෙහෙවර පිණිස යන පහෙණ ගමණය; තමාලද මනාප්‍රත්‍යය කුලයන්ටදී උන්ගෙන්ලද දෙයගැණීම් සංඛ්‍යාත පිණ්ඩ ප්‍රතිපිණ්ඩය; ලංභාශාවෙන් අල්ලස්ආදියදීම; ලින්බිම් ගෙබිම් ආදිය දක්වන්නාවූ වස්තුවිද්‍යාය; තිථිහොරා නක්‍ෂත්‍රවිධි දක්වන්නාවූ නක්‍ෂත්‍රවිද්‍යාය; අඞ්ගප්‍රත්‍යඞ්ගලක්‍ෂණ දක්වන්නාවූ අඞ්ගවිද්‍යාය; යනුයි-මේ එක්විසි ධර්මයෝ පැවිද්දන්විසින් නොසෙවිය යුතුහෙයින් නොහොත් නොකළයුතුහෙයින් අනෙසනයෝ නම්වෙති:--(8-2)

එහි අෂ්ටකුල දූෂණය කවරේද ?:—"**කුලදූසකො හි, කුලානි දූසෙති** පුප්ඵේනවා ඵලෙනවා චුණ්ණේනවා මත්තිකායවා දන්තකට්ඨේනවා වෙළුයාවා වෙජ්ජිකායවා ජඞ්ඝපෙසනිකෙනවා"යනුවෙන් වදාළ(අනෙෂණයෙනිම කී)පුෂ්පාදියෙන් කුලයන්සංග්‍රහකිරීමෙහි චේතනාවෝයි-: මොව්හු ලජ්ජී ප්‍රියශීලි භික්‍ෂුන්කෙරෙහි කුලපුත්‍රයන්ගේ ශ්‍රද්ධාව දූෂ්‍යකරණහෙයින් කුලදූෂණනම් වෙති:-

එයින් කෙසේශ්‍රද්ධාවදූෂ්‍යවේදයත්? යම්කිසිභික්‍ෂුවක්තෙම"පැහැදියයුතුතැන,නොපැහැදියයුතුතැන, ලජ්ජීසවභාව, අලජ්ජීසවභාව ගුණකියයුතුඅය, ගුණනොකියයුතුඅය, මේමේය"යි දායකාදීන්ට කියානොදී එහි මූලාකොට තමන්කෙරෙහි පහදවාගැණීමට පමණක් යටකී පුෂ්පාදියෙන්සංග්‍රහකිරීමෙන් උන්ගේසිත්සතුටුකරවාද, භික්‍ෂුධර්මය කුමක්දැයි නොදත් ඒ දායකාදීහුද අශුචියට ලෝල්වූ තිලමැස්සන්සේ අශුචියක්වැනි ඒ කුලදූෂක අලජ්ජීයාකෙරෙහි මූලාවීමෙන් පහදිති—: ඉක්බිති ඒ අලජ්ජීභික්‍ෂුතෙම ත

මත්ගේ ස්වභාවයෙන් වෙන්ව වසන ලජ්ජී ප්‍රියශීලී ශික්ෂාකාමී සෙසු
භික්ෂූන්කෙරෙහි "ඔව්හු කුහකයෝය සීලවන්තයෝ නම් අභසින්
යති දුස්සීල අලජ්ජීන්සොයන්ටබැරිය විනයපටිච්ඡන්නාය අභිත්ව
ජයට (සිවුරට) පැහැද පරම්පරාව අදහා දන්දීමෙන් බොහෝ අ
නිසංසය" යනාදි ලෙමාතුඅක්ගෙණබණකීමෙන් දායකයන් අප්‍ර
ශන්නකරවයි-: **කිම්භාගිරිකථාව** මීට සාධකයි: එසේ අලජ්ජීබන්ධ
නයට අසුවූනුදායකයන්ගේ ශ්‍රද්ධාඥාන්ද්‍රිය මුල්සිඳීමෙන් ලජ්ජීප්‍රියශී
ලීන් කෙරෙහි ආගම පරිද්දෙන් නොපැහැදීම මෙහි ශ්‍රද්ධාවගේ
දූෂ්‍යබවයයි දතයුතු-: ගැරඬියාගේ වෙළ්‍රීමක්වැනි අලජ්ජීදුස්සීල
වෙඨනයෙන්වෙළුණු ඒ දායකයෝද අගුණකියයුත්තාගේ ගුණකී
ම, ගුණකියයුත්තාගේ අගුණකීම, නොපැහැදිය යුතුතැන පැහැ
දීම, පැහැදියයුතුතැන නොපැහැදීම, යන සිව්මහාදෝෂයට පැමි
ණීමෙන්. මරණින්මතු අපායභාගීවෙති:—(8-3) එහි විඤ්ඤත්ති
තොමෝකවරේද?: ශිලත්කාලයෙහි බෙහෙත්හැර සිව්පසය පි
ළිබඳදෙය නොනෑ නොපැවරුවන්ගෙන් ඉල්වාගැණීමයි-: එහි
නොනෑයෝනම් කවරහුද?:—ජෙට්ඨභාතා කනිට්ඨාච, ත
ථා භගිණීයොදුවෙ, චූලමාතා චූලපිතා, මහාමාතා මහාපිතා; මා
තුවජා මාතුලොචෙ'ති, දසමෙ ඤාතයොමතා—යනුවෙන් කිය
නලද වැඩිමහළු සහෝදර, සහෝදරී, බාලසහෝදර, සහෝ
දරී, සුළුපියා, මහපියා, සුළු මව, මහ මව, නැනඳ, මාමා, යන දස
දෙනාගේ සත්කුල පරම්පරාගත නෑයන්හැර සෙසුලෝකයායි-:
එහි නොපැවරුවෝනම් කවරහුද?:— "**වදභණෙන පච්චයෙන**" ය
නාදිවශයෙන් "වහන්ස සිව්පසින් උවමනාකල්හිමට දැනුන්දුන
මැණවැයි" සාමාන්‍ය ප්‍රත්‍යයනාමයෙන් හෝ; "සිවුරෙන් ප්‍රයෝ
ජන ඇතිකල්හි මටකියව"යි යනාදි විශෙෂවශයෙන් ඒඒ ප්‍රත්‍යය
නාමයෙන් දව්ගිම්කොටහෝ දවස් මාස අවුරුදුවශයෙන් කාලප
රිච්ඡේදකොටහෝ ආරාධනාකොට කප්පියකාරකනොවූවෝයි-:
මෙහි සංඝයාට කැපකරුවූවෝය පුද්ගලයාට කැපකරුවූවෝයයි
කැපකරුවෝ දෙකොටසකි-: කැපකරුවී උපස්ථානකිරීමෙහි වි
ශෙෂ ආනිසංසද ඇත්තේය—: එය උපළුපන්තැන වෙළඳාම්ආදි
යෙන් වස්තු සපයනකල්හි පෙරජාතිවල සංඝයාහටහෝපුද්ගල
යාහටකැපකරුවී උපස්ථානකළනොකළ විධිවශයෙන් සතරාකා
රයකින් ඒඒ දායකයන්හට වස්තු ලැබෙන නොලැබෙනබව ආන
ඤ්සර්ව්ර මාගිම්යානන්වහන්සේට වදාරතිබේ:—(8-4) එහි රූපිය
සංවොහාරය කවරේද?:—දුෂකෘත වස්තුවෙන් දුෂකෘතවස්තුවක්
හෝ නිස්සග්ගිය වස්තුවක්හෝ කැපවස්තුවක්හෝ, නිස්සග්ගියව
ස්තුවෙන්නිස්සග්ගිය වස්තුවක්හෝ දුෂකෘත වස්තුවක්හෝ කැප
වස්තුවක්හෝ, කැපවස්තුවෙන් දුෂකෘතවස්තුවක්හෝ නිස්සග්ගි

ය වස්තුවක්හෝ පෙරළීමයි හෙවත් නුවමාරුකිරීමයි—: එහි අත ගැනීමත්හා පිළිගැණීමෙත් දුකුලාඇවත් අවදනා මුතු, මැණික්, වෛඩූර්‍යය, සක්, ගල්, පබළු, මැසිරිගල්, රතුකැට, යනාමොහුද; ය ටකියනලද සප්තවිධධාන්‍යද; බෙර, වීනා, දවුල්, තම්මැට්ටන්, කා හිපුනු, ආදී සියලු තූර්‍ය්‍යභාණ්ඩද; කඩු, තෝමර, කිරිච්චි, තුවක්කු, දුල්, අකුලු, කරග්ගෙඩි, ආදි සත්ව හිංසාවපිණිස සාදනලද සිය ලු ආයුධ භාණ්ඩද; සියලු ස්ත්‍රීරූපද; ස්ත්‍රී ආභරණද; ස්ත්‍රී, කුමාරිකා දාස, දාසි, අජ, එළක, කුක්කුට, සූකර, කුක්කුර, ඇත්, අස්, ගව, මහිස වතුපිටි, ගම් කුඹුරු, පලදරණ වෘක්ෂ, ගස්වලතිබෙන සියලු අමු ගෙඩිවර්ගද යනාදිය දුෂ්කෘත වස්තූහුයි-: රන්, රිදී, මසු, කහව නු, යනමොහු නිස්සග්ගිය වස්තූහුයි—: බොම කොසෙය්‍යාදි සිවුරු පිළි, පාත්‍ර, වස්ත්‍ර, බත්, සහල්, ගිතෙල්, සීනි, සූකිරි, හකුරු, පැනි, ආදී භි ක්ෂූන්ට කැපදෙය මෙහි කැපවස්තූහුයි—: (8–5) එහි ක්‍රයවික්‍රය කා වරේද?:-යටකී ඒ කැපවස්තූන් පස්සහදූමියන්හැර සෙසු අය සම ග යටත්පිරිසෙයින් මාතෘ පිතෘන් සමගවත් "මේ චීවරාදියගෙණ තොපසන්තක ඔයපාත්‍රාදියමට දෙව්ය"යි ගණුදෙනුකිරීමයි-: රූ පියසංවොහාරය, දුෂ්කෘත නිස්සග්ගි කැපවස්තූන් පිළිබඳය; ක්‍රයවික්‍රා ය, කැපවස්තූන්ම පිළිබඳය; මේ රූපිය සංවොහාර ක්‍රය වික්‍රාය දෙදෙනාගේවෙනසයි—: මෙසේකියනලද අකැප ආකාරයෙන් උපන්දෙය අනුභවකිරීමෙන් භික්ෂූන්ගේ ආජීව පාරිසුද්ධිශීලය වි පත්තිවේ:—දැන් ඒ ආජීවවිපත්තියෙහි දොෂ දක්වනුලැබේ—:

(9) **පුබ්බහන්ති අත්තානං** පච්ඡාහන්ති සොපරෙ
සුහතංහන්ති අත්තානං විතංසෙනෙව පක්ඛිමා.

භාවය: දුස්සීලවූ ඒකුහක භික්ෂුතෙම පළමුකොට තමන් (අ න්ධකාරයෙන් අන්ධකාරයට විනිපාතයෙන් විනිපාතයට පමු ණුවමින්) නසයි; පසුව (තමන් ආර්‍ය්‍යයෝකැයි සලකා ප්‍රත්‍යයදෙ න) දායකයන් (ඔවුන්ගේ අදහස නිශ්ඵලකිරීමෙන්) නසයි; ප ක්ෂිවැදිතෙම විතංසපක්ෂියා කාරණකොටගෙණ පක්ෂීන් මරන් නාක්මෙන් කුහනවෘත්තියෙන් තමන් මනාකොටම නසයි:— (10) තවද—**තිණ්හෙන ගොවිකත්තෙන**, වරං කුච්ඡිවිදාරණං, අකුසෙන ලද්ධලාභෙන, නතුකුච්ඡිපූරයෙ—භාවය: තියුණු කොට මුවහත්තබනලද ගෙරිමස්තාපන කැත්තෙන් බඩපැළීම උතුම්වන්නේය; තමාකෙරෙහි නැතිරහත්බව නොහොත්ලෝ කෝත්තරධර්මය ඇඟවීමෙන් ලබණලද ලාභයෙන් බඩනො පුරවන්නේය:—(11) "**සෙපත්‍අනෙසනාය ජීවිකං** කප්පෙන්ති තෙජීවිකං කප්පෙත්වා යක්ඛත්තංවා පෙතත්තංවා පත්වා බුරගො නාවාහුත්වා තිබ්බත්ථියසන්ති නිරයෙවා පටිසන්ධිං ගණ්හියසන්ති

අනෙසනාය උප්පන්නාපිණ්ඩපාතො ආදිත්තලොහගුළසදිසො
හලාහලවිසූපමො අනෙසනංහිනාම බුද්ධපච්චෙකබුද්ධ අග්ග
සාවකෙහි ගරහිතං"—: භාවය: යම් භික්ෂුකෙනෙක් වනාහී
එක්විසි අනෙශනයෙන් දිවිපවත්වද්ද; ඔව්හුවනාහි (එසේ) දිවි
පවතා යක්ෂබවටහෝ ප්‍රේතබවටහෝ පැමිණ උපදිත්; ගැල්ඇ
දිනා ගවයෝවහෝ උපදිත්; අවීචිමහානරකාදි අටමහනරකයෙ
හි ප්‍රතිසන්ධිගණිත්; අනෙශනයෙන් උපන් පිණ්ඩපාතය ගිනිගෙ
න දිලිසෙන ලොහොගුළිසමානය; හලාහල විසයකට උපමා
ඇත්තේය; අනෙශනය වනාහි බුද්ධප්‍රත්‍යෙක බුද්ධ අග්‍රශ්‍රාවක
යන්විසින් ගර්හාකරණලදී:-(12) තවද ––– ජීවිතඤ්ච අධම්මෙන,
ධම්මෙනමරණඤ්චයං, මරණං ධම්මිකංසෙය්‍යො, නොචෙජීවෙ
අධම්මිකං ––– භාවය: යම් අධර්මජීවිකායෙන් ජීවත්වීමක්වේද;ධ
ර්මජීවිකායෙන් ජීවත්වනු නොහැකිවීමෙන්යම් මියයාමක්වේද;
(එයින්) ධර්මයෙන් ජීවත්වනු නොහැකිවීමෙන්වන ධාර්මික ම
රණය උතුම්වන්නේය; අධර්මජීවිකායෙන් ජීවත්වීම උතුම්නො
වන්නේය:—(13) තවද; "අනගාරියොහි ඉමස්මිං සාසනෙ පබ්බජි
ත්වාදූතෙය්‍ය පහෙන ගමණං ඉච්ඡති වෙජ්ජකම්මං කරොති සංඝ
භෙදාය චෙතියභෙදාය පරක්කමති වෙළුදානාදිහි ජීවිකංකප්පෙ
ති සකලම්පිඅනාචාරං අගොචරං පරිපූරෙති අයමස්ස අනගා
රිය පටිපත්තිදුග්ගති සොතාජ්ඣිතො, කායස්සභෙදා නිරයම්පිග
ච්ඡති තිරච්ඡාන යොනිම්පිගච්ඡති පෙත්තිවිසයම්පි ගච්ඡති ස
මණයක්ඛානාම හොති සමණපෙතො, ආදිත්තාහි සංඝාටි ආ
දිත්ත සම්පජ්ජලිතකායො අට්ටස්සරංකරොන්තො විචරති" භා
වය: මේ සර්වඥශාසනයෙහි පැවිදිවූ අනාගාරික (භික්ෂු) තෙම
වනාහි (අභිජ්ඣාවිසමලොභාදී උපක්ලෙශයන් විසින්) මොන
වට කෙලසනලද සිත්ඇත්තේ (යටකියනලද) දූතෙය්‍යපහෙ
නගමන් රුචිවෙයිද; වෙදකම්කරයිද; චෛත්‍යභෙදයක් වැනීසං
ඝභෙදය පිණිස උත්සාහකරයිද; වෙළුදානාදි (කුලදූෂන)යෙන්
ජීවිකාවකරයිද;සියලුම අනාචාරඅගොචරයන් සම්පූර්ණකරයිද;
මේ ඔහුගේ අනගාරිකප්‍රතිපත්ති දුර්ගතියයි;හෙතෙම ඒ දුර්ගති
ප්‍රතිපත්තියෙහි සිටියේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි
(පිරිවරසහිත සංජීවාදිඅටමහා) නරකයටයයි; තිරිසන් අපාය
ටදයයි; ප්‍රේතලොකයටදයයි, ශ්‍රමණයක්ෂයෙක්දවෙයි; ශ්‍රමණ
මහාප්‍රෙතයෙක්දවෙයි; (එහි) ගිණිගෙන දිලිසෙන සංඝාටි ආ
දියෙන් මනාකොට දිලිසෙනලද ශරීරඇත්තේ උස්වූ හඬින්
හඬමින් හැසිරෙයි:—මෙසේ ආජීවවිපත්තියෙහි දොෂ දක්නා
ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයන්විසින් අධර්මයෙන් උපන්ප්‍රත්‍යය නපු
රුවිෂයක්මෙන් සලකා දුරින්ම දුරුකිරීමෙන් පිණ්ඩපාතයෙන්

හා සංඝභාතා උද්දෙස භතතාදී තුදුස්බතින්ද තමන්ගුණයෙහි පැහැදුනවුන් විසින් දෙනලද බත්ආදියෙන්ද දිවිපවත්වමින් ආජීවපාරිසුද්ධිශීලය සම්පාදනය කටයුතුයි:—

මෙතෙකින් අධුනික භුදිජනයාගේ ප්‍රමෝදය පිණිස කරණලද භික්‍ෂුශීලයෙහි **ආජීවපාරිසුද්ධි ශීලනිද්දෙස** නම්වූ පස්වෙනි පරිච්ඡෙදය නිමවනලදී:—

(ප: අ: 5.)

**ජානාතෙව'ං ඹුතන'මෙතං මයාසො**
**නිද්දෙසං ආජීව සුද්ධිප්ප කාසං**
**මිච්ඡා'ජීවෙ සිරුකො සො ධිතිමා**
**සුධා'ජීවො හොති අච්චන්ත'මෙව.**

---

කියනලද ආජීවපාරිසුද්ධිශීලයාගේ සම්පාදනයෙන්ම යම් ශීලයෙක් රක්‍ෂාකටයුතුයයි වදාළේද, එහෙයින් දැන් ඒ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය කියනුලැබේ—:(1)**"පටිසංඛායොනිසො චීවරංපටිසෙව** ති යාවදෙව සීතසස පටිඝාතායාති ආදිනා පනනයෙන වුතෙතා පටිසංඛාණ පරිසුද්ධො චතුපච්චයපරිභොගො පච්චයසන්නිස්සිත සීලංනාම" භාවය: නුවනින් පරීක්‍ෂාකොට සිවුරුවැලඳගත්තේය; යම්තාක් සීතපිඩානසන පිණිසයයි යනාදී ක්‍රමයෙන් කියනලද ප්‍රත්‍යවෙක්‍ෂාවෙන් පිරිසිඳුවනලද සිව්පස ප්‍රයෝජනගැන්ම(තථාප්‍රවෘත්තඅනවද්‍යචෙතනාව)ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලනම්වේයනුයි:—ආජීවය කරුණුකොටගෙණ පණවා වදාළ ශික්‍ෂාපදසය නොයික්මවා යටකී කොහොන්වනිත්ද, නානාප්‍රකාරතිරශ්චීනවිද්‍යාවන්ගේ වශයෙන්ද; අනෙසනාදීන්ගේ වසයෙන්ද; රූපියසංවොහාරාදී වශයෙන්ද; විඤ්ඤත්තිවසයෙන්ද; පැවතිමිථ්‍යාආජීවයෙන් තොරව දැහැමෙන් සෙමෙන්ලබනලද චීවරාදී සිව්පසය "පටිසංඛායොනි සොචීවරං පටිසෙවති" යනාදී වශයෙන් වදාළ චීවරපරිභොග ප්‍රත්‍යවෙක්‍ෂාය;පිණ්ඩපාත පරිභොග ප්‍රත්‍යවෙක්‍ෂාය; සෙනාසනපරිභොග ප්‍රත්‍යවෙක්‍ෂාය; ගිලානපච්චය පරිභොග ප්‍රත්‍යවෙක්‍ෂායයි සිව්ආකාර ප්‍රත්‍යවෙක්‍ෂායෙන් සිවුපසය ප්‍රයෝජනගැණීමෙහි උපදනා අනවද්‍යචෙතනාව,ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය නම්වේ-: යනුභාවයි:—(2) එහි චීවර පරිභොග ප්‍රත්‍යවෙක්‍ෂාතොම කවරේද?:—**"පටිසංඛායොනිසො චීවරං** පටිසෙවති, [a] යාවදෙවසීතසස පටිඝාතාය උණ්හසස පටිඝාතාය, ඩංසමකස වාතාතපසිරිංසප සම්ඵස්සානංපටිඝාතාය, යාවදෙවහිරිකොපීන පටි

---

[a] ප්‍රත්‍යවෙක්‍ෂා කිරණ භික්‍ෂුව විසින් "පටිසෙවාමි"යි කියයුතු. මතු "පිණ්ඩපාතං පටිසෙවති" යනාදියද මෙලෙසයි.

ච්ඡාදනත්ථං" යි වදාළලෙසින් "යම්තාක් අධ්‍යාත්මික ධාතු කිපීම්
වශයෙන්ද බාහිරඍතු පෙරළීමාදී වශයෙන්ද උපන්සීතලන
සන පිණිස; (එසේම උපන්) උෂ්ණය නසන පිණිස; ඩැහැලේ
බොණ මැස්සෝය මිදලේ බොණ මැස්සෝය සරජ අරජාදිවා
තය අව්වය, දට්ඨපුට්ඨවිෂඇති දීඝජාතිකසර්පයෝය යන මො
වූන්ගේ ස්පර්ශයන්නසනපිණිස; යම්තාක් (සියලුකල්හි) ලජ්ජාකි
පෙනතැන් වසනපිණිස;යයි මෙසේ නුවණින් පරීක්ෂාකොට සි
වුරුවැලඳගණීයි" ප්‍රයෝජනගැණීමක් පාසාසැලකීමයි:—මෙ
සිත් ලීලාඅලංකාර සැරසිලිආඩම්බරපිණිස හැඳීම්පෙරවීමාදිය කි
රිමප්‍රතික්ෂෙප කරණලදී:—(3)එහි පිණ්ඩපාතපරිභොග ප්‍රත්‍යවෙ
ක්ෂාතොමෝ කවරේද?: —"**පටිසංඛායොනිසො පිණ්ඩපාතංපටි**
සෙවති නෙවදවාය, නමදාය, නමණ්ඩනාය, නවිභූසනාය, යා
වදෙව ඉමස්සකායස්සඨිතියා, යාපනාය, විහිංසූපරතියා, බ්‍රහ්මච
රියානුග්ගහාය, ඉතිපුරාණඤ්චවෙදනං පටිහංඛාමි නවඤ්චවෙ
දනංනඋප්පාදෙස්සාමි, යාත්‍රාචමෙභවිස්සති අනවජ්ජතාච ඵාසු
විහාරොචාති"යි වදාළලෙසින් "ගම්දරුආදීන්මෙන් නොම ක්‍රීඩා
පිණිස; මුට්ඨිමල්ලාදී යෝධ භටයන්මෙන් නොමබලමද පුරුෂම
ද වඩනාපිණිස; අන්තඃ පුරවෙසඟනන්මෙන් නොමඅඟප්‍රත්‍ය
ඟයන්ගේ වැඩීමපිණිස; නටන නටවන නෘත්‍යකාරයන්මෙන්
නොමප්‍රසන්න ජව්ව [illegible] පිණිස; (පිණ්ඩපාතය ප්‍රයෝජනග
ණිම්)යම්තාක් මේ චතුමහාභූතික රූපසමූහය සම්බන්ධ ජීවිතෙ
න්ද්‍රියයාගේ පැවැත්මපිණිස; විහිංසාසංඛ්‍යාත බඩසය ව්‍යපසමණ
යකරණපිණිස; (ව්‍රණාලෙපයක්මෙන්ද සීතොෂ්ණාදිය ඇතිකල්
හි ඊටකරණ ප්‍රතිකාරයක්මෙන්ද මේ පිණ්ඩපාතය ප්‍රයෝජන
ගණිම්) ශාසනබ්‍රහ්මචය්‍ය්‍යාවට අනුග්‍රහ පිණිස (හෙවත් අධිශී
ල අධිචිත්ත අධිප්‍රඥයනත්‍රිශික්ෂායෙහි අනුයොගවශයෙන් භව
කාන්තාරයෙන් එතරවනුපිණිස; (කාන්තාරයෙන් එතරවණු
කැමති අඹුසැමිදෙදෙනා විසින් අනුභවකරණලද පුත්‍රමාංසයක්
මෙන්ද; නදියෙන් එතරවනුකැමැත්තහු විසින් නගිනලද පසු
රක්මෙන්ද; සමුද්‍රයෙන් එතරවනුකැමැත්තහු විසින් නගිනලද
නාවුකාවක්මෙන්ද; සලකානෘෂ්ණාවෙන් නොගිජුව නොමුළාව
මේපිණ්ඩපාතය ප්‍රයෝජනගනිම්;)මෙසේ මේපිණ්ඩපාතපරිභො
ගයෙන්භොජනයට පූර්වකාලික බැවින් පුරානයයි කියනලද ක්ෂු
ධාවේදනාව නසම්කියාද; අහරහත්ථක, අලංසාටක තත්‍රාවට්ටක,
කාකමාසක, භුත්තවමිත, බමුණන්සෙයින් ක්ෂුධාශාන්තිප්‍රමාණයට
අධිකකොට අනුභවකිරීමෙන් උපදනා අලුත්වේදනා සංඛ්‍යාත
භක්තමූර්ඡාව නූපදවන්නෙමි, කියාද; (මේපිණ්ඩපාතය ප්‍රයෝජ
නගනිම්; මෙසේ පස්විකාගැන්මෙන්) මාගේ ප්‍රත්‍යයප්‍රතිබද්ධ ප්‍රවෘ

තනිඇති මේ ශරීරසම්බන්ධ සතර ඉරියව්වගේ නොසිඳපැවැත්මයයි කියනලද යැපීමවත්තේය; බුද්ධනින්දිතමිථ්‍යාජීවයෙන් ප්‍රත්‍යය සෙවීම; පමණ නොදැනහෝ විනිපාතනය පිණිස පිළිගැන්මුනොපස්විකාවැලඳීම; යනමේ අයුක්තපරිෂෙශන අයුක්තප්‍රතිග්‍රහණ අයුක්තපරිභොගයන් දුරුකිරීමෙන් ධර්මයෙන් ප්‍රත්‍යයසොයං ධර්මයෙන්(දායක,දානවස්තු, ප්‍රතිග්‍රාහකප්‍රමාණයෙන්)පිළිගෙණ පස්විකාවූලඳිම් සංඛ්‍යාතනිරවද්‍යබවද;සතරපස් ආලෝපයක් පමණ ඌනකොට වැලඳීමෙන් සතර ඉරියව්වගේ යොග්‍යබව සපයන බැවින් පමණ දැන වැලඳීමෙන්ම ඇතිවන පහසුවිහරණයද වත්තේයයි තුළුකින්සලකා පිණ්ඩපාතය ප්‍රයෝජනගණියි” මෙසේ පිඩක්-පිඩක් පාසාප්‍රත්‍යවෙක්‍ෂා කිරීමයි—; මෙම පිණ්ඩපාත ප්‍රත්‍යවෙක්‍ෂායෙහි දක්වනලද නෙවදවාය, නමදාය, නමණ්ඩනාය, නවිභූෂනාය, යන සතර අඟයෙන්ම අයෝනිසො ප්‍රතිපත්ති සංඛ්‍යාතසියලු මිථ්‍යාප්‍රතිපත්තීන්ගේද; අනන්තසුඛල්ලිකානුයොගයයි කියනලද වස්තුකාමකෙලශකාම දෙක්හි කරණලද ඇලීමගේද ප්‍රහාණකිරීම කියනලදැයි දක්වනලදී—: යාවදෙව ඉමස්සකායස්ස ඨිතියායාපනාය, විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්චවෙදනං පටිහංඛාමි, නවඤ්චවෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රාචමෙභවිස්සති අනවජ්ජතාච, ඵාසුවිහාරොච, යනමේ අටපෙදෙන් භොජනානිසංස අෂ්ටාංගය දක්වනලදී—: මෙසේමේ ප්‍රහාතව්‍යඅඟසතරින්ද ආනිසංසඅෂ්ටාංගයෙන්දැයි ද්වාදශාංගයෙන් සමන්විත පිණ්ඩපාත ප්‍රත්‍යවෙක්‍ෂාව දතයුතු:—(4) එහි සෙනාසන පරිභොග ප්‍රත්‍යවෙක්‍ෂානොම කවරේද?:—“**පටිසංඛායොනිසො සෙනාසනං** පටිසෙවති, යාවදෙවසීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං”යි වදාළලෙසින් “යම්තාක් අධ්‍යාත්මික ධාතු කිපීම් වශයෙන්ද බාහිර ඍතුපෙරළීමාදි වශයෙන්ද උපත්සීතොෂ්ණයන් නසනපිණිස; ඩැහැලේ බොණමැස්සෝය විදලේබොණ මැස්සෝය සරජ අරජාදිවාතය අව්වය, දටඒජුටධවිෂඇති දීඝජාතික සර්පයෝය, යන මොවුන්ගේ සපර්ශයන් නසනපිණිස; යම්තාක්(සියලුකල්හිම) ශරීරපීඩාවිත්ත විකෂෙප යන මොවුන් ඇතිකරන්නාවූ යම්සීතොෂ්ණාදි නොසැපසෑතුවක් සෙනසුන් වැලඳගැන්මෙන් දුරුකටයුතුවේද; ඒ නොසැපසෑතුව දුරුකරණපිණිස; සිංහව්‍යාඝ්‍රාදිප්‍රකට උපද්‍රවය සාරම්මුණෙහි රක්‍ෂනදුස්සනවශයෙන් පවත්නාරාගමෙෂාදි අප්‍රකට උපද්‍රවයයි දක්වනලද දෙවදෑරුම්වූ යම් උපද්‍රවකෙණෙක් යම්විවෘතාඝන වෘක්‍ෂමූලාදියක හුන්නෙකුට අසංවෘතවාර ඇතිබැවින් අසප්පාය රූපදශිනාදියෙන් ආබාධකරද්ද,

එය සෙනසුන් වැදළුත්නහුට නොවනබැවින් ඒ ප්‍රකට අප්‍රකට පරිශ්‍රවයන් නසනපිණිස; නානාලම්බණයෙහි විසිරපවත්නාචිත්තය එයින් හකුළුවා කමටහන්වූ එකඅරමුණෙක නැවැත්වීම් සාඛ්‍යත පටිසල්ලානාරාමය පිණිස;යයිනුවණින් සලකා සැතපෙණ හිඳිනා සෙනසුන් ප්‍රයෝජනගති''යි මෙසේ ප්‍රයොජනගැන්මක් පාසා කල්පණාකොටගැණීමයි:-(5)එහි,ගිලානපච්චයපරිභොග ප්‍රත්‍යවෙක්ෂාතොමකවරේද?:-''පටිසංඛායොනි සො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣපරමතාය''යි වදාළ ලෙසින් ''යම්තාක් උපන්නාවූ ධාතුක්ෂොභලක්ෂණ දදකුෂ්ට පිළිකාදි නානාප්‍රකාර වේදනාවන්ගේ නැසීමපිණිස; නිදුක්බව පරමකොට; (හෙවත් යම්පමණ කාලයකින් ඒ සියලු දුක ප්‍රහීණවේද ඒතාක්) නුවනින් පරීක්ෂාකොට; ගිලන්හුගේ රෝගය සංසිඳුවන්නාවූ වෙදහු විසින් අනුදන්නාලද ගිතෙල් වෙඬරු ආදි ජීවිතපරිවාර බෙහෙත් සම්භාරය; ප්‍රයොජනගති''යි මෙසේ ප්‍රතිලබ්ධපරිභොග කාලයන්හි) සැළකීමයි:—(6)මෙසේ කියනලද සිව්පස ප්‍රත්‍යවෙක්ෂාතොමෝ වර්තමාන ප්‍රත්‍යවෙක්ෂාය; අතීතප්‍රත්‍යවෙක්ෂායයි දෙවැදෑරුම්වේ—:එහි ඒ ඒ ප්‍රත්‍යයන් ලැබුණුකල්හිද පරිභොගකරණ කල්හිද යටදැක්වූ ක්‍රමයෙන් නුවනින් සලකා ප්‍රත්‍යය ප්‍රයෝජනගැණීම වර්තමාන ප්‍රත්‍යවෙක්ෂා නම්වේ—; ''මයා 'පච්චවෙක්ඛිත්වා අජ්ජ යං චීවරං පරිභුත්තං තං යාවදෙව සීතස්ස පටිඝාතාය—පෙ—හිරිකොපීන පටිච්ඡාදනත්ථං, යථාපච්චයං පවත්තමානං ධාතුමත්තමෙවෙතං යදිදං චීවරං තදුපභුඤ්ජකොච පුග්ගලො ධාතුමත්තකො නිස්සත්තො නිජ්ජීවො සුඤ්ඤො සබ්බානිපන ඉමානිචීවරානි අජිගුච්ඡනීයානි ඉමංපූතිකායංපත්වා අතිවිය ජිගුච්ඡනීයානිජායන්ති'' යනුවෙන් සැළකීම අතීතප්‍රත්‍යවෙක්ෂානම්වේ-:භාවය: අදමාවිසින් ප්‍රත්‍යවෙක්ෂා නොකොට යම් සිවුරක් ප්‍රයොජනගත්නාලද්දේද; එය යම්තාක් සීත නසනපිණිස-පෙ-ලජ්ජාකිපෙණ තැන්වසනපිණිස;(ප්‍රයෝජනගතිමි)යම්යම් ප්‍රත්‍යයක්(කුමක්ද?)යම්යම් සිවුරක් පරිභොගවශයෙන් පවත්වනලද්දේද එය ධාතුමාත්‍රයක; හෙවත් ආපො තෙජෝවායොපඨවි වර්ණගන්ධරසඔජායන සුද්ධාෂ්ටකමාත්‍රයක එය අනුභවකළ පුත්ගලතෙමේද(මමද)ධාතුමාත්‍රයක;(සුද්ධාෂ්ටකමාත්‍රයක)එහෙයින්නිස්සත්තය;එහෙයින් නිජ්ජීවය;එහෙයින් ශූන්‍යය; පිළිකුල්කටයුතුවූ මේ සියලුම චීවරයෝවනාහි දෙතිස්කුණපකොට්ඨාස සංඛ්‍යාත මේ කුණුකයටපැමිණ අතිසයින්පිළිකුල්කටයුත්තාහුවෙති; (සුද්ධාෂ්ටකය සුද්ධාෂ්ටකයම වැළඳගති.)යනුයි- මේ අතීත ප්‍රත්‍යවෙක්ෂාතොමෝ පිණ්ඩපාතාදීන්යෙහිද මේ නයින්

දතයුතු-: මේ අතීත ප්‍රත්‍යවෙක්ෂාතොම පෙරවරු පස්වරු පෙරයම මැදුම්යම පසුයම යන පස් ස්ථානයෙහි සැලකියයුතු-: මෙසේ කියනලද වර්තමාන අතීත යන ද්විධ ප්‍රත්‍යවෙක්ෂායෙන් නොපස්විකා සිව්පසය පරිභොගකරන්නාහට එදවස අරුණුනැගීමෙන් ඉණපරිභොගවේ:-ආජීවවිපත්තියෙන්හා තෘෂ්ණාවෙන් ගෙනි ප්‍රත්‍යය ප්‍රයෝජනගැණීමෙන් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයවිපත්තිවේ-: දෑන් ඔහුගේවිපත්තිදොෂයෝ දක්වනුලබත්-: (7) යකඩින් නැගාවූමලය එසිත්ම නැගි ඒයකඩයම යම්සේකයිද; එසේම සතරපසද පස්විකා පරිභොගකරණ ප්‍රඥාහීන්මුණු සතරපසය නොපස්විකාව ලදන මහණනු, සවකීයවූ එමකර්මයෝ හෙවත් තමාසතන්හි උපන්නාවූ තෘෂ්ණාසංඛ්‍යාත ඒ අකුසලකර්මයෝ සතරඅපායාදි දුර්ගතියට පමුණුවන්නාහුය:— එහෙයින් වදාළහ — අයසාවමලං සමුට්ඨිතං, තදුට්ඨාය තමෙව ඛාදති, එවංඅති ධොණචාරිනං, සකකම්මානි නයන්ති දුග්ගතිං — උපායෙන් යුක්තවූ මනුෂ්‍යයෝ ගින්නෙන් කටයුතුදෙය බොහෝ කලකුදු කරන්නාහු ගින්නෙන් සිදුවන දහදොෂයට නොපැමිනෙත්, අනුපායෙන් ගින්නට ලංවූවාහු ගින්නෙන් පැමිනෙන දහදොෂයෙන් යුක්තවූවාහු ගින්නෙන් කටයුතු කෘත්‍යයකරගත නොහැක්කාහු දරුණුදුකට පැමිනෙත් — චීවරාදි සිව්පසය ගිනිසෙයින් දතයුත්තාහුය; ඒ ගින්නට නුවනින් ලඟාවීමසෙයින් ආසාව පෙරදැරිනොකොට පස්විකා ආහාරාදි ප්‍රත්‍යයන්ගේ ප්‍රයෝජනගැන්ම දතයුතුයි — රසතෘෂ්ණාවෙන් ගෙනුනාවූනොපස්විකා වැලඳීමෙහි දොෂනොදන්නාහෙයින් මොහයෙන්මුළාවූ අනුන්විසින් දෙනලද ආහාරය (සිව්පසය) ප්‍රයෝජනගන්නාවූ ශ්‍රමණතෙමබල්ලන් විසින් වමාරණලද්දක් (බඑවමණයක්) කන්නාහුසෙයින් නින්දකටයුතුයි — ප්‍රත්‍යයසෙවීමෙහි පිළිගැණීමෙහි වැල්දීමෙහි පමණද; පමණදැනීමෙහි ආනිශංසයද; දුරුකටයුතු නොවටනා නොසරුප්දෙයද තත්වූපරිද්දෙන්ම බොහෝසෙයින් ප්‍රත්‍යවෙක්ෂාකොට (පස්විකා) සිව්පසය ගිනිසෙයින් ඉස්වනයකරත්තේය; (ප්‍රයෝජනගත්තේය) එහෙයින් කීහ — අග්ගිනාකරණීයානි, කාරෙන්තාසුචිරම්පිච, අග්ගිදොසං නපප්පොන්ති, උපායො'පගතා නරා — අනුපායෙනු'පගතා, අග්ගිදොසෙන අට්ටි'තා, සකාළුඛා අසාධෙන්තා, දුක්ඛාපපෙප්පොන්ති දාරුණං — අග්ගිවපච්චයාසෙයන, අසඤ්ඤ යො'පගමොචිය, සොන්නදුබ්බමසංඛාය, ආහාරාදිනිසෙවනං — ගපිතොමුවජිතො සනෙන්තා, භුඤ්ජනෙතා පරභොජනං ශූවාඛන්තාංව භුඤ්ජනෙන්තා, සමණොස්ඣ ජිගුච්ඡියො — මනන්තං ළිගාතාතිසං සඤ්ච, පහාතබ්බඤ්ච තං තතො, බහුසො පච්චවෙක්ඛිත්වා, භජෙඅගගී'ව පච්චයෙ: — (8) තවද-යම්කිසි ශ්‍රමණබ්‍රා

ගමණ කොණක් චීවරාදි චතුර්විධ ප්‍රත්‍යයෙනි ලැබෙත්තාවූ ව ර්ණ(රූප)ශබ්ද, ගන්ධ, රස, ඕජාහෝවත් ස්පර්ශ, යනමේපඤ්චකා මය තෘෂ්ණාවෙන් ගෙතුනාහු; තෘෂ්ණාවෙත්මූලාවූවාහු; තෘෂ්ණා වෙහි බැසගත්තාහු; නොපස්විකා වැලඳිමෙහි දෝෂනොදත්තා හු; ප්‍රත්‍යවෙක්ෂාකරණයෙහි තොරවූවාහු; අනුභවකරද්ද; ඒ ශ්‍ර මණබ්‍රාහ්මණයෝ නැසීමට පැමිණියාහුය; විනාසවීමට පැමිනි යාහුය; මාරයාගේ වසඟයට පැමිණියාහුයයි; දතයුත්තාහුය-: එහෙයින් **“යෙකෙචි භික්ඛවෙ සමණාවා** බ්‍රාහ්මණාවා ඉමෙප ඤ්චකාම ගුණෙගපිතා” යනාදියවදාළසේක:-(9) තවද, ශ්‍රද්ධාදෙ ය චීවරාදි ප්‍රත්‍යය සෙවනයකරණ ප්‍රව්‍රජිතතෙමේ කාන්තාරයට පැමිණි මාතෘපිතෘන්ගේ පුත්‍රමාංස භොජනයක්මෙන්ද; රියස ක සිදුරෙහි තෙල් ප්‍රවේස කිරීමක්මෙන්ද; ව්‍රණාලෙප ඖෂධ යක්මෙන්ද; චතුර්විධ ප්‍රත්‍යය සෙවනය කරත්තේය—: එහෙ යින් “කන්තාරෙ පුත්තමංසංච අක්ඛස්සබ්භඤ්ජනංවිය, භෙ සජ්ජංච වණාලෙපං, පච්චයෙ පටිසෙවයෙ” යනුවදාළහ:-

මෙතෙකින් අධුනිකහුදී ජනයාගේ ප්‍රමොදයපිණිස කරණ ලද භික්ෂුශීලයෙහි **පච්චය සන්නිස්සිත සීලනිද්දෙස** නම්වූ හතෙ නි පරිච්ඡේදය නිමවනලදී.

(පː අː 6.)

**බුජ්ඣන්තිභාවෙන්චයොමතිමා වුත්තනම්'දං ජඨමනිද්දෙසං**
**පච්චයසන්නිස්සිත සීලස්මිං හොතිසසක්කං ගුරුබුද්ධිසො.**

---

කියනලද සතර සංවරශීලයාගේ කෞශල්‍යයපිණිස දත් මෙ හි මිශ්‍රකසංග්‍රහයක් දක්වනුලැබේ—: (1)සිව්පස පරිභොගයෝ ච නාහි ථෙය්‍යපරිභොග, ඍණපරිභොග දායජ්ජපරිභොග, සාමිපරි භොග ය,යි සතරදෙනෙක්වෙති-: සඟමැද ඉඳකත්තාවූද දුස්සී ලයාගේ සිව්පසපරිභොගය බුදුන්විසින් දුස්සීලයාහට සිව්පසය අනුදැනනොවදාළහෙයින්ද දායකයන්විසින්නොදෙනහෙයින්ද; * **ථෙය්‍යපරිභොග** නම්වේ; සිල්වත්හුගේ ප්‍රත්‍යවෙක්ෂා නොකො ටගැණීම **ඍණපරිභොග** නම්වේ; සප්තවිධ ශෛක්ෂයන්ගේ සිව්ප ස පරිභොගය තෙම **දායජ්ජපරිභොග** නම්වේ; ඔව්හුවනාහි භා ග්‍යවතුන්වහන්සේගේ පුත්‍රයෝය; එහෙයින්පියාසන්තකප්‍රත්‍යය යන්ටඅයිතිකාරයෝවී ඒ ප්‍රත්‍යයයන්පරිභොගකරත්; රහතන්ගේ පරිභොගය **සාමිපරිභොග** නම්වේ; උන්වහන්සේලා චන්හි තෘ

* දැනට අච්චුගැසී තිබෙන “දුශ්ශීලසාංග්‍රහ හෙදය” නමැති පොතෙන් මෙහි විස්තර බලාගතයුතු.

ෂණාවට්වාල්බව ඉක්මෙව්බැවින් ස්වාමිභූවීප්‍රත්‍යයඅනුභවකරණ,
සිල්වත්භික්ෂූන් විසින් ප්‍රත්‍යවෙක්ෂාකොට කරණලද සිව්පසප
රිභොගය (දායජ්ජපරිභොගයෙහි ඇතුළත් නමුදු ආවේනිකව)
**අනන්‍යපරිභොගයයිද** කියතුලැබේ-:මෙහි ඉනපරිභොගය නො
වටී; ථෙය්‍යපරිභොගය (වටිද නොවටිදයතු) කියතුමකිම-: එ
හෙයින් "**චත්තාරොමෙපරිභොගා**" යනාදිය වදාළසේක.—(2) ල
ජ්ජිපරිභොග අලජ්ජිපරිභොග,ධම්මියපරිභොග,අධම්මියපරිභො
ග,යයි අන්‍යවූද සතරපරිභොග කෙණෙක්වෙති—: ලජ්ජිභික්ෂුව
විසින් ලජ්ජිභික්ෂුවසමගකරණලද පරිභොගය; **ලජ්ජිපරිභොග**
නම්වේ—ලජ්ජිභික්ෂූනුවිසින් අලජ්ජියාසමග කරණලද පරිභොග
ය; අලජ්ජිභික්ෂුව විසින් ලජ්ජිභික්ෂුවසමග කරණලදපරිභොගය;
අලජ්ජිභික්ෂූනු විසින් අලජ්ජිභික්ෂුවසමග කරණලද පරිභොගය;
**අලජ්ජිපරිභොග** නම්වේ; එහි අලජ්ජියාහට ලජ්ජින්සමග කරණ
ලද පරිභොගයවටී;ලජ්ජිභික්ෂූනට අලජ්ජින්සමග කරණලද පරි
භොගය යම්තාක්කල් නොදනීද ඒතාක්වටී; ලජ්ජිභික්ෂුව සන්ත
කධාර්මිකපිණ්ඩපාතය අනුභවකිරීම **ධම්මියපරිභොග** නම්වේ; ල
ජ්ජියාසන්තක අධාර්මිකපිණ්ඩපාතය; අලජ්ජියාසන්තක ධාර්මිකපි
ණ්ඩපාතය;අලජ්ජියාසන්තක අධර්මිකපිණ්ඩපාතය; අනුභවකිරීම්
**අධම්මිය** පරිභොගනම්වේ: එයින් ධම්මියපරිභොගය වටී: එහෙ
යින් "**අපරෙපිචත්තාරො පරිභොගා**" යනාදිය වදාළසේක:-(3)
ලජ්ජිපරිග්‍රහ අලජ්ජිපරිග්‍රහ ධම්මපරිභොග ආමිසපරිභොග,යයි
අන්‍යවූද පරිග්‍රහදෙකෙක්ද පරිභොග දෙකෙක්ද වෙති—: අල
ජ්ජිභික්ෂුවක් විසින් ලජ්ජිභික්ෂුවක්ලවා සිව්පිරිසටබණ කියවීම් ගු
ණානුමොදනාකරවීම් ඉච්ඡු තැලයාට අඩුත්වාදීම් වශයෙන් සං
ග්‍රහකිරීම(බලදීම)ලජ්ජිපරිග්‍රහනම්වේ; එයවටී—: ලජ්ජියෙක් වි
සින් අලජ්ජිභික්ෂුවක්ලවා ප්‍රේමයෙන් එසේකරවීම අලජ්ජිපරිග්‍රහ
නම්වේ-:එය ආපත්තිකරවේ-: ඒ අලජ්ජිසංග්‍රහයකරණ (අලජ්ජි
හටබලදෙන) ලජ්ජිභික්ෂුතෙම සර්වඥශාසනය පසු බස්වන්නෙක්
ද; අතුරුදම් කරන්නෙක්දවෙයි, කවරහෙයකින්ද?—තස්මා එ
කො අලජ්ජිපි, දුස්සීලො අසමාහිතො, අලජ්ජිසතසහස්සම්පි, කා
රෙතිහිපකාසිතා—යනුවෙන් "එසේ බලලද කායවාක් සංවර ර
හිත දුස්සීලවූ අලජ්ජිතෙම තමන්වැනි අලජ්ජින්ලක්ෂයකුදු කරා
ය"යි කියනලද හෙයිනි-: පොහොය පවාරණාදිවිනය කම්මකිරී
ම නිසගැණීම බණ ඉගෙණගැණීම යනාදි සියල්ල ධම්මපරිභො
ගනම්වේ-: යම් ලජ්ජිභික්ෂුවක්සමග ආමිසපරිභොගයවටිද! ධ
ම්මපරිභොගයත් එහිවටී, එහෙයින් අලජ්ජින්ගෙන් ධම්මයඉගෙ
ණගන්නාභික්ෂූහුද අලජ්ජිමවෙති-: සිව්පසපිළිබඳදෙය ප්‍රයෝජ
නගැණීම **ආමිසපරිභොග** නම්වේ-: එහෙයින් "**අපරෙපිමෙපග්ග**

**ඤෙව පරිභොගාච**" යනාදිය වදාළසේක:—(4) තවද, චතුර්විධ ශු
ක්‍ෂුශීලයතෙමේ විරතීන්ගේ වශයෙන්ද දතයුතුයි. ශික්‍ෂාපදයන්
ඉක්මීමෙන් වැළැක්ම; ඉන්ද්‍රිය අසංවරයෙන් වැළැක්ම; මිථ්‍යාආජී
වයෙන් වැළැක්ම නොපස්විකා වැලඳීමෙන් වැළැක්ම; යන විර
තීන්විසින්සතරවැදෑරුම්වේ. එහෙයින්කීහ— **සික්ඛාපදාතික්කම
නො**, ඉන්ද්‍රියානං අගුත්තිතො, මිච්ඡාජීවා' පභොගාච, විරතීති ච
තුබ්බිධා—(5) මේසතරසංවරශීලයතෙමශ්‍රද්ධා, ස්මෘති, වීර්‍ය්‍ය, ප්‍රඥා,
යනසතරචෛතසිකධර්මයන් විසින්ඉසිලියයුතුවේ: භාග්‍යවතුන්
වහන්සේවිසින්අනුදැන වදාලාවූප්‍රාතිමොක්‍ෂසංවරශීලයෙහිඇතු
ලත් ශික්‍ෂාකොට්ඨාසය ශ්‍රද්ධාවන්ත්‍යා විසින් ශ්‍රද්ධාවම ප්‍රධානකො
ටගෙණ ඉසිලියයුතුයි. සතර ඉරියව්වෙහි එලඹවා තබනලද
සිහිඇත්තහු විසින් ස්මෘතිධුරයෙන් ඉන්ද්‍රියසංවරශීලය ඉසිලිය යු
තුයි. එක්විසි අනෙසන ඇපටතුල දූෂනාදියෙන් නොඇළුනාවූ
වීර්‍ය්‍යයෙන් දැහැමෙන් ප්‍රත්‍යය සොයන්නහුවිසින්ම ආජීවපාරිසුද්ධි
ශීලය ඉසිලියයුතුයි. යටකියනලද ක්‍රමයෙන් නුවනින් ප්‍රත්‍යය
ප්‍රයෝජන සළකන්නහු විසින්ම ප්‍රත්‍යය සංනිශ්‍රිතශීලය ඉසිලිය
යුතුයි. එහෙයින් කීහ— **සද්ධාසතිච විරියං**, පඤ්ඤාච අනුපුබ්බ
තො, චතුබ්බිධධුරෙනෙව, තං සීලංපරිරක්ඛියා'— (6) මේ ති
ක්‍ෂුශීල සංඛ්‍යාතසතර සංවරශීලයෙහි දෙසනාසුද්ධි, අධිට්ඨානසුද්ධි,
පාරියෙට්ඨිසුද්ධි, පච්චවෙක්ඛණසුද්ධි, යයි ප්‍රභෙදවශයෙන්සුද්ධීහු ස
තරදෙණෙක්වෙති. එහි, ප්‍රාතිමොක්‍ෂ සංවරශීලයතෙම පරිවාස
මානත්ත, අබ්භාන, යන ත්‍රිවිධවිනයකර්මය කිරීමෙන් උට්ඨාන
ගාමී වශයෙන්ද; ඔවුනොවුන් ඉදිරියෙහි සිදුවූවරද ප්‍රකාශකොට
ලජ්ජාභය උපදවා ගැණීමෙන් මතුසංවරයෙහි පිහිටීම් වශයෙන්
දෙසීමෙන්දැයි යන දෙයාකාරදෙශනාවෙන් සුද්ධවන හෙයින්
**දෙසනා**සුද්ධියයි කියනුලැබේ. එහෙයින්කීහ— **දෙසනා සංවරෙ**
ට්ඨි'ති' පච්චවෙක්ඛණ භෙදතො, සුද්ධි චතුබ්බිධා පානි. මොක්ඛ
සංවර සම්මතං, දෙසනාය විසුද්ධත්තා, දෙසනා සුද්ධිවුච්චති—
ඉන්ද්‍රියසංවරශීලයතෙම "නපුනෙවංකරිස්සාමි" යනාදිවශයෙන්
නැවතඑසේ නොකරම්යි තදලෙසඅටානෙණ මතුසංවරවීමෙන්
සුද්ධවන හෙයින්**අධිට්ඨාන**සුද්ධිනම්වේ. එහෙයින්කීහ— **නපුනෙ
වං**කරිස්සාමි, චිත්තාධිට්ඨාන සංවරා, වුත්තො සංවරසුද්ධී'ති' සුද්ධ
ති'න්ද්‍රියසංවරෙ— ආජීවපාරිසුද්ධිශීලයතෙම, අනෙසනයෙන් ප්‍ර
ත්‍යයසෙවීම හැර වීර්‍ය්‍යයෙන් දැහැමින් ප්‍රත්‍යයසොයන්නාහට සු
ද්ධවනහෙයින් **පාරියෙට්ඨි** සුද්ධියයි කියනුලැබේ. එහෙයින්කීහ
— **පහාය'නෙසනං** ධම්මෙ, නු'ප්පාදෙන්තස්ස එට්ඨියා, සුද්ධ
ත්තාපට්ඨිසුද්ධී'ති' වුත්තන'මාජීව නිස්සිතං— ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීල
යතෙම, නුවනින්(ප්‍රත්‍යයසෙවනයෙන්)ප්‍රයෝජනය සලකා ප්‍රත්‍ය

ය නැණිමෙන් ශුද්ධවන හෙයින් පච්චවෙක්ඛණ ශුද්ධියයිකියනුලැබේ. එහෙයින්කීහ—යොනිසො පටිසංඛාය, චීවරං පටිසෙවති, එවමාදියථාවුත්තා, පච්චවෙක්ඛණ සුජ්ඣනා, පච්චවෙක්ඛණ සුද්ධී'ති'වුත්තාංපච්චයනිස්සිතං—දැන් සංක්‍ෂෙපයෙන් සීලානිසංසය දක්වනු ලැබේ. (7) දෙශනාදිචතුර්විධශුද්ධියෙන් ශුද්ධකොට රක්‍ෂාකරණලද චතුර්විධභික්‍ෂුශීලරත්නය; සිතූසිතූනාක් සියලුසම්පත්තිය සිද්ධකරන්නේය. ඒසීලාලංකාරයෙන් සැරසුණුයොගාවචරතෙම ජාතියෙන් චණ්ඩාලවූයේද, ජාතිසම්පන්න නරෙන්ද්‍ර නාගෙන්ද්‍ර දෙවෙන්ද්‍රබ්‍රහ්මෙන්ද්‍රාදි මහොත්තමයන්ගේ සත්කාර ගරුකාර මානනපූජනාදිය ලබන්නේය. සිල්වතුන්ගේ කල්‍යාණ කීර්ත්තිඝොෂා තොමෝ සාගරපර්යන්ත සියලු පොළෝමණ්ඩලයෙහි පැතිරඑකණෙහි බ්‍රහ්මාණ්ඩයටද නැගින්නේය. තමන්ගේ අඛණ්ඩාදි ගුණසම්පන්න ශීලය ප්‍රත්‍යවෙක්‍ෂා කරණ භික්‍ෂුහට උපදිනා නිරවද්‍යසුඛය නරෙන්ද්‍ර නාගෙන්ද්‍ර අසුරෙන්ද්‍ර දෙවෙන්ද්‍ර බ්‍රහ්මෙන්ද්‍රයන්හටද දුර්ලභවන්නේය; "වරකුඩු රක්‍ෂාකරණලද උපොසථශීලය එකණෙහි දිව්‍යසම්පත්තිය පිණිස පවතී"යයි වදාල හෙයින්සව්ශීලශ්‍රෙෂ්ඨවූ ශ්‍රෙෂ්ඨභික්‍ෂුශීලයෙහි වාදීන්ද්‍රමුනීන්ද්‍රයන් හැර කවරෙක් ආනිසංස වර්ණනාකෙරේද?: ඒහෙත් මුනීන්ද්‍රතෙමේ "එකදවසකුඩු අඛණ්ඩාදිභාවයෙන් රක්‍ෂාකරණලද භික්‍ෂුශීලය තෙම චරිමකචිත්තයයි කියනලද අර්හත්ඵල චිත්තයඵලවා"යයි වදාළේය. හෙදවනාහි චිත්තසුද්ධිආදියට උපකාරබැවින් වදාළහයි දතයුතු. (8) සීලයෙහි මෙසේ මහත් ආනිශංසඇත්තේයයි දන්නාවූ සසරභයදක්නා භික්‍ෂුතෙම එක ඇසක් ඇත්තෙක් ඒ ඇසයම් සේරක්‍ෂිද ඒමෙන්භික්‍ෂුශීලයරක්‍ෂාකරන්නේය. එහෙයින්කීහ—එවංමහානිසංසත්ති, විදිත්වා සීලසම්පදං, නයනං එකනෙත්තාව, රක්ඛෙ සීලංචතුබ්බිධං—උත්සර්ගාදිවිශුද්ධියෝ චතුර්විධ භික්‍ෂුශීලය රක්‍ෂාකොට එහි ආනුභාවයෙන් ස්කන්ධ,ක්ලේශ,අභිසංඛාර, මෘත්‍යු, දෙවපුත්‍ර,යන පඤ්චමාරයන් පරාජයකලෝය හෙවත් නිර්වාණපුරප්‍රාප්තවූවෝය. මෙසේ ශීලානිසංසය සිතන්නාවූ පණ්ඩිතභික්‍ෂුතෙම ජීවිතය හෙතුකොටද ශික්‍ෂාපදනොකඩකොට අකුසීතව සමථවිදර්ශනාභාවනාවන් ගැටෙමින් වීර්‍ය්‍යකරන්නේය; ක්ලෙශපරිනිර්වාණය කරන්නේය හෙවත් අමෘතමහානිර්වාණය අත්පත්කරන්නේය. එහෙයින්කීහ—පාතිමොක්ඛසංවරෙ ඉන්ද්‍රියා'නුරක්ඛණං, පච්චයා'නුවෙක්ඛණං ජීවසුද්ධි එවච, නාවතුබ්බිධං බුධා සීලසුද්ධිම්'ඛියා, පූරයිත්වා පණ්ඩිතා මාරමද්දනං කතා—ඉති සීලගුණං විජානනයනෙන්තා, කුසලො ජීවිතහෙතුතො'පිසීලං, අවිඛණ්ඩිය සාධුසොධයනෙත්තා, අභිනිබ්බාති අතන්දිතො ඝටනෙත්තා—(9)මෙසේ කියනලදපරිච්ඡෙදන්සීල,

සීලවිපත්ති, විපත්තිදොෂ, සීලානිසංසයන් දැක සීලයෙහි පිහිටි
ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයන් විසින් "**සමාදින්නසීලෙන යොගිනා** ධුත
ඞ්ගසමාදානං කාතබ්බං"යි දක්වූහෙයින් ශීලයාගේවොදානය(පිරි
සිදුබව)පිණිස යම්කිසිධුතාඞ්ගයක් සමාදන් වියයුතුයි. ඒ ධුතඞ්ග
යෝවනාහි—**පඤ්ච**සෙනාසනෙවුත්තා, පඤ්ච අාහාරනිස්සිතා
එකො විරියසංයුත්තො, වෙච චීවරනිස්සිතා—යනුවෙන්'සෙ
නාසනයෙහි අල්පෙච්ඡසන්තුෂ්ටභාවයපිණිස අාරණ්‍යික රුක්ඛමූ
ලික අබ්භොකාසික සොසානික යථාසන්ථතික යනඅඞ්ගපසද; පි
ණ්ඩපාතයෙහි අපිස්සතොස් බැවිපිණිස,පිණ්ඩපාතික සපදානචා
රික එකාසනික පත්තපිණ්ඩික ඛලුපච්ඡාභත්තික යනඅඞ්ගපසද;
වීර්‍ය්‍යයුක්තකාවූ නෙසජ්ජිකාඞ්ගයද;චීවරයෙහිඅපිස්සතොස් බැවි
පිණිස,තෙචීවරික පංසුකූලික යනඅඞ්ගදෙකදැයි මෙසේතෙළෙ
සක් ධුතාඞ්ගවදාළසේක. ගිලානප්‍රත්‍යයද පිණ්ඩපාතයෙහි ඇතුළත්
හෙයින්එයපිළිබඳ අඞ්ගයක් අාවෙනිකව නොවදාළසේක. විස්ත
රවිසුද්ධිමාර්ගයෙහි බලනු—(10) **බහුම්පි**චෙසහිතං භාසමානො,
නතක්කරොහොති නරොපමත්තො, ගොපොවගාවො ගණයංප
රෙසං, නභාගවාසාමඤ්ඤස්සහොති—යනුවෙන්, "භාවනාවන්
හි නොයෙදෙනහෙයින් පමුත්තයයි කියනලද සීලවන්තභික්ෂු
තෙම; ත්‍රිපිටකබුද්ධවචනය අනුන්ට බොහෝකොට කියන්නේ
ද; යම් කම්මස්ථානයෙක්හි සිතනොබැඳ පවත්නේවිනම්; දවස
කුළියට අනුන්ගේ ගෙරිරක්නා ගොපොල්ලෙකු දිනබැළයට
මුත් ගවරසයට හිමිනොවන්නාක්මෙන් අනවැසියන්ගෙන්හා
දායකාදීන්ගෙන් ලබන වත් පිළිවෙතටහා චීවරාදි ප්‍රත්‍යයටමුත්
මහණකමෙහි ඵලය යයි කියනලද සතරමඟ සතරඵලයට හිමි
නොවන්නේය"යි වදාළහෙයින්; සීලසම්පන්න සියලු භික්ෂූන්වි
සින් එයින්සතුටුනොවී ධූතගුණයක පිහිටා සමථකම්මස්ථානභාව
නාවක්හෝ විදර්ශනාකම්මස්ථාන භාවනාවක්හෝ නිතරභාවනා
කළයුතුයි—(11) **දානෙ** සීලෙචයෙවුත්තා, අානිසංසාඅසෙසකා,
තෙමන්‍දුභාවනායාපි, සංසිජ්ඣන්තිඅසංසයං—භාවනාබලයො
ගෙන, බුද්ධභාවොපිසාධියො, තදඤ්ඤකාහිසම්පත්ති, භාවනාය
අසාධියා—යනුවෙන් "දානසීලදෙක්හි යම්පමණ අානිසංසලෙක
ණෙක් වදාරණලදහුද; ඒ සියල්ලම සවල්පභාවනාවෙන්ද නිසැ
කයෙන් ලැබියහැකියයිද. බුදුබවපවා භාවනාබලයෙන් සිඬකළ
යුතුවෙයි; එයින් අන්‍යකවරනම් සම්පත්තියක් භාවනාවෙන්සි
ඬකළ නොහැකිවේද; සියලු සම්පත්තිය සිඬකළහැකිවේමය"යිවා
දාළ අානිසංස දක්නාවූශ්‍රද්ධාවන්තභික්ෂූන් විසින් ඒදුවිධභාවනාවන්
අතුරෙන් සමථභාවනාවෙහි, පඨවිකසිණාදි දසකසිණද; උද්ධුම
තකාදිදසඅසුභද; බුද්ධානුස්මෘතිඅාදි දසඅනුස්මෘතිහුද;කරුණාදි ස

තරබ්‍රහ්මවිහරණද; ආහාර ප්‍රතිකූලසංඥාවද; සතරධාතුමනසිකාරයද; ආකාසානඤ්චායතනාදි සතරඅරූපජ්ඣානයෝදැයි කියනලද සතළිස්කම්මට්ඨානයෝද; පරිකම්මභාවනා උපචාරභාවනා අර්පණාභාවනායයි කියනලද ත්‍රිවිධ භාවනාවෝද; පරිකම්මනිමිත්ත උග්‍රහනිමිත්ත ප්‍රතිභාගනිමිත්තයයි කියනලද ත්‍රිවිධනිමිත්තයෝද; දතයුත්තාහුය. එහි පරිකම්මභාවනාතොම යටකී සතළිස්කම්මට්ඨානයෙහිමලැබේ, බුද්ධානුස්සෘති ආදිඅටෙහිද සඤ්ඤා වවත්ථානදෙක්හිදැයි දසකම්මට්ඨානයෙහි උපචාරභාවනාතොමො ලැබේ; සෙසුකම්මට්ඨානයන්හි අර්පණාභාවනාවලැබේ. (12: 1) මේ මතුදක්වනක්‍රමයෙන් භාවනාකරණ යොගාවචරයාහට පරිකම්මනිමිත්තාදිහු පැමිණෙති. කෙසේද? පළමුකොට වනාහි අනිතයෙහි ඒත්දැවූ, ජාති, ජරා, ව්‍යාධි, මරණ, සොක, යන පස්මහබියද; මතුවිඳිනුලබන්නාවූ, ජාත්‍යාදි එමපස්මහබියද; දැන්විඳින එම පස්මහබියද; සොර, සතුරු, රජ, දිය, ගිනි, යන පස්මහබියද; දණ්ඩ, එකසියසූතිසක් අපාය * රොග, ආත්මොපවාද, පරූපවාද, යනපස්මහබියදැයි මෙසේ කියනලද පස්විසිමහබයින් † තැතිගෙණ සතරසංවරශීලය සුද්ධකොට; ආවාසාදි දසපළිබොධයන් සිඳ; ප්‍රියගරුභාවනීයාදි ගුණයෙන් සමන්විතකල්‍යාණමිත්‍රයෙකු සමීපයට එළඹ; තමන්ගේ චරිතානුකූලවූ යටකී යම් කම්මට්ඨානයක් ගෙණ; මහාවාසාදිඅෂ්ටාදසවූ අනනුරූපවිහාරයන්හැර; නාතිදූරනාත්‍යාසන්නාදිවූ පඤ්චාඞ්ගසමන්විත අනුරූපවිහාරයෙහි වසන්නාවූ කෙසනඛහරණාදි ක්ෂුද්‍රපළිබොධයන්දුරුකොට; එක්වියත් සතරඟුල් පුළුලඇතිව (සාදනලද) වටවූ කිසුණු මඬුල්ලඅභිමුඛකොට; දෙරියන් වියත්හසනපාශී ප්‍රමාණයෙන් පණවන්ලද වියත් සතරඟුල් පමණ උසඇතිඅස්නෙහි සැපසේහිද; **"අප්පස්සාදා කාමා බහුදුක්ඛා** බහුපායාසා ආදීනවො එත්ථ භිය්‍යො" යනාදීන්කාමයෙහි දොෂ ප්‍රත්‍යවෙක්ෂාකොට; සියලු දුක් දුරලීමටකාරණවූ නෛෂ්ක්‍රම්‍යයෙහි බලවත් අභිලාසයඇතිව; බුද්ධධර්ම සංඝගුණානුස්මරණයෙන් ප්‍රීතිප්‍රමොද්‍ය උපදවා: "මේප්‍රතිපත්තිතොමෝ සියලු බුද්ධාදි ආර්‍ය්‍යශ්‍රාවකයන්විසින් ප්‍රතිපන්නාවූ නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපත්තිය"යි හටගත්ගෞරවඇතිව සිත්පිහිටුවා "එකාන්තයෙන් මේ ප්‍රතිපත්තියෙන් නිර්වාණසැපයට අයිතිකාරයෙක් වන්නෙමි" මෙසේ උත්සාහ උපදවා; සම්වූ ආකාරයෙන් ඇසඳල්වා කිසුණෙහිවණ්ණ

---

* තිර්යක්, ප්‍රෙත, අසුර, ලොකාන්තරික සමග 140 හක්වෙත්.

† ජාති ජරා ව්‍යාධි චුතිච සොකො; තෙකාලිකා පඤ්චදසෙවහොන්ති, චොරා'ගිරාජ'ග්ගී පාවකොච, දණ්ඩොභයො දුග්ගතිඝොර රොගො, අත්තානුවාදොච පරානුවාදො, වදෙබුද්ධො වීසතිපඤ්ච, මෙහයා.

ප්‍රත්‍යවේක්‍ෂා නොකොට් ලක්‍ෂණමනස්කාරයකොට, වර්‍ණයනො
හැරම උත්සාහයෙන් ප්‍රත්‍යුපස්ථිතධර්මයෙහි සිත්පිහිටුවා; ඒකාගවූසි
හිත් "**පඨවිපඨවි**" යනාදි ඒ ඒ භාවනානුක්‍රමයෙන් පඨවිකසිණාදි ඒ
ඒ අරමුණෙහි නිමිත්තග්‍රහණය කරන්නාහට ඒ අරමුණ **පරිකර්ම**
**නිමිත්ත**යයි කියනුලැබේ. ඒභාවනාතොමෝද පරිකම්මභාවනා
නම්වේ. (12:2) යම්කලෙක්හිවනාහි ඒපරිකම්මනිමිත්ත සිහින් ම
නාකොට ගන්නාලද්දේවේද; ඇසින් බලන්නක්හටමෙන් සිතට
අරමුණුවේද; ඇසපියාහෝ අත්තෑහිකටගොස්හෝ කල්පනාක
රන්නාහට කසිණමණ්ඩලසදෘශව මනොද්වාරිකජවනයන්ට අරමු
ණුවූයේද; එසමයෙහි **උග්ගහ** නිමිත්ත උපන්නේනම්වේ; ඒ භා
වනාද උපචාරභාවනානම්වේ; ඕතොම සිත එක අරමුණක පි
හිටවන්නේය. (12:3) එසේ සමාහිතවූ ඒයොගාවචරයාහට වනාහි
ඉන්මත්තෙහි ඒ උද්ග්‍රහනිමිත්ත විෂයකොට පරිකර්මසමාධියෙන්
භාවනාකරන්නාහට යම්කලෙක්හි ඒ උද්ග්‍රහනිමිත්තසදෘශවූ ඊට
වඩා පිරිසිදුවූ මණ්ඩලගත කසිණදෝෂයෙන් පහවූප්‍රත්‍යුපතියයි කි
යනලද භාවනාවෙන් නිපන්අරමුණ චිත්තයෙහි මනාකොට පි
හිටනලද්දේවේද; එකල්හි **පටිභාගනිමිත්ත** උපන්නේයයි කි
යනුලැබේ. එතැන්පටන් ධ්‍යානයට සතුරුයයි කියනලද; කා
මච්ඡන්දාදි නීවරණයන්කෙරෙන් විශෙෂයෙන් පහවූ කාමාවච
රසමාධියෙන් මත්තෙහි ඒ ප්‍රතිභාගනිමිත්ත උපචාරසමාධි
යෙන් නැවත නැවත; ආසෙවනයකරන්නාහට විතර්කාදිපඤ්චා
ඞ්ගයෙන් සමන්විතවූ ප්‍රථමධ්‍යානචිත්තය පිහිටන්නේය. (මේ
භාවනාතොමෙ අර්පණාභාවනානම්වේ.) ඉන් ඔබ්බෙහි එම ප්‍රථ
මධ්‍යානචිත්තය ආවර්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, උට්ඨාන, පච්ච
වෙක්ඛණ, යනමේ පඤ්චවසීතායෙන් වසඟකොට විතර්කාදි ඖ
දාරික අඞ්ගයන් පහකිරීමට විචාරාදි සූක්ෂ්මාඞ්ගයන් උපදවනු පි
ණිස මතුමතු භාවනාකරන්නාහට පිළිවෙලින් ද්විතියධ්‍යානාදිය
සුදුසුපරිද්දෙන් උපදින්. (13) විදර්ශනාභාවනාවෙහි සීලවිසුද්ධි, චි
ත්තවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි, කංඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ගඤාණදස්ස
නවිසුද්ධි, පටිපදාඤාණදස්සනවිසුද්ධි, ඤාණදස්සනවිසුද්ධි, යන සප්ත
විසුද්ධීන්ද; අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්‍ෂණයද; අනිත්‍ය දු
ක්ඛ අනාත්ම යන ත්‍රිවිධ අනුපස්සනාවෝද; සම්මසනඤාණ උද
යබ්බයඤාණ භඞ්ගඤාණ භයඤාණ ආදීනවඤාණ නිබ්බිදාඤාණ
මුඤ්චිතුකම්‍යතාඤාණ පටිසංඛාඤාණ සංඛාරුපෙක්ඛාඤාණ අනු
ලොමඤාණයයි කියනලද දසවිදර්ශනාඤාණයෝද; සුඤ්ඤත අ
නිමිත්ත අප්පනිහිත යන ත්‍රිවිධ විමොක්‍ෂයද; සුඤ්ඤතානුපස්ස
නා අනිමිත්තානුපස්සනා අප්පනිහිතානුපස්සනා යන ත්‍රිවිධ වි

මොක්‍ෂමුඛයෝද දතයුත්තාහුය. (14: 1)මෙසේ යට දැක්වූ චතුර්විධ භික්‍ෂුශීලය ශීලවිසුද්ධිනම්වේ; උපචාරසමාධිය අර්පණාසමාධිය චිත්තවිසුද්ධිනම්වේ; ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨාන වශයෙන් නාමරූප පරිග්‍රහය දිට්ඨිවිසුද්ධිනම්වේ; එම නාමරූපයන්ගේ ප්‍රත්‍යයන් මේ මේයයි නුවණින් අල්වාගැණීම කංඛාවිතරණවිසුද්ධි නම්වේ;—ඔභාසො පීතිපස්සද්ධි, අධිමොක්ඛොච පග්ගහො, සුඛං ඤාණ මුපට්ඨාන, මුපෙක්ඛාච නිකන්තිච— යනුවෙන් දක්වනලද ඔභාසාදි දස විදර්ශනොපක්ලේශයන් මාර්ගයට සතුරුයයි ඤාණයෙන් අල්වාගැණීම (හෙවත් ඔභාසාදි දස උපක්ලේශයෝ මාර්ගයනොවෙති විදර්ශනාවට උපක්ලේශයෝමය තත්වනිර්මුක්ත වීථිප්‍රතිපන්නාවූ විදර්ශනාඥාණයම මාර්ගයයි) මෙසේ මාර්ගස්වභාව නිශ්චයකරන්නාවූ ඥාණය මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධි නම්වෙයි. යටකීදසයෙන් උදයව්‍යය ඤාණයපටන් සත්‍යානුලොමඤාණයදක්වා පැවති නවමහා විදර්ශනාඥාණය ප්‍රතිපදාඤාණ දර්ශන විසුද්ධිනම්වේ. මෙසේ කියනලද සීල චිත්ත යන මූලභූත ද්විවිධ සුද්ධියෙන් හා,ශරීරභූතදිට්ඨිවිසුද්ධි ආදී සතරන්දැයි සප්තවිධ විසුද්ධීන්ගේ වශයෙන් ඉපදවියයුතුවූ දුක්ඛාදිචතුරාර්‍ය්‍ය සත්‍යයන් අවබොධකරණ චතුර්විධමාර්ගචිත්තය ඤාණදර්ශන විසුද්ධිනම්වේ. (14:2) මෙසේ කියනලද ක්‍රමයෙන් භාවනාකරන්නාවූ ඒ යොගාවචරයාහට විදර්ශනාවගේ මිහිකිරීමට පැමිණ දැන් "අර්පණාසංඛ්‍යාත ලොකොත්තරමාර්ගය උපදීයයි කියයුතුකල්හි භවාංගචිත්ත පරම්පරාව චලන උපච්ඡෙද වශයෙන් සිඳගෙණ උපන්මනොද්වාරාවර්ජන චිත්තයට අනතුරුව දෙතුන්විදර්ශනා චිත්තකෙණෙක් සංඛාරුපෙක්ඛාඤාණයෙන් ගන්නාලද යම්කිසි අනිත්‍යාදි ලක්‍ෂණයක් අරබයා පරිකර්ම,උපචාර, අනුලොම,නාමයෙන් පවත්නාහුය. ඒ අනුලොමචිත්තයෙන් ඔබ්බෙහි තුන්වැනිවහෝ සතරවැනිව භාවනාබලයෙන් නිර්වාණය අරමුණුකොට මාර්ගසමඞ්ගී පුද්ගලයාගේ පෘථග්ජනව්‍යවහාරය ඉක්මවමින් ආර්‍ය්‍යව්‍යවහාරයට පමුණුවමින් මාර්ගචිත්තයට අනන්තරාදි ප්‍රත්‍යයවූ ගොත්‍රභූනම් විදර්ශනාචිත්තය උපදනේය. ඒ ගොත්‍රභූ චිත්තයට අනතුරුව අෂ්ටාඞ්ගසමන්විත මාර්ගචිත්තයතෙම දුඃඛසත්‍යය අසම්මොහයෙන් දනිමින් තෘෂ්ණාසංඛ්‍යාත සමුදයසත්‍යය දුරුකෙරෙමින් නිර්වාණසංඛ්‍යාත නිරොධසත්‍යය ආලම්බණකරණයෙන් ප්‍රත්‍යක්‍ෂකෙරෙමින් සම්ප්‍රයුක්ත මාර්ගසත්‍යය තමාහා සහ ජාත ධර්මයන්ට සහජාතාදි ප්‍රත්‍යය වැඩීම්වශයෙන් (එකමජවනයාගේ ඒ ක්‍ෂණයෙහි සතර සත්‍යය සිද්ධකෙරෙමින්) සතරවනුවහෝ පස්වනුව ජවනස්ථානයට බස්නේය. ඒ මාර්ගචිත්තයෙන් මත්තෙහි තදනුරූප වශයෙන් ඵලචිත්තයෝ දෙදෙනෙක්හෝ තුන්දෙනෙක් පහකර

ණලද ගිනිඇතිතන්හි උෂ්ණයනිවීම පිණිස දියඉසීමක්මෙන් සමුච්ඡින්නකෙලශයන් ඇති සන්තානයෙහි කෙලශදරථ සන්සිඳවීම්වශයෙන් ඉපදනිරුඬවෙත්. ඉක්බිබෙහි චිත්තය භවඞ්ග ශ්‍රොතයට වැටෙන්නේය. මෙසේ විදර්ශනා භාවනාව දතයුත්තිය.

දැන් දස විදර්ශනාඥාණයෝ කියනු ලැබෙත්. (15) ඉපද නැතිවීම් අර්ථයෙන් අනිත්‍යයහ; උදයව්‍යය පීළනයෙන් එනම් ඉපද නැතිවීමට පෙරළීමෙන් දුක්යහ; තමන් කැමති ලෙස නොපවත්නාහෙයින් අනාත්මහයි; ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් ත්‍රිලක්ෂණයට නඟාදන්නාඥාණය; නොහොත් ස්කන්ධයන්ගේ කලාප සම්මර්ශනය සම්මසනඥාණ නම්වේ. ස්කන්ධ යන්ගේ සම්පූර්ණ ආකාරයෙන් ඉපදීම හා නැසීම දක්නාඥාණය; උදයව්‍යයඥාණනම්වේ. ඉක්බිති උදයහැරව්‍යයෙහි සර්වසංස්කාරයෝ බිඳෙනසුලුහයි ඔවුන්ගේ භඞ්ගමාත්‍රය අල්වාගන්නාඥාණය; භඞ්ගඥාණනම්වේ. භඞ්ගවශයෙන් විදර්ශකයොගාවචරයාහට ඔබ්බෙහි භවත්‍රයමගිනිගෙණ දිලිසෙන අඟුරුවළක්මෙන් භයවශයෙන් එලඹසිටිම් දර්ශනය; භයඥාණනම්වේ. එසේ භයවශයෙන් දක්නාහට ඔබ්බෙහි චණ්ඩමෘග වන ගුහණයක්මෙන් භවත්‍රයෙහි දොෂදර්ශනය; ආදීනවඥාණනම්වේ. මහාමත්ස්‍ය යෙකැයි අල්වාගත් සර්පයාගේ සෝවැතිදැක ධුනුවහරණ පුරුෂයෙකුමෙන් තිලක්ෂණදැකීමෙන් දුටුදොෂඇති යොගීහට සංස්කාරයන් හරිණු කැමතිව උපදනාඥාණය; මුඤ්චිතුකම්‍යතාඥාණනම්වේ. අත්හැරීමට උපාය පිළියෙලකරණු පිණිස නැවත සංස්කාරයන් පරීක්ෂා කිරීම්වශයෙන් පැවතිඥාණය; පටිසංඛානම්වේ. හරණලද භාර්යාවකෙරෙහි මධ්‍යස්ථවන පුරුෂයෙකුමෙන් දොෂදුටු සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථවීම; සංඛාරුපෙක්ඛාඥාණනම්වේ. භාවනාකරණ යොගාවචරයාහට මූලක්සම්මසනාදි නවදෙනාගේ කෘත්‍යනිෂ්පත්තියටද; මතුඋපදනා සතතිස් බොධිපාක්ෂික ධර්මයන්ටද; අනුකූලව උපදනාඥාණය අනුලොමනම්වේ. දැන් අනුපස්සනාහා විමොක්ෂද විමොක්ෂමුඛයෝද කියනුලැබෙත්.

(16)එහි ත්‍රෛභූමිකධර්මයෝ අනාත්මහයි පැවති අනත්තානුපස්සනාතොම ආත්මාභිනිවෙස දෘඪග්‍රහණයහරින්නී (ආත්මශූන්‍යතාකාරයම අනුවදක්නාහෙයින්) ශූන්‍යතානුපස්සනානම්වූවිමොක්ෂමුඛයවේ. හෙවත් ප්‍රතිපක්ෂයන් කෙරෙන් විමුක්තවශයෙන් ආර්යමාර්ගසංඛ්‍යාත විමොක්ෂයටද; ඵලසමාපත්තිකාලයෙහි ඵලවිමොක්ෂයටද; වාරවන්නේය. යටකී සංස්කාරධර්මයෝ අනිත්‍යහයි පැවති අනුපස්සනා තොම අනිත්‍යයෙහි නිත්‍යයයි පැවති විපල්ලාස නිමිත්තහරින්නී (විපල්ලාසනිමිත්තග්‍රහණයෙන්) අනිමිත්තානුපස්සනානම් විමොක්ෂමුඛයවේ. සංස්කා

රබම්මයෝ දුක්ඛයනයි පැවති අනුපස්සනාතොම "එතං මම එතංසුඛං" යනාදීන් ප්‍රවෘත්තතෘෂ්ණා ප්‍රාර්ථනාව දුක්ඛාකාරදර්ශනයෙන් හරින්නී (ප්‍රනිධිරහිතාකාරය දක්නාහෙයින්) අප්පනිහිතානුපස්සනානම් විමොක්ෂමුඛයවේ. එහෙයින් හෙවත් මේ ත්‍රිවිධ අනුපස්සනාවන් විදර්ශනාවශයෙන් විමොක්ෂමුඛ යන නාමය ලබනහෙයින්; වුට්ඨානගාමිනී විදර්ශනායයි කියනලද සත්‍යානුලොම විදර්ශනාතොමෝ ඉදින් "**අනත්තා අනත්තා**"යි භාවනාකෙරේද; එයින් ලබණ මාර්ගයතෙම ශූන්‍යතවිමොක්ෂනම්යිද; ඉදින් "**අනිච්චං අනිච්චං**"යි භාවනාකෙරේද. මාර්ගයතෙම අනිමිත්තවිමොක්ෂනම්යයිද; ඉදින් "**දුක්ඛං දුක්ඛං**"යි භාවනාකෙරේද මාර්ගයතෙම අප්පනිහිතවිමොක්ෂනම්යයිද; ව්‍යුත්ථානගාමිනිවිදර්ශනා ගමණ වශයෙන් මේ ත්‍රිවිධනාමය ලබයි. මාර්ගචිත්තවීථියෙහි වනාහි ඵලචිත්තයෝද මාර්ගාගමණ භාවනාවශයෙන් ඒ ත්‍රිවිධනාමය ලබති. (17)මෙහි වනාහි(යොගාවචරතෙම)ශ්‍රොතාපත්තිමාර්ගය භාවනාකොට දෘෂ්ටි විචිකිත්සා ප්‍රහාණයෙන් පහකරණලද අපායගමන් ඇත්තේ; සත්වරක කාම ස්වර්ගයෙහි ප්‍රතිසන්ධිග්‍රහණය පරමකොට ඇතිහෙයින් **සත්තක්ඛත්තුපරම** නම්වූ ශ්‍රොතාපන්නනම් ආර්‍ය්‍යශ්‍රාවකවේ. සකෘදාගාමි මාර්ගය උපදවා රාගද්වෙෂ මොහයන්ගේ තුනීකිරීමෙන් මනුෂ්‍යලොකයට ප්‍රතිසන්ධිවශයෙන් එකවරෙක එනස්වභාව ඇති **සකෘදාගාමි**නම් ආර්‍ය්‍යශ්‍රාවකවේ. අනාගාමිමාර්ගය උපදවා කාමරාගව්‍යාපාදයන්ගේ සමුච්ඡෙද ප්‍රහාණයෙන් මනුෂ්‍යාත්මභාවයට ප්‍රතිසන්ධි වශයෙන් නොඑනස්වභාව ඇති **අනාගාමි**නම් ආර්‍ය්‍යශ්‍රාවකවේ. අර්හත්මාර්ගය උපදවා (ඉතුරු) සියලුකෙලශයන්ගේ ප්‍රහාණයෙන් ක්ෂයකරණලද චතුර්විධ ආශ්‍රවයන් ඇති දෙවියන් සහිත ලොකයාවිසින් දෙනලද දක්ෂිණාව මහත් ඵලකිරීමට සමර්ථවූ **අර්හත්** නම් ආර්‍ය්‍යශ්‍රාවකවේ. මෙසේ ශූන්‍යතවිමොක්ඛාදි නාමයෙන් දක්වනලද සතරමග සතරඵලයෝ ප්‍රව්‍රජ්‍යයෙහි ඵලයහෙයින් සතරශ්‍රාමණ්‍යඵලය යයිකියනු ලබත්.

මෙතෙකින් ආධුනිකනූදීජනයාගේ ප්‍රමොදය පිණිස කරණලද භික්ෂුශීලයෙහි **මිස්සකසඞ්ගහනිද්දෙස**නම්වූ සත්වෙනි පරිච්ඡේදය නිමවනලදී.

(ප: අ: 7.)

**මිස්සක සඞ්ගහ නිද්දෙසං යො පස්සති'දං සමසද්ධො පඤ්ඤො,**
**වීසති පඤ්ච භයම්හා භීතො සත්ත විසුද්ධි සිතො සො හොති.**

(අ. 4) කොසලලඤ්ඤාය භික්ඛූනං භික්ඛුසීලෙ ඉධාගතෙ
සුත්තා‘ගතං භික්ඛුසීලං පවක්ඛිස්ස‘මිතොපරං
නිජභාසාය‘හං සිද්ධං වන්දිත්වා රතනත්තයං.

(මා. 2) තංචූලල මජ්ඣිම මහා සීලතො තිවිධා භවෙ
පිටසීකුචජීප්පභෙදෙහි’නෙකාභෙද ගතං මතං.

භාවය: ඒ(සූත්‍රයෙහිආභික්ෂුශීලය)චූලසීල මජ්ඣිමසීල මහාසීල වශයෙන් ත්‍රිවිධවන්නේය. (ඒ එකී ඒකී සීලය)පිටසීභෙද කුචජීභෙදයන(ද්විධ)භෙදවශයෙන් නොයෙක් ප්‍රභෙදයට පැමිණියේය යි දත්නාලදී.

(1) එහි **චූල්ල සීලය** කවරේද?:— (1—1) මේ ශාසනයෙහි භික්ෂුතෙම ප්‍රාණඝාතය දුරුකොට ප්‍රාණඝාතයෙන් වැලැක්කේවේද; පරොපඝාතය පිණිස දඬුනොගන්නා හෙයින් තබන ලද දඬුඇත්තේවේද; තබනලද ශස්ත්‍රඇත්තේවේද; පාපයෙහි ලජ්ජාඇත්තේ මෛත්‍රීසිත්ඇති බවට පැමිණියේ සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පාඇතිව වාසයකෙරේද; මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ. (1-2) නුදුන්දෙය ගැණීම හැර හිමියන් විසින් දුන්දෙයම ගන්නා සුලුවූයේ; දුන්දෙයම සිතිනුත් ඉවසන සුලුවූයේ චංචාරහිතවූ එහෙයින්ම පවිත්‍රවූසිත්යුක්තව වාසයකෙරේද; මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ. (1-3) අබ්‍රහ්මචරියාවහැර ශ්‍රෙෂ්ඨචය්‍ය්‍යාවෙහි හැසිරෙන සුලුවූයේද; අනාචාරයෙන් දුරුවූයේද; අසද්ධර්මයෙන් ග්‍රාමවාසීන්ගේ සවභාවෙන් වැලැක්කේවේද; මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ. (1-4) මුසාවාදයහැර මුසාවාදයෙන් වැලැක්කේවේද; සත්‍යය කියන සුලුවූයේ සත්‍යයෙන් සත්‍යය ගලපාකියන්නේවේද; ස්ථිරවපිහිටියාවූ කථාඇත්තේ ඇදහිලිකට යුතුකථාඇත්තේ ලොකයාහට විසංවාද නොකරන්නේද; නොහොත් වෙනස් නොවන වචන කියන්නේවේද; මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ. (1-5) ප්‍රියබව ශූන්‍ය කරණවචන දුරුකොටපෛශූන්‍යයෙන් හෙවත් කේලාමෙන් වැලැක්කේවේද; මෙතනින් අසාමොවුන්ගේ භෙදයපිණිස එතන්හි නොකියන්නේවේද, එතනින්හෝ අසා ඔවුන්ගේ භෙදය පිණිස මොවුන්ට නොකියන්නේවේද; මෙසේ භෙදවූවන් සමගිකරවන්නේ සමගිවූවන්හට අනුබලදෙන්නේ; සමගිතන්හි වාසයඇත්තේ; සමගිවූවන්කෙරෙහිඇලුනේ; සමගිවූවන් දැක අසා සතුටුවන සුලුවූයේ; සාමාග්‍රිගුණය පහලකරණ බස්කියන්නේවේද; මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ. (1-6) රළුවචන පහකොට රළුවචනකීමෙන් වැලැක්කේවේද; යම් ඒ වචනයක් නිර්දොෂද; ව්‍යජින මාධූර්‍ය්‍යයෙන්

කණ්ට සැප එළවන්නීද; අර්ථමාධුර්යයෙන් සකල ශරීරයෙහි ප්‍රේමඋපදවන්නීද; අප්‍රස්ඛලිතව සැපසේ සිතටවදනා හෙයින් හෘදයාඞ්ගමද; වාක්ගුණයෙන් සම්පූර්ණබැවින් සිව්මැළිද; බොහෝ ජනයාට ප්‍රියවේද, බොහෝජනයන්ගේ සිතටඅභිවෘද්ධිකරයිද; එබඳු වචනකියන්නේවේද; මෙයද ඒ භික්ෂුහුගේ ශීලය වේ. (1-7) සම්ඵප්‍රලාපය දුරුකොට(සම්ඵයයිකියනලද අර්ථය භඟකරණ(පලන)හෙයින්) සම්ඵප්‍රලාපයයි කියනලද ලොභාදි කෙලශජනකවචන කීමෙන් වැළැක්කේවේද; කියයුතුකාලය සලකා කියන සුලුවේද; සත්‍යය කියන සුලුද; දෘෂ්ටධාර්මික සාම්පරායික අර්ථනිශ්‍රිත වචනකියන්නේ නවලෝකොත්තර ධර්මනිශ්‍රිතවචනකියන්නේ; සංවරවිනය පහානවිනය නිශ්‍රිතවචන කියන්නේ; යුක්තප්‍රාප්ත කාලයෙහි උපමාකාරණ සහිතවූ කෙළවර ඇත්තාවූ අර්ථවෘද්ධියෙන් යුක්තවූසිත්හි නිධානයක්මෙන් තැබිය යුතු බස්කියන්නේවේද; මෙයද ඒ භික්ෂුහුගේ ශීලයවේ.

(1-8)තෘණ වෘක්ෂ ලතාදීන්ගේ ඡේදන, භේදන, විකොපණයෙන් වැළැක්කේවේද; පෙරවරු එක්වේල වළඳන බත් ඇත්තේ; රාත්‍රිභොජනයෙන් වැළැක්කේ; විකාලභොජනයෙන් වැළැක්කේවේද;, නැටීම, නැටවීම, එයබැලීම, ගීකීම, ගීකියවීම, එයඇසීම, වාද්‍යයකිරීම, කරවීම, ඒයඇසීම, යන විපරීතදර්ශනයෙන් වැළැක්කේවේද; මල්පැළඳීමෙන්, සුවඳින් සැරසීමෙන්, ඇඟගානා සුවඳින් ඡවිරාගවශයෙන් සැරසීමෙන්, වැළැක්කේවේද; සුගත්අඟලින් අටඟුලටවඩා උස්අසුන් වලහිඳීමෙන්, අකැප ඇතිරිලි අතුට හිඳීමෙන්, වැළැක්කේවේද; රන් රිදී මසු කහවනු පිළිගැන්මෙන්, පිළිගැන්වීමෙන්, තමන්වෙනුවට ඉවසීමෙන්, වැළැක්කේවේද; ශාලිව්‍රීහ්‍යාදි සප්තවිධ ධාන්‍ය පිළිගැණීමෙන්, වැළැක්කේවේද; ආමකමත්ස්‍ය මාංශයන් පිළිගැණීමෙන්-පුරුෂාන්තරගත ස්ත්‍රීන්හා පුරුෂාන්තරයට නොපැමිණි කුමාරිකාවන් පිළිගැන්මෙන්-දාසීන්හා දාසයන් පිළිගැන්මෙන්-නිරෙළුවන්හා පලෙළුවන්පිළිගැන්මෙන්—කුකුළන්හා ශූරන්පිළිගැන්මෙන්—හස්ති, ගව, අශ්ව, වෙළඹුන්, පිළිගැන්මෙන්-කෙත්වත් අරන්ආදිය පිළිගැණීමෙන්-ගිහීන්ගේ පත්හසුන් හෝ මුවිහසුන් ඒ ඒ තැනටගෙණ යන දූතක්‍රියාවෙහි හා ගෙන් ගෙට යවනලද පඬුරුආදියගෙණ යාමයයි කියනලද මෙහෙවරෙහියෙදීමෙන් වැළැක්කේවේද; මෙය රැගෙණ මෙය දෙවයි යනක්‍රය වික්‍රයෙන් වැළැක්කේවේද; කිරාගැණීමෙන් වංචාකිරීම, රත්තලි හා රන් ගැතලිමිශ්‍රකොට වංචාකිරීම, මැනීමෙන් වංචාකිරීම,යන මෙයින් වැළැක්කේවේද; අත්ලස්ගැන්ම,ඒ ඒ උපායෙන් මෙර මාංවංචාකිරීම, සමානදෙයින් වංචාකිරීම, යනකූ

පීල ප්‍රයෝගයෙන් වැලැක්කේවේද; අත්පාආදිය කැපීම, මැරීම, රජ්ජුබන්ධන අන්දුබන්ධනාදි බන්ධනය, ජිමයෙන්හා කැලෑආදියෙන් සැඟවීසිට වස්තුහැරගැන්ම, ගම් නියම්ගම් ආදියපැහැරීම, උමත්බ්ද වස්තුහැර ගැණීමආදි රෞද්‍රක්‍රියාකිරීම, යන මෙයින් වැලැක්කේවේද; මෙයද (මෙකී සියලු අකෘත්‍යයෙන් වැලැක්මද)ඒ භික්ෂූහුගේ ශීලයවේ.

මෙතෙකින් පිටිසි භෙදයෙන් (8) අටවැදෑරුම්වූ කුවජීභෙදයෙන් (26) සවිස් වැදෑරුම්වූ **චුල්ලසීලය** නිමවනලදී.

(2)එනි **මජ්ඣිමසීලය කවරේද**?:-(2-1)යම්සේ වනාහි ඇතම් පින්වත් මහණ බමුණුකෙනෙක් කාම්පල අදහාදෙනලද සිවරුදි ප්‍රත්‍යයන් අනුභවකොට ඔව්හු මෙබඳු බීජගාම භූතගාම විකොපණයෙක්හි යෙදුනාහු වාසයකරද්ද;කවර බීජගාම භූතගාමයෙක්ද?:-කසා ගිඟුරු වදකසා පිරිබුලු ඉවද කුලුරු ණ සුවඳහොට වම්මුනු ආදිමූලබීජය; ඇසටු නුග පුලිල දිඹුල් කසට ගෙලකිඳ ආදිබන්ධබීජය; උක් හුන බට රඹුක් ආදි ඵළුබීජය; අඳු තලා දමුනු නිරිවේරිය ආදිඅග්‍රබීජය; පස්වැනිවූ පුබ්බණ්ණ අපරණ්ණාදි බීජබීජයෝමය; මෙබඳුවූ බීජගාම භූතගාමයන්ගේ ඡෙදන භෙදනාදිශයන් වැලැක්කේවේද;මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ.

(2-2)යම්සේ ඇතැම් පින්වත් මහණබමුණු කෙණෙක් සැදැහැයෙන් දුන්බොජුන් අනුභවකොට ඔව්හු මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙක්හි යෙදී වසද්ද; ඔව්හුකවරහුද?: අදදවසෙහිලද ඛජ්ජ, භොජ්ජ, ලෙය්‍ය, පෙය්‍යාදිවශයෙන් චතුර්විධවූ ආහාරවර්ගය සෙටදවසට තබාප්‍රයෝජන විඳිමය; අඹපැන් දඹපැන් ආදිඅෂ්ටවිධ පානවර්ගය එසේප්‍රයෝජන විඳිමය; සිවුරුපිළිආදිය ලදින්“මේ තුන්සිවුරු දිරානියකල පසුව සිවුරුවලදිම්සි” සිවුරුපිළිආදිය නගා තැබිමය; රථගැල් පූවන් ඉඳලු කුනන්ආදි යානාවත්ලැබ පරිහරණයකොටතබා ප්‍රයෝජනවිඳිමය; දළනැඳ වේවැල්හැඳ ආදිය ලදින් බොහෝදෙය පසුවටතබා ප්‍රයෝජන විඳිමය; ශරීරයෙහි කණ්ඩුතිආදියනිසා සඳුන් සුවඳ කසාආදි ඇඟඉලුම් වසයෙන් සුවඳලදින් ඇඟනලා රෙනසන් හුන්කල පසුවතබා ප්‍රයෝජන විඳීමය; ඉතිරිවූසාල් තල උඳු මුන් පොල් ලූණු මත්ශ්‍ය, මාංශ ගිතෙල් “කුඹල්වලන් ආදියගෙන්වා තබවා කැඳ බත් ආදිය පිසවා අවස්පතා ප්‍රයෝජන විඳුමහ”යි මෙකී තිල තණ්ඩුලාදිය රැස්කොටතබා ප්‍රයෝජනවිඳුමය; මෙසේමෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැලැක්කේවේද; මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ.

(2-3)යම්සේවනාහි ඇතම් පින්වත් මහණබමුණු කෙණෙක් සැදැහැයෙන්දුන් බොජුන් අනුභවකොට ඔව්හුමෙබඳුවූ විසූකදස්සනයෙක්හි යෙදිවෙසෙද්ද;ගේකවරේද?: නැටීම,ගීකීම, බෙරවැයීම,

රඟමඬුලු සැරසීම, භාරත(රාමායන,) සීතා(ජානකී) හරණාදි පරකථා ඇසීම; කාංස්‍යතාලම්හා අත්තල ආදියලීම; මනුෂ්‍යපට හැසීමහෝ නොහොත් මන්ත්‍ර පිරවීමෙන් මලම්තිනන්වා කථාකිරීම; සිව්රැස්බෙරගැසීම හෝ කලබෙරගැසීම; නාටකයන්ගේ ඉසින් පැන්විදීමහෝ නොහොත් ස්ත්‍රීපුරුෂ සඟමකොට රඟජනක ප්‍රතිභාණ චිත්‍ර විචිත්‍ර කිරීම; යවටගෙන ලාලිවසයෙන් කෙළීම; (බෝලගැසීම) නොහොත් චණ්ඩාලයන්ගේ සනාදෙවුනාකෙළීම; හූනාගස්ඔසවා ක්‍රීඩාකිරීම; මළවුන්ගේ මිනීඇටසෝදා රැස්කොටතබා අඬාවැලප රා මස් ආදිය අනුභවකිරීම; නොහොත් ඉන්ද්‍රජාලයෙන් මිනීඇටසොදා දැකීම; ඇතුන්හා යුධකිරීම් යුධබැලීම් ආදිය; අසුන්හා යුද්ධකිරීම් බැලීම්ආදිය; මීවුන්හා යුද්ධකිරීම්ආදිය; වෘෂභයන්හා යුධකිරීම් ආදිය; තිරෙළුවන්හා යුද්ධකිරීම් ආදිය; පලෙළුවන්හා පොරගැසීම් ආදිය; කුකුළුපොරලැවීම් ආදිය; වටුපොරලැවීම් ආදිය; පොලුහරම කිරීම්ආදිය; නොරතුරු ඇනීම්ආදි මුට්ඨි යුද්ධය; මලලවපොර ඇල්වීම් ආදියය; යුද්ධකිරීමය; ඇත් ඇනි, අස් ඇනි, ආදිය මෙතෙකැයි ගණන් කිරීම; පත්මබ්‍යූහ සකටබ්‍යූහ චක්‍රබ්‍යූහ වශයෙන් සෙනාසන්නිවෙසය; (යුද්ධසෙනාව සිටුවීමය) ඇත් ඇනි අස් ඇනි ආදිය දැක්මහෝය; මෙසේමෙබඳු ශාසන ප්‍රතිපත්තියට ප්‍රතිපක්‍ෂ දර්ශනයෙන් වැළැක්කේවේද; මෙයද ඒ භික්‍ෂුහුගේ ශීලයවේ.

(2-4) යම්සේ වනාංගි ඇතම් පින්වත් මහණ බමුණු කෙනෙක් සැදැහැයෙන් දුන්බොජුන් වළඳා ඔව්හු මෙබඳු ප්‍රමාදයට කාරණ වූ ද්‍යූතකෙළියෙහි යෙදුනාහු වාසයකරද්ද;හේ කවරේද?:-එකි එකී පඞ්ක්තියෙහි ගැබ් අටක් බැගින් සූසැට ගැබක්ඇති දූපෝරු, රජවල්පෝරු ආදියෙහිකෙළීම; එකි එකී පෙල ගැබ්දශයක් බැගින් අසූනැබක්ඇති දූපෝරු රජවල්පෝරු ආදියෙහිකෙළීම; අටගැබ් දසගැබ් ඇති දූපෝරු ආදියෙහිමෙන් ආකාශයෙහි මැසිසිතින් සලකා දූපෝරු රජවල්පෝරු ආදියෙන් කෙළීම, බිම මණ්ඩලවශයෙන් නොයෙක් තැන ඉරි ඇඳ එසින් වැළඳිගිය යුත්තක් වළගා පැනපැන කෙළීම;(නෙරෙන්චිකෙළීමය;) එක්කොට තබන ලද දූකැටහෝ අකුරුහෝ නොසොල්වා නියයෙන්ම ඉවත්කොටහෝ ගසාහෝ කෙළීම; දූපෝරුවෙහි පසඇට පමණක් ලාගෙණ පසැටින් කෙළීම; සිංකෙළීම; අලකාපශතහි පිහිටි දිය ආදියෙහි ඉරටුම්ටිගලාතෙමා"තොපට කවරරූවක් පාංමෝදැයි" කියාබිම් භිත්ති ආදියෙහි ඉරටාමිටිනසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීම; පත්දුකෙළීම; පත්කුලල් පිඹ කෙළීම; හම්දීරුවන් කෙළනෑකුඩුනගු ච් ගෙණ සිසැම්වශයෙන් කෙළීම; කාරණත්පිනීම; තල්පත් ආදීන් ඉදිකොට කත්නගුරුවා

කෙළිම; පත්නාලියෙන් වැලි ආදිය මැන කෙළිම; ක්ෂුද්‍රරථයෙන් කෙළිම; ක්ෂුද්‍ර ධනුවෙන් කෙළිම; ආකාශයෙහි හෝ පිටහෝ අකුරු ඇඳ පෑ ඇඳි අකුරු දක්වා කෙළිම; සිතින් යමක් සිතා "මා විසින් සිතූදෙය දතුද?" යනාදින් දක්වා කෙළිම; කණකොර පිළි ආදිවේශයෙන් ඒ ඒ දෝෂරූප යොදා දක්වා කෙළිම හෝ ය; මෙසේ මෙබඳුවූ ප්‍රමාදයට කරුණුවූ ද්‍යූකෙළියෙහි යෙදීමෙන් වැළැක්කේවේද; මෙයද ඒ භික්ෂුහුගේ ශීලයවේ.

(2-5) යම්සේවනාහි ඇතම් පින්වත් මහණ බමුණුකෙණෙක් සැදැහැයෙන්දුන් බොජුන් වළඳා ඔව්හු මෙබඳු උසසුන් මහඅස්නෙක්හි වාසයකරද්ද; ශේකවරේද?:- පමණ ඉකුත්දික්හගලා පූටුය; ඇරගිඳුවූ වසලරුපාදියඇති පයඞ්කය; සතරඟුලෙන් දික්ලොම් ඇති ඇතිරිය; විචිමෙන් විසිතුරු එළුලොම් ඇතිරිය; මෑදුවූ සුදුඑළුලොම් ඇතිරිය; එළුලොම්මුවා ඝණපුප් ඇතිරිය; තිළිය, නොහොත් රුක්ඛ, ලතා, පෝටකී, යන ත්‍රිවිධපූළුත්ය; සිංහාදිරූපයෙන් විසිතුරුවූ එළුලොම් ඇතිරිය; එක්පිටක ලොම්ඇති එළුලොම්ඇතිරිය, දෙපිට ලොම්ඇති එළුලොම් ඇතිරිය; රත්කසුකම්කොට කැටි නිගිරිනුයිත්කළ පසතරණය; රන්කසුකම්කොට නිගිරිනුයිත්කළ පසතරණය; ඉගමුත්සොළොස් දෙනෙකු සිට නැටියහැකි එළුලොම්මුවාඅවත් මහඇතිරිය; ඇතුන්පිට අතුරණ ඇතිරිය; අසුන්පිට අතුරණ ඇතිරිය; රථපිට අතුරණ ඇතිරිය; ඇඳපමණකොට ගිවනාලද අඳුන් දිවිසමින්කළ පසතරණය; උතුම් කෙහෙල් මුවසමින්කළ පසතරණය; මත්තෙහි බඳනාලද රත්වියත් සහිතවූ රතුඇතිරිය; හිස්දෙර පාමුල රත්කත් වසින් නොහොත් රතුකොට්ටාඇති ආසනය; මෙසේ මෙබඳුවූ උසසුන් මහඅස්නෙන් වැළැක්කේවේද; මෙයද ඒ භික්ෂුහුගේ ශීලයවේ.

(2-6) යම්සේවනාහි ඇතම් පින්වත් මහණබමුණු කෙණෙක් සැදැහැයෙන් දුන්බොජුන් වළඳා ඔව්හු මෙබඳුවූ මණ්ඩන විභූසනයෙක්හි යෙදුනාහු වාසයකරද්ද; ශේකවරේද?:- ගන්ධචූර්ණයෙන් ඇඟඉලීම; ශරීරාවයව වඩනා පිණිස පිරිමැදීම; බාලදරුවන්මෙන් සුගන්ධ දියෙන් සනානය කිරීම; මල්ලවයන්මෙන් මුගුරුආදියෙන් අත් පා ඇදීය තළා මස්වැඩීම; කැටපත්පිරිමාණකිරීම; අඳුන් තෙල් පරිහරණකිරීම; ගෙතූ නොගෙතූ සුවඳමල්හා යම්කිසි නොරඳ කොකුත් රත්සඳුන් ආදි ඡවිරාගයක් පරිහරණකිරීම; මුහුනෙහි තල කැළල් කුරුලෑ ආදිය හරණ පිණිස මැටිකල්ක, අබකල්ක, තලකල්ක, කසාකල්ක, යෙන් උලා ඡවි වර්ණකිරීම; මුඛචූර්ණ ලෙපයෙන් මුහුණ පැහැපත් කිරීම; හස්තාභරණ පැළඳීම; කුඩුම්බිය බැඳීම; ලාඉදල්බැඳි විසිතුරු අලඞ්කාර දඬුගෙණ ඇවිදීම; ස්ත්‍රීපුරුෂාදි රූපයෙන් විසිතුරු බෙ

හෙත් නලවල් දසරුවෙහි එල්වා ඇවිදීම; කඩු එල්වා ඇවිදීම;
පස්වනක් හුසින්වෙළා මෝරදැතිආදි චිත්‍රකර්මාන්ත කරණලද
ඡත්‍රදරා ඇවිදීම; රත්පැදි විසිතුරු කර්මාන්ත කරණලද මොණර
පිළිආදියෙන් වටකරවනලද විසිතුරු වහන් පයලා ඇවිදීම; න
ලල්පට බැඳීම; ශිඛාමාණික්‍ය පැලඳීම; විසිතුරු සෙමර වල්වි
දුනා දැරීම, දික්දනඇති ධවල වස්ත්‍ර හැඳ පෙරව ඇවිදීමහෝය;
මෙසේ මෙබඳුවූ ශරීර සැරසීම හා අලඞ්කාර කිරීමෙහි යෙදී
මෙත් වැලැක්කේවේද; මෙය්ද ඒ භික්‍ෂූහුගේ ශීලයවේ.

(2-7) යම්සේ වනාහි ඇතම් පින්වත් මහණබමුණුකෙණෙක් සැදැ
හැයෙන් දුන්බොජුන් අනුභවකොට ඔව්හු මෙබඳු ස්වර්ගමෝක්‍ෂ
මාර්ගයට බාධක කථාවෙක්හි යෙදුනාහු වාසයකරද්ද; ශේ කප්රේ
ද?:–"මහාසම්මතාදි රජදරුවෝ මෙබඳුවූ අනුභාව බලපරාක්‍රම
ප්‍රතාප යසස්තෙජස් ඇත්තාහුය"යි රජදරුවන් අරබයා පැවති
කථාය; "චූලදේවාදිසොරු මෙබඳුවූ ආනුභාව ශෞර්වීර්ය්‍යය ඇත්
තාහුය"යි සොරුන් අරබයා පැවතිකථාය; "අසවල් අමාත්‍යයෝ
විශිෂ්ටරූ ඇත්තෝය; ප්‍රසාදවහයෝය බලපරාක්‍රම ඇත්තෝය"
යනාදීන් ඇමතින් අරබයා පැවතිකථාය; "අසවල් සේනාව සතු
රන්මරා යුඬකළනිඝාව යහපතැ"යි යනාදීන් සේනානිශ්‍රිත කථා
ය; "යක්‍ෂභූත ප්‍රේත පිශාචාදීන්ගෙන් සිංහව්‍යාඝ්‍රාදි චණ්ඩමෘගයන්හා
සොරසතුරු ආදීන්ගෙන් බලවත් භයට පැමිණ මෙබඳුවූ වික්‍රමය
කින් ගැලවීගියම්හ"යනාදීන් භයනිශ්‍රිතකථාය; "භාරතයුඬාදීයෙ
න්අසවලා අසවලුන් මෙසේ ඇනමැරීය විද්දේය කෙටීය යනාදීන්
යුඬනිශ්‍රිත කථාය; "මෙබඳුපැහැපත් සුවඳවත් රසවත් සිනිඳුආහා
රයක්ලැබ සැපසේකෑම්හ පුම්හ" යනාදිරසාශ්වාද වසයෙන් ආ
හාරනිශ්‍රිත කථාය; අඹ දඹාදි ඵලනවර්ගයක් ලැබ මෙබඳු වර්ණ
ගන්ධ රසයෙන්යුක්ත පානවර්ගයක් 'බීපුමෝවේද"යි යනාදී
න්රසාශ්වාද වසයෙන් පානනිශ්‍රිතකථාය; "මෙබඳු සුවපහස්ඇ
ති පටපිළිලැබ සුවසේ හැඳපෙරව ඇවිද්දෑමෝවේද" යනාදීන්
වස්ත්‍රනිශ්‍රිත කථාය; "දළුහැඳ දළුපුටු ආදියෙහි සැපසේවැදහෙව
වැදහිඳ දවස්අල්ලමෝවේද" යනාදීන් ශයනනිශ්‍රිතකථාය; "දැස
මින් සීනිද්ද බෝලිද්ද ආදිසුවඳමල් සැපසේපැලඳ පුම්හ" යනාදී
මාලානිශ්‍රිත කථාය; සාන්දු සුවඳ කස්තුරු කපුරු ජබාදු සඳුන් පි
නිදිය ආදි සුවඳ සැපසේ ප්‍රයෝජන විඳපුමෝවේද" යනාදී සුග
න්ධනිශ්‍රිත කථාය; "අපගේඥාතීහු සම්පත්තියෝය; සෞර්වීර්යඇත්
තෝය පොහොසත්හුය"යනාදි ඥාතිනිශ්‍රිත කථාය; "රථ ජීනෝ
ලි කූනම් ඇත් අශ්ව ආදි යාන වාහනයෙන් පළමු(ගිහිකාලයෙහි)
සැපසේ ඇවිද්දපුමෝවේද" යනාදීන් යානනිශ්‍රිතකථාය; "අස
වල්ගම්වැස්සෝ සමෘද්ධියෝය" යනාදීන් ග්‍රාමනිශ්‍රිත කථාය; "අ

සවල් නියම්ගම්වැස්සෝ බලවනනයෝය පොහොසත්හුය"ය නාදීන් නිගමනිශ්‍රිතකථාය; "අසවල් නුවරපවුරු පදලං අට්ටාල වෙට්ටම් මාලිගා වීථි වින්‍යාස පිහිටිනියාව යහපත" යනාදීන්න ගරනිශ්‍රිතකථාය; "අසවල් ජනපදවාසීන්ගේ ගම් බිම් පොල් පු වක් අල කෙසෙල් බුලත් ඉඟුරු කසා ආදීන් සැදීසිටිනියාව යහ පත" යනාදීන් ජනපදනිශ්‍රිතකථාය; "අසවල් ස්ත්‍රියගේ රූපශ්‍රී ය යහපත කුලඇත්තිය ගුණඇත්තිය" යනාදීන් ආස්වාදවශ යෙන් ස්ත්‍රීනිශ්‍රිතකථාය; "නන්දිමිත්‍ර සූරනිර්මලාදි යෝධයෝ මෙබඳුවූ බලපරාක්‍රම ඇත්තෝය" යනාදීන් යොධනිශ්‍රිතකථාය; "අසවල් වීථිය එක්මහල් දෙමහල් උළුගෙවල්වලින් සැදීසිටිනි යාව යහපත, අසවල්වීථිය දුරදුර නැගුපැන් පොකුණුවලින් වි රලව නොපිසියේයි" යනාදීන්හෝ "අසවල්වීථියෙහි ඇත්තෝ ආඪ්‍යයෝය සමර්ථයෝය අසවල්වීථියෙහි ඇත්තෝ නිර්ධනීය (දුප්පත්හුය) අසමර්ථයෝය" යනාදීන් වීථිනිශ්‍රිත කථාය; "අස වල් ඝටචේටිකාතොමෝ ප්‍රසාදඑළවත්නීය නටන්ට ගී කියන්ට සමර්ථීය"යනාදීන් කුම්භදාසීනිශ්‍රිතකථාය;"ඉකුත්ව මියපරලොව ගිය අපගේ නෑයෝ පොහොසත්කම්න්හා රූපශ්‍රීආදී සමුපේත අනූනව දවස් ඇර පූවෝවේද" යනාදී මලනෑයන් අරබයාපැව තිකථාය; පූර්වපශ්චිමකථායෙන් විනිර්මුක්ත අවශෙෂ නානාස්ව භාවඇති ව්‍යර්ථකථාය; ලෝකයකවුරුන් විසින් නිර්මාණකරණ ලද්දේදැයි කීකල්හි "අසවල්හු විසින් නිර්මාණකරණලද්දේය"යි කියාහෝ, "ඇටසුදු හෙයින් කපුටුවා සුදුවිය. ලේරතු හෙයින් කොකාරතුවිය" යනාදීන් විතණ්ඩසල්ලාප කථානම්වූ ලොකා ඛ්‍යායික කථාය; කවර හෙයකින් සාගරය සමුද්‍රවේදැයි විචාළ කල්හි "සගර දෙවියන් විසින් කණනලද හෙයින් සාගරයයි" කියා හෝ "මා විසින් කණනලදයයි හස්තමුද්‍රයෙන් දන්වනලද බැවින් සමුද්‍රයනම්විය" යනාදි ව්‍යර්ථකථාවෙන් යුක්තවූ සමුද්ද ඛ්‍යායික කථාය; භවනම් අභිවෘද්ධිය, අභවනම්පරිහානිය, භව නම්ශාස්වතදෘෂ්ටිය, අභවනම්උච්ඡේදදෘෂ්ටිය, භවනම්ඇතිවීමය, අභවනම්නැතිවීමය, භවනම්කාරණය, අභවනම් අකාරණය,යි මෙබඳුවූ භවාභවකථාහැර, නිරර්ථකවූ යම් යම් කාරණයක්දක්වා "මේකාරණයෙන් භවය;මේකාරණයෙන්අභවය"යි පැවැත්තාවූ භවාභවකථාවහෝය; මෙසේ මෙබඳුවූ තිරශ්චානකථාවෙන්වැ ලැක්කේවේද; මෙයද ඒභික්ෂූහුගේ ශීලයවේ.

(2–8)යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණ බමුණුකෙණෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා ඔව්හු මෙබඳු දොෂාරොපණ ක ථායෙක්හි යෙදීවාසයකරද්ද; හේකවරේද?:—තෝ මේ ධම්මවි නයදෙක නොදත්තෙහි; මම මෙබඳු ධම්මවිනයදනිමි, තෝ මේ

ධම්මවිනය කුමකැයි නොදන්නෙහි; තෝ වරදවාපිළිපන්නෙහි, මම මොනවට පිළිපන්නෙම්වෙමි; මාගේවචනය සියලු අර්ථයෙන් යුක්තය; තාගේවචනය නොසිලිටුය; අර්ථයෙන් කාරණයෙන් යුක්තනොවෙයි; පළමුව කියයුක්ත පසුවකීයෙහි; පසුවකියයුක්ත පළමුවකියෙහි; තාවිසින් බොහෝ කලක්පුරුදු කිරිම්වශයෙන් යමක් ප්‍රගුණකරණ ලද්දේද; ඒ සියල්ල මාගේ එකවචනයෙන්ම පෙරළිව්‍යාඑවගියේය; තටදොෂය ආරොපනය කරණලදී; තෝ නිග්‍රහකරණලද්දෙහි; දොෂයෙන් මිදෙන පිණිස කාරුණු ඉගෙණීමට ඒ ඒ පණ්ඩිත මහණබමුණන්වෙතයව; ඉදින් සමර්ථයෙහිනම් දැන්ම තෝ වාදයෙන් ගැලවීයවයි''ගෝය; මෙසේ මෙබඳු දොෂාරොපන කථාවෙන් වැලැක්සේවේද; මෙයද ඒ භික්ෂුහුගේ ශීලයවේ.

(2-9) යම්සේ වනාහි ඇතම් පින්වත් මහණ බමුණුකෙණෙක් වෙද්ද; ඔව්හු සැදැහැයෙන්දුන් බොජුන්වළඳා මෙබඳු දූතෙය්‍යපහීනගමනානු යොගයෙක්හි යෙදිවසද්ද; හේ කවරේද?:-රජ දරුවන්ගේද රජමහඇමතින්ගේද ක්ෂත්‍රිය යන්ගේද බ්‍රාහ්මණයන්ගේද ගෘහපතීන්ගේද කුමාරයන්ගේද (යම්කිසිවකුගේ)පත්හසුන් පඬුරුආදියගෙණ "මෙතෙනින් අසවල්නම් තැනටයව, එතනින් අසවල්තැනටඑව, මෙතනින් මෙනම්දෙයක් ගෙණයව, අසවල්තැනින් මෙනම් දෙයක් මෙතනට ගෙණඑවයි" ගෝය; මෙසේ මෙබඳු පත්හසුන් පඬුරුහා එගෙන්ගෙහට යන කකුල්මෙහෙ ආදියෙහියෙදිමෙන් වැලැක්කේවේද; මෙයද ඒ භික්ෂුහුගේ ශීලයවේ. (2-10)යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණ බමුණුකෙණෙක් සැදැහැයෙන් දුන්බොජුන් වළඳා ඔව්හු ත්‍රිවිධකොහොන්වතින් ලොකයාවිශ්මපත් කරවන්නෝවෙද්ද, ලාභසත්කාරකැමතිව විසමකථා කියන්නාහුවෙද්ද; ලාභසත්කාර සඳහන්කිරීම ස්වභාවකොට ඇත්තාහුවේද්ද; මෙරමාගේ ගුණලාභාදිය නිසා කීම ස්වභාවකොට ඇත්තාහුවේද්ද; ස්වල්පලාභයක්දී බොහෝ ලාභ සොයන්නාහුවෙද්ද; මෙසේ මෙබඳු කුහණලපනාදියෙන් වැලැක්කේවේද; මෙයද ඒ භික්ෂුහුගේ ශීලයවේ.

මෙතෙකින් පිටසිභෙදයෙන් (10) දසවැදෑරුම්වූ කුච්ජිභෙදයෙන් (147) එකසිය සත්සාළිස් වැදෑරුම්වූ **මජ්ඣිමසීලය** නිමවනලදී.

(3) එහි **මහාසීලය කවරේද?**:-(3-1) යම්සේ වනාහි ඇතම් පින්වත් මහණ බමුණුකෙණෙක් සැදැහැයෙන් දුන්බොජුන් වළඳා ඔව්හු මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාවන් හෙතුකොට මිථ්‍යාජීවයෙන් දිවිපවත්වද්ද; හේකවරේද?:-හස්තපාදාදීන් අතුරෙනි"මෙබඳුවූ යම්කිසි අවයවයකින් සමන්විතවූයේ දීර්ඝායුෂක වන්නේය; යසශ්‍රී ඇති

වත්තේය, යනාදී ක්‍රමයෙන් පැවතිසා මුද්‍රිකා ලක්ෂණයයි කියන ලද අඞ්ගශාස්ත්‍රය; ඒ ඒ කාරණා පරීක්ෂාකොට කියනා නිමිත්ත ශාස්ත්‍රය * අසන්පාතාදීන්ගේ මහත්වගැසීමදැක "මෙබඳු හෙණ වැදීමෙන් මෙසේවූ සුභා සුභයෙක් වන්නේය"යි කියන්නාවූ උත්පාත ශාස්ත්‍රය; "යමෙක් පෙරවරුවේලෙහි ස්වප්නදුටුයේ වීනම් මෙබඳු විපාකවන්නේය, මෙසේවූ ස්වප්නයක්දුටුයේනම් ඔහට මෙබඳු විපාක වන්නේය"යි කියන්නාවූ ස්වප්නශාස්ත්‍රය; "මෙබඳු ලක්ෂණයෙන් යුක්තවූයේ රජවන්නේය, මෙබඳු ලක්ෂණයෙන් යුක්තවූයේ යුවරජ වීන්නේය" යනාදි ක්‍රමයෙන් පැවැත්තාවූ ලක්ෂණශාස්ත්‍රය; අළුත්වූ හෝ පරණවූ ඉනෝ වස්ත්‍රයෙනි මෙතැන් පටන් මෙසේ මීයන් කෑ කල මෙබඳුවූ සුභාසුභයෙක් වන්නේයයි කියන්නාවූ මූසිකශාස්ත්‍රය; "මෙබඳු දරකින් ගිණිදෙවියාපිදූකල්හි මෙනම් විපාකයක් වන්නේය"යි කරන්නාවූ අග්ගිහෝමය; මෙබඳු සැන්දකින්වහණි පූජාකළකල්හි මෙබඳු විපාකවන්නේයයි කරන්නාවූ දබ්බිහෝමය; මෙබඳු වී පොත්තකින් ගිණිපිදූකල්හි මෙබඳු විපාකයක්වන්නේයයි කරන්නාවූ ථුසහෝමය; මෙබඳු කුඩකින් යාගකළකල්හි මෙබඳු දෙයක්වන්නේයයි පැවති කණහෝමය; මෙබඳු සහලකින්යාග කළකල්හි මෙබඳු දෙයක්වන්නේයයි පැවති තණ්ඩුලහෝමය; මෙබඳු ගිතෙලකින් යාගකළකල්හි මෙබඳු විපාකවන්නේයයි පැවති සප්පිහෝමය; මෙබඳු තෙලකින් යාගකළකල්හි මෙබඳු විපාකවන්නේයයි කියන්නාවූ තේලහෝමය; මුඛයෙන් අබආදී යගෙණ ගින්නෙහිලීමහෝ මන්ත්‍රපිරිවහා යාගකිරීමහෝයයි පැවති මුඛහෝමය; දකුණුදසරුවෙනි ලේ ගෙණ යාග කිරීමෙන් පවත්නාවූ ලෝහිතහෝමය; ශරීරආකාරය බලා මෙතෙම කුලපුත්‍රහෝ අකුලපුත්‍රයෝවෙයි, යසශ්‍රීඇත්තේහෝ නැත්තේහෝවෙති; මේ ආදීක්‍රමයෙන් කියන්නාවූ අඞ්ගවිද්‍යාය; ශ්‍රීවස්තු ආරාම උද්‍යාන වස්තුආදීන්ගේ ගුණදෝෂසැලකීම් වශයෙන්ද, මුත්තිකාවිශේෂදැක මන්ත්‍ර ජල්පනයකොටද, පොළොව යටින් තිස්රියනක් පමණ තැනහෝ අහසින් අසූරියනක් පමණ තැනහෝ සියලුතන්හි ගුණදෝෂ දක්නාවස්තුවිද්‍යාය; අඬෙගය්‍ය මාඞ්ග

* පාඬිරජතෙමේ මුතුතුණක් මිටමොලවාගෙණ මාඅත කුමක්දැයි නිමිත්ත පාඨකබමුණා අතින් විචාළේය. හෙතෙම ඈත මෑත බලන්නේ හූනෙකුමැස්සෙක් ඩැහැගණු පිණිස පැන්නකල්හි ඉගිලීගියබවදැක මදුරුවා මිදුනුහෙයින් මුතුවියයුතුයයි සලකා මහරජමුතුයයිකීය. රජ ඒ කීයක්දැයි විචාළකල ඔබ්මොබ බලන්නේ කුකුළෙකු තුන්විටක් හැඬුය. ඒයඅසා තුණයයිකීය. මෙයාකාරයෙන් කරුණු කියන ශාස්ත්‍රය නිමිත්ත ශාස්ත්‍රයයි.

රක්ෂාදි නීතිශාස්ත්‍රය; සොහොනෙහි වැස යාගකරන්නාවූ විද්‍යාවහෝ සිවෙල්සුතුරුවිද්‍යාය; යක්ෂවිධානය, යක්ෂ ප්‍රලය කරන්නාවූ භූතවිද්‍යාය; බිම්ගෙයිවසන්නහු ඇසින් උගත භූරි මන්ත්‍රය; සර්පවිෂ බානා මන්ත්‍රහෝ සර්පවිධාන කාරණ මන්ත්‍රය; යම් මන්ත්‍රයක් පිරෙව්කල පළමුසර්පයා කෑමෙන් බොහෝකාලක් තිබූත්තු විෂයෝ බසීද අමුතුව විෂයෝ නැගේද විෂබන්ධනය හෝවේද එබඳු විෂවිද්‍යාය; ගෝනුස්සන් ඇන්කල විෂ බානා මන්ත්‍රය; මීයන් කෑකල විෂබානාමන්ත්‍රය; පියා (තටු) ඇතිනැති ද්විපද චතුෂ්පාදයන්ගේ හඬඅසා දොෂා දොෂ කියන්නාවූ සකුණවිද්‍යාය; කපුටුවන් හඬ අසා යහපත නපුරකියන්නාවූ කපුටුතුරුය; "දැන් මේතෙම මෙතෙක් අවුරුදු මාස් දවස් ජීවත්වන්නේයයි" මෙසේ පැවැත්තාවූ ජරාරිෂ්ටවිද්‍යාය; යුද්ධාදියෙහි යම් පරිද්දකින් ඇඟදඬුනොවැදේනම් එපරිද්දෙන් පිරිවහණමන්ත්‍රය; සියලු පක්ෂීන්ගේ හා චතුෂ්පාදජාතීන්ගේ හඬදැනීම්වශයෙන් පැවැති මන්ත්‍රය හෝය; මෙසේ මෙබඳු තිරශ්චීනවිද්‍යාවන් හේතුකොටගෙණ ජීවිකාව කිරීමෙන් වැළැක්කේවේද; මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ.

(3-2)යටකී පරිද්දෙන් යම්කිසිබාහිර මහණබමුණුකෙනෙක් "මෙබඳු මාණික්‍ය ප්‍රශස්තය මෙබඳු මාණික්‍ය අප්‍රශස්තයයි හෝ, බලන්නාවූ සත්වයාහට ආරෝග්‍ය ඓශ්වර්‍ය්‍යාදිය දෙන්ට හේතුය අහේතුයයි "මෙසේ වර්ණසංස්ථානාදි වශයෙන් මාණික්‍යලක්ෂණදැනීමය;" මෙබඳු දණ්ඩක්රැගෙණ ඇවිදිකල මෙබඳු යහපතෙක් නපුරෙක්වෙයි" යනාදිවශයෙන් පැවති දණ්ඩලක්ෂණය; මෙබඳු වස්ත්‍රයෙක් හැඳිකල මෙබඳු ගුණදොෂයෙක්වෙයි යනාදි වස්ත්‍රලක්ෂණය; "මෙබඳු කඩුවක්ඇල්වූකල මෙබඳු ඉදොෂයෙක් වෙයි" යනාදි ඛඩ්ගලක්ෂණය; මෙබඳු හීයක්ඇල්වූකල මෙබන්දක්වෙයි යනාදී ශරලක්ෂණය; මෙබඳු දුන්නක්ඇල්වූකල මෙබන්දක්වෙයි යනාදී ධනුලක්ෂණය; කඩුශරදෙකින් පිටත්සෙසු ආවුධ ඇල්වූ කල මෙබන්දක්වෙයි යනාදී ආවුධ ලක්ෂණය; යම් ගෙයක මෙබඳු ස්ත්‍රියක් මෙබඳු පුරුෂයෙක් වෙසේනම් ඒ ගෙට මෙබඳු වැඩක් ඇවැඩක්වෙයි යනාදී ස්ත්‍රී පුරුෂලක්ෂණය; යම් ගෙයක මෙබඳු කුමාරයෙකු-කුමාරියෙකු-දාසයෙකු-දාසියෙකු-උපන්කල-මෙබඳුඇතෙකු-අසෙකු-නැගිකල-මෙබඳු ගොණෙකු-දෙනෙකු-මීවෙකු-මීදෙනකගෙන් ප්‍රයෝජන විඳි කල මෙබඳු ගුණදොෂයෙක්වෙයි යනාදීන් පැවති ඒ ඒ ලක්ෂණය; "මෙබඳු තිරලු පළෙලු කුකුළු වටුවන්ගේ මස්කෑම යුතුය මෙබඳුවූවන්ගේ නොකෑයුතුය"යි යනාදීන් පැවති අජාදිලක්ෂණය, "සිතියම් පලඳනාදියෙහි මෙබඳු ගොධින්ගේ රූපාදියකළකල මෙබන්දෙක්වෙයි"

යනාදිගොධාලක්ෂණය; * "පලඳනාවෙහි හා ගෘහයෙහි මෙබඳු
කෙමියක්(කැණිමඬලක්)ඇතිකල මෙබත්දෙක්වෙයි" යනාදීක
ණ්ණිකාලක්ෂණය; *"සිතියම් ආදියෙහි මෙබඳු කැස්බෙකු ඇතික
ල මෙබත්දෙක්වෙයි" යනාදි කච්ඡපලක්ෂණය; "සියලු චතුෂ්පා
දජාතීන් අතුරෙන් සිතියම්හි පලඳනාදියෙහි මේ සත්වයා ඇතිකල
මෙබත්දෙක්වෙයි යනාදී මෘගලක්ෂණය"යි මෙසේ කියනලද
මෙබඳු තිරශ්චීනවිද්‍යාවන් හේතුකොටගෙණ දිවි පවත්වද්ද;
එබඳු මිථ්‍යාජීවිකාවෙන් වැලැක්සේවේද; මෙයද ඒ භික්ෂුහුගේ
ශීලයවේ.

(3-3) එපරිද්දෙන්ම යම්කිසිබාහිර මහණ බමුණුකෙනෙක් "අස
වල් දවස් අසවල් නැකතින් අසවල් රජුගේ නුවරින් (යුද්ධාදියට)
බැහැරයාමවන්නේය"යි කියාද; එසේම අසවල්රජහුගේ නුව
රට ඊමවන්නේයයි කියාද; ඇතුළුනුවරට පිටතින් අවුත්විරුද්ධව
උන්රජුකරු අපරජ්ජුරුවන්ගේ පෙරගමන්යාම වන්නේයයිකියා
ද; පිටතින් අවුත් ඇතුල්නුවර උන්රජදරුවන්ගේ පෙරලාඅභි
මුඛව ආ අපරජ්ජුරුවන්කරු දක්මට ඊම වන්නේයයි කියාද; පිට
තින් ආ රජදරුවන්ගේ ඇතුලුනුවරඋන් රජ්ජුරුවන්කරුදක්මට
ඊමවන්නේයයි කියාද; ඇතුළුනුවරඋන් රජ්ජුරුවන්ගේ පිටතින්
ආ රජදරුවන්කරු දක්මට පෙරලායාම වන්නේයයි කියාද; ඇතු
ළුනුවර රජහටජයවන්නේයයි කියාද; පිටනුවරින් ආ රජහටපරා
ජයවන්නේයයි කියාද; පිටනුවරින් ආ රජහටජයවන්නේයයි කි
යාද; ඇතුලුනුවර රජහට පරාජයවන්නේයයි කියාද; මෙසේ
මොහට ජයවන්නේය මොහටපරාජය වන්නේයයි කියාහෝ
මෙසේ කියනලද මෙබඳු තිරශ්චීනවිද්‍යාවන්හේතුකොටගෙණ
ජීවත්වෙද්ද; එබඳු මිථ්‍යාජීවිකාවෙන් වැලැක්සේවේද; මෙයද
ඒ භික්ෂුහුගේ ශීලයවේ.

(3-4) එසේම යම්කිසිබාහිර මහණ බමුණුකෙනෙක් "අසවල්දවස්
සඳ රාහුගන්නේය, අසවල්දවස් ඉර රාහු ගන්නේය, අඞ්ගාරකාදි
ග්‍රහතාරකාවන්ගේ යුද්ධාදිවශයෙන් සඞ්ගමයවන්නේය; චන්ද්‍රසූර්‍ය්‍ය
යන්ගේ මාර්ගයෙහිද අමාර්ගයෙහිද ගමන්වන්නේය; ග්‍රහතා
රකාවන්ගේ මාර්ගයෙහිද අමාර්ගයෙහිද ගමන්වන්නේය; අහ
සෙහි ගිණිසිළුවැටීම් වශයෙන් උල්කාපාතවන්නේය; වනඞ්ගි
සිඛා ධූමසිඛාවෙන් ආකුලබවක්මෙන් දික්කාලුෂ්‍යය වන්නේය;
පොළොව සැලීමවන්නේය; අසනිපාත වශයෙන් අවකාශයෙහි

---

* එක්තරා විහාරයක සිතියමෙහි ගොයෙකු ගිණිපිඹිනා ආකා
රයඇතිකොට ඇන්දෑහ, එතැන් පටන් එහි භික්ෂූන්ගේ විවාදබෙ
හුල විය. එක් ආගන්තුක භික්ෂුවක් ඒ සිතියම්නැව දැක මැකිය. එ
තැන්පටන් (ඒ වෙහෙරෙහි) විවාද ව්‍යුපශම්න විය.

ශුෂ්කවලාහකගර්ජනාවවන්නේය; චන්ද්‍රසූර්‍ය්‍ය නක්ෂත්‍ර තාරකාවන්ගේ නැගීමද; හසනයටියාම(බැසීම)ද; නොපිරිසිදුබවද; පිරිසිදුබවද වන්නේය; ලොවට මෙබඳු සුවදුක් එළවන්නාවූ චන්ද්‍රග්‍රහණ වන්නේය; මෙබඳු විපාකඇති සූර්‍ය්‍යග්‍රහණ වන්නේය; මෙබඳු විපාකඇති අගාරකාදී ග්‍රහතාරකාවන්ගේ සඟමය වන්නේය; මෙබඳු විපාකඇති චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ මාර්ගයෙහිද අමාර්ගයෙහිද ගමන්වන්නේය; මෙබඳු විපාකඇති ග්‍රහතාරකාවන්ගේ මාර්ගයෙහිද අමාර්ගයෙහිද ගමන්වන්නේය; මෙබඳු විපාකඇති උල්කාපාත දිසාකාලුෂ්‍ය, පොළොව සැලීම, අවකාශයෙහි ශුෂ්කවලාහක ගර්ජනාව වන්නේය; චන්ද්‍රසූර්‍ය්‍යනක්ෂත්‍රතාරකාවන්ගේ මෙබඳු විපාකඇති නැගීම බැසීම කිලිටුබව පිරිසිදුබව වන්නේය”යි මෙසේ කියනලද මෙබඳු තිරශ්චීනවිද්‍යාවන්කරණකොටගෙණ ජීවත්වෙද්ද;එබඳු ලාමක ජීවිකාවෙන් වැළැක්කේවේද; මෙයද ඒ භික්ෂුහුගේ ශීලයවේ.

(3–5)එසේම යම්කිසි බාහිර මහණබමුණකෙණෙක් “කාලට මනා වැසිවස්නේය; කාලටවැසි ඉඳුරාම නොවස්නේය; රට සුභික්ෂවන්නේය, දුර්භික්ෂවන්නේය, නිර්භයවන්නේය, භයවන්නේය; රෝගවන්නේය; නිරෝගවන්නේය; ඇඟිල්ල ඇල්ලවීම; නෙරුස් පඤ්චරශ්මිවශයෙන් ගිණීම; පුඩුගණනා; කාව්‍යකිරීම; විතණ්ඩශාස්ත්‍රය ඉගැණීමය”යි කියාහෝ මෙසේ මෙබඳු තිරශ්චීනවිද්‍යාවන්හෙතුකොටගෙණ ලාමකජීවිකාවෙන් ජීවත්වෙද්ද; එබඳු ජීවිකාවෙන් වැළැක්කේවේද; මෙයද ඒ භික්ෂුහුගේ ශීලයවේ.

(3–6)එසේම යම්කිසි බාහිරමහණබමුණකෙනෙක් “මේ කුමාරයාහට අසවල්කුලයෙන් අසවල්නැකතින් අසවල්කුමාරිකාව ගෙණෙව” යනාදීන් ආවාහකරවීම;“මේ කුමාරිකාව අසවල්කුමාරයාහට අසවල් නැකතින්දෙව, එසේ ඇති කල්හි ඇට අභිවෘද්ධිවන්නේය”යනාදීන් විවාහකරවීම; “අද නැකත යහපත අද සමගිවවස, එසේවූ කල්හි තොපදෙදෙනාගේ වියෝගය නොවන්නේය”යිමෙසේ සමගි කරවීම; “ඉදින් තොපිදෙදෙන වෙන්වනු කැමැත්තෝ වී නම් අදම වෙන්වව්, එසේ කල්හි තොපදෙදෙනාගේ නැවත එක්වීමක් නොවන්නේය”යි මෙසේ වියෝගකරවීම, “තොප පිසින් නයදුන්වස්තුව අදරුස්කරව, අදරුස්කළ කල්හි බොහොකලක් තහවුරුවන්නේය”යි මෙසේ ධනසංචයකාරවීම; “ඉදින් නයදීම් පොළී පිටලීම් ආදිවශයෙන් වස්තුවඅනුන්ට දෙනුකැමැත්තෝ වීනම් අදමදෙව, අදදුන්දෙය දියුනුවන්නේය”යි මෙසේ වස්තුව විසිරවීම; ප්‍රියමනාප යසශ්‍රී කරවීමද,මෙකීදෙයට විපරීතයකරවීම; නස්නාවූගණිය නැවත නොනස්නා පිණිස බෙහෙත්දීම; මනත්‍රයෙන් දිවසොල්වාගතනො

දිනදක්කිරීම; නොහොත් දිවගුළුබැඳීම; මුඛ බන්ධන මන්ත්‍ර පිරවී
මෙන් හනුතදක්කිරීම; අත් පෙරළුවන මන්ත්‍රපිරවීම; කණ්බිහිරික
රවණ මන්ත්‍රපිරවීම; මන්ත්‍රපිරවීමෙන් කැටපත්හි දේවතාරෝප
ණයකොට ප්‍රශ්නවිචාරීම; කුමාරිකාවගේ ශරීරයෙහි දේවතා
රොපණයකොට ප්‍රශ්නවිචාරීම; යක්දෙස්සන් ඇඟට යකුන් නන්
වා ප්‍රශ්නවිචාරීම; ජීවිකා ප්‍රවෘත්තිය පිණිස සූර්‍ය්‍යයා නමස්කාරකි
රීම; එසේම මහාබ්‍රහ්මයාහට උපස්ථානකිරීම; මන්ත්‍ර පිරූවා මුඛ
යෙන් වහන්ජාලාවන් පිටකිරීම; "සිරිදේවිය මෙසේ අවුත් මා
ගේ මස්තකයෙහි පිහිටාවයි" මෙසේ මස්තකයෙන් ශ්‍රීකාන්තා
වට අවහාණය කිරීම; යයි මෙසේ කියනලද මෙබඳු මිථ්‍යාජීවි
කාවන් හෙතුකොටගෙණ දිවි පවත්වත්ද; එබඳු මිථ්‍යාජීවිකා
වෙන් වැලැක්කේවේද; මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ.

(3-7) එසේම යම්කිසිබාහිර මහණ බමුණුකෙණෙක් දේවාල
යස්ථානයට නොස් "ඉදින් මට මෙනම් මෙනම් දෙයක් සමෘද්ධි වී
නම් නුබවහන්සේට මෙනම් මෙනම් දෙයකින් පූජාසත්කාර
හා බලිවිධානකෙරෙම්"යි කටයුතුවූ සාන්තිප්‍රතිඥ කර්‍මය; (දෙවි
යන්ටබාරවීම)ඒ ප්‍රාර්ථනාකළකාර්‍ය්‍යය සමෘද්ධවූකල්හිකටයුතුප්‍රණි
ධිකර්‍මය; (බාරදීම) බිම්ගෙයිවැස උගත්මන්ත්‍රයාගේ ප්‍රයොගකි
රීම; පණ්ඩකයා පුරුෂකිරීම; පුරුෂයා පණ්ඩකකිරීම; පළමු ගෙ
වල් නොකළබිම ගෙවල් කරවීම; "මේ මේ දෙයගෙණෙවයි"කි
යාගෙන්වා ගෘහබලිවිධානකිරීම;ජලයෙන් මුවසුධකරවීම;අනුන්
නැඟැවීම; ගිණිදෙවියාහට අනුන්ගේ කාර්‍ය්‍යයනිසා යාගකිරීම;
බෙහෙත් යොගදී වමන කරවීම; එසේම විරෙචන කරවීම;
නාභියෙන් මත්තෙහි පිත්ත ශ්ලෙෂ්මාදී දොෂ පහකරවීම; එසේ
ම නාභියෙන්යට දොෂහැරීම; නශ්‍යකොට ශිරෝවිරෙචනකිරීම;
කන්වඩනා පිණිස හෝ කර්ණව්‍රණසංසිඳෙන පිණිස බෙහෙත්
තෙල්දීම; ඇසුරුදුපැහැදීම්ආදී අක්ෂිසන්තාපයට බෙහෙත් යො
දා නශ්‍යකිරීම; දෙතුන්පටලයක් කපාගණයන්ට සුදුසු ක්ෂාරාඤ්ජ
න ඉදිකිරීම; සිහින් බෙහෙත් අඳුන්කිරීම; සත්කටුලා කටයුතු
වෙදකම; ශ්‍රීනිසෝද්දී සිරාසන්ධිහැඳින සල්ලවෙද්‍යයන්විසින් ක
ටයුතු වෙදකම්කිරීම; බාලදරුවන්ට කරණ වෙදකම; නොයෙක්
මුල් කොල ආදියගෙණ කකාරු කරණ ශරීරචිකිත්සාව; ඊට ඊට
සුදුසු තද තද බෙහෙත්දී පැයගණනක් ගියකල නොමනාබෙ
හෙත් නැත්වීමයයි මෙසේ කියනලද මෙබඳු තිරශ්චීනවිද්‍යා
වන් කාරණකොට ගෙණ ජීවත්වෙද්ද; එබඳු ලාමකජීවිකාවෙන්
වැලැක්කේවේද; මෙයද ඒ භික්ෂූහුගේ ශීලයවේ.

මෙතෙකින් පිටසිහෙදයෙන් (7) සත්වැදෑරුම්වූ කුච්ජෙද
යෙන්(148)එකසිය අටසාලිස් වැදෑරුම්වූ මහාසීලය නිමවනලදී.

කියනලද පරිද්දෙන් මෙසේ ත්‍රිවිධසීලයෙන් සම්පූර්ණ භික්ෂුතෙම චක්ෂුරාදී ඉන්ද්‍රියයන්හි වසනලද සංවරය ඇත්තේ අභික්කමනාදී සත් ස්ථානයෙහි සාත්ථක සම්පජඤ්ඤ, සප්පාය සම්පජඤ්ඤ, ගොචරසම්පජඤ්ඤ, අසම්මොහසම්පජඤ්ඤ, යන චතුර්විධ සම්පජඤ්ඤයෙන් සමෘතිප්‍රඥව ඇතිව; යථාලාභ සන්තොස, යථාබල සන්තොස, යථාසාරුප්පසන්තොස වශයෙන් චීවරාදි එකී එකී ප්‍රත්‍යයෙහි පවත්නා සොළොස්වැදෑරුම් ප්‍රත්‍යය සන්තොෂයෙන් යුක්තවූයේ යම්යම් තැනකයයිද (ඒ සියල්ලන්හි යට දැක්වූ උපමායෙන් කුඩාවැහැයයි කියනලද දැහැටි ආදිය කපන පිහියද, ඉඳිකටුවද, පෙරහනෙහි දමා එය පාත්‍රයතුළ තබා පාත්‍රය වත් අංසකූටයෙහි එල්වා තුන්සිවුර ශරීරය පිළිබඳකොට යන ස්වභාවයෙන් සල්ලහුක ප්‍රතිපත්තිය හෙවත් ලැහැල්ලු පැවැත්ම පූරණයකොට යටකී සමථ විදර්ශනාභාවනාවන් වඩා සතර ශ්‍රාමණ්‍ය ඵලය අත්පත් කරන්නේය— මෙතෙකින් ආධුනික භූද්‍ර ජනයාගේ ප්‍රමොදය පිණිස කරණලද භික්ෂුසීලයෙහි **චුල්ලසීලාදි නිද්දෙස** නම්වූ අටවෙනි පරිච්ඡෙදය නිමවනලදී.

(පඃ අඃ) **චුල්ලසීලාදි නිද්දේසං සො’මංපස්සති සාදරො,**
**සොචුල්ලමජ්ඣිම මහා සීලෙසු බහබුද්ධිකො.**

යම්හෙයකින් සීලය දන්නාවූ ශ්‍රද්ධාවන්තයෝ දුස්සීලයන්ගේ දොෂනා, සිල්වතුන්ගේ අනුසස් දැනීමෙන් සීලයෙහි පිහිටද්ද, එහෙයින් දැන් දුස්සීලයන්ගේ දොෂහා සිල්වතුන්ගේ අනුසස් මෙහි පහළවන්නාහුය.

(1) විනයනය ප්‍රධානකොට කියනලද චතුර්විධවූද; සූත්‍රනය ප්‍රධානකොට කියනලද ත්‍රිවිධවූද; භික්ෂුසීලයට පිටිපා ශ්‍රමණවෙස් ගෙණ වසන්නාවූ කායවාක් සංවර රහිත ප්‍රකට ශ්‍රමණ දුශ්ශීලයෝ තමන්ගේහා තමන් සේවනාදිය කරණ ශිෂ්‍ය දායකාදීන්ගේද; ස්වර්ගමොක්ෂ මාර්ගයන් දූෂ්‍යකරන්නාහ්බැවින් මාර්ග දූෂකයෝයයි කියනු ලබත්. “**සො පුග්ගලො අත්තනො** ලොකුත්තරමග්ගස්ස පරෙසං සුගතිමග්ගස්සච දූසනතො මග්ග දූසීති වෙදිතබ්බො”යි යනුවෙන් එම අර්ථය දක්වනලදී.

(2) “**සෙය්‍යථාපි භික්ඛවෙ ඡවාලාතං** උභතොපදිත්තං මජ්ඣෙගූථගතං නෙවගාමෙ කට්ඨත්ථං ඵරති න අරඤ්ඤෙ ඵරුතත්තං, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි යථායං පුග්ගලො නෙව තස්ස හිතාය පටිපන්නො නොපරහිතාය,, යනුවෙන්“ මහණෙනි දෙකොණ ගිනිගෙණ දිලිසෙනලද මැද අසූචි තැවරුණාවූ සො

හොන් පෙනෙල්ල යම්සේ ගමෙහි කාෂ්ටකෘත්‍ය පිණිස නොපවතිද යම්සේ අරණ්‍යයෙහි දැවකෘත්‍ය පිණිස නොපවතිද; මහණෙනි යම් මේ පුත්ගලයෙක්තෙම තමන්ට හිතපිණිස නොපිළිපන්නේද; අනුන්ට හිතපිණිස නොපිළිපන්නේද; මේ ශ්‍රමණ දුශ්ශීල පුත්ගලතෙම ඊට උපමාකොට මම කියමියි, වදාළහෙයින් ශ්‍රමණ දුශ්ශීලයෝ ගිහි භොගයෙන්ද පිරිහුනාවූ මශ්‍රණකාමද නොපුරනනාවූ උභය භ්‍රෂ්ටයන්බව ප්‍රකාශවේ. (3) තවද "**බහුසුතොපිචෙ හොති,** සීලෙසු අසමාහිතො, සීලතො නං ගරහන්ති, නාස්ස සම්පජ්ජතෙ සුතං" යනුවෙන් ඉදින් යමෙක් බහුශ්‍රැතවූයේනමුත් සීලයෙහි නොපිහිටියේද, ඔහට "දුශ්ශීලයායය"යි ගර්හාකරත්; ඔහට ශ්‍රැත කෘත්‍යයක් නොපැමිණේ"යි වදාළහෙයින්ද; මේනිසාම විසුද්ධිමාර්ගයෙහි "**සුතාදි ගුණයුත්තොපි** අපූජ්ජරහො සුසානාග්ගිව්‍ය බ්‍රාහ්මණානං"යි කීහෙයින්ද; උගත් ශ්‍රමණ දුශ්ශීලයෝ පවා ගර්හා කටයුතුවූවෝබවද; ඔවුන්ට චීවරාදි ප්‍රත්‍යයෙන් නොපිදිය යුතුබවද පැහැදිලිව ප්‍රකාශවේ. නූගත් දුස්සීලයන්ගැන කියනුම කිම. මඞ්ගල සූත්‍රයෙහිද "පූජාච පූජනීයානං" යනාදිය වදාළහෙයින් ඒ නොපිදියයුතු ශ්‍රමණ දුශ්ශීලයන්හට චීවරාදි ප්‍රත්‍යයෙන් පිදීම අවමඞ්ගල්‍යයක්බව පැහැදිලිවප්‍රකාශවේ. (4) "**යොනින්දියං පසංසති,** තං වානින්දති යො පසංසියො, විචිනාති මුඛෙන සො කලිං, කලිනා තෙන සුඛං නවින්දති" යනුවෙන් "යමෙක්තෙම නින්දා කටයුතු දුස්සීලයාහට "සිල්වතායයි ප්‍රශංසාකරයිද; යමෙක් ප්‍රශංසාකටයුතුද, ඒ සිල්වත්හටගෝ "දුස්සීලයා"යයි නින්දාකරයිද; හෙතෙම කටින් පව්රැස්කරයි;ඒ පාපීතෙම පරලොව සැපතක් නොවිඳී"යි වදාළහෙයින් සිල්පද කඩකරමින් නොයෙක් නොපණත් ක්‍රියාවල යෙදී වසන ශ්‍රමණ දුශ්ශීලයෝ "ආයති පරම්පරාවේන් පැවතෙන අර්හත් ධජය දරන්නාවූ උත්තමයෝය"යි ඔවුන් ගුණවර්ණනා කරමින් යහපත් සිල්වතුන්හට "කුහකයෝයයි ආක්‍රොශ පරිභව කරණ දායකාදීහු, ඒ ශ්‍රමණ දුශ්ශීලයන්ගේගුණකීමාදිය නිසා අපායගතවන බව ප්‍රකාශවේ. ප්‍රෙතවස්තු ප්‍රකරණයේ ගූථඛාදක ප්‍රෙතවස්තුව මීට සාධකයි. **පරමත්ථදීපනී** නම්වූ තදර්ථකථාවෙහි සැවැත්නුවර එක්තරා උපාසකයෙක් තමන් කුළුපග (පාපී) භික්ෂුවක්හට විහාරයක් කරවාදී උපස්ථාන කරමින් ඔහුගේ අවවාදයෙහි පිහිටා වසනීංතර සිල්වතුන්ට ගර්හාකළාවූ ඒ පාපී තෙම මියගොස් එම විහාරයේ වැසිකිළියෙහි ප්‍රෙතයෙක්ව උපන් බවද; ඒ දායකතෙමේද ඒ පාප භික්ෂුවගේ අවවාදයලෙස හැසිර මියගොස් එම වර්ච්ස්කුටයේ ඒ ශ්‍රමණ මහාප්‍රෙතයාගේ හිසපිට ප්‍රෙතයෙක්ව ඉපිද දුක් විඳිනබවද ප්‍රකාශව තිබේ. දුශ්ශීල උපස්ථානය කරණ දායකාවරු

සහ ප්‍රතිග්‍රාහකයෝත් උඩුයටි කුරුවී උපදිනබවට මෙය යහපත් දෘෂ්ටාන්තයකි. (5) "චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථා භතා නික්ඛිත්තො එවං නිරයෙ" යනාදී ශ්‍රීමුඛ පාලියෙන් "නොදැන නුවනින් ගුණය අල්වා නොගෙණ අගුණ කියයුත්තාගේ ගුණකීම; ගුණ කියයුත්තාගේ අගුණකීම; නොපැහැදිය යුතුතැන පැහැදීම; පැහැදිය යුතුතැන නොපැහැදීම; යනමේ කාරණ සතරින් සමන්විතවූයේ ගෙණ යන ලද බරක් බහා තබන්නාක්මෙන් මරණින් මතු අපායෙහි උපදී"යි වදාළහෙයින් ශ්‍රමණ දුශ්ශීලයන්ගේ ගුණ කියමින් ඔවුන්ගේ දුෂ්ප්‍රතිපත්තියෙහි මිථ්‍යානුලොම ප්‍රතිපදාවෙහි පැහැදී වසන දායකාදීහු එයින් අපායභාගී වනබැව් ප්‍රකාශවේ. (6) "යෙබොපනස්ස සෙවන්ති භජන්ති පයිරුපාසන්ති දිට්ඨානුගතිං ආපජ්ජන්ති තෙසං තංහොති දීඝරත්තං අහිතාය දුක්ඛාය" යනුවෙන්ද; අට්ඨකථායෙහි "ජසතථාරෙ සෙවන්තානං මිච්ඡා දිට්ඨිකානං විය දෙවදත්තං සෙවන්තානං කොකාලිකාදී නං විය ච සෙවනං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති" යනුවෙන්ද; ශ්‍රමණ දුශ්ශීලයන් සේවනාදිය කරමින් මෝහයෙන් මුළාව පින්සළකායයි උපස්ථාන කරණ දායකාදීන්ට ඒ දුස්සීල සෙවනාදිය දීර්ඝකාලයක් මුළුල්ලෙහි අහිත පිණිස සතරඅපාය දුක්පිණිස පවත්නාබැව් ප්‍රකාශවේ. (7) තවද "යෙතෙ භික්ඛවෙ භික්ඛු දුස්සීලා පාපධම්මා–පෙ–කසම්බුජාතා, දස්සනං පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං අනත්ථා වහංවදාමි, සවනං–අනුස්සතිං–අනුපබ්බජ්ජං–උපසංකමණං–පයිරු පාසනං පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං අනත්ථා වහංවදාමි" යනුවෙන් ඒ දුශ්ශීල භික්ෂූන්ගේ දැකීමද; වචනඇසීමද; ඔවුන් සිහිකිරීමද; අනුව පැවිදිවීමද; ඔවුන් සමීපයට පැමිනීමද; (සෙවනය) නැවත නැවත ලඟඳීම් වශයෙන් ඔවුන්වෙත පැමිනීමද; (භජනය) අපාය දුක් එලවන හෙයින් අනර්ථ එලවායයි ප්‍රකාශවේ. (8) "එවරූපො භික්ඛවෙ පුග්ගලො ජිගුච්ඡි තබ්බො නසෙවි තබ්බො නභජි තබ්බො නපයිරු පාසි තබ්බො" යනුවෙන් "මෙබඳු ශ්‍රමණ දුශ්ශීල පුත්ගලයා අසූචියක් මෙන් කුණපයක්මෙන් කුනුමස් දියැත්තක් මෙන් පිළිකුල් කටයුතු ඔහු සමීපයට නොඑලඹියයුතු, ඔහුගේ කිසි ක්‍රියාවකට ඇලුම් නොකටයුතු, ඔහුවෙත (ලඟ ඉඳනැගීම් වශයෙන්) නැවත නැවත නොපැමිණියයුතු"යි වදාළහෙයින් ශ්‍රමණ දුශ්ශීලයන් දුරින්ම දුරුකටයුතුබව ප්‍රකාශවේ. ගෘහස්ථ දුශ්ශීලාදී අනිකුදු දුස්සීලයන් "සෙවන භජන පයිරුපාසන නොකටයුතුයයි" වදාළ පමණමුත් පිළිකුල් කටයුතුහයි නොවදාළේය. ගිහි දුස්සී

ලයාටවඩා ශ්‍රමණ දුශ්ශීලයා උතුම්යැයි සලකන භවතුන් විසින් එහිරහස කුමක්දැයි සෙවිය යුතුවතිබේ.

(9) මෙසේ තමන්ගේසහ තමන් ආශ්‍රය කරන්නවුන්ගේද ස්වර්ග මොක්ෂ මාර්ගය දූෂ්‍යකරන්නාවූ; සොහොන් පෙණෙල්ලක්සේ නිස්ඵලවූ; ගර්හාකටයුතුවූ; එහෙයින් නොපිදියයුතුවූ; ප්‍රශංසා නොකටයුතුවූ; නොපැහැදිය යුතුවූ; සෙවනාදිය නොකටයුතුවූ; දක්‍ෂිණාදියෙන් අනර්ථ ඵලවන්නාවූ; පිළිකුල් කටයුතුවූ; ශ්‍රමණ දුශ්ශීලයන්කෙරෙහි මුළාවෙන් පැහැදී සෙවනාදිය කරමින් ඔවුන්ට අනූනූන නොවඳළ චිවරාදී සිව්පසයෙන් උපස්ථාන කරණ දායකාදීහු මරණින්මතු අපාය භාගීවෙති.

දෙව්දත්තෙර කෙරෙහි "මහානුභාවසම්පන්න උත්තමයෙකැයි ආස්ථානයේ පැහැදී ඕනට උපස්ථානකළ අජාතශත්‍රු රජ්ජුරුවන්ගේ අපාය ගමණ සඳහා — **අසන්තංසො පග්ගණ්හාති,** අසන්තං උපසෙවති, තමෙවකාසංකුරුතෙ, ව්‍යග්ඝොසක්ඛිවකං යථා"යි — වදාළ ශ්‍රීමුඛ පාලියෙන්හා තදර්ථකථායෙන්දඑම අර්ථය පැහැදිලිව ප්‍රකාශවේ. * දුශ්ශීල උපස්ථානාදියෙන් අවැඩ සිද්ධවනබැව් විස්තරව දැන ගනුකැමැති සුධීන් විසින් මීට අනතුරුව දුශ්ශීලසඞ්ග්‍රහභෙදයෙහි 15 වෙනි පිට පටන් 31 වෙනි පිට දක්වා බැලියයුතු.

(10) තවද, "**යොඅග්ගිපදිත්තම්වඅඞ්ගාරං** අත්තනාදුග්ගහිතෙන අත්තාන ඤ්ච, අත්ථනොවචන කාරෙච විනාසෙන්ති" යනුවෙන් පූරණ කාශ්‍යපාදීහුද, දෙවදත්තාදි ශ්‍රමණදුශ්ශීලයෝද, කකුසද බුදුන්කල දිඝී විදග්ධ්‍රාතෘද; දිලිසෙන ගිණිඅඟුරුමෙන් තමන්ගේ දුග්‍රාහයෙන් තමන්ද; තමන්ගේ වචනකරණ අවවාදය ලෙස පිළිපදින දායකාදීහුද; විනාශකරත්"යයි දැක්වූ හෙයින්ද, ශ්‍රමණදුශ්ශීලයන්ගේ අවවාදලෙස පිළිපදිමින් ඔවුන්ට උපස්ථානකරණ දායකවරු නිරයභාගීවන බැව් පෙණේ. එහිම, දිඝීවිදග්ධ්‍රාතෘතෙම තමන් උපස්ථායක කුලපත්සියයන් කැටුව මහ නරකයෙහි පැසෙනබැව් කියා තිබෙන හෙයින් එය ස්ඵුටයි.

(11) "අජාතශත්‍රුරජ දෙව්දත්තෙරහට උපස්ථානකළේ පින්සලකා නොවේය, පින්සලකා කාට උපස්ථානකළත් කාගෙන් බණ ඇසුවත් වැරදි නැතැයි" සමහරු කියති. නමුත්, චූලවග්ගයෙහි "**අථ ඛො අජාතසත්තු කුමාරො දෙවදත්තස්ස** ඉමිනා ඉද්ධිපාටිහාරියෙන අභිප්පසන්නො පඤ්චහි රථසතෙහි සාතනාජි භාරෙ අභිහරීයන්ති"යි යනුවෙන් "ඉක්බිත්තෙන් අජාතශත්‍රු රජතෙම දෙවදත්තයාගේ මේ සෘද්ධි ප්‍රාතිහාර්යයෙන් මනා

---

* මෙම ගාථාඅටුවා දෙක්හි විස්තර දුශ්ශීල සඞ්ග්‍රහභෙදයේ 17 පිට 29 පෙල පටන් 18 පිට 33 පෙල දක්වා බලනු.

කොට ප්‍රසන්නාවූයේ, රථ පන්සියයකින් භත්තාභිහාරය පමුණුවනු ලැබෙයි" ප්‍රකාශවනිබේ. තවද, ධම්මපදට්ඨකථායෙහි "රාජා මහාජනස්ස කථං සුත්වා පඤ්චථාලි පාකසතානි නීහරාපෙත්වා න පුන තස්සු'පට්ඨානං අගමාසි" නාගරාපිස්සකුලං උපගතස්ස භික්ඛා මත්තම්පි නාදංසු" යනුවෙන් අජාතශත්‍රුරජ "දෙව්දත් තෙම පාපයෙකැ"යි යන මහජනයාගේ කථාව අසා බත් වසුන් පන්සියය ගෙන්වා නැවතඔහට උපස්ථානයට නොගියේය, නුවරවැස්සෝද පිඩුපිණිස ආ ඔහට පිණ්ඩපාත පමණකුදු නුදුන්නාහුය"යි ප්‍රකාශවනිබේ. මෙයින් ප්‍රථමකොට රජතෙම දෙවදත්තයාගේ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙන් "මේ ශ්‍රමණතෙම මහානුභාව සම්පන්නයෙකැයි" ඔහට මුළාවෙන් පැහැදී පින්සලකාම උපස්ථානාදිය කළබවත්, පසුව දෝෂ දුටුතැන පින්සලකාවත් කිසි උපස්ථානයක් නොකළ බවත්, නුවර වැසියෝ පින් සකලාම දෙන පිණ්ඩපාතය පමණවත් නුදුන් බවත් පැහැදිලි හෙයින් ඒ කියමන ඔවුන්ගේ ඉතා දුර්වල මතිමාත්‍රයකි.

(12) දුස්සීලයාබව දැන දැන පින්සලකා ඔහට සිව්පසයෙන් උපස්ථාන කරණ ඔහුගෙන් බණඅසන දායකවරු ඒ හෙතුවෙන් අපාගත නොවෙත්ය" යන දුශ්ශීලපක්ෂයේ කියමන මේ අතරට පැමිණි හෙයින් දැන් එය විභාගකර බලමු. දුස්සීලයන්හට උපස්ථාන කිරීමෙහි සහ ඔවුන්ගෙන් බණ ඇසීමෙහි උපදනා දාන චෙතනාව හා ශ්‍රවණ චෙතනාවද කුසල්හෙයින් "කුසලහෙතුයෙන් අපාගත නොවෙත්"ය යන දුර්මතයකින් දුශ්ශීල පක්ෂය එසේ කියායයි සිතිය යුතුවේ.

(13) යම් දායකයෙක්තෙම දන්දීම පිණිස බණ ඇසීම පිණිස ශ්‍රමණ දුශ්ශීලයන් සොයා යයිද; එයින් ඒ දුස්සීලයා කෙරෙහි යටකිලෙස අපායෝත්පත්තියට හේතුවූ පැහැදීමද 1 පිළිකුල් නොකිරීමද 2 සෙවනයද 3 භජනයද 4 පියිරුපාසනයද 5 ඔවුන්ගේ අවවාදය කැමතිවී එහිපිහිටීමෙන් දෘෂ්ටානුගතියද 6 නොපිදිය යුතුතැන පිදීමේ අවමඞ්ගල්‍යද 7 ඔවුන්ගේ ගුණකීමද 8 යන අටවැදෑරුම් මහාසාවද්‍ය අකුසලයෝ ඒ දායකයාහට සිදුවෙද්ද නැද්දැයි ආත්මාර්ථකාමීහු සිතත්වා. (14) නොවරදවා කියන්නාහු විසින් "**දුස්සනංපහං භික්ඛවෙ දොසං** ජිනකබුනං අනත්ථාවහං වදාමි" යනාදීන් "ශ්‍රමණ දුශ්ශීලයා දැකීම පටන් කොට ඇතිසියල්ලම අනර්ථ එළවාය"යි වදාළහෙයින් එසේ දුස්සීලයන් සොයා යෑම ඇතිකල්හි ඒ දුස්සීල දානය ගැණීද; ඔහුගෙන් බණ ඇසීම ගැණීද, උපන් දාන චෙතනාව හා ශ්‍රවණ චෙතනාව නිසාම, යටකී පැහැදීමාදි අෂ්ට අකුසල චෙතනාවෝ උපදනාහුයයි කිය යුතුවේ. මෙයින් ඒ උපස්ථානයෙන් සහ බණ ඇසීමෙන් උපන්

පූර්ම පූර්ම කුසල චෙතනාවෝ පසුව පසුව උපන් පැහැදීමාදි ඒ සියලු අකුසල චෙතනාවන්හට ප්‍රත්‍යයවන බව පැහැදිලිව පෙණේ. අනන්තනය, සමන්ත **මහාපට්ඨාන** ප්‍රකරණයේ **පණ්ණ** ත්තිවාරයෙහි "**පුරිමා පුරිමා කුසලාධම්මා** පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයොයි" වදාළ දෙශනා පාලියෙත් "පළමු පළමු උපදනාවූ කුසල චෙතනාවෝ පසුව පසුව උපදනා අකුසල චෙතනාවන්හට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවෙත්ය"යි වදාළහෙයින් එය සුදුටයි. යම්හෙයකින් මෙසේඅකුසලයට හෙතුවන කුසලක් ඇත්තේද, එමෙන් කුසලයට හෙතුවන අකුසලයක්ද ඇත්තේය. එබඳු කුසලා කුසල මිශ්‍රකර්මයෝ බොධයනවිසින් කටයුතුයයි වාදීන්ද්‍ර මුනීන්ද්‍රතෙමේ නොවදාළසේක. "**නාඤ්ඤොපසංසන්ති සපින්නපස්සෙද**" යනාදින් එබඳු කර්මයන් නොකටයුතු බවට උපදෙස්දී වදාළසේක.

(16) තවද, "**චත්තාරි මානි භික්ඛවෙ** කම්මානි කතමානි චත්තාරි කණ්හං කණ්හවිපාකං, සුක්කං සුක්කවිපාකං, කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං, නෙවකණ්හසුක්කං නකණ්හසුක්කවිපාකං" යනාදී දෙශනාවෙන් අකුසල විපාකවූ අකුසලකර්මයක්ද, කුසල විපාකවූ කුසල කර්මයක්ද; කුසලාකුසල විපාකවූ කුසලාකුසල මිශ්‍ර කර්මයක්ද, කුසලාකුසල විපාකනොවූ කුසලාකුසල නොවන කර්මයක්ද ඇති බැව් වදාළ බැවින් ශ්‍රමණ දුශ්ශීලයන්හට පින් සලකා කරණ උපස්ථානය හා ඔවුන්ගෙන් ධර්මය ඇසීමට යාම යටකිලෙස අකුසලයට හෙතුහෙයින් සෙවනාදී අකුසලයන් සහිත හෙයින් සාවද්‍යවූ කණ්හසුක්ක මිශ්‍ර කර්මයවේ.

(17) "**චතූහි භික්ඛවෙ—පෙ—එවං නිරයෙ**, කතමෙහි චතූහි සාවජ්ජෙන කායකම්මෙන සාවජ්ජෙන වචීකම්මෙන සාවජ්ජෙන මනොකම්මෙන සාවජ්ජාය දිට්ඨියා" යනාදින් වදාළ දෙශනාවෙන් "වරද සහිත කායවාග් මනස් කර්මයෙන් හා, වැරදි සහිත දෘෂ්ටියෙන් අපාය භාගීවන බව ප්‍රකාශවේ. පින්සලකා දුශ්ශීල උපස්ථානකිරීමෙහිද මේ සතර කාරණයම ලැබෙනබැව් ය ථොක්තක්‍රමයෙන් පෙණෙනහෙයින් එසේකරණ උපස්ථානාදිය අපායෝත්පත්තිවීමට හෙතුබැව් දතයුතු. දුශ්ශීල පක්ෂයගේ යටකී ඒ වාදය වැරදිබැව් මෙසේ සහ ධාර්මිකව ඔප්පුදී දින් දුශශීල පක්ෂයට අපවාද දක්වනු ලැබෙත්.

(18) පින් සලකා කරණ දුශශීල උපස්ථානයෙහි හා ඔවුන්ගෙන් බණ ඇසීමෙහි ලැබෙන්නාවූ දාන චෙතනාව හා ශ්‍රවණ චෙතනාව "කුසල්හෙයින් එය කිරීමෙන් පිනක්මමිස පාපයක් නොලැබේය"යි කියන්නාවූ දුශශීලපක්ෂයවිසින් දන්දෙන අදහස්න්ම සතුන්මරා පින්සලකා මස් දන්දීමෙහිද; දන්දෙන අදහසින්සොර

කම්කිරීමෙන්ද, බොරුකිරීමෙන්ද, රහමෙර වෙළඳාම්කිරීමෙන්ද, වස්තුව සපයා පින් සලකා දන්දීමෙහිද; උපදනා කුසල දාන චෙතනාවෙන් ටිකක් ආනිසංස ඇතිහෙයින් "ඊශ කටපුණ්‍යය"යි කියයුතුවේ. (19) තවද, ඔක්කාක රජකාලයේ බ්‍රාහ්මණයන්විසින් උපදවනලද සාවද්‍යවූ අශ්වමෙධ පුරිසමෙධාදී යාගයන් හා සබ්බසතක සබ්බසහස්සාදි දානයන් දීමෙහිත් උපදනා දානචෙතනායෙන්ද මදක් කුසල්ඇති හෙයින් එබඳු දානයන්දීමද බෞද්ධයන්විසින් කටපුණ්‍යයයි කියයුතුවේ. (20) **"සෙය්‍යො අයොගුලො** භුත්තො, තත්තො අග්ගිසිඛූපමො, යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො, රට්ඨපිණ්ඩං අසඤ්ඤතොති" වදාළලෙස ශ්‍රමණ දුශ්ශීලයන්හට පරිභොගකිරීමෙන් පරලොව අපායදුක්ඛගෙණ දෙන්නාවූ සිල්වතුන්ට අයිතිවූ සිවුපසය පින් සලකා ඔවුන්ට දෙන දායකයාහට පිනක්මම්ස පාපයක් නොලැබේනම් ශ්‍රද්ධා චෙතනාවෙන් පින් සලකා රාසොණ්ඩයෙකුට ලෝකයෙහි කුසලයයි සම්මතවූ * මජ්ජ දානය දීමෙන් පින්සිදුවේයයි කියයුතුවේ.

(21) යටකීලේස සත්වඝාතනාදියකොට පින්සලකා දන්දෙන දායකවරු ඒහෙතුයෙන් යම්සේ අපායගාමීවෙද්ද; එමෙන් පින් සලකා ශ්‍රමණ දුශ්ශීල උපස්ථානය කරණදායකවරු ඒහෙතුවෙන් අපායභාගී වෙත්. (22) පූර්වකාලයෙහි ගෙරිමස් කෑමෙහි ලොල් වූ බ්‍රාහ්මණයන් විසින් **"මහාරාජ ගොමෙධයඤ්ඤං යජස්සු** එවං තෙ බ්‍රහ්මලොකස්ස මග්ගො විසුද්ධො භවිස්සතීති" යනුවෙන්හා **"එවංහි තෙ ජනො සත්තකුල පරිවට්ටා** සග්ගෙ උප්පජ්ජිස්සන්තීති" යනුවෙන්ද, "මහරජ ගවයන්මරා යාගපූජාකර; එසේ ඇති කල්හි තට බ්‍රහ්මලොක මාර්ගය සුද්ධවන්නේය; එසේ යාගපූජා කරන්නහුගේ සත්කුල පරම්පරාව දක්වා ස්වර්ගයෙහි උපදීත්යයි" කියනලද වචනය පිළිගත් ඔක්කාක මහරජතෙම "බ්‍රහ්මලොක සැපලබනපිණිස සියදහස්ගනන් ගවයන් මරා පින්සලකා ඔවුන්ට දන්දී යම්සේ අපාය ගාමීවූයේද; එමෙන් සිවුපසය ලැබීමෙහි ලොල්වූ දුශ්ශීල පක්ෂයවිසින් කියනලෙස පින්සලකා දුශ්ශීල උපස්ථානය කරණ දායකවරු අපාය භාගීවෙත් මය. (23) රාකොස් සත්හට පින්සලකා මජ්ජදානය දීමෙන් දායකප්‍රතිග්‍රාහකයෝ යම්සේ අපාය භාගීවෙත්ද; එමෙන් ශ්‍රමණ දුශ්ශීලයාහට අනු

---

* "පඤ්චදානානි අපුඤ්ඤානි පුඤ්ඤ සම්මතානි ලොකස්මිං, මජ්ජදානං සමජ්ජදානං ඉත්ථිදානං උසභදානං චිත්තකම්මදානන්ති පරිවාරෙවුත්තං"යි කීහෙයින්ද; ආයුෂ්මතුන්ට සුරාව දුර්ලභයයි හඟිමින් සාගතස්ථවිරයන් වහන්සේට පින් සලකා කාපෝතිකා නම් සුරාව දන්දුන්හෙයින්ද එය කුසල සම්මතබැව් පැහැදිලිය.

දැන නොවදාළාවූද, පරිභොග කිරීමෙන් ඔහට අපායදුක් ගෙණ දෙන්නාවූද, සිව්පසයෙන් පින්සලකා සංග්‍රහකරණ එය ලබණ දායක ප්‍රතිග්‍රාහකයෝ අපාය භාගීවන බැව් දතයුතු.

(24) දෘෂ්ටානු ගතියට නොබැඳී සෙවනාදිය කරමින් දුශ්ශීල උපස්ථානය කිරීමෙන් කිසිපාපයක් නැතැයිද දුශශීල පක්ෂය කියති. පින්සලකා දුස්සීල සේවනාදිය කටයුතුයයි සර්වඥයන් වහන්සේ විසින් නොවදාරණලදහෙයින් එයද ඔවුන්ගේ දුර්ලද්ධිමාත්‍රයකි. දුස්සීල අලජ්ජීන්ගේ සේවන භජනාදියෙන් දෘෂ්ටානුගතියට පැමිණෙනබවම මෙසේ වදාළසේක. තිකඞ්ගුත්තර සමණවග්ගයෙහි. "**නඑවරූපස්සාහං කස්සප**! ථෙරස්ස භික්ඛුනො වණ්ණං භනාමි තංකිස්සහෙතු සත්ථා තස්සවණ්ණං භණතීති අඤ්ඤෙ නං භික්ඛූ භජෙය්‍යුං යෙනං භජෙය්‍යුං ත්‍යස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං යස්සදිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං තෙසං තං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛාය, තස්මාහං කස්සප! එවරූපස්ස ථෙරස්ස භික්ඛුනො නවණ්ණංභනාමි." යනුවෙන්" එම්බා කාශ්‍යපය! මෙබඳුවූ (ශික්ෂාවත් නොකැමැතිවන අනුත් ශික්ෂාවෙහි නොපිහිටුවන ශික්ෂා පූරණයකරන්නාවූන්ගේ ගුණනොකියන) ස්ථවිර භික්ෂූගේ ගුණ මමනොකියම්,කවර හෙතුවකින්ද? ශාස්තෘතෙම වනාහි ඒ අලජ්ජියාගේ ගුණකියායයි අනික් භික්ෂූහුද ඒ අලජ්ජි භික්ෂුව සෙවන භජන කරන්නාහුය; යම්කෙනෙක්. ඒ අලජ්ජි භික්ෂූහු සෙවන භජන කරද්ද; ඔව්හු ඒඅලජ්ජියාගේ දෘෂ්ටානු ගතියටපැමිනෙත්නෝය. යම්කෙනෙක් ඒ අලජ්ජියාගේ දෘෂ්ටානු ගතියට පැමිනෙද්ද; ඔවුන්ට එය බොහෝ දීර්ඝකාලයක් මුළුල්ලෙහි අහිතපිණිස සතර අපාය දුක්පිණිස වන්නේය; එම්බා කාශ්‍යපය! එහෙයින් මම මෙබඳු අලජ්ජියාගේ ගුණ නොකියම් වදාළසේක.

(25)මෙසේ දුශ්ශීලයන්වෙත පැමිණීමෙහි දොෂයන් දැනවදාළාවූ තථාගතතෙමේ සීහසෙනාපති උපාලි ගෘහපති ආදීන්හට "සිගා ගෙදොරටපැමිණි දුස්සීලයන්ට හිඟමන්දියයුතුය"යි වදාළේය. එසේම ධම්මසංවණ්ණනාචාර්ය්‍ය බුද්ධ මතඥවූ අර්ථ කථාචාර්ය්‍යයෝ "**දානං නාම නකස්සචි නිවාරිතං**" යනාදීන් සාමාන්‍යයෙන් දන්දීම කිසිවෙකුට තහනම් නොකළ හෙයින්ද (දන්දීමට දුස්සීලයන් සොයායාම තහනම් කළහෙයින්ද)යාචක වශයෙන් පැමිණි දුස්සීලයාහට හිඟමන් දියයුතුයයි නියමකරමින් මේ දුස්සීලවාදයෙහි තිබූව **සාරත්ථප්පකාසිනී** සංයුත්තනිකාය අර්ථකථායෙහි ලියා තැබූබව අන්මාර්ථ කාමිසකල බෞද්ධයන් විසින් සිත තබාගත යුතුයි. මෙසේ දුස්සීලාදීනවයෝ තුමූහයවිය යුතුහ.

(26) භික්ෂුසීලය මනාව රක්ෂාකරන්නාවූ සිල්වත් භික්ෂූහු වනාහි තමන්ට සහ දෙවියන්සහිත ලෝකයාහට දෘහිතවැඩපිණිස ප්‍රති

පත්නාවූ උත්තමයෝ වෙති. සබ්‍රම්සරුන්ට හා ශිෂ්‍ය උපස්ථායකාදීන් හට වැඩකැමති භික්ෂූන් විසින් "සීලයෙහිම සමාත්තකාරී වියයුතු" බැව් වදාළසේක. සියලු ආකාංඛෙය්‍ය සූත්‍රය මෙහිවිස්තර වශයෙන් දතයුතු. තදට්ඨකථායෙහිවූ:- තතං ගෙනා භගවතා "යෙ තෙ භික්ඛවෙ භික්ඛූ සීල සම්පන්නා සමාධි-පඤ්ඤා-විමුත්ති-විමුත්ති ඤාණ දස්සන සම්පන්නා' දස්සනං පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහුකාරං වදාමි. සවනං-අනුස්සතිං-අනුපබ්බජ්ජං—උපසංකමණං—පයිරු පාසනං පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහුකාරං වදාමි" යි යනුවෙන් "සිල්වතුන්ගේ දැකීමද, වචන ඇසීමද, ගුණානුස්මරණයද, අනුව පැවිදිවීමද. සමීපයට එළඹීමද, උත්වහන්සේලාගේ ක්‍රියාවලට ඇලුම් කිරීමද, (ස්වර්ගමෝක්ෂ සම්පත්තිය පිණිස පවත්නා හෙයින්) බොහෝ උපකාරයයි වදාළසේක. පුග්ගල ප්‍රකරණ ටීකාවර්ණනාහි "**තෙසන්නං හොතීති** තෙසං සම්මා සම්බුද්ධා දයො සෙවන්තානංවිය තං සෙවනං දීඝරත්තං හිතාය සුඛාය හොති" යනුවෙන් සිල්වතුන් සේවනය කරන්නාවූ උපස්ථායක ඤාතිමිත්‍රාදීන් හට සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ අගසව්වන් වහන්සේලාද' අසීති මහා ශ්‍රාවකාදීන්ද' සෙවනය කළාවූ දායකාදීන්ටමෙන් ඒ සිල්වතුන්ගේ සෙවනය බොහෝකලක් මුළුල්ලෙහි හිතසැප පිණිස පවතියයි වදාළසේක.— මෙසේ සිල්වතුන්ගේ අනුසස් සතුටුවියයුතුහ.— මෙතෙකින් ආධුනික බුද්ධජනයාගේ ප්‍රමෝදය පිණිස කරණලද භික්ෂුශීලයෙහි **දුස්සීලාදීනව නිද්දේස** නම්වූ නවවෙනි පරිච්ඡෙදය නිමවනලදී.

**යොහි ඉමං දුස්සීලා'දීනව නිද්දෙසං සාධුකං පස්සති'සො**
**දුස්සීලු'පස්සය භය දස්සී ගුණාදිං'ව ජිගුච්ඡති'සීලෙ.**

(ආ-5) භික්ඛුසීලස්ස පබ්බජ්ජා සීල'මාදි භවෙ යථා
තථා ඉදානි සම්පන්න ඔකාසත්තා'නු'දීරිතං.

(ආ-6) සද්ධම්මසඞ්ඝං සම්බුද්ධං වන්දිත්වාන ඉතොපරං,
සමන්තුද්දෙස සීලං'තං පවක්ඛිස්සං සහාසයා.

(මා-3) පබ්බජ්ජා කාච කො තස්සා දායකො කොච ගාහකො
දානා'කාරොච කො තිස්සා තස්සීලඤ්ච කථං ඉති
ඉදං පඤ්චවිධං පඤ්හං ඤාතබ්බං ඉධ විඤ්ඤුනා.

භාවය: මෙම **සාමණේර සීලනිද්දෙසයෙහි**. ප්‍රව්‍රජ්‍යාතොම කව

රිද? එයදෙනතැනැත්තහු කවරේද? එයගන්නහු කවරේද? ඒ ප්‍රව්‍රජ්‍යාවදෙන ආකාරය කවරේද? ඒ ප්‍රව්‍රජ්‍යාවසම්බන්ධ සීලය කාවරේද? යන මේ පඤ්චප්‍රකාර ප්‍රශ්නය ප්‍රාඥයන් විසින් දතයුත්තේය. සාමණේර ශීලයෙහි වනාහි කෞශල්‍යය පිණිස, ඒ කියනලද ප්‍රශ්න පඤ්චකයාගේ ප්‍රපඤ්චය (විස්තරය) මෙසේ එලවනු ලැබේ.

(1) එහි ප්‍රව්‍රජ්‍යාතොම කවරීද?:—“**අනුජානාමි භික්ඛවෙ තීහිසරණාගමනෙහි සාමණෙර පබ්බජ්ජං**” යනුවෙන් ‘‘මහණෙනි ත්‍රිවිධ සරණාගමණයෙන් සාමණේරප්‍රව්‍රජ්‍යාව අනුදනිමි’’ වදාළ හෙයින් ඒ සරණාගමණ සමාදානයෙහි උපදනා කාමාවචර කුසලචිත්ත සම්ප්‍රයුක්ත ශ්‍රද්ධාචේතනාතොමෝ ප්‍රව්‍රජ්‍යා නම්වේ. එහෙයින් ‘‘**පබ්බජ්ජාහි සරණාගමනෙනෙව සිද්ධා**’’ යනාදියෙන් ‘‘ප්‍රව්‍රජ්‍යාතොම වනාහි සරණාගමණයෙන්ම හෙවත් විධිපරිද්දෙන් සරණය සමාදන්වීමෙන්ම සිද්ධය’’ යිද; (මතු කියනු ලබන) ශික්ෂාපදයෝ වනාහි දැහිවශයෙන් ශික්ෂාපූරණය පිණිස දතයුත්තාහුයයිද; පෙලෙහි ආපරිද්දෙන් ඉගෙණීමට නොහැකිවූවාහට යම්කිසි භාෂාවකින් අර්ථවශයෙන්ද කියාලන්ට වටිත්’’ යයිද් දක්වනලදී.

(2) එය දෙන තැනැත්තහු කවරේද?:—‘‘**අනුජානාමි භික්ඛවෙ ව්‍යත්තෙන භික්ඛුනා** පටිබලෙන දසවස්සෙනවා අතිරෙක දසවස්සෙනවා උපසම්පාදෙතුං නිස්සයංදාතුං’’ යනුවෙන් පරිසූපට්ඨාපක ප්‍රතිබල ස්ථවිරභික්ෂුහටම උපාධ්‍යායග්‍රහණයදී උපසම්පදාකරවන්ට සහ නිසදෙන්ටත් අවසරදී වදාළහෙයින්හා, ප්‍රව්‍රජ්‍යාවද ඒ උපාධ්‍යාය ග්‍රහණයහා නිශ්‍රයග්‍රහණය පිළිබඳ හෙයිනුත් ස්ථවිරභික්ෂුතෙමේම ප්‍රව්‍රජ්‍යාව දෙන්නේවේ. ඉදින් ස්ථවිරතෙම වනාහි උද්දෙස පරිපුච්ඡායෙහි ව්‍යාවෘතවූයේ අවකාශනොලබත්නේ, නවකභික්ෂුවක්හට ‘‘ඇවැත්නි මොහු පැවිදිකරව’’යි නියමකරයිද; ස්ථවිරයන්ගේ අණුවලත් නවකභික්ෂුතෙමේද, ප්‍රව්‍රජ්‍යාව දෙන්නේවේ; ස්ථවිරයන් විසින් නොකියනලද්දාවූද ලදරුභික්ෂුතෙම තමන් උපාධ්‍යායයන් උදෙසා පැවිදි කරයිද, වටී. ඉදින් ලදරුභික්ෂුවක් නැත්නම්ද ‘‘මොහු ඛණ්ඩසීමාවට ගෙණගොස් පැවිදිකරවයි හෙවත් හිසරැවුල් හරවා සිවුරු දෙව’’යි සාමණේර තෙමේද කියයුතුවේ. සරණදානය වනාහි ආචාර්යයන් විසින්ම කටයුතුයි, එසේ ඇතිකල්හි භික්ෂුව විසින්ම පැවිදිකරණලද්දේවේ. මෙසේ වනාහි සරණදානය භික්ෂුවක් විසින්ම කටයුතුය; සිවුරුදීම භික්ෂුවක් විසින් හෝ අණලද සාමණේරකෙණෙකුන් විසින් හෝ කටයුතුය; කර කම්මය නොහොත් හිසරැවුල් හැරවීම යම්කිසිවෙකු විසින් කටයුතුය.

(3) එහි ප්‍රව්‍රජ්‍යාව ලබන්නහු කවරේද?:—‘‘**න භික්ඛවේ පඤ්චහි ආබාධෙහි ඵුට්ඨො පබ්බාජෙතබ්බො**’’ යනාදින් ‘‘පැවිදි

නොකටයුතුය''යි වදාළ කුටිකාදි * තෙපණස් පුත්ගලයන් හැර ඒ ප්‍රව්‍රජ්‍යාදොෂ රහිතවූ මව්පියන් විසින් අනුදන්නාලද යම්කිසි කුලපුත්‍රයෙක්වේ. හෙතෙම අනත්ම පරිච්ඡේදයෙන් "**අනුජානාමි භික්ඛවෙ ඌනපණ්ණරසවස්සං** දාරකං කාකුඩ්ඩෙපකං පබ්බාජෙතුං'' යනු වදාළ හෙයින් ආහරපාත්‍රයෙහි කවුඩන් එලවන්ට ශක්ති ඇතිඋනු පසළොස්ඇවිරිදි වයස් ඇති ළදරු පවා පැවිදි කටයුතුයයි දතයුතු. "**පණ්ඩකො භික්ඛවෙ අනුපසම්පන්නො** න උපසම්පාදෙතබ්බො උපසම්පන්නො නාසෙතබ්බො''යි යනාදීන් මෙනි ප්‍රථම පරිච්ඡේදයෙහි කියනලද පණ්ඩකාදි එකොළොස්දෙන උපසම්පදා නොකට යුතුයයිද; පෙරඋපසම්පදාවූවන්හු දැනගත්කල්හි ලිඞ්ගනාසනායෙන් නැසිය යුතුයයිද; ඌනවීසතිවස්ස, අන්තිමවත්ථුඅජ්ඣාපන්න, (පාරාජිකාවූවන්හු) යන දෙදෙන උපසම්පදා නොකට යුතුයයිද; "පැවිදි නොකළ යුතු යයි'' වදාළ කුටිකාදි දෙසාළිස්දෙනෙක් උපසම්පදා කරුනම් මනාකොට ඇතුළත්වනු ලබනහෙයින් සුවෝසාරිතයයිද; ඒ පණ්ඩකාදි එකළොස්දෙන දුවෝසාරිතයයිද; වදාළේය. එහෙයින් "**සචෙසඞ්ඝො උපසම්පාදෙති** සූපසම්පන්නො'' යනුවෙන් "ඉදින් සඞ්ඝතෙම ඒ සුවොසාරිතයා උපසම්පදා කරවාද, ඇගපත් උපසම්පදා ශීලය ඇත්තෙක්වෙයි'' දක්වනලදී. †

---

* මෙහි ආදිශබ්දයෙන් ගණ්ඩික, කිලාසික, සොසික, අපමාරික, රාජභටක, කාරභෙදක, ලිඛිතක, කසාහතක, ලක්ඛණාහතක, ඉණායික, දාස, අනනුඤ්ඤාතක, යටකීපණ්ඩකාදි එකළොස් අභව්‍යපුත්ගලයෝ. හත්ථච්ඡින්නක, පාදච්ඡින්නක, හත්ථපාදච්ඡින්නක, කණ්ණච්ඡින්නක, නාසච්ඡින්නක, කණ්ණනාසච්ඡින්නක, අඞ්ගුලිච්ඡින්නක, අළච්ඡින්නක, කණ්ඩරච්ඡින්නක, ඵණහත්ථක, ඛුජ්ජක, වාමනක, ගලගණ්ඩික, සීපදික, පාපරොගික, (89) අසූනවදෙකෙනෙක් පමණවූ පරිසදූසක, කාණ, කුණී, ඛජක, පක්ඛහතක, ඡින්නිරියාපථක, ජරාදුබ්බල, අන්ධ, මූග, බධිර, අන්ධමූග, අන්ධබධිර, මූගබධිර, අන්ධමූගබධිර, යන දෙපනස ගත්නාලදහු.

† පැවිදි නොකටයුතු පුත්ගලතෙම කෙසේ උපසම්පදා කළයුතුද?:– නොදැනීමෙන්හෝ, අනුක්‍ෂුද්‍රඇවතට පැමිණීමෙන් ක්‍ෂුද්‍රඇවතට නොපැමිණීම ගරුකාරණ ශාසනපාලක විනයධරයන් විසින් මහත් අර්ථය දැකීමෙන්ද ඒ සුවෝසාරිතයෝ පැවිදි උපසම්පදාකරවනුලබති. එහෙයින් මහාවිහාර පරම්පරායාත භික්‍ෂූන් අතර ලඞ්කාරාම කසු දෙරටෙහි, හිර සඳමෙන් ප්‍රකටව ගුළුකතීකෙනෙක්ව විසූ පය මාපටඇඟිල්ලනැති ජජ්ජපටනම් මහාස්ථවිරකෙනෙක් සිටියබව ශාසනවංශාදි පොත්වල පෙණේ.

(4) එහි ප්‍රව්‍රජ්‍යාව දෙන ආකාරය කවරේද?:—"**එකොපි කුලපුත්තො සාසනෙ** පබ්බජිත්වා සකලං සාසනං සොභෙස්සති" යනුවෙන් "එකම කුලපුත්‍රයෙකුදු ශාසනයෙහි පැවිදිව (චතුර්වර්ගී සංඝයාලැබ ගණයාවඩා)සියලු සර්වඥශාසනය අහස්ගත පූර්ණචන්ද්‍රයාමෙන් බබලවන්නේය"යි කීහෙයින්ද; "**සොධෙත්වා පබ්බාජෙතබ්බො සොධෙත්වා උපසම්පාදෙතබ්බො**" යනුවෙනි "ශුද්ධකොට පැවිදිකළයුතුය ශුද්ධකොට උපසම්පදා කළයුතුය"යි වදාළහෙයින් ප්‍රව්‍රජ්‍යාදෝෂ විරහිත අත්‍යුත්කෘෂ්ටක කුලදරුවෙකු ලැබ ප්‍රථමකොට "**අනුජානාමි භික්ඛවෙ සඞ්ඝං** අපලොකෙතුං භණ්ඩුකම්මාය" යනුවෙන් "හිසමුඩුකිරීමට එහි සීමට්ඨක සඞ්ඝයාවිචාරන්ට අවසරදෙම්"යි වදාළ හෙයින් පැවිදිකරවන භික්ෂූහුවිසින් එම පණ්ඩුපලාසයා කැටිව සීමායෙහිඋන් භික්ෂූන්වෙතපැමිණ උත්කුටුකාසනයෙන්හිඳ ඇඳිලිබැඳගෙණ "**සඞ්ඝං භන්තෙ ඉමස්ස දාරකස්ස** භණ්ඩුකම්මං ආපුච්ඡාමි"යි තුන්යලක් විචාරා ඉක්බිති හිසරැවුල්හරවා හිහිගඳ හරවනපිණිස කසාගඳ චූර්ණාදි යම්කිසිවකින් "හිසද ශරීරයද උලාසෝදා ස්නානකොට එවයි" උදකතීර්ථයට යැවිය යුතුයි. ඉක්බිති උදකතීර්ථයට ගොස් ස්නානකොට ආවාවූ ඒ පණ්ඩුපලාසයා ලවා "**සබ්බදුක්ඛ නිස්සරණ නිබ්බාණ** සච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජෙථමං භන්තෙ අනුකම්පං උපාදාය"යනුවෙන් "ස්වාමීන්වහන්ස! සියලු දුකට පිහිට නැත්තාවූ නොහොත් සියලු දුකින් නික්ම ගියාවූ නිර්වාණය සිද්ධකරගැණීම පිණිස මේ කසාවස්ත්‍රය ගෙණ අනුකම්පා පිණිස මාපැවිදිකළ මැනවී"කියාද, නැවත "සබ්බදුක්ඛ-පෙ-එතංකාසාවං දත්වා පබ්බාජෙථමංභන්තෙ අනුකම්පං උපාදාය"යනුවෙන්-පේ-"ඔයකසාය වස්ත්‍රයදී අනුකම්පා පිණිස මාපැවිදිකළ මැනවි"කියාද, කරණයාඥුව පූර්වකොට ඇති චීවරප්‍රතිග්‍රහණයහා චීවරදානය තෙවරක් හෝ දෙවරක් හෝ වරක් හෝ කරවා පසුව ඔහු අත සිවුරුදී තමා විසින් සිවුරු හැඳවිය යුතුයි.

සිවුරු හැඳපෙරවූ ඉක්බිති රැස්වසිටි භික්ෂූන්ගේ පාවත් දවා සරණදීමපිණිස උත්කුටුකායෙන්හිඳුවා ඇඳිලිබැඳවා "**සමහං වඳාමි නං වඳෙහි**" කිය යුතුයි. ඔහුවිසින් "**ආමභන්තෙ**"යි කී ඉක්බිති "**බුද්ධංසරණංගච්ඡාමි**" යනාදි සරණාගමන පාඨය සිථිල ධනිතාදි * දසවිධව්‍යඤ්ජනසම්පත්තියහා ස්ථානකරණ සම්පත්තිය

* දීඝ, රස්ස, ගරුක, ලහුක, නිග්ගහීත, සම්බන්ධ, වවත්ථිත, විමුත්ත, යන ව්‍යඤ්ජන අට ආදි ශබ්දයෙන් ගන්නාලදහ. එහිස්ථාන කරණාදිය ලිහිල්කොට කියයුතු, ක, ග, යනාදිය සිථිලනම්වේ. ඒස්ථානාදියම බරකොටකියයුතු ඛ, ඝ, යනාදිය ධනිතනම්වේ.

* නොපිරිහෙළා "බුද්ධංසරණංගච්ඡාමි" යනාදින් ඒකසම්බන්ධ කොට අනුනාසිකාන්තකොටහෝ "බුද්ධම්-සරණම්-ගච්ඡාමි"යි විච්ඡේදකොට මකාරාන්තකොට හෝ ආචාර්යයන් විසින් කියා ඉක්බිති අන්තේවාසිකයාලවාද එසේම කියවිය යුතුයි. මෙසේ උභතො සුද්ධියෙන් ත්‍රිසරණ සමාදන් වීමෙන් † ඒ පණ්ඩුපලාස තෙමේ සාමණේර භූමියෙහි පිහිටියේවේ. **"සික්ඛාපදානිපන සරණාගමනෙනෙව ඉජ්ඣන්ති"** යනුවෙන් (මතුකියනුලබන) ශික්ෂාපදයෝ වනාහි සරණාගමණයෙන්ම සමෘද්ධවෙත්ය"යි දක්වනලදී. මෙසේ උක්තප්‍රකාරයෙන් හිසරැවුල්හැරවීම, සිවුරුදීම, සරණසමාදම්කරවීම,යන තුන්ආකාරය කරත්තේ පැවිදි කරත්තේ නම්වේ. මෙයින් එකක් කිරීමෙහිද පැවිදි කිරීම යනු ව්‍යවහාරවනු ලැබේ. තවද, මෙහි දැඟුල්කට අඩුවූ හිසකේ ඇති නවමුණ්ඩකාදින්ගේ හිසකේ කැපීම් කෘත්‍යයක් නැත්තේය. එහෙයින් එබඳුවූ වනු භණ්ඩුකර්මයපිණිස අපලෝකණනොකොටද පැවිදිකළයුතුයි. භණ්ඩුකර්මයකොටද සම්පූර්ණ පා සිවුරු ඇත්තහුම පැවිදිකළයුතු. ඉදින් නැතිනම් ඉල්වාගත්තාවූහෝ විසවා

---

දීර්ඝකාලයෙන් කියයුතු "ආ"යනාදිය දීර්ඝනම්වේ. එයින් අර්ධකාලයෙන් කියයුතු "අ" යනාදිය හ්‍රස්වනම්වේ. දීර්ඝහා සංයොග පරකොටඇති අක්ෂරයෝ ගරුකනම්වෙත්. හ්‍රස්වයහා සංයොග පරකොටනැති අක්ෂරයෝ ලඝුකනම්වෙත්. යමක් අක්ෂරොත්පත්තියට උපකාරවන කරණය පෙළා අවිවෘතමුඛයෙන් අනුනාසිකකොට කියනුලැබේද; එය නිග්ගහීත නම්වේ. යමක් පරපදයහා සම්බන්ධකොට කියනුලැබේද, එය සම්බන්ධනම්වේ. යමක් පරපදයහා සම්බන්ධනොකොට (සන්ධිනැතිකොට) කියනුලැබේද, එය වවත්ථිතනම්වේ. යමක්කරණස්ථානය *නොපෙළා විවෘතමුඛයෙන් අනුනාසිකනොකොට කියනු ලැබේද එයවිමුත්ත නම්වේ. එහෙයින් කිහ. පරිවාරපාළි අට්ඨකථායෙහි:—**සිථිල ධනිතඤ්ච දීඝරස්සං**,ගරුකලහුකඤ්ච නිග්ගහීතං, සම්බන්ධං වවත්ථිතං විමුත්තං, දසධාබ්‍යඤ්ජන බුද්ධියාපභේදො. මෙයින් සිථිල ධනිත, නිග්ගහීත, විමුත්ත,යන චතුර්විධ අක්ෂරයෝ සරණාගමණ හා උපසම්පදායෙහි කර්මවාක්‍යය දූෂ්‍යකරත්.

* ස්ථාන නාම් අක්ෂරොත්පත්තිවන බොටුව, තල්ල, මූර්ධන,දත්, තොල්පට, නාසිකාව, යනසතැනයි. කරණනම් අක්ෂරොත්පත්තියට උපකාරවනතැනුයි. ජිහ්වාමැද, දිවඅගසමීප, ආදියවේ.

† මෙහි බුදුන් සරණයත්තේ අසාධාරණ ගුණයන් සරණයයි. ධර්මය සරණයත්තේ නිර්වාණය සරණයයි. සංඝයා සරණයත්තේ ශෛක්ෂ අශෛක්ෂ ධර්මයන් සරණයයි. නොඑසේනම් සරණංකරවේ.

සඟුහණයෙන් ගත්තාවූහෝ පාසිවුරෙන් යුක්තවූවහුද පැවිදි
කරන්ටවවි. පාත්‍ර චීවර සම්පාදන කරමින් පැවිදිවීමට වෙහෙ
ර සිටින ඒ පණ්ඩුපලාසයාහට අනාමට්ඨපිණ්ඩය දෙන්ටද; තලු
තැටියෙහි අනුභව කරන්ටදවවි. පෙරබතෙහි අනික් සාමණේ
රයන්හට ලැබෙන කොටස් සමාන ආහාරකොටසද, පසුබතෙ
හි තෙල් මීපැනි ආදිභෛෂජ්‍ය කොටසද; දෙන්ටවවි. පැවිදි ව
නු කැමති කුලපුත්‍රයන්ගේ ප්‍රථමකොට මහත්උත්සාහය ඇත්
තේවේ. පසුව කාෂායවස්ත්‍රයන්ද;හිසරැවුල්හරණ ශස්ත්‍රයද; දැක
බයවෙත්; එපමණකින්ද පැනයත්. එහෙයින් ආචාර්‍ය්‍යතෙමේම
නහනතොටට ඔහු කැඳවා ගෙණගොස් ඉදින් ඉතාලදරුවෙක්
නොවේනම් "ස්නානයකරවයි" කිය යුතුයි. ඔහුගේහිසවනාහි
තෙමේම මැටිආදිකල්කයගෙණ උලාසේදියයුතුයි. ලදරුකුමාර
තෙම වනාහි තෙමේම දියටබැස නොම මැටියෙන් ගටානැහැ
විය යුතුයි. ඉදින්කැසිළි පිලකාදීහුවෙද්ද; යම්සේ මැනිතොම
පුත්‍රයාහට පිළිකුල්නොකරයිද; එමෙන් පිළිකුල් නොකරන්නහු
විසින් මනාකොට අතපය හිසපටන් ගටා නැහැවියයුතුයි. කව
රහෙයකින්ද? එපමණ උපකාරයෙන් කුලපුත්‍රයෝ ආචාර්‍ය්‍ය උ
පාධ්‍යායයන් කෙරෙහිද බලවූත්සෙනහය ඇත්තාහු ගෞරවස
හිතවූවාහු සිවුරුනාරින සවභාව ඇත්තාහුවෙත්. උපන් උකට
ලිස්වභාවත් දුරලා ඝථවිරබවට (දසවස් ඇතිබවට) පැමිණෙති.
කෙලෙහිගුණ දත්නාහු ප්‍රකටකොට කෙලෙහිගුණ දත්නාහුවෙ
ති. මෙසේ ස්නාන කරවනකල්හිහෝ හිසරැවුල්හරවන කල්හි
හෝ"තෝ!ප්‍රසිඬකීර්ති පරිවාරාදිය ඇත්තෙක දූත්තොපතීසා අ
පිප්‍රත්‍යයෙන් කලානතනොවන්නෙමු"යනාදි කිසියම් අනෛයාහි
නික කථාවක්නොකට යුතුයි. වැලිදු ඕහට "ඇවත මනාකොට
කල්පනාකරව සිහිය එලඹවා තබවයි" කෙසා, ලොමා, නඛා, ද
න්තා, තචො, යනමේ සමපස්වෙතිකොටඇති කම්මට්ඨානය කි
යා දිය යුතුයි. යටකීලෙස සිවුරුදුන් ආචාර්‍ය්‍යතෙමේ "ඇවැත්නි
මේ කසායවස්ත්‍රයන්ගෙණ මෝහට අඳවවයි" අන්කිසිලදරු භි
ක්ෂුවක් හටහෝ සාමණේරාදි කෙණෙකුටහෝ අනකරයිද; ප
ණ්ඩුපලාසයා හටමහෝ "මේසිවුරු රැගෙණ හැඳගනුව"යි අඥ
කරයිද; ඒසියල්ලවවි. අවසර නුදුන්කල්හි යම්හඳනයක් හෝ
පොරවනයක් හෝ හඳිද; පෙරවයිද; එයඉවත්කරවා නැවත දී
යයුතුයි. සරණදානයෙහිද,ඉදින් ආචාර්‍ය්‍යතෙම ව්‍යඤ්ජනාදි සම්ප
ත්තිය නොපිරිහෙළා කියන්ටහැකිවේද; අතවැසිතෙම නොහැ
කිවේද; අතවැසිතෙම හැකිවේද; ආචාර්‍ය්‍යතෙම හෝ නොහැකි
වේද; දෙදෙනම හෝ නොහැකිවෙද්ද; ඒසියල්ල නොවවි. ඉ

අිත් වනාහි දෙදෙනාම හැකිවෙද්ද; එයවටී. එක අක්ෂරයකුදු පිරිහීමෙන් ප්‍රව්‍රජ්‍යාව නොපිහිටනබැවින් උපසම්පදායෙහි කර්මවාක්‍යයමෙන් ප්‍රව්‍රජ්‍යායෙහි මේසරණාගමණ ඇතුළුනු.

(5) එහි ඒ ප්‍රව්‍රජ්‍යාවසම්බන්ධශීලයකවරේද?:-"**අනුජානාමි භික්ඛවෙ සාමණේරානං දසසික්ඛාපදානි** තෙසුච සාමණේරෙහි සික්ඛිතුං, පාණාතිපාතාවේරමණී, අදින්නාදානා වේරමණී, අබ්‍රහ්මචරියා වේරමණී, මුසාවාදා වේරමණී, සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී, විකාලභොජනා වේරමණී, නච්චගීත වාදිත විසූකදස්සනා වේරමණී, මාලාගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී, උච්චාසයන මහාසයනා වේරමණී, ජාතරූපරජත පටිග්ගහනා වේරමණී"යනුවෙන් "මහණෙනි සාමණේරයන්හට මේ දසශික්ෂාපදයන්ද; සාමණේරයන් විසින් ඒ දසශික්ෂාවන්හි හික්මෙන්මද; අනුදනිමි"යිසනාදිය වදාළහෙයින් මේදසසීලය ප්‍රව්‍රජ්‍යාව සම්බන්ධශීලයවේ. නොහොත් හෙරණපැවිදි තැන්ගේ ශීලයවේ. එහි"**දසසික්ඛාපදානි**"යිද"තෙසුච සාමණේරෙහි සික්ඛිතුං"යිද වදාළහෙයින්"දසසීලය දසසික්ඛය"යි දසකදෙකක්වෙත්. "**අනුජානාමි භික්ඛවෙ දසහ'ඞ්ගෙහි සමන්නාගතං සාමණේරං නාසෙතුං**" යනුවෙන් දනාදනාසතුන් මැරීම; නුදුන්දෙය නුල්පටකුදු සොරසිතින් ගැනීම; තිරිසන්ගතස්ත්‍රීමාගමක්හාද මෛථුන ධර්ම සෙවනය; සිනාසෙන වචනයෙන්ද බොරුකීම; පිණිබිඳක් පමණද රහමෙර පානයකිරීම; බුදුන්ගේ නුගුණකීම; ධර්මයෙහි නුගුණකීම; සංඝයාගේ නුගුණකීම; මිථ්‍යාදෘෂ්ටිවීම; අපටවාවිකාඋපසම්පදාවලත් භික්ෂුණියක් දූෂ්‍යකිරීම; යනාමේ දසාඞ්ගයෙන් යුත් සාමණේරයන් නසන්ට අවසරදුන්සේක. එහි: "**දසහඞ්ගෙහි**"කියාසහ"**නාසෙතුං**"කියාත් වදාළහෙයින් දසපාරාජිකා දසනාසනායයි දසක දෙකක්වෙත්. "**අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස** සාමණේරස්ස **දණ්ඩකම්මං** කාතුං" යනුවෙන් භික්ෂූන්ට අලාභපිණිස උත්සාහකිරීම, අනර්ථපිණිස උත්සාහකිරීම, ලගිනාආවාසයෙන් නෙරපීමට උත්සාහකිරීම, ආක්‍රොශපරිභව කිරීම, භික්ෂු භික්ෂූන්කෙරෙහි බිඳවීම, යනකාරණා පසෙන්යුත් සාමණේරයන්හට ආවරණදණ්ඩකර්මය කරණ්ට අවසරදුන්සේක්. එහිද: කියනලද පඤ්චාඞ්ගයෙන්යුත් සාමණේරයන්හට වදාළ ආවරණ දණ්ඩකර්මයහා ශික්ෂාපදයන්ගේ අනතිමට වදාළ විකාල භොජනාදි පඤ්චාඞ්ගයෙන්යුත් සාමණේරයන්හට ධර්මසංග්‍රාහක මහා ස්ථවිරයන් වහන්සේලාවිසින් අපරාධානුරූප වශයෙන් වැලි, දිය, දර, දඬුවම් නියමකළ හෙයින්, දසදඬුයමක්ද ලැබෙත්. මේසේ පඤ්චදසකයන්ගේ වශයෙන් මෙම සාමණේරශීලය සමපණස් ප්‍රභෙදවේ. එහෙයින්කීහ **සාමණේර සික්ඛා**යෙහි:-

දසසීලා දසසික්ඛා දස පාරාජිකා’පිච
නාසනා දසවත්ථූච පඤ්ඤසා හොන්ති භෙදතො.

මෙහි, අඤ්ඤහෙයින් “**පාණාති පාතා වෙරමණී**”යනාදි ශික්ෂාපද දසය සමාදරයෙන් ගැණීමෙහි උපදනා කාමාවචර කුසලචිත්ත සම්ප්‍රයුක්ත විරතිචෙතනාවෝ සහ තත් සම්ප්‍රයුක්ත ඵස්සාදි ධම්මයෝ, දසශීලනම්වෙත්; ශික්ෂ්ම්යයුතු ධම්මයත් බැවින් එම්දසසීලය ම දසසික්ඛනම්වේ. නාසනාඞ්ග දසයකිරීමෙහි උපදනා චෙතනාවෝ සාමණෙරභාවයෙන් පරදවනහෙයින් පාරාජිකාවෝ නම් වෙති. එයින් ප්‍රාණඝාතකිරීමාදි ප්‍රථමඅඞ්ගපස ලිඞ්ගය (මහණවේසය) නසානැවන ශේසයගත්වන හෙයින් ලිඞ්ග **නාසනා** වෝ යයිද; බුදුන්ගේ නුගුණකීමාදි දෙවෙනි අඞ්ගපස මහණවේසය නසා එයින් බැහැරකරවන හෙයින් **සබ්බනාසනා** වෝයයිද කියතුලැබෙත්. භික්ෂූන්ට අලාභපිණිස උත්සාහ කිරීමාදි යටකීආවරනාඞ්ගපස තමන්නිතරලගිනාසෙනාසනයහා ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්හට මෙහෙවරපිණිස යාම ආවරණකරණ (වලකණ) හෙයින් **ආවරණාඞ්ග** වෙත්, නොහොත් ඒදෙතැනින් බැහැරකරවණහෙයින් සඞ්ඝරම්න් නෙරනාවත්යයිකියතුලැබෙත්. විකාලභොජනය, නැටීම, ගීකීම, බෙරගැසීම, විසුලුදැක්ම, මල්දැරීම, වාසචුණ්ණාදිගන්ධයෙන් උතුනැත් විලිම්වසයෙන් සැරසීම, ඇඟනානාසුවඳින් අලංකාරකිරීම; උච්චාසයන මහාසයනයෙහි හිඳීම; රන්රිදී, මසු, කහවනු, පිළිගැණීම; යනමේ පඤ්චාඞ්ගය වැලිඅදියගෙන්වා චෛත්‍යාඞ්ගනාදියෙහි දමවන හෙයින් වැලිදඬුවම්නම්වෙත්. නැටීමාදියෙහි විස්තර දෙවෙනි පරිච්ඡෙදයේ 23වෙනි ශික්ෂායෙහි කීනයින්දත යුතු.

(5-2) මෙහිවනාහි යම්හෙරණ පැවිදි කෙණෙක් ප්‍රාණඝාතාදි දස නාසනාඞ්ගයන් අතුරෙන් එකකුදු කරයිද; ඒ සාමණෙරතෙම ලිඞ්ගනාසනා යෙන් නැසියයුතුයි. “**සාමණෙරොහි අනන්තමසො** කුන්ථකිපිලලිකම්පි මාරෙත්වා මංකුනණ්ඩම්පි භින්දිත්වා නාසෙතබ්බතං යෙව පාපුණාති, තාවදෙවස්ස සරණගමණානිච උපජ්ඣාය ගහණඤ්ච සෙනාසනගාහොච පටිප්පස්සම්භන්ති, සඞ්ඝලාභම්පි නලහති, ලිඞ්ගමත්තමෙවඑකං අවසිට්ඨං හොති” යනුවෙත් “හෙරණතෙමවනාහි යටත්පිරිසෙයින් කුරුකුහුඹියෙකුදමරා; මකුණුබිජුවටකුදුබිඳ; ලිඞ්ගනාසනයෙන් නැසියයුතුබවටමපැමිණෙයි. එකණෙහිම ඔහුගේ සරණාගමණයෝද;(මහණකම්ද) උපාධ්‍යාය ග්‍රහණයද; (වස්කාලයෙහිනම්) වස්එලඹීමද * සංසිඳෙයි හෙවත් බිඳෙයි. ඒසාමණෙරතෙම සංඝික ලාභයද

* මෙයින් සාමණෙර තැන්විසින්ද වස්එලඹිය යුතුබවපෙණේ

නොලබයි; එකම ලිඞ්ගය (මහණ වේසය) පමණක් ඉතිරි වෙයි" දක්
වනලදී. * ඒ සාමණේරතෙම වනාහි ඉදින් ආකිණ්ණදොෂ ඇත්
තෙක්ම වෙයිද; මතු සංවරයෙහි නොපිහිටියිද, බැහැර කළයුතු
යි. යළිත් හෙතෙම "මා විසින් යුහුසුලුව වරදවා නපුරු කොට
කරණලදැ"යි නැවත සංවරයෙහි පිහිටනු කැමති වෙයිද; එහි ලි
ඞ්ගනාසන කෘත්‍යයක් නැත්තේය. හඳිනලද හඳනය පොරෙ
නය ඇති ඒ සාමණේරයන් හට ම සරණ දියයුතුයි. උපාධ්‍යායග්‍ර
හණ දිය යුතුයි. ශික්ෂාපදයෝ වනාහි සරණාගමනයෙන්ම සිද්ධ
වෙති. භික්ෂුව විසින් උපසම්පදා මාලකයෙහිදී චතුපාරිශුද්ධි ශීලය
මෙන් සාමණේරයන් විසින්ද මේ දසසීලය සරණ සමාදාන
යෙන් සමාදම් වනලදම වෙයි. එසේ ඇතිකල්හිද දළ්හීකරණ
පිණිසහා මතු සංවරයෙහි පිහිටුවනු පිණිසත් නැවත දසසීලය
දියයුත්තාහුය. ඉදින් පෙරවසෙහි නැවත සරණයෝ සමාදන්වන
ලද්දාහුද පසුවසෙහි වස්සාවාසිකය ලබයි. පසුවසෙහි සමාදම් ව
නලද්දාහුද සංඝයා විසින් අපලොකන කර්මයෙන් (ඔවුනොවුන්
ගේ කැමැත්තෙන්) ලාබය දිය යුතුයි.

(5—3) නුදුන් දෙය ගැණීමෙහි තණකොලයක් පමණවස්තු
වෙන්, අබ්‍රහ්මචර්‍යයෙහි මාර්ගත්‍රය අතුරෙන් යම්කිසි මාර්ගයක
වරදවා පිළිපැදීමෙන්, මුසාවාදයෙහි සිනාසෙන අදහස ඇති
බැවිනිසා හෝ බොරු කීමෙන්, දියබිඳක් පමණද රහමෙරපාන
යෙන්, අශ්‍රමණ වෙයි ලිඞ්ගනාසනයෙන් නෑසියයුතු බවට පැමි
ණෙයි. විකාලභෝජනාදි ඉතිරි පඤ්චශික්ෂාපදයන් අතුරෙන් ය
මක් බිඳුනු කල්හි ලිඞ්ගනාසනයෙන් නොනැසිය යුතුයි. අපරාධා
නුරූපවූ යම්කිසි දණ්ඩකර්මයකින් පෙළවා මතු සංවරය පිණිස ශි
ක්ෂාපද දියයුත්තාහුමය.

(5—4) නුගුණ කීමෙහි වනාහි, අර්හාදි නව ගුණයන්ට ප්‍රති
පක්ෂව බුදුන්ගේ හෝ, ස්වාක්ඛ්‍යාතතාදි ෂඩ්ගුණයන්ට ප්‍රතිප
ක්ෂව ධර්මයාගේ හෝ, සුප්‍රතිපන්නතාදි නවගුණයන්ට ප්‍රතිපක්ෂ
ව සඞ්ඝයාගේ හෝ, නුගුණ කියන්නේ රත්නත්‍රයට නිනද,

---

* **"උපසම්පන්නා නම්පි පාරාජිකං සමාපජ්ජිත්වා** සරණගමන
දිසාමණේර භාවස්සාපි විනාසනතො සේනාසනගාහො පටි
ප්පස්සම්භති සංඝලාභම්පි තෙන ලභන්ති වෙදිතබ්බං"යනු
වෙන් "උපසම්පදාවූවන්ගේද පාරාජිකා ඇවතට පැමිණීමෙන් ස
රණගමනාදි සාමණේරභාවයද විනාස වනහෙයින් වස්ලැබීම
ද පටිප්පස්සම්භනවේ. ඒ දුශ්ශීල ශ්‍රමණයෝ සඞ්ඝසතු ලාබයද නො
ලබත්හි දතයුතු"යයි **පරමත්ථ** මඤ්ජුසා, **විමතිවිනෝදනී** ආදී ටීකා
වන්හි කීහ. මෙහි විස්තර දැනගනු කැමති සැඩින් විසින් ශ්‍රමණ
**දුශ්ශීල සරණාගමන විභාග**නම්වූ පොත බැලිය යුතුයි.

කරන්නේ හඟවාකරන්නේ ආචාර්‍ය්‍ය උපාධ්‍යායාදීන් විසින් "එසේ නොකියව"යි රත්නත්‍රය ත්‍රිගුණකීමෙහි පෙළඹදක්වා වැළැක්විය යුතුයි. ඉඳින් තුන්ගුවනිවර දක්වා අවවාද කරණු ලබන්නේ ඒ ලබ්ධිය හරිද; දඬුයම් කම් කරවා සඟමැදට ගෙණ "අචවයො මං භණෙන අවචනමා" යනාදීන් වරද දෙසවියයුතුයි. ඉඳින්නොවල කීද; ලිඞ්ග නාසනයෙන් නැසියයුතුයි, හෙවත් සිවුරු කඩබා ශාසන යෙන් නෙරපියයුතුයි. ශාස්වත උච්ඡේද දෘෂ්ටික සාමණේරයන් කෙරෙහිද මෙමක්‍රමයමයි. මෙහි භික්ෂුණීදූෂක තෙම වනාහි, නියමයෙන් අබ්‍රහ්මචාරී ග්‍රහණයෙන් ගන්නාලද්දේද; "මතුසංවර යෙහිපිහිටනුකැමති අබ්‍රහ්මචාරික හෙරණතෙමවනාහි සරණස මාදන්කරවා උපසම්පදාකරන්ටවටි. භික්ෂුණීදූෂක හෙරණතෙම මතුසංවරයෙහි පිහිටනු කැමැත්තේද; ප්‍රව්‍රජ්‍යාවද නොලබයි; උපසම්පදාව කියනුකිම" යනමේඅර්ථය දක්වනපිණිස "භික්ඛුනීදූසකො" යනමේ දසවෙනි අඞ්ගය ආවෙනිකව වදාරණලදැයි දතයුතු. දැන් මිශ්‍රක සඞ්ග්‍රහය කියනුලැබේ. විමතිවිනොදනි යෙහි. (5–6) "**ආභිසමාචාරිකෙ සුපිව්නෙතබ්බොති** ඉමිනා සෙඛිය වත්ත ඛන්ධක වත්තෙසු අවුත්තසුච සුකකම්සට්ඨිආදි ලොකවජ්ජසික්ඛා පදෙසුච සාමණෙරෙහි වත්තිතබ්බා"යනුවෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍රවත් හිද හික්මවියයුතුයි, යනමේ **සමන්තපාසාදිකා** අට්ඨවාවචනයෙන් "සෙඛියාවත් කඳුවත්හිද අනිකුදු සුක්කවිසට්ඨිකාදි ලොකවද්‍ය ශික්ෂාවන්හිද සාමණේරයන් විසින් හික්මියයුතුයි" කීහෙයින් මෙම ප්‍රකරණයේ ප්‍රථමපරිච්ඡේදයෙහි දුෂ්කෘතාපත්ති සකන්ධය සම්බන්ධව උද්දෙසාගතනයින් කියනලද ලොකවද්‍ය පන්සැත්තෑ සෙඛිය ශික්ෂාවෝද–දෙවෙනි පරිච්ඡේදාවසානයෙහි කියනලද අගනතුකවත ආදිතුදුස් කඳුවත්ද–ප්‍රථම පරිච්ඡේදයෙහිම ආපත්තිදැක් වීම්වසයෙන් කියනලද සුක්කවිසට්ඨිකා, කායසංසග්ග, දුට්ඨුල්ල වාචා, අත්තකාමපාරිචරිය, අමූලිකචොදනා, කිඤ්චිදෙසලෙස, සංඝභෙද, භෙදානුවත්තක, දුබ්බච, කුලදූසන, යනසඟවෙසෙස් නවයද; අවජ්ඣාන, අත්තපරිනාමන, නිස්සග්ගියද; මුසාවාද * ඔමසවාද, උජ්ඣාපනක ඛියනක, අනුප ඛජ්ජනිසජ්ජ, නික්කඩ්ඩනක, ආමිසහෙතු, අභිහට්ඨුංපවාරණ, උය්‍යොජන, සභොජනකුල, රහොනිසජ්ජ, දුතියරහොනිසජ්ජ, උය්‍යුත්තදස්සන, උය්‍යොධික, සුරාපාන– † අඞ්ගුලිපතොදක උදකෙහසසධම්ම, අනාදර, හිංසාපන, අපනිධාන, පානජීවිතා වොරොපන, ‡ උක්කොටන, දුට්ඨුල්ල පටිච්ඡාදන, ඊට්ඨිඅපපටි නිස්සජ්ජන, උපලාලන, සික්ඛා

---

* † ‡ මේශික්ෂාවෝ දසසීලයෙන්ම ප්‍රතික්ෂෙපනමුදු ලොක වද්‍යහෙයින් කියනලදහ.

පදවීවණ්ණනක, මොඝනක, පහාරදාන, තලසත්තික, අඹුලක, කුක්කුච්චුප්පාදන, උපස්සුති, කම්මපටිබාහන, ඡන්දඅදාන, ඛීයනක, ලාභපරිනාම, යනඅටතිසක් සුඛපවිහි ශික්ෂාවෝදැයි, මෙකී සම්පන්නස් ලෝකවද්‍ය ශික්ෂාවෝද; සාමණේර තැන්විසින් හික්මියයුත්තාහුය. මෙහිසූත්‍රවිභඞ්ග ග්‍රන්ථයෙන් අපවිස්තර විස්තර කොට දක්වනලද සමසතලිස් දුෂ්භාෂිත ශික්ෂාවෝද ඔමසවාද ශික්ෂායෙහි ඇතුළත්හෙයින් සාමණේරතැන් විසින් ඒසියල්ලද රක්ෂාකටයුතුයි. "**තස්සපන අවන්නමානො අලජ්ජිදණ්ඩ කම්මා**රණොව හොතිති දසෙසති" සත්‍යවෙත් "එහිවනාහි නොපවත් නාහෙරණතෙම අලජ්ජියෙක්වෙයි; දඬුයම්කර්මයට සුදුස්සෙක්ම වේයයි දක්වයි" කීහෙයින් එසේකියනලද (179) එකසියනව සැත්තෑ ශික්ෂාවන් ‡ නොරකින සාමණේරතෙමේද වැලි, දිය, දර, දඬුයම් කටයුතුවේ.

(6) ආදිබ්‍රහ්මචරිය, අභිසමාචරික, යයිකියාද; චාරිත්‍ර, වාරිත්‍රයයිකියාද; මෙම සාමණේරශීලයතෙම ද්විවිධවේ. සමපණස් ප්‍රභෙද දස සීලයතෙම ම ශ්‍රීබ්‍රහ්මචර්යාවට ආදිහෙයින් ආදි බ්‍රහ්මචරිය ශීලය වේ. ඉතිරිවූසියලු ශික්ෂාකොටස අභිසමාචාරික ශීලයවේ. "මෙය කටයුතුය"යි වදාළදෙයකිරීම චාරිත්‍රසීලනම්වේ. "මෙයනොකටයුතුය"යි වදාළදෙයින් වැළකීම වාරිත්‍රසීලයවේ. ඒ නොකිරීමද; නොවැළකීමද, වත්‍රභෙදකදෙශීනම් වේ. ශික්ෂාභෙදයෙන් (189) එකසිය නවඅසූ ප්‍රභෙදයට ගියාවූ මෙසේකියනලද මෙම ශීලය සාමණේර ප්‍රාතිමොක්ෂ සංවරශීලනම්වේ. ඒ ප්‍රාතිමොක්ෂ සංවරයාගේම විරසපීතිය පිණිසවදාළාවූ ඉන්ද්‍රියසංවර, ආජීවපාරිශුද්ධි, ප්‍රත්‍යයසන්නිශ්‍රිත, යනසීලතුණෙහි පිහිටියාවූ හෙරණ පැවිද්දන්ගේම ප්‍රාතිමොක්ෂ සංවරය විරසපීතිකවේ. එහිවිස්තර 4-5-6-වෙනි පරිච්ඡේදයන්හි කී ක්‍රමයින්දතයුතු. සර්වඥ ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාපෙක්ෂක කුලදරුවෙක්ලද සර්වවිරයන් වහන්සේවිසින් මෙසේකියනලද පරිද්දෙන් පැවිදිකරවා උපාධ්‍යාය ග්‍රහණය දී සවකීය පුත්‍රයෙක් කෙරෙහි මෙන් කෙණෙක්මෙන් ශාසනාලයෙන් තමන් සමීපයෙහි හැසිරෙන්නෙක් කොටහික්මවියයුතුයි. යම්තාක්කල්වනාහි සාමණේරතෙම තමාවිසින් හික්මියයුතුදෙය

---

‡ මෙසේ ගණන්වශයෙන් කියනලදනමුදු මෙයින් ඉතිරිවූද උපසම්පන්න භික්ෂූන්ට තුලසිය ද්‍රෂ්කුළායයි පණවාවදාළ ශික්ෂාවන් අතුරෙන් ලෝකවද්‍ය සියලු ශික්ෂාවන්හි හෙරණ පැවිදිතැන් විසින් හික්මියයුතුබව දතයුතු. එහෙයින්ම සාමණේර, භික්ෂුණී, ශික්ෂමානා, සාමණේරී, යනසහ ධාර්මිකයන්විසින්හික්මියයුතුබැවින්, භික්ෂූන් අරබයා පණවාවදාළ සියලු විනයප්‍රඥප්ති ශික්ෂාවෝ "සඞ්ඝධම්මික" යයි කීයනුලබත්.

නොදනිද; සඟළසිවුරු පාත්‍රධාරණ ස්ථානනිසද්‍යාදී යෙහිද, අද
ක්‍ෂවේද; ඒතාක් කල් භෝජන ශාලාවකටහෝ සලාකබෙදන
තැනකටහෝ අතික්‍රමවූහෝ එබඳුතැනකට නොයැවිය යුතුයි.
සමීපයෙහි හැසිරෙන්නෙක්ම කළයුතුයි. ඒසාමණේරයන්හට ප
රාමාස අපරාමාසාදී සියලුකැප අකැපදෙය කියාදියයුතුයි. හැඳීම්
පෙරවීම් ආදී ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍රවත්හි හික්මවියයුතුයි. සත්වෙනි පරි
ච්ඡේදයෙහි කියනලද සියලු මිශ්‍රකසංග්‍රහයද මෙහි දතයුතු.
මෙතෙක් සාමණේර සීලයහා ඒ සීලවිපත්ති දක්වනලදහ. දැන්
විපත්තිදෝෂයෝ කියනුලැබෙත්. හෙරණසික විනිශ්චයෙහි:-
(5-5) "මෙසේ දක්වනලද මේදසපරිච්ඡෙද එකකුදුවත්නෙ දු
ස්සීලවූවාහට සැදැහැයෙන්දුන් පසවලදතුවරු [ගිනිගෙණ දිලි
යෙන ලොහොගුළාවලදතු මැනවැයිදු; සැදැහැයෙන්දුන් සිවුරු
හඳනාපොරොණා වරා ගිනිගෙණ දිලියෙන යපටහඳනේ මැන
වැයිදු; සැදැහැයෙන් කරවාදුන් සෙනස්නෙහි ලගනා වරා ගිනි
ගෙණ දිලියෙන ලොහොනෙසි ලග්නේ මැනවැයිදු; සැදැහැ
යෙන්දුන් හැඳපුටුආදිය හෝනා හිඳිනාවරා ගිනිගෙණ දිලියෙන
ඇඳපුටුආදිය හෝනේහිඳුනේ මැනවැයිදු; සැදැහැයෙන් වඳන
වුන්ගේ වැදුම්ඳුවසනු වරා ගිනිසදල වරක්එව පොලුලා අඹරණු
මැනවැයිදු; හිදුනුසැහින් උරෙනිවිදුනේ මැනවැයිදු; වදෑළබැ
වින්, පරිජිවන්නාට නිසි විකුම්කොට බුත්සිල්ඇත්තාහු විසින් ගි
සගිනිඇවිලියාක්හුඒ ගිනිතිවන්නාට වනවේලේ වියක්සෙයින් ව
හාසංවරයෙහි පිහිටිය යුත්තේය. නොඑසේ වූවාහුවිසින් සඟුන්
වලඳඑවන සතරපසයෙහි විධානනොකොට යුත්තේය, නොදපි
රියස යුත්තේය, නොද සිය අතින් සැපවිය යුත්තේය; යටත්පිරිසෙ
සින් වළඳිනසඟනාට අවුලටතිසි කොලත්තකුදු කැපකොට
නොදිය යුත්තේය. සඟුන් ඔහුලවා කැපකරවා නොගතයුත්තේ
ය. මේඅත්ථය අටුවායෙහි ආබැවිනුදු "එකොපි අලජ්ජිඅලජ්ජිසතම්
පි අලජ්ජිසඟාසම්පි කාරෙති"යු බැවිනුදු; මේ මෙසේ වනබැ
වින් තමහාවිලපන් සතරපසය සඟනට දියටිහු විසිනුද; සඟනට
වළඳඑවන සතරපසීයෙහි විධානකරණු කැමැත්තාහු විසිනුදු, ආ
යතිසංවරයෙහි නොපිහිටත්හොත් මහණවෙස්හැර ගිනිහාවයට
යායුත්තේය......මේ දස පරිච්ඡෙද එකකුදු අවත්නාහු සැදැහැ
යෙන්දුන් සතරපසය පරිභොගකරන්නාට නොහිසිවන බැවින
දු; මෙයින් සිඩවන ආදිනවනොදැනද පරිභොගකළ අපායසිද්ධ
වනබැවිනුදු; (ඔහට) මහණලිඟුඑනා පැවිදිනැහි බැවිනුද සඟුන්
හා සම්භොගයට නොනිසිවනා බැවිනුදු; ලිංගනාසනාවිසින්
සබබනාසනාවිසින් නයනකල්හි මේදසපරජි අවත්නම්මු නැසිය
යුතු බැවින්ද දසනායනානම්වෙයි ඉහු"යනු කියනලදී.
දැන්සීලානිසංසයෝ කියනු ලැබෙත්, උනුම්කොට රක්‍ෂාකරණ
ලද මෙමසීලය වනාහි මෙලොව පරලොව ඇතිතාක් උතුම්

ආනිසංසයන් ගෙණදී පසුව කෙළවර තෘෂ්ණාවගේ නිවීමයයි කියනලද නිර්වාණසම්පත්තියට පමුණුවන්නේය. එහෙයින්කීහ. **සද්ධම්මොපායනයෙහි**:-

ඉමම්හි සීල රතනං ඉධචේ'ච පරත්ථච.
ආනිසංස වරෙ දත්වා පච්ඡා පාපෙති නිබ්බුතිං.

සත්වෙනි පරිච්ඡෙදයෙහි කියනලද සීලානිසංසයෝද මෙහිදත යුත්තාහුය. තවද, ක්‍ෂුද්‍රානු ක්‍ෂුද්‍රවත් (ශික්‍ෂාවන්) නොපුරන්නේ සීලය නොපුරයි; අපිරිසිදු සිල්ඇති දුෂ්ප්‍රාඥතෙම චිත්තෛකාග්‍රතාව නොලබයි. නානාලම්බණයෙහි ලැගුණුසිත් ඇත්තාවූ වික්‍ෂිප්ත චිත්තය ඇතිපුද්ගලතෙම මනාකොට නුවණින් ධර්මය(ප්‍රතිපත්ති ය)නොදකී; ධර්මය නොදක්නාවූ පුද්ගලතෙම දුකින් නොමිදෙයි. එහෙයින් වදාළහ: **මහාවග්ගයෙහි**:—

වත්තං අපරිපූරෙන්තො නසීලං පරිපූරති
අසුද්ධසීලො දුප්පඤ්ඤො චිත්තෙ'කග්ගං නවින්දති
වික්ඛිත්තචිත්තො නෙ'කග්ගො සම්මා ධම්මං නපස්සති
අපස්සමානො සද්ධම්මං දුක්ඛා න පරිමුච්චති.

යම්හෙයකින් වත්පුරන්නේ සීලය පූරණ කරයිද, විශෙෂයෙන් පිරිසිදු සිල්ඇති ප්‍රාඥවන්නාවූ ඒ පුද්ගලතෙම චිත්තෛකාග්‍රතාවද ලබයි. කර්මස්ථානවූ එක අරමුණෙහි පිහිටි සිත්ඇත්තාවූ අවික්‍ෂිප්ත චිත්තයඇති පුද්ගලතෙම ධර්මයනුවණින් දකීද; ප්‍රතිපත්තිසධර්මය දක්නාවූ ඒ පුද්ගලතෙම දුකින් මිදෙයි; එහෙයින් වදාළහ-මහාවග්ගයෙහිම:-

යං වත්තං පරිපූරෙන්තො සීලම්පි පරිපූරති
විසුද්ධසීලො සප්පඤ්ඤො චිත්තෙ'කග්ගම්පි වින්දති.
අවික්ඛිත්තචිත්තො එකග්ගො සම්මාධම්මං විපස්සති
සම්පස්සමානො සද්ධම්මං දුක්ඛා සො පරිමුච්චති.

එහෙයින් ප්‍රාඥසම්පන්නවූ සර්වඥපුත්‍රතෙම වත්හි ක්‍ෂුද්‍රානු ක්‍ෂුද්‍ර ශික්‍ෂාවන් පූරණ කරන්නේය; ශ්‍රෙෂ්ඨවූ සර්වඥයන් වහන්සේගේ (එම) අවවාදය කරන්නේය; එයින් තෘෂ්ණාවගේ මිදීමයයි කියනලද නිර්වාණපුරයට පැමිණෙන්නේයි. එහිම වදාළහ:—

තස්මාහි වත්තං පූරෙන්තො ජිනපුත්තො විචක්ඛණො
ඔවාදං බුද්ධසෙට්ඨස්ස තතො නිබ්බාණමෙ'තිහි.

ශික්‍ෂායෙහි ගෞරව ඇති ශ්‍රාමණෙරතෙමේ මෙසේ ශීලය දැන බිජුරකින කිකිළියක්සෙයින් වාලධියරකින සෙමරදෙනක්මෙන් ප්‍රියපුත්‍රයෙකු රකින මවක්මෙන් එකඇසරකින පුරුෂයෙක්මෙන් මෙමශීලය රක්නේය. එහෙයින්කීහ **සද්ධම්මොපායන** යෙහි:-

කිකී'ව අණ්ඩං චමරී'ව වාලධිං පියං'ව පුත්තං නයනං'ව එකකං,
තථෙ'වසීලං අනුරක්ඛමානකා සුපෙසලා හොථ සදාසගාරවා.

මෙතෙකින් ආධුනික භූදිජනයාගේ ප්‍රමොදයපිණිස කරණලද භික්ෂුශීලයෙහි සාමණෙරශීලනිර්දෙශ නම්වූ දසවෙනි පරිච්ඡෙදය නිමවනලදී.

(ප. අ. 10) පරිච්ඡෙදි'මං පස්සහ කම්ම'ප්පකාසං
විජානාති නිච්චං විභාවෙති යොසො
සමුනානං පයාති ස'පෙක්ඛො දසා ලු
ධුවං සාමණෙරාන 'සීලම්හි යොසො

විනය සම්පුණ්ණං 'තිප්පපකෙඛවහි සුක්ඛං
කුපුරිස අමනුඤ්ඤං ධම්මිකානං මනුඤ්ඤං
ඉතිහි දස පරිච්ඡෙදං ඉමං භික්ඛුසීලං
සකල සුරනරානං අත්ථසිද්ධිං කරොතං.

1 බුද්ධස්ස ධම්මරාජස්ස සාසනස්ස චිරට්ඨිතිං
සුවණ්ණජොතස්ස සහෙන ඉච්ඡනෙනන ධුවං මයා.
2 ආධුනිකානං සබ්බෙසං හිතත්ථාය කතංඉදං
භික්ඛුසීලං විභාවීනං කිංසාධෙති මහො'දයං.
3 තෙනෙ'වෙ'දං බුද්ධක'නති කොටීමා අචමකඤති
ධීරා පා මොජ්ජමනසා හොන්තු එත්ථපරකාමෙ.
4 සුතෙහාල්පපනාබහුස්සුතානං තිනාපසංසාචපමාණ'මෙති
සුතෙන ප්‍රප්පනාන බහුස්සුතානං තිනාපසංසාහි නිරත්ථකාව.
5 විජ්ජනති එත්ථදොසා පමාදජාචෙ'ව හාමජාච
ගණ්හන්තු තත්ථධීරා සමාහිතා යුතතා'මෙව'ත්ථං.

1 ඉමිනා'හං පුඤ්ඤෙන උප්පන්නු'ප්පන්න ඨානෙසු
සනෙතා'ප ස්සයලාහී බුජ්ඣිං චරිම භවෙ බොධිං.
2 සබ්බත්ථ සිද්ධිනෙතා භදනත මෙධඞ්කරාභිධො ථෙරො
මය්හං ආචෙරවරො අනනතංයාතං සකපණිධානස්ස.
3 ඉන්දාසභවරඤාණො යොචරථෙරො'සි සඞ්ඝ පිතුභූතො
සොමය්හඤ්'පජ්ඣායො අනනතංයාතං සක පණිධානස්ස.
4 මය්හං මාතාපිතරො මං වඩ්ඪෙසුං මහා'නුකම්පා යෙ
සො ජනකොච ජනෙත්ති අනනතං යාතං සකපණිධානානං.
5 යො මාතාවිය මය්හං උපකාරො'හොති සඞ්ඝතිස්සො සො
මය්හං මාතුලථෙරො අනනතං යාතං සකපණිධානස්ස.
6 විජෙජාදයපරිවෙණෙ මුඛතෙබ්බයො සිරිසුමඞ්ගලො ථෙරො
සො මම ආචරියවරො අනනතං යාතං සකපණිධානස්ස.
7 තස්මිං දුතියා'චරියො ථෙරො දෙවා'දිමිත්ත නාමො යො
සොපි මමං ආචරියො අනනතං යාතං සකපණිධානස්ස.

8 යෙ මය්හා සඤ්ජීවිකා සඞ්ඝාතකා චෙව මජ්ඣත්තා
සබ්බෙ තෙ නරදෙවා අනත්තං යනතු සක පණිධානානං.
9 යෙ මය්හං අමනාපා ඊජ්ජුනො විහරන්ති භූතෙසු
සබ්බෙ තෙ භූතාව අනත්තං යනන්තුං සකපණිධානානං.

ශික්ෂාශීලය නිමි.

## ශුද්ධපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 5 | , | ‘ |
| 1 | 6 | , | ‘ |
| 1 | 15 | සම්පෙනෙහා. | සම්පනෙහා. |
| 2 | 3 | තමෙ. | තෙමේ. |
| 4 | 10 | පාරිචර්ය. | පාරිචරියා. |
| 4 | 15 | තොදෙසා | නොදෙසා උපද්‍රව සහිත කොට උපචාර රහිත කොට. |
| 4 | 18 | ,, | ,, |
| 9 | 21 | අරණ්‍ය. | ආරණ්‍ය. |
| 12 | 13 | යා | යම් |
| 14 | 7 | සික්‍ෂණිනියක්. | සික්‍ෂණියක්. |
| 14 | 30 | චතුව්විධ. | චතුර්විධ. |
| 16 | 13 | කුලයන්හි. | කුලයන්හි. |
| 16 | 21 | දූතුන්. | දූතුම්. |
| 17 | 34 | අනි. | ඇති. |
| 17 | 35 | ප්‍රවේසත්. | ප්‍රවේසම්. |
| 19 | 4 | පවත්වනාහුය. | පවත්නාහුය. |
| 19 | 5 | විවණ්ණක. | විවණ්ණකා. |
| 20 | 3 | සික්‍ෂුව. | සික්‍ෂුවඅතින්. |
| 20 | 22 | සාවික. | සාවිකා. |
| 21 | 3 | අරණ්‍ය. | ආරණ්‍ය. |
| 21 | 11 | දෙදණමබලු. | දෙදනමබුලු. |
| 21 | 24 | ග්‍රියව. | ග්‍රීවය. |
| 22 | 3 | පලලත්තිකායෙන්. | පලලනිකායෙන්. |
| 23 | 1 | විසිරප්සිරවා. | විසුරුවවිසුරුවා. |
| 23 | 4 | චපුචපුකාර. | චපුචපුකාරක. |
| 23 | 5 | සුරුසුරුකාර. | සුරුසුරුකාරක. |
| 23 | 15 | ධුම්මදෙසන. | ධම්මදෙසනා. |
| 23 | 16 | පාදුක. | පාදුකා. |
| 24 | 27 | රාජරාජ. | රාජරාජ. |

| පිට. | පේළි. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 25 | 9 | විනයදුෂ්කෘත නම්වේ * | |
| 30 | 26 | වෛදනාත්‍රික. | වෙදනාත්‍රික. |
| 31 | 25 | පරාජිකා. | පාරාජිකා. |
| 32 | 15 | උ෴ෂණියා. | උෂ්ණය. |
| 33 | 19 | මූබපූජන. | මූඛපුෂ්පජන. |
| 34 | 26 | කඩ්ග. | ඛඩ්ග. |
| 37 | 13 | කප්පියානිවෙදි තබ්බාන්. | කප්පියාකප්පියානං අනුලොමානි වෙදිතබ්බාන. |
| 37 | 36 | කාවතී. | කාතීව. |
| 41 | 20 | ස්ථනකාදීන්ගේ. | ස්ථනඛාදීන්ගේ. |
| 41 | 21 | මම්මුළාවීම්. | මංමුළාවීම්. |
| 42 | 16 | ක්‍රිඩා. | ක්‍රීඩා. |
| 43 | 21 | සාංඝික. | සාඝික. |
| 45 | 30 | ආයස්මා. | ආයස්මා ඔකාසං. |
| 46 | 33 | උපසම්පාදෙතබ්බං. | නඋපසම්පාදෙතබ්බං. |
| 47 | 21 | ආජානනෙනා. | අජානනෙනා. |
| 48 | 21 | අදිපනසබ්බං. | ආදිපනසබ්බං. |
| 49 | 1 | සාසඳ්ධිං. | නාසඳ්ධිං. |
| „ | 8 | ද්‍රශි. | ඔහුකෙරෙහි. |
| „ | 10 | කියතු ලැබෙත්. | කියතු ලැබේ. |
| „ | 16 | අභිසමාචාරික. | ආභිසමාචාරික. |
| 50 | 29 | ආජීවනය. | ආජීවයන. |
| 56 | 21 | සඳ්දංගුාවා. | සඳ්දංසුතවා. |
| 58 | 12 | පුත්ගල. | පුද්ගල. |
| 59 | 32 | පරිරිච්ඡේදිය. | පරිච්ඡේදය. |
| 63 | 5 | ලෙමාතෘ. | ලෙශමාතෘ. |
| „ | 17 | මාතෘවජා. | පිතෘවජා. |
| „ | 23 | දුතුන්. | දූතුම්. |
| „ | 33 | ආනන්ද. | සාරිපුත්‍ර. |

---

* මෙතනට "අසවල් සික්‍ඛු" නෙම යනාදි සූත්‍රදුෂ්කෘත විස්තරය දතයුතු.

25 පිට 12 පෙළ පටිස්සව දුෂ්කෘත නම්වේ. යන තන්හි-එහෙයින් කීහ:—

දුක්කටං පුබ්බයොග ඤ්ච සහයොග'නාමාසකං
දුරු'පචිණ්ණ විනය ඤ්ත ඤාත්ති පටිස්සවං
ඉති අට්ඨවිධං වුත්තං දුක්කටං විනයඤ්ඤුනා.-

යනුයොදු දතයුතු.

| පිට. | පෙල. | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| 65 | 35 | උස්වූ. | බැගෑවූ. |
| 63 | 16 | නුවනින්. | නුවණින්. |
| 67 | 4 | විදලේබොනමැස්සෝ. | විදලේබොන මඳුරුවෝ |
| 72 | 38 | පඟඝවෙච | පඟඝගාවෙච. |
| 74 | 36 | විචිනන. | විචිනන. |
| 75 | 35 | වාදෘ. | වදෘ. |
| " | 37 | මන. | මාන. |
| 78 | 16 | සව්. | ෂඩ් |
| 80 | 13 | මගීා. | මාගීා. |
| " | 23 | අහඝීද්. | අභිද්. |
| " | 24 | ද්‍රහාන. | ප්‍රහාණ. |
| " | 26 | අහඝීත්- | අභිත්. |
| 81 | 19 | වංචා. | වඤ්චා. |
| 83 | 26 | කුනන්. | කුනම්. |
| 85 | 31 | අදිය. | ආදිය. |
| " | 33 | කොකුන්. | කොකුම්. |
| 92 | 26 | අභිවෘඩි වත්තේය. | අභිවෘඩි වත්නීය. |
| 94 | 11 | වන්. | වම්. |
| 95 | 10 | දුස්සීලයායයයි. | දුස්සීලයා යයි. |
| 97 | 28 | තමත්. | තමත් දෘෂ්ටි අභිරුචිත. |
| 98 | 7 | ගෙත්වා. | භිකුත් කරවා. |
| " | 11 | සකලාම. | සලකාම. |
| 101 | 13 | පජ්ජයෙය්‍යා. | පජ්ජෙය්‍යා. |
| " | 34 | නිකායා. | නිකාය. |
| 102 | 4 | වූ:-තනං. | වුතනං:- |
| " | 26 | භික්‍ෂු. | භික්ඛු. |
| 104 | 25 | අලවජ්ජනක. | අලවජ්ජනක. |
| " | 27 | දෙකෙණෙක්. | දෙනෙක්. |
| 105 | 22 | කාසාවසත්‍රය. | කාසාවි වසත්‍රය. |
| " | 25 | කාසාය. | කාසාව. |
| 106 | 19 | හ්‍රස්වය හා සංයොගපර කොටනැතිඅක්ෂරයෝ. | සංයොග පරකොට නැති හ්‍රස්වාක්ෂරයෝ. |
| 107 | 13 | තෙමේම. | තමා විසින්ම. |
| 108 | 9 | මලා. | මාලා. |
| 109 | 36 | හෙවත්. | නොහොත්. |
| 111 | 1 | හගීා. | ගගීා. |
| " | 27 | පාරිවුරිය. | පාරිචරියා. |
| 112 | 14 | චරිකා. | චාරිකා. |

මෙහි මතුදක්වනලද වගන්ති තුණ 42 පිටේ 41 වෙනි අඩංය දරණ වගන්තියේ අගට යොදා දත යුතු.

(41-2) බුලත් පුවක් හුණු දුම්කොල යනාදී තාම්බූල භාණ්ඩය (බුලත්විට) වැලඳීම වත්මාන කාලික භික්ෂූන් අතර විනයට අනුලොම් නොවනසේ දක්නාලැබේ

සබ්බකාලිකසම්භොගො කාලෙ සබ්බස්ස කප්පති
සතිපච්චයෙ විකාලෙ කප්පතෙ කාලිකත්තයං.

භාවය:“කාලයෙහි(පෙරවරු) ගිලන් නොගිලන් සියලු දෙනාට යාවකාලික, යාමකාලික, සත්තාහකාලික, යාවජ්විත, යන සර්වකාලික පරිභොගය කැපවේ. විකාලයෙහි ගිලන්බැව් ආදී ප්‍රත්‍යයක් ඇතිකල්හි යාමකාලිකාදී කාලිකතුණ කැපවේය” යි වදාළහෙයින් ගිලන්බැව් ආදී ප්‍රත්‍යයක් ඇතිකල්හි යාවජ්විත වූ තාම්බූලභාණ්ඩය අනික්කාලිකයන්හා මිශ්‍රනොවන පරිද්දෙන් විකාලයෙහි වැලඳීමෙන් ඇවැත් සිදු නොවෙත්.

යාමකාලිකමාදීනි සංසට්ඨානි සහත්තනා
ගාහාපයන්ති සභාවං තස්මා එවමුදීරිතං.

භාවය: (යාව)යාමකාලිකාදී සතර කාලිකයෝ තමත් සමග මිශ්‍රවූවාහු තමත්(හීන)කාලික භාවය ගන්වත්. එහෙයින් (එක කාලිකයක්හා මිශ්‍රවූ අනික්කාලිකය ඒ හීනකාලිකයාගේ කාලය තුළම අනුභවකට යුතුයයි) මෙසේ කියනලදී.

ආමිස සංසට්ඨං පටිග්ගහෙත්වා ඨපිතං හොති යථාවත්ථුකං පාචිත්තියමෙව. “ආමිෂයෙන් මිශ්‍රවනලද (යාවජ්විතය) පිළිගෙණ තබනලද්දේවේද (එය වැළඳීමෙන්) යථාවත්ථුකපචිතිවෙ”යි. වදාළ හෙයින් පෙරවරු කැඳ බත් අවුලු ආදිය සමග තාම්බූල භාණ්ඩය පිළිගෙණ ආමිස සහිත මුඛයෙන් වැළඳූ භික්ෂුතෙම එයින් ඉතිරි බුලත් භාණ්ඩය විකාලයෙහි ප්‍රත්‍යයක් ඇතිකල්හිද වැලඳීමෙන් **විකාලභෝජන** පචිති ඇවතින් සාපත්තිකවේ.

පස්වරු බුලත්විට වැලඳූ භික්ෂුතෙම බුලත් කසට ත්‍යුත් මුඛයෙන් අඹපැන් ආදී යාමකාලිකය වලඳාද; ඒ අඹපැන් ආදියහා මුඛගත තාම්බූලකසට මිශ්‍රවීමෙන් වලඳා ඉතුරුව තිබුනු බුලත් භාණ්ඩය යාමකාලික ගතියට පැමිණේ. එය දෙවෙනි දින අරුණෙන් පසු වලඳන ඒ භික්ෂුතෙම **සන්නිධිකාර** පචිතියෙන් සාපත්තිකවේ.

ගිතෙල් වෙඬරු ආදිසත්තාහකාලිකය සමඟද යටකීලෙස මිශ්‍රවූ බුලත් භාණ්ඩය සත්දින ඉක්මවා වලඳන භික්ෂුතෙම **භෙසජ්ජනිදහන** පචිතියෙන් සාපත්තිකවේ.

එබඳු ගිලන් බවක්නැතිකල්හි රසතෘෂ්ණාවෙන් මැඩී අඹපැන් ආදිය සහ බුලත් භාණ්ඩය විකාලයෙහි පිළිගන්නාවූද, වලඳන්නාවූද, භික්ෂුතෙම දුකුළා ඇවතින් සාපත්තිකවේ.

(41-3) මෙකල සමහර භික්ෂූන් අතරෙහි කෝපි තේවතුර බීම

ද විනයට අනුලෝම් නොවනසේ දක්නාලැබේ. වෛද්‍යාචා ර්යයන් විසින් කෝපි, තේකොළ බෙහෙත්යයි අනුනොදත් නා ලද්දහුය. අපගේ ස්වාමිවූ බුදුන් විසින්ද "අනුජානාමි භික්ඛ වෙ ඵලානිභෙසජ්ජානි බිලඞ්ගං-පෙ-පණ්ණානි භෙසජ්ජානි නි ම්බපණ්ණං-පෙ-නෙවඛාදනීයෙ ඛාදනීයත්ථං ඵරන්ති න භොජ නීයෙ භොජනීයත්ථං ඵරන්ති-පෙ-නාතිප්පටිග්ගහෙත්වා යාවජීවං පරිහරිතුං-පෙ-යනාදියෙන් ඛාද්‍යභොජ්‍යාදි ආහාර පිණ්ඩස නො පවත්නාවූ වලගසහල් ආදි ඵල වර්ගයා ඇටවර්ගද, එසේම ව්‍යඤ්ජ න පිණ්ඩද, නොපවත්නාවූ කොසඹ පත්‍ර ආදි පත්‍ර වර්ගද, පිළිගෙ ණ අවිනිම්කොට තබා ප්‍රත්‍යයක් ඇතිකල්හි පරිභොග කටයුතු යයි වදාරණලදී. මෙකල මනුෂ්‍යයෝ වනාහි පිපාසය නසන පි ණ්ඩස නොව ක්ෂුධාග්නිවෙදනාව නසන පිණ්ඩස (ආහාර පිණ්ඩස) කෝපි තේවතුර බොණ බවදක්නා ලැබේ. එහෙයින් කෝපි තේකොළ යාවජීවිකයට ඇතුළත් නොවෙත්. සත්තාහකාලි කයට ඇතුළත්ද නැද්ද යන කාරණය ගැණ කියයුත්තක්ම නැත්තේය. අනුලෝම් සහිතවූ යාමකාලිකය වනාහි අව්වෙන් රත්කොට ගැණීම විනා ගින්නෙන් රත්කොටගැණීමක් නැත් තේය. කෝපි තේකොළ දෙවර්ගයම ගින්නෙන් රත්කොට (ද්‍ර නූකර) ගන්නාලද හෙයින් යාමකාලිකයද නොවන්නේය. තේකොළ වනාහි ව්‍යඤ්ජන පිණ්ඩස ගන්නාලද පත්‍ර කොටසක් ද වන්නේය; එහෙයින්ද තේකොළ යාමකාලික නොවන්නේය.

මෙසේ කියනලද කාරණයන්ගෙන් කෝපි සහ තේකොළ යාමකාලිකාදි කාලිකත්‍රයට අනුලෝම් නොවන බවහා යාව කාලිකයට අනුලෝම්වන බව පැහැදිලිව පෙණේ. එහෙයින් ප්‍රත්‍යයක්ඇති කල්හිද විකාලයෙහි කෝපි තේවතුර බොණ භි ක්ෂුතෙම **විකාලභොජන** පචිත්තියෙන් සාපත්තිකවේ.

(41-4) අපගේ ස්වාමිවූ භාග්‍යවත්තෙමේ හිසරදයෙන් පෙළ නාවූ පිලින්දවච්ඡ ස්ථවිරයන්වහන්සේද ශීතවනයෙහි කමටහන් වැඩූ පන්සියයක් භික්ෂූන්ද අරබයා "අනුජානාමි භික්ඛවෙ ධූමං පාතුං" යනුවෙන් ගිලන්භික්ෂූන්ට වැටියෙහි බෙහෙත් දවටා හෝ කෝවෙහි දමාහෝ දුම් බොන්ට අවසරදී වදාළසේක. ඒ ලෙශයෙන් මෙකල නොගිලන් භික්ෂූන් විසින් ගිහියන්සේ දුම් කොල වැටිකොට හෝ කෝවෙහිලා හෝ දුම් බීම ශාසන චාරි ත්‍රයට එකඟනොවේ. දුම් බීමෙන් සුවවෙන ආබාධයක් නැතිව එහි තෘෂ්ණාවෙන් මඩනාලදුව දුම් බොණ භික්ෂුතෙම දුකුළා ඇවැතින් සාපත්තිකවේ.

මෙසේ බලත්විට "සැපීම, කෝපිබීම, තේවතුරබීම, දුම්බීම," යන සතර කාරණයගැණ දෙශනා අට්ඨකථාදිය අනුවගියාවූ අංගමතය මෙසේ දක්වීමු තමහට වැඩකැමති ශික්ෂාකාමී බුද්ධ පුත්‍රයෝ විමසා මෙහි යුක්තායුක්තය හඟිත්වා.

# දැන්වීමයි.

1 ශ්‍රමණ දුශ්ශීල උපස්ථානය හා ඔහුගෙන් බණ ඇසීමාදිය වැරදි බැව් දක්වා කරගම්පිටියේ වාදය අරමුණුකොට මුද්‍රණ කරවනලද් දුශ්ශීල සඞ්ග්‍රහ භේදය.

2 ශ්‍රමණ දුශ්ශීලයාහට තිසරණය පමණවත් ගුණයක් නැති බැව් දක්වා බවපොතේ වාදය අරමුණුකොට මුද්‍රණකරවනලද ශ්‍රමණ දුශ්ශීල සරණාගමණ විභාගය.

3 විනයපිටකය අනුපසම්පන්නයන්ට කියාදීම තහනම් නොවනබව දක්වා අතුරුවැල්ලේ වාදය අරමුණුකොට මුද්‍රණකරවනලද විනය අපටිච්ඡන්න භාවප්‍රතිච්ඡය.

4 දුශ්ශීල උපස්ථානාදි කරුණු සයක් අරමුණුකොට පානදුරේ උපන්මහාවාදය අරමුණුකොට මුද්‍රණකරවනලද පානදුරේ අභිනව විවාදය.

5 මෙම භික්ෂුශීලය යන මේකී පොත් පිළිවෙළින් ශත 20-15-18-36-62-යන ගනන් වලට මෙහි නම් පෙණෙන අපවෙන මුදල් එවීමෙන් හෝ ඒ ගනන් වලට සෑහෙන ශත 5-2 තැපැල් මුද්දර එවීමෙන්හෝ ලබාගතහැකි බැව් සියල්ලන් විසින් දතයුතු. භික්ෂුශීල මුද්‍රාඞ්කන සමාගමේ සියලු සමාජිකාම ගනුන්ගෙන්ද භික්ෂුශීලය ලබාගත හැකිවේ. තැපැල්ගාස්තුව අයකරණු නොලැබේ.

මේවනට,

1-5—ඩී. සී. පෙරේරා හුනුමුල්ලේ
සොහොලේ මහත්මයා.
මිනුවන්ගොඩ තැපැල්පල.

2-5—ගල්කිස්සේ සී. ඩී. ප්‍රනාන්දු.
ගල්කිස්සේ තැපැල්පල.

2-3-4-5—පානදුරේ පී. ඒ. පීරිස්.
පානදුරේ තැපැල්පල.

1-2-3-4-5—උඩුගම්පල වෙලුන් පෙරේරා
අමරසිංහ ගුරුන්නාන්සේ.
හේණරත්ගොඩ තැපැල්පල.

නොම්මරපිළිවෙලින් පොත් ඇති මහතුන් හැඳිනගත යුතු.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු